

විශුද්ධි මාර්ගය

(ප්‍රථම භාගය)

අ පි ක ථා චා ය්‍ය්

භදන්ත බුද්ධඝොෂ මහාස්ථවිර ප්‍රණීත

විශුද්ධිමාර්ග.

ශීල-ධුතාඞ්ග නිදේශාත්මක

ප්‍රථම භාග ය.

කාලිකාලඝාතිනඃසඞ්ඝපණ්ඩිතපරාක්‍රමබාහුමහරාජප්‍රණීත

පදාර්ථව්‍යාඛ්‍යාන යෙන්

සමුපෙතයි.

කොළඹ මාලිගාකන්දේ විද්‍යොදයමහාවිද්‍යාලයෙහි ආචාර්ය්

පරවාහැර වජිරඤාණ සවාමිපාදයන් වහන්සේ

විසින්

පරිශොධනය කොට සංස්කරණය කරණලදී.

ශොධක සවාමීන්වහන්සේ විසින් ලියනලද

උපග්‍රන්ථයකින්ද යුක්තයි.

විද්‍යොදය මහාවිද්‍යාලයාධිප

කහවේ ශ්‍රී සුමඞ්ගල රත්නසාරාභිධාන

කොළඹ නවකෝරලේ

ප්‍රධාන සඞ්ඝනායක මාහිමියන් වහන්සේ විසින්

ශොධ්‍යපත්‍රාවලොකනයෙන් සම්මතයි.

කොල්ලුපිටියේ ශ්‍රීනගර් නිවසේ

සී. ඒ. හේවාවිතාරණ වෛද්‍යාචාර්ය්‍ය මැතිතුමන්

විසින්

මහාබොධි යන්ත්‍රාලයේ මුද්‍රාපිතයි.

බු: ව: 2471.

ක්‍රි: ව: 1927.

VISUDDHI MAGGA.

BY

BHADANTACHARIYA BUDDHAGHOSA
MAHATHERA
The Chief Buddhist Commentator.

VOLUME I.

WITH THE PARAPHRASE

BY

HIS MAJESTY KALIKALASAHITYA SARVAGNA PANDITA
PARAKRAMABAHU,
King of Ceylon.

EDITED BY

PARAWAHERA VAJIRANANA THERA
Member of the tutorial staff of Vidyodaya Oriental College, Colombo.

FINALLY REVISED BY

KAHAWE SRI SUMANGALA RATANASARA MAHA THERA
Pradana Nayaka of Western Province,
Principal, Vidyodaya Oriental College,
The highest oriental institution in the island.

PUBLISHED BY
DR. CHARLES ALWIS HEWAVITARNE.
MAHA BODHI PRESS,
COLOMBO, (CEYLON).

B. E. 2471.
C. E. 1927.

සංක්ෂේපනය.

---

i. විශුද්ධිමාර්ගීය.

ශ්‍රීසුගතතථාගතප්‍රවචනාර්ථවිභාවනාත්මක සමස්තසත්ත්වවිශුද්ධිවිධායක විශුද්ධිමාර්ගී නම්වූ මේ ග්‍රන්ථරත්නය වනාහි රාගාද්‍යශෙෂමලාපගම යෙන් අත්‍යන්තපරිශුද්ධ වූ පරමවිශුද්ධි සඞ්ඛ්‍යාත නිර්වාණාධිගමොපාය ප්‍රකාශ කරණ හෙයින් අර්ථානුගත සඤ්ඤාවශයෙන් විශුද්ධිමාර්ගී නම් වන්නේය. සම්බුද්ධපරිනිර්වාණයෙන් දශවත ශතවර්ෂයේදී සිංහලාපි කථා පරිවර්තනය සඳහා දඹදිවින් ලක්දිව පැමිණි විශුද්ධබුද්ධින් ප්‍රසිද්ධ බුද්ධඝොෂාභිධාන ප්‍රථමාර්ථකථාචාර්යයන් වහන්සේ විසින් තෙවළා බුදුවදන් වෙත පැවැති සර්වකීය ප්‍රඥා මහිමය පහළ කෙරෙමින් අර්ථකථා සහිත මුළු තුන්පිටකය සංක්ෂෙපයෙන් සඞ්ග්‍රහ කොට නිපදවන ලද ප්‍රාථමිකග්‍රන්ථය විශුද්ධිමාර්ගීය බව ද තත්සම්බන්ධ විවරණන වෘත්තාන්ත ද ජනශ්‍රුතියෙහි සුප්‍රසිද්ධය. එබැවින් ග්‍රන්ථවිභාවනාවශ යෙන් දැක්විය යුතු ප්‍රපඤ්චකථා විවෙකකාමීන්ට ප්‍රපඤ්චයක් ම විය හැකි හෙයින් ද අපවිසින් ම මතු ලියනුලබන බුද්ධඝොෂ චරිත කථාවෙන් එය දතහැකිවන හෙයින් ද මෙහි නො කියම්හ.

සැකෙවින් වනාහි මේ ග්‍රන්ථය දීඝනිකායාදීන්ට ලියූ **සුමඞ්ගලවිලාසිනී** ආදිය මෙන් විශෙෂාර්ථකථාවකුදු නො වේ. **සමන්තපාසාදිකාදිය** මෙන් සිංහලාර්ථකථාපරිවර්තනයකුදු නො වේ. **අභිධම්මාර්ථසඞ්ගහ-අභිධම්මාවතාර-සුමනාවතාරාදිය** මෙන් ප්‍රකරණාන්තරයකුදු නො වේ. මෙය වනාහි දීඝනිකායාදි චතුර්විධ නිකාය මධ්‍යයෙහිවූ ත්‍රිපිටකයට ම සාධාරණ වූ සුමඞ්ගලවිලාසින්‍යාදියෙන් ශ්‍රෙෂ්ඨවූ ම අර්ථකථාරත්නයෙකි. තථාගතයන් වහන්සේගේ නියත විභජ්ජවාදයවූ බුද්ධාගමය මතාන්තර කාලුෂ්‍යයෙන් විශුද්ධ කොට දක්වන ධර්මාදර්ශයකි. ශීල සමාධි ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාවිෂයෙහි සඛන්ධ - ධාතු - ආයතන - ඉන්ද්‍රිය - සත්‍ය - ප්‍රතීත්‍යසමුත්පාදාදි පරමාර්ථධර්මයන්ගේ ලක්ෂණාදිවර්ණනාසාකල්‍යයෙන් සම්පූර්ණ වූ සද්ධර්මරත්නාකරයකි.

සර්වජ්ඤ මූලභාෂාවිෂයෙහි සුලලිත පදබ්‍යඤ්ජනයෙන් විරචිත සුවිශුද්ධවිනිශ්චය ඇති විශුද්ධියෙන් ප්‍රතිමණ්ඩිතවූ මේ ග්‍රන්ථය ශතවර්ෂ තුදුසක් පමණකල් මුළුල්ලෙහි සර්වවිරවංශාගත මහාර්ෂිණාශ්‍රව සම්ප්‍රදායයෙහි පවත් මේ දක්වා නිර්වාණාධිගමොපාය මාර්ගයෙහි පිළිපන් යොගාවචරයනට අමෘතානන්දජනනය කෙරෙමින් ද ව්‍යක්තමධුරධර්මකථික යන්ගේ හස්තසාරයක් මෙන් ද සාතිශයාදරපරිශීලනයෙහි පවත් නේ ම ය.

පර්‍යාප්ති-ප්‍රතිපත්ති-ප්‍රතිවේධ ශාසනයන් පිළිබඳ සාමාන්‍යවූ දැනීමක් ඇතිකරගැනීම සඳහා පරිශීලනය කටයුතු එකම ග්‍රන්ථය විශුද්ධිමාර්ගීය බව ප්‍රදක්ෂිණග්‍රාහිසුධීන්ගේ විවාදරහිත පිළිගැනීම වේ. යමෙක් මේ ග්‍රන්ථය පාල්‍යර්ථවශයෙන් උදග්‍රහණය-ධාරණය කරන්නේ නම් ඕහට බුද්ධාගමයෙහි සාරධර්මයන් සම්බන්ධ විශෙෂඥානයක් ඇතිවන්නේමය. එබැවින් මේ ග්‍රන්ථය සුලභව පැවැත්ම බෞද්ධයන්ගේ මහාභාග්‍යයකි.

ii. විශුද්ධිමාර්ගීය පිළිබඳ පරිවාරග්‍රන්ථ.

දවිතීයාර්ථකථාචාර්‍යවූ බදරතිත්ථවාසී භදන්ත **ධම්මපාල** මාහාසාමි පාදයන්විසින් නිපදවූ **පරමත්ථමඤ්ජූසා** නම් ටීකාවද තට්ටීකාග්‍රයෙන් කලිකාලසාහිත්‍යසර්ව්වඥපණ්ඩිත **පරාක්‍රමබාහු** මහරජාණන් විසින් නිපදවූ සිංහල මහාව්‍යාඛ්‍යානය ද විශුද්ධිමාර්ගීය පිළිබඳ පරිවාර ග්‍රන්ථයෝ වෙත්.

එසින් **පරමත්ථමඤ්ජූසා** නම් ටීකාව න්‍යාය වෛශෙෂික ශාස්ත්‍රානුගතවූ අතිප්‍රඥාතව්‍යාත්‍යාත්‍රීසංවර්ණ්‍යාවෙකි. න්‍යායඝන්දර්‍ශනයෙන් මතාන්තර නිරාකරණය කොට හැමලෙසින් යථාර්ථවිභාවනා කළ ටීකාවක් මේහැර තවත් නැතැයි කියයුතුය. මේ ටීකාවට පෙර විශුද්ධිමාර්ගීය පිළිබඳ සිංහලව්‍යාඛ්‍යානයක් තුබූ බවද එය අභයගිරි ජෙතවන නිකායික යන්ගේ මතාන්තරසඛ්කලනයෙන් දූෂිතව අර්ථසම්පත්තියෙන් පරිබාහිරව තුබූ හෙයින් යථාර්‍ථාවබොධයෙහි නො තරම්වූයෙන් නෂ්ටප්‍රායවූ බවද මේ ටීකා සන්න දෙක්හි ම පෙණෙන කෙවිවාදවලින් පැහැදිලි වේ.

iii. පරාක්‍රමබාහු මහා ව්‍යාඛ්‍යානය.

සම්සන්නකවිජ්‍ඤානමාත්‍රාමණිරත්නාකරමාන්‍යවූ නැමීබඹර කලිකාල සාහිත්‍යසර්ව්වඥපණ්ඩිත **ශ්‍රී පරාක්‍රමබාහු** භූපාලොත්තමයන් විසින් පරමත්ථමඤ්ජූසා නම් ටීකාව ගුරුතන්හි තබා මේ විශුද්ධිමාර්ගීව්‍යාඛ්‍යානය කරණලදි.

මේ මහාරාජයා වන්නාහි ශ්‍රී බුද්ධ වර්ෂ 1779 වැන්නෙහි මෙයට හවුරුදු 691 ට පමණ පූර්වයෙහි ලඞ්කාරාජ්‍යශ්‍රියට පැමිණ සකලශ්‍රීන් විරාජිත ජම්බුද්‍රෝණී (දඹදෙණි) පුරප්‍රවරය අග්‍ර රාජධානිය කොට පන්තිස් හවුරුදක් මුළුල්ලෙහි රාජ්‍යය කළ දවිතීය පරාක්‍රමබාහු නම් අග්‍රරාජර්ෂිය. සුවිශදප්‍රඥාමහිමයෙන් හා සුවිශාලපාණ්ඩිත්‍යයෙන් සිංහල ඉතිහාසය කීර්තිමත් කළ අධිරාජයාතෝ නම් මේ දවිතීය මහා පරාක්‍රමබාහු රාජයාණෝය. ශෞර්‍යවීර්‍යබලපරාක්‍රමයෙන් හා යශස්තෙජසින් ජගද්ව්‍යාප්ත සම්භූපාලොත්තමවූ මේ රජතුමා තර්කන්‍යායදර්ශනෙතිහාසක්‍රියාකල්ප විකල්ප නිඝණ්ටුවර්ණ්ණෙ ව්‍යාකරණාදි ශාස්ත්‍රාන්තරයෙහි හා සිංහල පාලි සංස්කෘතප්‍රාකෘතාදි භාෂාන්තරයෙහි ද පැවති නිර්මලවූ බුද්ධිප්‍රභා ඇත්තේ අසදෘශකවියෙක් ද විය. ත්‍රිපිටක පර්‍යාප්ති විෂයෙහි පටුප්‍රඥවූයේ ශ්‍රද්ධා සම්පන්න ද විය. නිති පන්සිල් රැක්කේ පොහොය අවසිල් ද රැක්කේය. දිවි දෙවැනි කොට සසුන් රැක්කේ සුබිත කෙරෙමින් රට වැසියා ද රැක්කේය. මහදන් දුන්නේ මහ වෙහෙර ද කරවීය. සම්‍රාජගුණසංහතියෙන් විශිෂ්ටවරිත්‍රශ්‍රීන් විරාජමානවූ මේ පෘථිවීශ්වර තෙමේ **කලිකාල සාහිත්‍ය සර්ව්වඥපණ්ඩිත** යන සම්‍යදර්ත්‍ථනාමය

අර්ථානුගත කෙරෙමින් බොහෝ කලක් මුළුල්ලෙහි ශත්‍රුවිඝනපරිතාප යෙන් තැවුනු ලක්දිව හා බුදුසස්න සෙමෙහි තබා මහත්වූ රාජ්‍ය භාරය උසුලන අතරම සබකීය ප්‍රඥාමහිමය ප්‍රතිබිම්බිත වීමට සවණ්ඩාදශී සදෘශවූ **නිස්සංදේහ** නම් වනවිනිස සන්නය ද, **විශුද්ධිමාර්ග මහාව්‍යාඛ්‍යා නය** ද, කාව්‍යචූඩාමණියවූ **කව්සිළුමිණ** නම් සිංහල මහාකාව්‍යය ද, සම්පාදනය කොට ධර්මවිනය හා ශාස්ත්‍රයෙන් ද සිංහල බෞද්ධ මහා ජනතාවට විශෙෂානුග්‍රහය කෙළේය.

iv. ව්‍යාඛ්‍යාසඞ්ගරුප.

මේ රජතුමා විසින් ප්‍රණීත විශුද්ධිමාර්ගීව්‍යාඛ්‍යානය වනාහි ව්‍යාඛ්‍යාවිෂයෙහි සාර්ථකෞඛම වූයේම අර්ථව්‍යක්තියෙහි ප්‍රශස්තය. සන්ධ්‍ය ශුද්ධියෙන් සුවිශදවූයේම මතානන්තරවිෂයෙහි සෛථිල්‍ය. ශබ්දාර්ථ චින්තා විසින් සන්නාථවූයේම නිරුක්ති-නිර්දේශ-ප්‍රකෘති-ප්‍රත්‍යය විභාගාදි ව්‍යාඛ්‍යා සඞ්ගරුපයෙන් සුරුපය. අභිප්‍රෙතාර්ථ සූචක වචනසමපත්ති යුක්ත වූයේම අත්‍යුක්තකාංඝන-පරවමහන්නාදි විපත්ති වියුක්තය. අර්ථවිභාවන යෙහි තර්කන්‍යායදශීනොක්තිදශීනයෙන් සහෙතුකවූයේම මතිමාත්‍ර දශීනයෙන් පරිබාහිරය.

මෙලෙසින් සර්ථතොභද්‍ර වූ මේ ව්‍යාඛ්‍යානයෙහි ප්‍රධානාඞ්ගයෝ නම් පාලිවශයෙන් සුබොධපදයනට ගුඪාර්ථ කථනය ද, දුර්බෝධපදයනට ශිථිලාර්ථ කථනය ද, එසේම අර්ථසුගම නැති පදයනට පරිකථා ලිවීම ද, අර්ථව්‍යක්තිය සඳහා සාධක දැක්වීම ද වෙත්. ඇතැම් සම්‍යනපදයනට ව්‍යසනව අර්ථ කථනයද දුර්බෝධ සන්ධානඇති පදයනට සුබොධ වන සේ විසන්ධි කොට අර්ථකථනය ද, එකාර්ථසූචක පදයනට ගෞරව සඳහා බහ්වර්ථකථනය ද මෙහිවූ සාමාන්‍යාඞ්ග වෙත්. මෙයින් මේ ශ්‍රෙෂ්ඨව්‍යාඛ්‍යා කතෘ ව්‍යාඛ්‍යාදර්ශීත්වය නොව ආධුනිකානුග්‍රහය ද අර්වාචීන ව්‍යාඛ්‍යා කතෘන්ගේ ආචාර්‍යත්වයද සැලකුබව සිතියයුතු.

v. භාෂානතාඞ්ගය.

මෙහි භාෂාව්‍යවහාරය වූකලී සතලොස්වන සුගතශතාබ්දයෙහි ග්‍රන්ථ රචනා විෂයෙහි ව්‍යවහෘතවූ ශිථිලත්ව ගුඪත්ව පරිහාරයෙන් සම්ප්‍රවෘත්ති ඇත්තාවූ මිශ්‍ර සිංහල භාෂාවයි. මේ ව්‍යාඛ්‍යානකාලය ලක්දිව භාෂාශාස්ත්‍ර සම්බන්ධී විශෙෂොද්දීපනියකින් යුක්තවූ බැවින් ව්‍යාඛ්‍යාවිෂයවූ භාෂාව අතිශයින් ශිෂ්ටසම්මතය. මේ ව්‍යාඛ්‍යානකර්තෘවූ රජතුමා සව්‍යාකරණ සංස්කෘත භාෂාවිෂයෙහි හසල බුද්ධිමතෙකු බැවින් සෛථිල්‍යභාවයෙන් මෙහි යොදා තිබෙන වාක්‍යයෝ බොහෝසෙයින් සංස්කෘතප්‍රාය වෙත්. **සිදත්සඟරා** නම් සිංහල ව්‍යාකරණයට ද පුරාතනවූ මේ ව්‍යාඛ්‍යානාගත භාෂාව වර්තමාන ශිෂ්ටභාෂාව හා සමාන වේ. එහෙත් ඇතැම් සර්ථනාම-ආඛ්‍යාත-නිපාත පදයන්ගේ විශෙෂයෝ ද ඇතැම් තැන්හි සවර විපර්‍යාසභෙද ද ඇත්තාහ. ඇතැම් පදයන් පිළිබඳ ව්‍යාඛ්‍යානව්‍යවහාර වර්තමාන ව්‍යවහාරයන්ට වඩා වෙනස් බැව් මෙහි පෙණෙන උදාහරණ වලින් පැහැදිලි වේ.

ව්‍යාඛ්‍යානව්‍යවහාර.		වර්තමානව්‍යවහාර.
"ආවත්	=	ඇවැත්
ඉහි	=	එහි
මිහි	=	මෙහි
අසුවල්	=	අසවල්
එක්බිති	=	ඉක්බිති
පිළිබැඳි	=	පිළිබඳ
උපාසකවරිනි	=	උපාසකවරුනි."

vi. ව්‍යාඛ්‍යානාශ්‍රිතවූ ග්‍රන්ථ.

මේව්‍යාඛ්‍යානයට පෙර විශුද්ධිමාගීයට ලියූ පුරාතන සන්නයක් තුබූ බව යට කියනලදී. එය මේ ව්‍යාඛ්‍යානසමය තෙක් පැවැති බව ද රජතුමා විසින් එහද ආශ්‍රය කොට ගෙණ ටීකාවම ගුරුතැන්හි තබා මේ ව්‍යාඛ්‍යානය කළබව ද "මෙයින් මතු සන්නටීකා තුබූසේ ප්‍රසන්න වචන යෙන් සාභිප්‍රාය පදවී වණ්ණනා කරණු ලැබේ" යන නිගමනයෙන් පහැදිලි වේ. ඒ පුරාණසන්නය මතභෙදප්‍රාය වීමෙන් අවීභක්ෂ්‍යකව තුබුබැවින් ටීකාචාර්‍යයන් විසින් ද අනාදෘතවූ බව "කෙචි, එකචෙච, එවං වදන්ති තං තෙසං මතිමත්තනං," යන ආදී මතභෙද දර්‍ශනයෙහි කී වචනවලින් පෙණේ. ටීකාචාර්‍යයන් විසින් එහි ඇතැම් මතභෙද නොපිළිගණිමින් බැහැර ද නොකෙරෙමින් පඬුවන්ගේ විවෙක බුද්ධි විෂය කළ බව "අපරෙ, කෙචි, එකෙ වදන්ති, වීමංසිතබ්බං" යනාදියෙන් පැහැදිලි වේ. මේ ටීකාගෙහි ආ 'කෙචි' ආදිපදයන්ට "සන්නයෙහි' යනු ව්‍යාඛ්‍යානාගත අවීවාචනාසි. මෙයින් ව්‍යාඛ්‍යාකතෘද ටීකාගත මතානන්තර පරිහාරයට අනුලොම්වූ බව පෙණේ.

ඇතැම්විට මෙහි කී පුරාණ සන්නය විශුද්ධිමාගීයට පෙර **උපතිස්ස** නම් තෙර කෙනෙකුන් විසින් සිංහලයෙන් ලියූ නාමශෙෂොපගත වීමෙන් ශ්‍රාතිසම්ප්‍රදායයෙහි පවත්නා විමුක්තිමාගීයවත් දැසි සැකකළ යුතු.

මේ සන්නටීකා දෙක හැර මේ ව්‍යාඛ්‍යානයෙහි ආශ්‍රිතවූ පාලි සංස්කෘත ග්‍රන්ථයෝ බොහෝ වෙත්. එයින් සමහරක් නම්:–දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අඞ්ගුත්තර නිකාය, සුමඞ්ගලවිලාසිනී, පපඤ්චසුදනී, මනොරථපූරණී, ධම්මපද, සුත්තනිපාතට්ඨකථා, නිද්දෙසට්ඨකථා, සමොහවිනොදනී, අත්ථසාලිනී, පාචිත්තියපාලි, පරිවාරපාලි, කඞ්ඛාවිතරණී, න්‍යායාඤ්ජලී, ජාතකමාලා යනාදීහු වෙත්.

vii. විශුද්ධිමාගී ව්‍යාඛ්‍යානාභිශොභනය.

සමස්තධර්මාර්‍ථව්‍යාඛ්‍යාවිෂයයෙහි අග්‍රගණ්‍යවූ ධර්මශාස්ත්‍රඥතයෙහි අත්‍යන්තොපකාරිවූ මේ විශුද්ධිමාගී සන්නය මුද්‍රණවිෂය නොවී අතිශයින් දුර්ලභව පවත්නා අතර රත්මලාණේ විසූ බුද්ධශාසනමහාශූර සෙනාපති ඇම්. ඩබ්ලිව්. ධර්මරත්න ලක්මිණිපහන් කතුතුමන් විසින් පරිශොධ නය කොට භාවසන්නයකින් ද යුක්ත කොට මෙයට පන්තිස් වසකට

දූෂිතව තුබූ එතද් ව්‍යාඛ්‍යානය පිළිබඳ එතුමන්ගේ පරිශොධනය මේ දක් වාත් බොහෝ දෙනා විසින් ආදෘතය. එයින්ද ආධුනිකයන්ට ලැබිය හැකි ප්‍රයොජන ඉතා මහත්ය.

viii. අපේ මෙම සංස්කරණය.

මෙසේ සුලභව පවත්නා මේ ව්‍යාඛ්‍යානය විශුද්ධිමාගීය හදරණු වනට අතිශයින් උපකාර වෙතත් විශෙෂයෙන් මෙකල පාරිවෙණික ශිෂ්‍යයන්ගේ සුඛාවබොධය පිණිස සුදුසු සංස්කරණයකින් මෙය මුද්‍රණය කරවුව හොත් මැනවැයි සැලකූ විද්‍යොදය පිරිවෙණේ ආචාර්‍ය්‍ය අප වයස්‍ය **පණ්ඩිත වැලිවිටියේ සොරත** ආයුෂ්මතුන් වහන්සේ ඇතුළු හිතවත් කීපදෙනෙකුන් විසින් මෙහෙයනලද අපි මේ සංස්කරණයෙහි ව්‍යාපෘත වීමු.

පෞරාණිකවූ මෙබඳු ගැඹුරු ධර්මව්‍යාඛ්‍යානයක් පරිශොධනය කිරීමේ දුෂ්කරතා බොහෝය. එහෙත් මෙකල ලබාගත හැකි තරම් පුරාණවූ පුස්කොළපොත් කීපයක් සපයා ගෙණ හැකිතාක් පරිශ්‍රම යෙන් පරිශොධනය කොට පෙල වෙනම් යොදූ ව්‍යාඛ්‍යාගත සංවණ්ණනීය පදයන් ඉඩහලිෂි අකුරෙන් අඩකිත කොටගෙණ පරිකථා ලියූ උපග්‍රන්ථ යක් ද යොදූ විශෙෂයෙන් පාරිවෙණික ශිෂ්‍යයන්ගේ ද සාමාන්‍යයෙන් ධර්මකථිකයන්ගේ ද පහසුව පිණිස භාගවිභාග කොට ශීල ධුතාඞ්ග නිදේශ දවයාතමක ප්‍රථම කාණ්ඩය ප්‍රථමවරට මෙසේ සංස්කරණයට පැමිණවීමු. අවශෙෂ කාණ්ඩද යුහුසුලුව මෙසේම සංස්කරණයට පමුණුවන්නෙමු.

අපගේ මේ පරිශොධනයෙහි පොත් සපයා දීමෙන් සඞ්ග්‍රහ කළ විද්‍යොදය පිරිවෙණේ පූජ්‍යකාලයාධිපති **හික්කඩුවේ පෙමානන්ද** මහා සථවිරයන්වහන්සේට ද, පැල්මඩුල්ලේ පුරාණවිහාරාධිපති **හාල්දඬුවන ධම්මරක්ඛිත** සථවිරයන්වහන්සේට ද කෘතඥතා පූර්වක සාදරස්තුතිය පිරිනමමු. ඒ හැර විද්‍යොදය පිරිවෙණේ උපප්‍රධානාචාර්‍ය්‍ය **බද්දේගම පියරතන** සථවිර සවාමිපාදයන්වහන්සේ පුරාණ පොතක් සපයා දීමෙන් හා ඇතැම්විට ශොධ්‍යපත්‍ර බැලීමෙන් ද විශෙෂයෙන් අපට උපකාරීවූ බව ගෞරවයෙන් සඳහන් කරමු.

කාලානන්තරාගත ලෙඛකදොෂ පරිහාරයෙන් සංස්කරණය කළ අපේ මේ ශුද්ධියද අත්‍යන්තපරිශුද්ධියයි නොසිතියයුතු හෙයින් ඝටිත සථාන ඇතිවිය නොහෙන්නේ නොවේ. එබැවින් එබඳු තැන්හි සුධීන් ගේ සමාධිය සමග මෙහි දක්වූ අපගේ පරිශ්‍රමය පිළිබඳ සන්තුෂ්ටිය ද අප වෙත ලැබිය යුතුබැව් දක්වමින් මේ සංස්කරණය ලොකශාසනොප කාරය පිණිස නිඃසරණාධ්‍යාශයෙන් යෙදී විමුක්තායතන ශිෂ්‍යයෙන් විශුද්ධිමාගීය හදරණුවන්ගේ සුඛාවබොධය පිණිස පවතීවාසි ආශංසනය කරම්හ.

පරවාහැර **වජිරඤාණ** සථවිර.

P. VAJIRAÑĀṆA.

2471
1927 මැයි මස 16 දින

ශ්‍රීමද් බුද්ධඝොෂ මහාසඞ්ඝ්‍රාම චරිතය.

ශ්‍රී ලඞ්කාශාසනප්‍රතිෂ්ඨාපයිතෘවූ මහා මහින්ද්‍රමහාක්ෂීණාශ්‍රවයන් වහන්සේගෙන් පසු පන්දහසක් හවුරුදු පවත්නා සර්ව්වඥශාසන යට උපකාරී වීම පිණිස මනුලොව පහළවූ ශ්‍රේෂ්ඨ පුදගලයානෝ නම් අර්ථකථාචාර්ය්‍ය භදන්ත බුද්ධඝොෂ මහා සඞ්ඝ්‍රාමපාදයානෝය.. සථාවිර වංශප්‍රදීපායමානවූ මේ මහාසථවිරොත්තමයන් වහන්සේගේ ලොව පහළ වීම විශෙෂයෙන් බෞද්ධලොකයාගේ ද සාමාන්‍යයෙන් සමස්ත ලෞකයාගේ ද සර්ව්වාපීසිද්ධියට අසහායකාරණයෙකි. සමස්තබෞද්ධ ජනතාවගේ අනන්‍යාදරගෞරවයට භාජනවූ නිපුණාර්ථදර්ශීවූ මේ මහා ප්‍රාඥයන් වහන්සේගේ ත්‍රිපිටකපර්ය්‍යාපන්නිප්‍රභෙදගත නවාඞ්ගශාසනා ශාසනවිෂයෙහි පැවැති අලාමකවූ ප්‍රඥතොමෝ බුද්ධඝොෂ යන අනොමනාමයෙන් මූර්ත්තිමත්වූවා විශුද්ධිමාර්ගී නමැති ධර්ම්මාදර්ශයෙහි ප්‍රතිබිම්බිතවැ පවත්නීය.

මේ වාග්මීවර මහාසථවිරයන් වහන්සේගේ උදාරතර ගම්භීර චරිතය සම්බන්ධී සර්ව්සම්පූර්ණ විස්තරයක් විෂය කොට ඇති ග්‍රන්ථබන්ධයක් හෝ ඓතිහාසික වාර්ත්තාවක් හෝ යටත් පිරිසෙසින් හසුන්ලෙඛනයක් හෝ සිංහලයන් කෙරෙහි නොපැවැත්ම මහා අභාග්‍යයකි. මතාන්තර කලුෂ කාලුෂ්‍යයෙන් ප්‍රච්ඡන්නාපථයෙහි පවත්නා බුද්ධඝොෂාචාර්ය්‍යයන් වහන්සේගේ චරිත සම්බන්ධයෙන් සංක්ෂිප්ත විස්තරයක් නමුත් ප්‍රකාශයට පැමිණවීම තදභිලාෂින්ගේ මනොවිනොදනය පිණිස පවත්නේමය. එසේ හෙයින් ප්‍රාච්නප්‍රතීච්න මතාන්තර සමාලොචනයෙන් යථොක්ත වීරචරිතය සම්බන්ධී බිඳුමාත්‍ර විස්තරයක් මෙහි දක්වනු ලැබේ.

අර්ථකථාචාර්ය්‍ය අනුබුද්ධ බුද්ධඝොෂ මහාසථවිරයන් වහන්සේගේ චරිත සම්බන්ධයෙන් කිසිවකුත් ශතවර්ෂ කිපයක් ඉක්ම යනතුරු ඉතිහාසයක ඇතුළත් නුවූ බව සිතියඬුක. ඒ තාක් උන්වහන්සේගේ චරිතකථාවෝ ජනශ්‍රුතියෙන් හා දිනසටහන් මගින් පැවැත්තාහයි සිතිය යුතු. ශතවර්ෂ කීපයකින් පසු තදීයචරිතශ්‍රිය ඓතිහාසිකදර්ශන තලයෙහි නානාස්වරූපයෙන් ප්‍රතිබිම්බිත වීය.

බුද්ධඝොෂචරිතකථාසම්බන්ධයෙන් කීර්ත්තිමත්වූ ඉතිහාසග්‍රන්ථයෝ බොහෝසි. එයින් සිංහල-බුරුම-ඉංග්‍රීසි ඉතිහාස ප්‍රධාන සථාන යෙහි ලා ගිණියයුතු. එසිතුදු සිංහලඉතිහාසය සත්‍යප්‍රාය සංක්ෂෙපචරිත කථාවක්ම ආශ්‍රයකළ හෙයින් ඇතැම් කරණුපිළිබඳ සංශයාකුල ප්‍රපඤ්ච කථා ඇතද ප්‍රථමස්ථානයම ලබයි. එය සිංහලයන්ට මහත්වූ ගෞරවයකි. මේ සුවිශාලාතිගම්භීරවරිත විෂයෙහි ආශ්‍රිතවූ ඓතිහාසික ග්‍රන්ථයෝ නම්:-

1. චුල්ලවංස (මහාවංස 2 කාණ්ඩය)
2. සද්ධම්මසඞ්ගහ,
3. බුද්ධඝොසුප්පත්තිකථා,

4. **සාසනාලඞ්කාර,**
6. **ගන්ධවංස,**
7. **චුල්ල ගන්ධවංස,**
8. **වංසදීපනී,**
9. **කථාගතුප්පත්තිකථා** යන මොහුයි.

මේ සිඟල්ල ප්‍රාචීන ග්‍රන්ථයෝයි. මේ හැර(The Life of Buddhaghosa= බුද්ධඝෝෂ චරිතය ආදී) අර්ඃචීන ග්‍රන්ථයෝ ද බොහෝ වෙත්.

(1) **චුලවංසය නම්**:-(1004 වන වර්ෂයේ ලක්දිව රජපැමිණි **ධාතුසෙනරජුදවස මහානාම** තෙරුන් විසින් විජයාගමනයේ පටන් මහසෙන් රජුගේ රාජ්‍යකාලය දක්වා ලියා තුබූ)මහාවංශයේ සත්තිස්(37)වන පරිච්ඡේදයේ සිරිමෙවන් රජහු පුවත පටන් 4 වන පරාක්‍රම බාහු රජුගේ කාලය තෙක් ලියා තිබෙන කාණ්ඩයයි. දඹදෙණි නුවර පරාක්‍රමබාහු රජුදවස-එනම් අටළොස්වන ශතවර්ෂාවසාන භාගයෙහි **කඞ්ඛරවින්**-හෙවත්-**අග්ගමදන** රවින් ලක්දිවට පැමිණි දවීතීය ධම්කිත්ති මහා සවාමීන්වහන්සේ විසින් මෙය ලියන්නලදැයි කියති. එසේ නම් බුද්ධඝෝෂ චරිතය සමග සබඳිය නාමය ඉතිහාසගත කළ විරවරයානෝ මේ **චූතිය ධම්කිත්තී** මහා සවාමිපාදයෝය. ඒ චූලවංසයෙහි මහානාම රජුගේ පුවත සමග බුද්ධඝෝෂ චරිතය ප්‍රකාශ වේ.

(2) **සද්ධම්මසඞ්ගහ** නම්:-පස්වන **භුවනෙකබාහු** රජුට හා දෙවන **වීරබාහු** රජුට අතර එකුන්විසිවන ශතවර්ෂයෙහි **ධම්මදිත්ත** නම් මහාසවාමීන්ගේ ශිෂ්‍යවූ පස්වන **ධම්කිත්ති** මහාසවාමීන් විසින් ලක්දිව සද්ධම්ප්‍රවෘත්තිය දක්වමින් ලියන්නලද ග්‍රන්ථයකි. මේ ධම්කිත්ති පාදයෝ ලඞ්කාවට පැමිණ ථෙරූපසම්පදා ලබා ගෙන **අඵසාදඞ්ඝ** පුරයට ගොස් **පරමරාජ** නම් සියම් මහරජතුමා විසින් කරවූ **ලඞ්කාරාම** නම් විහාරයෙහි වසමින් සද්ධම්සංග්‍රහය කළබව ග්‍රන්ථාවසානයෙහි පෙණේ. එහි 7 වන පරිච්ඡේදයේ චූලවංසයෙන් උපුටා ගත් බුද්ධඝෝෂ චරිතය වෙනත් ග්‍රන්ථයන්ගෙන් ගත් කරුණු සවිස්තරයක්ද ඇතුලත් කොට ලියා තිබේ.

(3) **බුද්ධඝෝසුප්පත්තිකථා නම්**:-තෙළෙස් (13) වන ශතවර්ෂයෙහි වෙදෙහ මහාසවාමීන්ගේ ශිෂ්‍යවූ **මඞ්ගල** නම් තෙරුන් විසින් බොහෝ වෘත්තාන්තකථා සංග්‍රහ කොට ගෙන බුද්ධඝෝෂාචාර්‍යයන්ගේ උත්පත්තියේ පටන් සවඥීප්‍රාප්තිය තෙක් සවිස්තරව පාලිභාෂාවෙන් ලියන ලද පරිච්ඡේද අටකින් යුත් ග්‍රන්ථයකි.

(4) **සාසනාලඞ්කාරය නම්**:-1832 වර්ෂයේදී බුරුමරට **රතනාපුණ්ණපුර** විසූ **සිරිමහාතිස්ස** නම් බුරුම පණ්ඩිත තෙරුන් විසින් සබඳී භූමියේ සහ බුරුමරටේ ශාසන ප්‍රවෘත්තිය දක්වමින් ලියන ලද්දකි.

(5) **සාසනවංසය නම්**:-සතළොස්(17)වන ශතවර්ෂයේදී බුරුමතෙර කෙනෙකුන් විසින් බුරුමරට ශාසනප්‍රවෘත්තිය දක්වමින් ලියන ලද්දකි.

(6-7) **සඞ්ඝවංසය** හා **චූලගඞ්ඝවංසය** සත ලොස්වන ශතවර්ෂයේ **නාළන්දක** නම් බුරුම තෙරුන්විසින් පාලිභාෂා ප්‍රවෘත්තිය දක්වමින් ලියන ලදී.

(8) **වංසදීපනී** නම්:-එක්දහස් අටසිය තෙවිසි (1823) වැන්නෙහි **ජිනාලඞ්කාරඛේජ** නම් බුරුම තෙරුන් විසින් ශාසනවංශ ප්‍රවෘත්තිය දක්වමින් ලියනලද ග්‍රන්ථයකි.

(9) **සථාගතුප්පත්තිකථා** නම්:-ඤාණගම්භීර නම් බුරුමතෙරුන් විසින් බුද්ධචරිතය හා සාසනවංසය දක්වමින් ලියනලද ග්‍රන්ථයකි.

මෙකී තෑක් ග්‍රන්ථ අතුරෙන් චූලවංසය හා සද්ධම්මසඞ්ගහය හැර සෙසු සියල්ල බුරුමරට පවත්නා ග්‍රන්ථයෝයි.

මෙතැන් පටන් යටකී ඉතිහාස ග්‍රන්ථ සමාලෝචනයෙන් ලබනලද ප්‍රවේශමාර්ගී ඇතිව යථොක්ත බුද්ධඝොෂමහාසවාමීන්ගේ විසිතුරුවූ චරිතකථාව ආරම්භ කරණු ලැබේ.

ජන්මග්‍රාමය හා ලෞකිකාලය.

බුද්ධඝොෂාචාර්‍යයන්වහන්සේ දඹදිව ගයානගරයේ මහබෝ මැඩ සමීපයෙහි නොහොත් මහබෝමැඩින් ක්‍රෝශපඤ්චකයකින් දකුණු දෙස එක්තරා බමුණු ගමෙකැ උපන් බ්‍රාහ්මණ මාණවකයෙකු බව චූලවංස යෙහි කී"බොධිමණ්ඩසමීපම්හි ජාතෝ බ්‍රාහ්මණ මාණවෝ"යන ගාථාර්ධ යෙන් ප්‍රකාශ වේ. කිනම් ගමෙකැ කිනම් බමුණුකුලයක කවර නම් මවුපියන් කෙරෙහි උපන්නෙක්දැයි එහි ප්‍රකාශ නො වේ. සද්ධම්ම සඞ්ග්‍රහයෙහිද චූලවංසයෙහි කීමට වඩා ඒ පිළිබඳ යමක් කියා නැත. බුද්ධඝොසුප්පත්ති කථායෙහි-"එකස්මිං කිර සමයෙ ඝොසෝ නාම ගාමෝ මහාබොධිතෝ අවිදූරෙ අහොසි කස්සපා බහුන්නං ගොපාලදාරකානං බාහුල්ලනිවාසට්ඨාන භූතත්තා ගාමස්ස ඝොසගාමෝ නාම අහොසි" යනාදීන් එක්කලෙක මහාබොධියට නුදුරෙහි "ඝොස" නම් ගමෙක් විය. එය ගොපලු දරුවන්ගේ නිරන්තර වාසස්ථානයක් වූ බැවින්'ඝොස ගාම'නම් විය. එකල එහි එක්තරා රජෙක් විය. (මේ රාජයා පස්වන ශත වර්ෂයෙහි මගධදෙශයෙහි රාජ්‍යය කළ **සඞ්ඝරාම** නම් රජයයි **ජගජ්ජ්‍යාති** නම් ග්‍රන්ථයේ කියා තිබෙනබව **විමලවරණ්ණලෝ** නම් පණ්ඩිතුමාගේ පොතෙහි දක්වා තිබේ. චූලඝඞ්ඛවංසයේ **ඝොසඝඞ්ඝම** නම් රජයයි කියා තිබේ.)ඒ රජුට ප්‍රියවූ මනවඩන්නාවූ කෙසී නම් පුරොහිත බ්‍රාහ්මණයෙක් විය. ඔහුගේ භාර්‍යාවද කෙසිනී නම්විය"යනු දක්වා"තෙනාහු පොරාණා" යන්නෙන් මේ ගාථාවෝ දක්වනලදහ.

"කෙසී ච නාම බ්‍රාහ්මණෝ රඤ්ඤෝ වල්ලභෝ පියෝ,
වෙදතනයං සික්ඛාපෙති රාජානඤ්ච දිනෙ දිනෙ.
තසෙසව කෙසිනී නාම බ්‍රාහ්මණී ච විසාරදී,
බ්‍රාහ්මණස්ස පියා හොති ගරුට්ඨා ච අනාලසා.

රජුට වල්ලභවූ ප්‍රියවූ **කෙශි** නම් බමුණෙක් විය. හෙතෙමේ රජුට දවස්පතා ත්‍රිවෙදය උගන්වයි. විසාරදවූ ගරු තැන්හි සිටියාවූ අලස නුවූ **කෙශිනී** නම් බැමිණිය ඔහුගේ ප්‍රියාව වූවාය" යනු එහි භාවයි.

"තෙනාහු පොරාණා" (=එහෙයින් කිහ පුරාතනයෝ) යන්නෙන් **මඛාදලක්ඛණාදී** මේ ප්‍රවෘත්තිය ජනශ්‍රැතියෙන් ගෙණ මෙහි දැක්වූ බව පෙණේ.

වංශදීපනීකතීහ බුද්ධඝොෂාචාර්‍යයන් වහන්සේ **ථෙටන්** * (සුවණ්ණභූමි) නම් නගරයෙහි උපන්නේයයි තෙලිඟු ඉතිහාසයෙන් ගෙණ සවකිය ග්‍රන්ථයෙහි සඳහන් කෙළේය. අන් සමහරු මුන්වහන්සේ **ඝෂඛඝල** නම් නියම්ගම කාඝසථගොත්‍රයෙහි උපන්නෙකැයි කියති. තවත් සමහරු ආන්ද්‍ර බ්‍රාහමණයෙක් (තෙලිඟුජාතියට අයත් බමුණෙක්) යයි කියති.

මෙසේ හෙයින් බුදුගොස්තෙරපාතන්ගේ ජනමග්‍රාම විවෙචනය විවාද සහිත වූවකි. ඒ කෙසේ වෙතත් මුන්වහන්සේ "ත්‍රිවෙදය හදුලේය, වාද කටැවිව දඹදිව හැසුරුණේය, පාතඤ්ජල නම් දර්‍ශනශාස්ත්‍රය හදුලේය" යන ප්‍රවෘත්තිවලින් බ්‍රාහමණජාති ඇත්තෙකු බව නිශ්චය වෙයි. බ්‍රාහමණජාති ඇත්තෙක් නම් සුවණ්ණභූමියෙහි උපන්නෙක් නොවේ. සුවණ්ණභූමිය බ්‍රාහමණජාතීන්ගේ ජමමභූමිය නොවන හෙයිනි. එහෙත් සුවණ්ණභූමියෙහි විදෙශිකබ්‍රාහමණ සමූහයන් වාසය කළ බව නම් ඉතිහාසයේ සඳහන් වේ. කෙසේ නමුත් බුද්ධඝොෂාචාර්‍යයන් වහන්සේ සුවණ්ණභූමිය (රාමඤ්ඤදෙශය) ගැණ විශෙෂයෙන් දැනසිටියෙකු බව උන්වහන්සේගේ අවසාන අර්‍ථකථාවවූ **මනොරථපූරණී** යෙහි "ඉතො කිර සුවණ්ණභූමි සත්තමතතානි යොජනසතානි හොති"යි දැක්වූ පාඨයෙන් පෙණේ. රාමඤ්ඤදෙශය බුද්ධාගම පිහිටිතැන්පටන් **සුවණ්ණභූමි** නමින් ද බුද්ධඝොෂාචාර්‍යයන්ගේ ශුද්ධවූ ධම්ප්‍රයොග ගෙණයාමෙන් **සුධමමවති-සුධමමනගර** නාමයෙන් ද ව්‍යවහාර විය. "සුධමම නගර" යනු "තුදම්"වී නැවත "තුදන්"වී එයින් ථෙටන් (Thaton)වූ බව **ඉඥිස්ග්‍රෙ** මහතා කියයි.

බුද්ධඝොෂාචාර්‍යයන්ගේ මවුපියන් ගැණ සඳහන් වී තිබෙන්නේ බුද්ධඝොසුප්පත්ති කථායෙහි පමණක් වේ. ඒ වැදගත් කරුණකි. එහෙත් එහි උප්පත්තිය ගැණ කියා තිබෙන කරුණු නො ඇදහිය හැකිසේ පෙණේ. ඒ මෙසේයි: යට කී කෙසී නම් බමුණුගේ විශ්වාසීවූ බොධිමණ්ඩවාසී මහාසථවිරතෙමේ "ලක්දිව පවත්නා සිංහල අර්‍ථකථා මාගධ නිරුත්තියට පරිවර්‍තනය කිරීම පිණිස කවරෙක් සමර්‍ථද"යි පරීක්ෂා කොට **තවතිංසා** දෙව්ලෝවැසි **ඝෝෂ** නම් දෙව්පුත් දැක එහි ගොස් සක්දෙව්

---

* ථෙටන් (Thaton) නම්:-පුරාණයේ මොඬිඝෝලි ජාතිකයන් වාසය කළ දකුණු බුරුම්යට අයත් ප්‍රධාන නගරයකි. දැනට සමුද්‍රයෙන් **සැතැප්ම 20** ක් පමණ දුරහිවූ ඒ නගරය එකල රාමඤ්ඤදෙශයේ යාත්‍රානිර්‍ගම (විදෙශ) වැ පැවැත්තේය. ක්‍රිස්තු වර්‍ෂයට පෙර 306 දී පමණ බම්බඝෘහක රජුවිසින් බම්දූන පිරිසක් ථෙවින් දුවට ගෙවලදී.

රජු ලවා මිතිස්ලොව උපදනා පිණිස සොළොස් දෙවිහට ආරාධනය කරවා කෙසී නම් බැමිණිය කුසැ පිළිසඳ ගණු පිණිස ගිවිස ගෙණ අවුත් කෙසී නම් බමුණාහට "මෙයින් සත්දවසක් ගියතැන ගොළුගේ බැමිණිය කුස ගැබක් හටගන්නේය"යි කී. දෙව්පුත්තෙමේත් දෙව්ලොවින් චුතව ඇය කුස පිළිසඳ ගෙණ දසමස් ඇවැමෙන් මවුකුසින් බිහිවූයේය. කුමරු බිහිවන කල බමුණුකුලයේ දස්කම්කරු ආදීහු 'කව්, බොව්' යනාදීන් මහත් සොළොස් පැවැත්වූහ. එහෙයින් කුමරු සොළොස් නම් කෙළේය" යනු එහි සඳහන් වාතීයි. මෙය මිලිඳුප්‍රශ්නය අනුගමනය කොට ලියුවක් බව සිතිය හැක. උතපත්තියේ පටන් ප්‍රව්‍රජ්‍යාව තෙක් කියා තිබෙන කරුණු මිලිදුපැනයේ **නාගසේන** උතපත්ති කථාවට සමාන හෙයිනි.

මේ බ්‍රාහ්මණමාණවක තෙමේ පටුතර බුද්ධි ඇත්තේ වෙදත්‍රය හා ශ්‍රැති-සෘති-තර්ක-න්‍යාය-දර්ශන-ක්‍රියාකල්පවිකල්ප-නිඝණ්ටු- ඉතිහාස-කලා-ශිල්පාදී සකලබ්‍රාහ්මණධර්මයන් ඉගෙණ ගත් කෘතප්‍රවාදී ඇත්තෙක් විය.

"විජ්ජාසිප්පකලාවෙදී තීසු වෙදෙසු පාරගෝ" යන මහාවංශොක්තියෙන් ඒ බව පැහැදිලි වේ.

ප්‍රව්‍රජ්‍යාව.

මෙසේ දඹදිව මධ්‍යදෙශයෙහි උපන් මේ බ්‍රාහ්මණ මාණවක තෙමේ සකලකලා දන්නේ ත්‍රිවෙදපාරප්‍රාප්ත වූයේ මන්‍යකොට දන්නාලද සමය ඇත්තේ සියලුවාදයන්හි විසාරදවූයේ වාදූර්පීව ශාස්ත්‍රමදයෙන් මත්ව ගම් නියම්ගම් දනවු සැරිසරණට වන්නේය. හෙතෙමේ යම් තැනක පණ්ඩිතයෝ වෙසෙත් නම් ඔවුන් කරා පැමිණ වාදරමහ කෙළේය. ඔහු විසින් අසනලද ප්‍රශ්න එකකුත් කිසිවෙකුට විසඳලිය නොහැකි විය. සියල්ලන් විසින් අසනලද ප්‍රශ්න හෙතෙමේ විසඳලූ ශේය. මෙසේ ශාස්ත්‍රය නිසා උපන් අභිමාන ඇත්තේ එක් දවසක් රාත්‍රියෙහි එක්තරා විහාරයකට පැමිණ (මේ විහාරය බෝමැඩ නෙඤ්ජරා නදිය අසල පිහිටි 'සුජාතගොඩ' විහාරයයි බුරුම ඉතිහාසයේ සඳහන් වේ.) ඒ වෙහෙර එක්පසෙක හිඳ පාතඤ්ජල මතය සම්පූර්ණ පදයෙන් පිරිමඬුලු කොට හදාලේය. පාතඤ්ජලය නම් පතඤ්ජලි මුනිහු විසින් කියනලද මහාභාෂ්‍යය හෝ යොගශාස්ත්‍රයයි-හෙවත්-යොගදර්ශනයයි. **සඩ්ඛ්‍යඛ්‍යාත්‍රහණේ** කී පරිදි ඒ වෙහෙර බොහෝ භික්ෂූහු විසූහ. ඔවුන් අතර ප්‍රතිසම්භිදා ප්‍රාප්ත **රෙවත** නම් රහත් කෙනෙක් වූහ. උන්වහන්සේ ත්‍රිවෙදපාරප්‍රාප්තවූවෝ පරවාදමර්දනයෙහි සමර්ථවූසේක. සඞ්ඝස්ථවිරවූ හෙතෙමේ බ්‍රාහ්මණමාණවකයාගේ ඒ හඬ අසා "මේ තෙමේ මහා ප්‍රාඥයෙක, දමනය කටයුතුයයි" සිතා ඔහු කැඳවා "කොටළුහඬින් හඬන්නේ කවරෙක්"දැයි විචාළේය. එවිට බමුණුතෙමේ "කිම? කොටළු හඬෙහි අර්ථ දනී"දැයි තෙරුන් විචාළේය. දනිමියි උත්තර දුන් හෙයින් බ්‍රාහ්මණතෙමේ ත්‍රිවෙදයෙහි දුරවබෝධවූ ගැටමුසු පැන පිළිවිසියේය. තෙරුන් වහන්සේ විතාළ තාක් සියලු ප්‍රශ්නයන් ඉතා පහසුවෙන් විසඳ විරොධාභාස ද දැක්වූහ.

ඉක්බිති සථවිරතෙමේ "යුෂ්මත්තුන් විසින් විතාල තාක් පැන විසඳිමි, එකකුදු මම නො විචාලෙමි. දැන් විචාරණු කැමැත්තෙමි. මාගේ පැන විසඳව"යි කියා **"ෂස්ස චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති, තස්ස චිත්තං නිරුජ්ඣිස්සති නුප්පජ්ජිස්සති, යස්ස වා පන චිත්තං නිරුජ්ඣිස්සති නුප්පජ්ජිස්සති, තස්ස චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති."** යන අභිධර්මපිටකයේ යමකප්‍රකරණයේ චිත්තයමකපාලිය විචාළේය. බමුණු තෙමේ කිසිවකුත් නො වැටහෙන්නේ "නොදනිමි සවාමිනි! සි කියා" මේ කවරෙකුගේ මන්ත්‍රයක් දැයි විචාළේය. මේ "බුඩමන්ත්‍රය"යි තෙරුන් කී හෙයින් බමුණුතෙම "වහන්ස! මෙය මට දී වදාළ මැනවැ"යි කීයේය. සථවිරතෙමේ "අප වැනි පැවිදිවෙස් දරන්නවුන්ට ම දෙම්හ. නොපැවිද්දන්ට නොදෙම්හ"යි කීය. හෙතෙමේ බුඩමන්ත්‍ර පිණිස පැවිදි වනු කැමැති විය. සථවිරතෙමේ ඔහු පැවිදි කරවා සුදුසු පරිද්දෙන් කමටහන් දුන්සේක. ඉක්බිති හෙතෙමේ බුඩධර්මය මනාකොට ඉගෙණ මෙයම එකායනමාර්ගයයි දැන හටගත් ශ්‍රඩාබුඩි ඇත්තේ හිරසඳ මෙන් මුළුලොව පතළවූයේ බුදුන්ගේ සෙසින් ගැඹුරු හඩ ඇතිහෙයින් ද බුදුන්ගේ සෙසින් මහීතලයෙහි පතළ යශොඝොෂ ඇතිහෙයින් ද **බුඩඝොෂ** යයි ප්‍රසිඩ විය. එහෙයින් කීහ චූලවංසයෙහි:

බුඩස්ස විය ගම්භීර-ඤාසත්තා නං වියාකරුං,
බුඩඝොසොති ඤාසෝ හි-බුඩෝ විය මහීතලෙ.

(බුඩඝොසුප්පත්ති කථායෙහි මේ ප්‍රවෘත්තිය මීට වඩා විසදුණව පෙණේ. එහි "තෙරුන්වහන්සේ කෙසී බ්‍රාහ්මණයාගේ ගෘහයෙහි දන් වලදන්නට වැඩ සොඹනම් බමුණු කුමරුගේ අස්නෙහි වැඩහුන් හෙයින් හෙතෙම කිපියේ" කිමෙක් ද මුණඩකය! මන්ත්‍ර දනීද"යි විචාරා "දනිමි"යි කී හෙයින් "එසේ නම් හදාරවයි" කීයේය. තෙරුන්වහන්සේ ද නුවුපහටුව ත්‍රිවෙදය ආදි-මධ්‍ය-අවසාන ද දක්වමින් හදාළෝය. බමුණු තෙමේ ඒ අසා ලජ්ජාවට පැමිණියේ "වහන්ස ඔබගේ මන්ත්‍ර ඉගෙණ ගණු කැමැත්තෙමි, හදාරව"යි කීය. එවිට තෙරුන්වහන්සේ ඔහු පහදවමින් **"කුසලා ධම්මා, අකුසලා ධම්මා, අබ්‍යාකතා ධම්මා"** යන අභිධර්මමාතෘකා වදාළෝය. තරුණතෙමේ ඒ ඉගෙණ ගණු පිණිස පියා නන් විචාරා පැවිද්දට කැමැති විය. තෙරුන්වහන්සේ ඔහු පැවිදි කළහ යනු එහි දක්වා තිබේ.)

ලඝුකාවතරණය.

මෙසේ විශාරදවූ බුඩ්ධිප්‍රභා ඇති බුඩඝොෂසථවිරතෙමේ **ඒ** හෙර වෙසෙමින් බ්‍රහ්මඣර්මයේ නිස්සාරත්වය දක්වමින් **ඤාණෝදය** නම් ප්‍රකරණය කොට **ඛම්මසඞ්ගණී** නම් අභිධර්මප්‍රකරණයට **අට්ඨසාලිනී** නම් අටුවාව කෙළේය. මනා නුවණැති හෙතෙමේ පිරිත් අටුවාව කරන්නට පටන්ගත්තේය. ඒ දුටු රෙවත සථවිරතෙමේ "මෙහි ජඹුදීපයෙහි ත්‍රිපිටක පාලිය පමණක් පරම්පරානීතය, සඞ්ගීතිත්‍රයාරූඪ

බුඩධඝෝසයෙ ද ශාරිපුත්‍රාදි තෙරුන්විසින් වදුළ අර්‍ථකථා ද මනාකොට බලා ප්‍රාඥවූ මිහිඳු මහරහතුන් වහන්සේ විසින් හෙලදිව් වැස්සන්ගේ පම ණක් ප්‍රයොජනය පිණිස සිංහලභාෂාවෙන් කරණලද ශුඛවූ අර්‍ථ කථාවෝ සිංහලයන් කෙරෙහි පවත්නාහ, තෙපි එහි ගොස් ඒ අසා දැනගෙණ සියල්ලන්ගේම මූලභාෂාවවූ මාගධ නිරුක්තියට පරිවර්‍තනය කරව්; එය සියලු ලොකයාට හිත සැප පිණිස වන්නේ"යයි වදුළසේක.

ඉක්බිති ප්‍රසන්නාවූ සිත් ඇති ඒ මහාප්‍රාඥ තෙමේ උපාධ්‍යායයන් වැඳ අවසර ගෙණ දඹදිව මහධදෙඝයෙන් පිටත්ව බුදුන් පිරිනිවි 953 වෂියෙහි රජ පැමිණි මහානාම රජු දවස ලක්දිවට පැමිණියේය. බුඩඝොසුපපත්ති කථාවෙහි මේ ප්‍රවෘත්තිය මෙසේ සඳහන්ව තිබේ. එනම්: එක්දවසක් රහොගතව විවෙකිව සිටි බුදුගොස් තෙරුන්ට මෙබඳු පරිවිතර්‍කයක් උපන්නේය. "කිම? බුඩධම්විෂයෙහි මාගේ ප්‍රඥව අධිකතර ද නොහොත් උපාධ්‍යායයන්ගේ ප්‍රඥව අධිකතර ද කියා"සි. එවිට රහත්වූ ඒ රෙවත ස්ථවිරතෙම තමන් සිතින් ඔහු සිත දැන "බුඩඝොෂය! දැන් නුඹගේ විතර්‍කිය මට නුරුස්නේය. නුඹගේ විතර්‍කිය ශ්‍රමණයන්ට සුදුසු නොවන්නේය. එබැවින් මා වහා ක්ෂමා කර ගණුව"සි කීයේය. හෙතෙමේත් උපාධ්‍යායයාගේ වචනය අසා බියපත් සිත් ඇත්තේ "සවාමිනි! මාගේ දෝෂය, ක්ෂමාවුවමැනවැ"සි කිය. එවිට තෙරුන්වහන්සේ "ඉදින් එසේ නම් ලක්දිවට ගොස් සිංහලඅර්‍ථකථා මාගධනිරුක්තියට පෙරළාගෙණ එව, එකල්හි මම ක්ෂමා වන්නෙමි"සි කී හෙයින් බුදුගොස් තෙමේ ලක්දිවට එනු කැමතිව පළමු කොට මිසදිටහි පිහිටි පියානන් සම්දිටහි පිහිටුවනු පිණිස සිය නිවෙසට ගොස් ගැජකුටිදෙකක් තනවා ගඩොලින් සෙවෙනි කරවා මැටි අලෙවි කරවා එහි එක් ගැබක ඇතුළ පිට දෙරගුල් යොදවා එහි ගිනිකබලක් සහ සහල්, දිය, කිරි, දී, වෙඩරු, ගිතෙල් ආදිය තබ්බවා* යන්ත්‍රයක් යොදා තමපියානන් එහි ඇතුල් කරවා යන්ත්‍රයෙන් දෙර වැස්විය. එකල බමුණා "මම නුඹේ පියා වෙමි, මක්නිසා මෙසේ කෙළෙහිදැ"සි ඇසී. බුදුගොස් තෙමේ "සැබව පියා වෙහිය, නමුත් මිසදිටුවෙක, බුදුසස්නේ නොපහන් වූවෙක, එහෙයින් මෙසේ අඹ කෙළෙමි"සි කීය. "මම මිසදිටුකම් නොකරන්නෙමි, දෙර අරුව"සි බමුණා කිය. එවිට දෙර හරවා "අදසසනෙන මොරසස" යනාදි ගාථා අටකින් බණ කියා සම්දිටුවෙයි පිහිටුවීය.

ඉක්බිති හෙතෙම දඹදිව බෝමැඩින් පිටත්ව වෙළඳ සමූහයා සමඟ නැවිතොටට ගොස් නැවිනැග ලක්දිව බලා පිටත්වූයේය.

සද්ධම්මසඞ්ග්‍රහයෙහි–බුද්ධඝොෂතෙමේ නාගපට්ටනයෙන් නැව් නැංගේයයි කියා තිබේ. ශාසනවංශයෙහි බුදුගොස් තෙරුන්වහන්සේ සුධම්මවතියේ හෙවත් ථෙවන් නම්වූ සවණ්ණභූමියෙහි උපන්නේ එහි

---

* අදුරෙහි සඟල්, දිය, කිරි, දී, වෙඩරු, ගිතෙල් ආදියෙහි මවයස දැන ප්‍රයෝජන ඇත කොතෙක්කාසේම මිසදිටු අදුරෙහි යාපත අයාපත නොදතමහන බව මෙයින් කැඟවී.

කෙලාස නම් ආරාමයෙහි වාසය කොට ක්‍රි. ව. 387 දී සිංහ රාජවංශ යෙහි පස්විසිවන (25) රජවූ 'කිඩ්ලිඝෝඩ' නමින් ප්‍රසිද්ධ ධම්මපාල රජු විසින් මෙහෙයන ලදුව රාමඤ්ඤදෙශයේ* කුසිම-හෙවත්-බැසින් නම් නගරයෙන් නැව්නැගී තාම්ලිතති (තම්ලුක්) නම් ඉන්දියාවේ නැව්තොට බලා පිටත්වූයේ යයි කියා තිබේ. මෙයින් බුදුගොස් තෙරණුවෝ මහබෝ වැදීම පිණිස පළමු කොට ගෞඩදෙශය මැදින් ගයාවට ගොස් බෝමැඩ වෙත නෙරඤ්ජරානදීතීරයේ පුපඵගොඩ් ආරාමයේ නැවතී සිට ආපසු හැරී සුවණ්ණභූමියට ගොස් පසුව ලඞ්කාවට පැමිණියහයි සිතිය හැකිය.

දශවන ශතවර්ෂය වනතුරු සුවණ්ණභූමිය හා ලඞ්කාව අතර දැන ඇදින ගැණීමක් නොතුබුනේය. එබැවින් 387 දී වූ මේ ප්‍රවත විශ්වාස කිරීම දුෂ්කර වේ. මෙහි විමසිය යුත්තක් ඇත. එනම් බුඩඝොෂ මහා සවාමීන් පරිවර්තනය කළ මනොරථපූරණී නම් අට්ඨකථාවෙහි සුවණ්ණ භූමිය ලඞ්කාවේ සිට යොදුන් 700 ක් පමණ දුරින් පිහිටි බවත් එක්වා වෙගයකින් යන්නාවූ නැව සත්දිනකින් සුවණ්ණභූමියට පැමිණෙන බවත් දක්වා තිබීමෙන් ද, ක්‍රි.ව. 1487 දී රාමාධිපති ධම්මචෙතිය රජු සින් පිහිටුවා තිබෙන ශිලාලිපියෙන් ද බැසින් නගරයේ සිට ලඞ්කාවට යාත්‍රා ගමන් කළ බව පැහැදිලි වේ.

මෙයින් බුද්ධඝොෂ කාලයේ පටන් 15 වන ශතවර්ෂය දක්වා සුවණ්ණභූමිය සහ ලඞ්කාව අතර සම්බන්ධතම පැවති බැව් පෙණේ. නමුත් බුදුගොස් තෙරුන් කුසීම හෙවත් බැසින් නගරයෙන් නැව් නැග ලඞ්කාවට ආ බව විශ්වාස කිරීමට මෙයම ප්‍රමාණ නොවේ.

මීට වඩා බොහෝ කාලයක පටන් ඉන්දියාව හා ලඞ්කාව අතර වැඩි සම්බන්ධතමක් පැවැත්තේය. 5 වෙනි ශතවර්ෂයේ එය තදින් පැවැති බැව් පෙණේ. සඞ්ඝභද්‍රයෙහි "බුදුගොස් තෙරුන් නාග පට්ටනයෙන් නැව් නැංගේය" යන කිමෙන් ඒ බව වැඩියක් ප්‍රකටවේ. එකල නාගපට්ටනය ලඞ්කාව හා වෙළඳුම් කරණ ලක්දිවට ඉතාම නුදුරුවූ ඉන්දියාවේ තොටුපලක් විය. බුඩඝොසුපපත්තිකථාගේ වෙළඳ සමූහයා සමඟ පිටත්වූයේයයි කිමෙන් ද බුඩඝොෂාචාර්යයන් වෙළඳ නැවකින් ලක්දිවට පිටත්වූ බව නිගමය කළහැකිය.

යාත්‍රාගමන හා බුඩදත්ත තෙරුන් හමුවීම.

මෙසේ බුද්ධඝොෂාචාර්යයන් වහන්සේ ලඞ්කාව බලා දඹදිවින් පිටත් වූ දින බුඩදත්තනම් සථවිර තෙමේ ලංකාවෙන් දඹදිව බලා නැව් නැංගේය. නැව්දෙකම තෙදිනක් සමුද්‍රයේ යාත්‍රා කළ ඉක්බිති ශක්‍රාදි දෙවියන්ගේ අනුභාවයෙන් එකිනෙක ලංවීමෙන් සථවිරවරු දෙදෙන හමුවූහ. බුඩදත්ත සථවිර තෙමේ බුඩඝොෂ සථවිරයන් අට්ඨකථා

---

* රාමඤ්ඤය නම්: පෙගු, හංසාවඩි, මුත්තම (දැනට මෝතඹ), කුසීම් (දැනට පැසීම් නොහොත් බැසින්) යන රටවල් ඇතුලත් දෙශයයි.

පරිවර්තනය පිණිස ලක්දිව් යනබව දැන තෙමේත් අර්ථකථා කරණයට ලක්දිව් ගියබවත් එහිදී **ජිනාලංකාරය, දණ්ඩධාතුවංසය, බෝධි වංසය** යන ග්‍රන්ථ පමණක් කළ බවත් කියා "මම දැන් අල්පවූ ආයු ඇත්තෙක් වෙමි, මහල්ලෙක්මි, එබැවින් මිට වඩා ශාසනසඞ්ග්‍රහයක් කළ නොහැක්කෙමි. තෙපි ලක්දිව් ගොස් බුඩවචනය මාගධනිරුත්තියට පෙරළා ශාසනසඞ්ග්‍රහය කරව්"යයි කියමින් බුදුගොස් තෙරුන් සතුටු කොට තමහට සක්දෙව් විසින් දෙනලද අරුණෙඩියත් යමුවා පන් හිඳත් ගලත් දී "ඉදින් ඔබට ඇස් ලෙඩක් හෝ පිට රුජාවක් හෝ වී නම් මේ අරළුපලය මෙගල ගා ආලෙප කරව"යි කියා ආශිර්වාද කොට දඹදිව් බලා නික්මුනේය. එහි ගොස් කීපදවසකින් අපවත් වී තුසිතයේ උපන්නේය. බුඩඝොෂ තෙමේ ද වෙළඳුන් සමග ලක්දිව් පැමිණියේ **දවිජඤාන** නම් තොට නැව නවත්වා එහි විසීය. එහිදී දිය ගෙණ යාම පිණිස පැමිණි දැසියන් දෙදෙනෙකු එකිනෙකා බහින්බස් බැණගෙණ කලහයට වන්බව දැක"දැන් මුන් කලහ කොට රජුකරා ගොස් මා සාක්ෂ්‍ය කාරයෙකු කොට දක්වතැ"යි සිතා ඔවුන් බැණ ගත් පරිදි සටහන් කරගත්තේය. ඒ දෙදෙනාත් නිමියන් කරා ගොස් ඒ බැව් කියා විනිශ්චයට පැමිණියාහු සාක්ෂි විචාළ කල තොට නැවතී සිටිනා භික්ෂූන්වහන්සේ මේ බව දුටුසේකැයි කීහ. රජතෙමේ ඔහු ගෙණෙවයි පුරුෂයෙකු යැවිය. ඔහු ගොස් "රජ අණැ"යි දැන්වූ කල ලියාගත් පත රජුවෙත පැමිණවිය. රජ ඒ බලා අධිකරණය සුදුසුලෙස විනිශ්චය කොට තෙරුන් කෙරෙහි පහන් විය. (බුඩඝොසුපපත්ති කථා.)

මේ ප්‍රවෘත්තිය සඞ්ඝපරිණායකයෙහි සහ ශාසනවංශයේත් සඳහන් වේ. නමුත් චූලවංසයෙහි සඳහන්වී නැත. සඞ්ඝපරිණායකයෙහි අරළු ගෙඩිය සහ පන්හිඳ දඹදිවින් පිටත්වීමේදී බුදුගොස් තෙරුන්ටම සක්දෙව් රජුවිසින් දුන්බව ද බුඩදත්ත තෙරුන් හමුවූ බව දැසඳහන් වේ. දවිජඤානය එහි සඳහන්වී නැත. මේ බුඩඝොසුපපත්තිකථා ප්‍රවෘත්තියෙන් බුඩදත්තාචාර්යතෙමේ බුඩඝොෂාචාර්යයන්ට සමකාලිකයෙකැයි සිතිය හැක. සමහරු මේ දෙදෙන සමවස් හෝ අතිරෙකවස් ඇත්තෝයයි කියති. "මම දැන් මහලු වෙමි"යි බුඩදත්ත තෙරුන් කී හෙයින් බුදුගොස් තෙරහු තරුණවියෙහි සිටිබව හැඟෙන හෙයින් එය පිළිගත නොහැකි වෙයි. ගඞ්ගවංසයෙහි බුඩදත්ත තෙරුන් බුඩඝොෂ තෙරුන්ට පසුව ලක්දිවට ආ බව කියා තිබේ. පළමු ප්‍රවෘත්තියේ හැටියට එය සිදුවියහැකි නොවේ. බුඩදත්ත තෙරුන්වහන්සේ අනුරාධපුර මහවෙහෙර කලක් වාසය කළාවූ සොළීරට **කාවේරී** ජනපදයේ උපන් කෙනෙකි. **භූතමඞ්ගල** නම් ගමෙහි කරවූ ආරාමයෙහි වාසය කරමින් **අභිධම්මාවතාර, විනයවිනිශ්චය** ආදී ග්‍රන්ථ රචනා කළ බවත් උන්වහන්සේ විසින් ම දක්වා තිබේ. ශාසනවංශයෙහි බුඩවර්ෂ 930 දී බුඩදත්ත තෙරුන්වහන්සේ සවණ්ණභූමියේ සිට ලඞ්කාවට පැමිණි බවත් ලක්දිව නැවතී සිටි කාලයෙහි **ජිනාලඞ්කාරය** සහ එහි ටීකාව ද කළ බවත් කියා තිබේ. මෙය නොඅදහිය හැකි වෘත්තාන්තයකි, මක්නිසාදයත්:

ජීනාලඞ්කාරය සහ එහි වණ්ණනාවත් 17 වෙනි ශතවර්ෂයේදී රෝහණ ජන පදයේදී බුඩරක්ඛිත සථවිරයන් විසින් කරණලද බව ඒ පොතේ අව සානයෙහි පෙණෙන හෙයිනි. සාසනදීපනියෙහිත් ඒ බව දක්වා තිබේ. බුඩඝොෂාචාර්‍යයන් දඹදිව සිට ලක්දිවට එනු පිණිස පිටත්ව එද්දී බුඩදත්ත තෙරුන් අතරමග කලිඟුරටේදී හෝ වෙනයම් කිසිතැනක ආරාමයකදී සම්මුඛවූබව සිතියහැකැයි බිෂොප් බිහෑන්ඩව් ඉඞග්ලිෂි මහතාගේ අදහසයි. කෙසේ නමුත් බුඩදත්ත තෙරුන්වහන්සේ උපතිස් රජුගේ අවසානකාලයෙහි හෝ මහානාමරජුගේ මුල්කාලයෙහි ලක්දිවට පැමිණීබවත් අටුවා කිරීමට පෙර බුඩඝොෂ සථවිරයන් වහන්සේ හමුවී සාකච්ඡා කළ බවත් පිළිගැණීමට බොහෝ කරුණු ඇත්තාහ.

අනුරාධපුරයට පැමිණීම.

මෙසේ පැමිණි බුඩඝොෂාචාර්‍යතෙමේ සැපසේ ලඞ්කාවට පැමිණ අනුරාධපුරයට වැද මහවෙහෙර **පධානඝරයට** ගොස් **සංඝපාල** නම් මහතෙරුන් වහන්සේ දුටුයේය. මෙකල ලක්දිව මහවෙහෙර, භයිරි වෙහෙර, ජෙතවන වෙහෙරය'යි තුන් නිකායික භික්ෂූන් වාසය කරණ වෙහෙර තුනක් වූහ.

බුඩවර්ෂ 454 දී වළගම්බා රජුදවස මහවෙහෙරවැසි භික්ෂූන්ගෙන් කොටසක් වෛතුල්‍යවාදයන් පිළිගෙණ ධම්මරුචි නිකායට එකතු විමෙන් භයිරි වෙහෙර ව්‍යාපත වී භයිරිනිකාය නමින් ප්‍රසිඬ විය. 795 දී තවත් කොටසක් සාගල නමින් භින්නව මහසෙන්රජු කළ ජෙතවන වෙහෙර ව්‍යාපත වී දෙනාන්නකාය නමින් ප්‍රසිඬ විය.

මෙයින් සාගලිකයෝ අමුතුවෙන් ආගමව්‍යාඛ්‍යාන ද කළහ. තුන් නිකායේ සඞ්ඝකර්මාදිය හා ලබ්ධි භෙදයෝ ද ධර්මාවිභාගයෝ ද එකි නෙකට වෙනස් වූහ. "කායනුත්ත, කායනොත්ත, කායඤ්ඤත්ත" යනාදීන් ඇතැම් පාඨ පිළිබඳ භෙදත් බොහෝ වූහ. බුඩඝොෂාචාර්‍යයන් පැමිණි කාලයේ මිහිඳුමහරහතුන්වහන්සේ විසින් සිංහලභාෂාවට නැඟූ අර්ථකථාසහිත ත්‍රිපිටකය මතාන්තරසම්මිශ්‍රණයෙන් තොරව මහවෙහෙර වැසි ථෙරිය නිකායිකයන් කෙරෙහිම පැවැත්තේය. එහෙයින් අර්ථකථා පරිවර්තනය සඳහා පැමිණි උන්වහන්සේ සියලු සත්පුරුෂයන්ගේ නිවාසයවූ මහවෙහෙරටම පැමිණ (එකල සඞ්ඝරාජ පදප්‍රාප්ත) සඞ්ඝපාල නම් තෙරුන්වහන්සේ දුටුබව සැලකිය යුතුයි.

උන්වහන්සේ සඞ්ඝපාල තෙරුන්ගෙන් සිංහලභාෂාව ද අටුවා ද ථෙරවාද ද සම්ප්‍රකාරයෙන් අසා ඉගෙණ ගත්සේක. එකල ලක්දිව මහාඨ්ඨකථා, මහාපච්චරිය, කුරුන්දිඅට්ඨකථායයි අටුවා තුණෙක් විය. ප්‍රථම සඞ්ගායනාවෙහි මහාකාශ්‍යපාදි මහාක්ෂීණාශ්‍රවයන් විසින් සඞ්ගීතවූ මිහිඳු මහතෙරුන් විසින් සිංහලභාෂාවට නගන ලද්දාවූ අටුවාව මහ අටුවා නම් විය. ලක්දිවදී පසුරකව රැස්වී එහිදී කරණලද නෙසින්

දෙවෙනි අටුවාව පරිචරි නම් විය. ලක්දිව කුරුන්ද වෙළුනම් විහාර සේදි කළහෙයින් තුන්වෙනි අටුවාව කුරුන්දි නම් විය.(කුරුන්දි නම් වඳු රුස්සගල් පර්වතයකැයි ඇතැම් අයගේ මතයයි) බුද්ධඝොෂාචාර්‍යයන් වහන්සේ මේ අටුවා සඞ්ඝපාල තෙරුන්වහන්සේගෙන් ඉගෙණගත්බව මහාවංශයෙහි පෙණෙයි. නමුත් සමන්තපාසාදිකාවසානයෙහි පෙණෙන

"මහාඅට්ඨකථං ඤත්වා-මහාපච්චරි මෙව ච
කුරුන්දිඤ්චාති තිසෙසාපි-සීහලට්ඨ කථා ඉමා.
බුද්ධමිත්තෙනාති නාමෙන-විස්සුතස්ස යසස්සිනො
විනයඤ්ඤුස්ස ධිරස්ස සුත්වා ථෙරස්ස සන්තිකෙ."

යන ගාථාවලින් බුද්ධමිත්ත නම් තෙරුන්ගෙන් අර්‍ථකථා ඉගෙණගත්බව ප්‍රකාශ වේ. මේ දෙක එකිනෙක නොගැළපේ. මෙහි "බුද්ධමිත්තය" යනු සඞ්ඝපාල තෙරුන්ගේම අපරනාමයකැයි සිතිය හැක. නොඑසේ වී නම් බුදුගොස්තෙර මේ දෙදෙනාවහන්සේගෙන්ම කලින්කල අටුවා කථා ඉගණගත්තා විය හැක.

අටුවා ද ථෙරවාද ද ඉගෙණගත් බුද්ධඝොෂාචාර්‍යතෙමේ මෙයම ධර්‍මසවාමිවූ බුදුරජානන් වහන්සේගේ අදහසයයි නිශ්චය කොටගෙණ ඒ මහවෙහෙර සංඝයා රැස්කරවා අර්‍ථකථා පරිවර්‍තනයට මට සියලු පොත් දුන මැනවයි කීය. සංඝතෙමේ උන්වහන්සේ විමසනු පිණිස "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤ" යනාදි සංයුත්තනිකායෙහි ආ ගාථාව දී තොපගේ සමර්‍ථතා මෙසි දක්වා පොතක් කරව, එවිට අපි පොත් දෙන්නෙමු යයි කීය. සප්වීර තෙමේ මැනවැයි හිවිස අටුවා සහිත තුන්පිටකය සංක්‍ෂෙපයෙන් එහිම සඞ්ග්‍රහ කොට විශුද්ධිමාර්‍ග නම් පොත ලියූයේය. "පොත ලියා ධර්‍මධර සංඝයා රැස් කරවා කියවන්නට සිතා තැන්පත් කොට තුබූ කල්හි දෙවතාවෝ උන්වහන්සේගේ නිපුණබව මහාජනයා වෙත පතළ කිරීම පිණිස එය අතුරුදන් කළහ. තෙරුන් වහන්සේ දෙතුන්වරක් එය ලියූහ. තුන්වෙනිවර පොත කියවන්නට ගෙණාකල අනික් පොත් දෙකත් දේවතාවෝ එහි තුබූහ. භික්‍ෂූහු පොත් තුණම එක්කොට බලා කිසි වෙනසක් නොදැක තුටුපහටුවූවාහු නිසැකින්ම මුන්වහන්සේ මෙතේ බෝසත්හු යයි ඝොෂණය කොට අටුවා හා පිටකත්‍රයෙහි පොත් දුන්නාහුය"යි ද, බුද්ධඝොසුප්පත්ති කථායෙහි රාත්‍රි තුණෙක පොත්තුණ ලියූ බව ද කියා තිබේ. මේ ප්‍රවෘත්ති දෙකා ප්‍රතිඤ්ඤා රහිතබව පෙණෙයි. යට සඳහන්වූ ප්‍රවෘත්තිවලින් මගධදෙශිකයන්ගේ හා බුරුමරට වැස්සන්ගේත් බලවත් ඕනෑකම පිට අටුවා ලිවීමට බුදු ගොස් තෙරුන් ලක්දිවට පැමිණිබව සිතිය හැක. එබැවින් උන්වහන්සේ ලක්දිව, ඉන්දියාව, බුරුමය යන තුන් රටට දීම සඳහා විශුද්ධිමාර්‍ගයේ කොපි තුණක් ලියුබව කරුණු සහිත නොවන්නේ නොවේ.

ලක්දිව වාසය හා ග්‍රන්ථකරණය.

දඹදිවින් අර්‍ථකථාචාර්‍ය්‍ය කෙනෙක් මහවෙහෙරට පැමිණිය හැයි ඇසූ මහානාම රජතෙමේ අතිශයින් සන්තොෂ වී මහවෙහෙරට

පැමිණ බුදුගොස් තෙරුන් දැක වැඳ සාකච්ඡා කොට ලක්දිව වාසය ඇති තාක් මාගේ සිවුපසය ඉවසා වදාළ මැනැවැයි පැවරුවේය. මහ වෙහෙර යාබද මහාපධානඝරයෙහි දූරසඞ්කර විහාරයෙහි **ග්‍රන්ථාකර** පිරිවෙණ මහානාම රජු විසින් පවරණු ලැබූ මුන්වහන්සේගේ වාසස්ථා නය විය. මේ මහානාම රජුගේ නාමය බුඞ්ඝොෂාචාර්‍යයන් විසින් කරණලද කිසිම ග්‍රන්ථයක දක්නට නොලැබේ. නමුත් සියලු ඉතිහාස පොත්වල බුදුගොස්තෙරුන් මහානාම රජු දවස විසූබව දක්නා ලැබේ.

සමන්තපාසාදිකා නිගමනයෙහි මහවෙහෙර දකුණුපස පධානඝර යෙහි **මහානිගමසාමි** යයි ප්‍රසිඩවූ අමාත්‍යයා විසින් කරණලද ප්‍රාසාද යෙහි වාසය කරමින් **සිරිනිවාස** රජුගේ 20 වන වර්ෂයෙහි ආරම්භ කොට 21 වන වර්ෂයෙහි එය අවසාන කෙළේයයි ආචාර්‍යයන් විසින් ම දක්වා තිබේ. එසේම **සිරිකුඩ්ඩ** රජුගේ ප්‍රාසාදයෙහි වෙසෙමින් **ඛුද්දසික්ඛා කථාව** කෙළේයයි එහි නිගමනයෙන් පෙණේ. පූජාවලියෙහිද **ශ්‍රී නිවාස** නම් රජු හා **මහානිගමසාමි** නම් අමාත්‍යයාගේ අරාධනාවෙන් අර්ථකථා ලියූ බව සඳහන් වේ. **සුලුපූජාවලියෙහි** ද **සඞ්ඝරතනාකරයෙහි** ද මහා නාම රජු දවස බුඞ්ඝොෂාචාර්‍ය තෙමේ දඹදිව සිට ලක්දිවට වැඩ බුදුන් වදාළ 275250 ක් පමණ ග්‍රන්ථ ඇති ආගමට 361750 ක් පමණ ග්‍රන්ථ ඇති අටුවා ලියුවේයයි සඳහන් වේ. නමුත් ලක්දිව ශ්‍රීනිවාස-සිරි කුඩ්ඩ නමින් අනික් රජෙකු සිටිබව නොපැණේ. එහෙයින් මෙය මහානාම රජුගේ අපර නාමයකැයි සැලකිය යුතුයි.

මෙහි මහවෙහෙර දකුණුපස පධානඝරයෙහි මහානිගමසාමි විසින් කරවූ පහසක් ද තුබුන බැව් හැඟේ. භාවනානුයෝගී භික්ෂූන් වාසය කරණ පහස හෝ සංඝරාජතෙරුන් වාසය කරණ පහස පධා නඝරය විය හැක. මහවෙහෙර දකුණුපස දූරසඞ්කර නම් ආරාමය පිහිටි වේයයි සිතියයුතු. ග්‍රන්ථාකර පිරිවෙණ එහි පුස්තකාලය විය යුතුයි. බුඞ් ඝොෂාචාර්‍යයන් වහන්සේ පධානඝරයෙහි සිරිකුඩ්ඩ රජුගේ පහ යෙහිත් මහානිගමසාමිගේ පහයෙහිත් කලින්කල පහසුපරිදෙන් විසූබව මෙයින් නිශ්චය වේ.

(බුඞ්ඝොසුපපත්ති කථායෙහි-බුදුගොස් තෙරහු ලෝවාමහපායේ සහත මාලයේ විසූබවත් එහිසිට පිඬුසිහා (පුස්කොළ සිහා) වැඩිබවත් තුන්මාසයකින් තමන්ගේ කටයුතු සියල්ල නිම කළබවත් කියා තිබේ. එය ඇදහිය නොහැකි වාර්‍තාවකි. ඇතැම්විට විශුද්ධිමාර්ගය කරණ කාල යෙහි එහි විසූ බවත් එය තුන්මාසයකින් නිම කරන්ට ඇතිබවත් අනු මාන වශයෙන් සිතියයුතුයි.)

මෙසේ දූරසඞ්කර විහාරයෙහි වාසයට පැමිණි බුදුගොස් තෙර ණුවෝ අර්ථකථා පරිවර්තනය ආරම්භ කළෝය. පළමු කොට බුඞ්ඝොෂා චාර්‍ය තෙමේ මහාපච්චරි කුරුන්දි ආදියෙහි යුක්තාර්ථ ද ගෙණ ඒ අටුවා වන්හි කී ස්ථවිර වාද ද ගෙණ **සමන්තපාසාදිකා** නමින් විනය අටුවාව මාගධනිරුක්තියට පරිවර්තනය කළසේක. විනය පිටකයෙහි සියලු

අර්ථකථා එහි අන්තර්ගතය. ඉක්බිති **සුමඞ්ගලවිලාසිනී** නම් දීඝ අට්ඨකථාව ද **පපඤ්චසූදනී** නම් මැදුම්සඟි අට්ඨකථාව ද **සාරත්ථප්පකාසිනී** නම් සංයුත් අට්ඨකථාව ද **මනෝරථපූරණී** නම් අඞ්ගුත්තර අට්ඨකථාව ද යන සතර මාගධිභාෂාවට පෙරළන ලදහ. ඉක්බිති හෙතෙමේ බුද්දකනිකායට අයත් **ධම්මපද, ජාතක, සුත්තනිපාත, අපදාන** යන අර්ථකථා සතර ද අභිධම් පිටකයෙහි ධම්මසඞ්ගණී ප්‍රකරණයට **අත්ථසාලිනී** නම් අට්ඨකථාව ද විභඞ්ගප්‍රකරණයට **සම්මොහවිනෝදනී** නම් අට්ඨකථාව ද සෙසු පඤ්ච ප්‍රකරණයට **පරමත්ථදීපනී** නම් පඤ්චප්‍රකරණ අට්ඨකථාවද, ඉක්බිති උභය මාතිකාවට **කඞ්ඛාවිතරණී** නම් අට්ඨකථාව ද කෙළේය.

සඞ්ගීතිත්‍රයෙහි **කුරුන්දඅට්ඨකථාව** පාලියට නගා සමන්තපාසාදිකා නම් විනයපිටකයේ අර්ථ කථාව ද **මහාඅට්ඨකථාව** පෙරළා සූත්‍රපිටකයේ අර්ථ කථාව ද **මහාපච්චරිය** පෙරළා අභිධම්පිටකයේ අර්ථකථාද කළබැව් කියා තිබේ. මෙයින් පෙණෙන්නේ මේ අට්ඨකතුණ පිළිවෙළින් තුන් පිටකයට වෙන වෙනම ලියා තුබූ අට්ඨකථා බවයි. නමුත් එය සමන්ත පාසාදිකා ආරම්භයේ පෙණෙන "තස්සා මහාඅට්ඨකථං සරීරං කත්වා" යන වචන හා නොගැළපේ. විශුද්ධිමාගීයට අනතුරුව පළමුවෙන් කළ අට්ඨකථාව සමන්තපාසාදිකාවයයි බොහෝ දෙනාගේ පිළිගැණීමයි. බුදු ගොස් තෙරුන් පළමු පළමු කළ අර්ථකථාවල නාමය පසු පසු කළ අර්ථකථාවල සඳහන් වේ. මුද්‍රිත සමන්තපාසාදිකාවේ 94 පිටේ "සරණ ගමනභෙදවිධිය මෙහි කීමෙන් විනය නිදානය මහත්වන හෙයින් නො කීම්. අර්ථින් විසින් පපඤ්චසූදනියෙහි භයභෙරව සූත්‍ර වණ්ණනා වෙන් ද සුමඞ්ගලවිලාසිනියෙහි ශරණ වණ්ණනාවෙන් ද ගතයුතුයයි සඳහන් වීමෙන් සමන්තපාසාදිකාව පළමුවෙන් කෙළේය යනු සැක සහිත සේ වැටහෙයි. ඇතැම්විට සරණගමනවිධි මතු එහි විස්තර කරණු කැමැත්තෙන් මෙසේ කීයේයයි ද සිතියහැක. සුමඞ්ගලවිලාසිනි–පපඤ්චසූදනී දෙක්හිම සමන්තපාසාදිකාව සඳහන්ව තිබෙන හෙයින් එය පළමු කළ අට්ඨකථාව බව නිශ්චය කළ හැකියි. විනයම ශාසනයාගේ ආදිය හෙයින් පළමුවෙන්ම සමන්තපාසාදිකා වණ්ණනාව කරණ ලද බව උන්වහන්සේගේ ප්‍රාරම්භගාථාවලින් විවාදරහිතව පිළිගත යුතු වේ. චතුරාගම වණ්ණනා අතුරෙන් මනෝරථපූරණිය, පසුව කළ බව ඒ නාමයෙන්ම පෙණේ. චතුරාගම වණ්ණනා කිරීම් සඞ්ඛ්‍යාත මනෝරථය අඞ්ගුත්තරවණ්ණනාවෙන් යම්සේ පිරුණේ ද එහෙයින් ඊට 'මනෝරථපූරණී' යන නම් කළබව එහි නිගමනයෙන් පෙණේ. චතුරාගමය නම් දීඝසඟි, මැදුම්සඟි, සංයුත්සඟි, අඞ්ගුත්තරසඟි යන සතර මහසඟියයි.

මෙතැන්හි බුද්ධඝෝෂාචාර්‍යයන්ගේ නිබන්ධ හා පරිවර්තනාග්‍රන්ථ මාලාව ලඝුවිස්තරයකින් දක්වනුලැබේ. "බුද්ධඝෝෂාචාර්‍යයන් වහන්සේ දඹදිවදී ඤාණෝදය නම් ප්‍රකරණය කොට අර්ථසාලිනියද කළහ" යනු මහාවංසයේ සඳහන් වේ. මේ ප්‍රවෘත්තිය ශාසනවංශයේ ද සඳහන් වේ. නමුත් බුද්ධඝෝසුප්පත්ති කථාව මේ කාරණ නිශ්ශබ්ද වෙයි.

(1) සූත්‍රාණුදය නම්.-ප්‍රකෘතිවාද මර්දනය කෙරෙමින් බුහමලබ්ධියට විරුඬව ලියනලද ග්‍රන්ථයකි. මෙය නාමශෙෂභාවයට පැමිණ තිබේ යයි සිතිය යුතුයි.

(2) පළමුවන **අර්‍ථශාලිනිය** ධම්මසඬගණි ප්‍රකරණ පාලියේ අර්‍ථ වණ්‍ණනාවයි. (දෙවෙනි **අර්‍ථශාලිනිය** ලඬකාවේදී කරණලදී. මෙහි පළමුවන පොත දෙවෙනි පොත ලිවාට පසු ප්‍රතිසංස්කරණය කරන්නට ඇතැයි කියා හෝ නැත්නම් පළමු පොතම සිංහලපොතට සම කොට බලා ශුඬ කරන්නට ඇතැයි කියා හෝ සිතියහැක.)

(3) **පරිනානඬකථා** නම්: පිරිත් පොතට කළ අටුවාවයි. ඒ ගැණ ඉතිහාසය කිසිවකුත් නොකියයි. (මේ දඹදිවදී කරණලද ග්‍රන්ථයි.)

(4) **විශුඬිමාර්‍ගය** නම්: චතුරාගමයේම අර්‍ථ ප්‍රකාශ කරණ සීල-සමාධි-ප්‍රඥාමුඛයෙන් මුළු බුඬාගම සඬ්‍ග්‍රහ කොට සඬඝපාල තෙරුන්ගේ ආරාධනාවෙන් කරණලද බෞඬධර්‍මසාගරයයි. මෙය බුදුගොස් තෙරණුවන් සවකීය ප්‍රඥාමහිමය දක්වමින් ලක්දිවදී කළ ප්‍රථම අර්‍ථසංවණ්‍ණාවයි. මෙය පොවිසි පරිවෙජදය කින් හා බණවර පණස් අට කින් යුක්ත වේ.සියලු අර්‍ථකථාවන්හිම වාගේ මේ නාමය ගෞරවයෙන් සඳහන් වී තිබේ.

(5) **සමන්තපාසාදිකා**: මෙය ත්‍රිපිටක අර්‍ථකථා අතුරෙන් පළමු වෙනි අර්‍ථකථාවයි. මෙය බුඬඝෝෂ නම් තෙරුන්ගේ ආරාධනයෙන් කරණලද විනයපිටකයේ අර්‍ථවණ්‍ණනාවයි හෙවත්-පරිජි, පවිති, පරිවාර, මහවග, සුළුවග යන පොත් පහේ අටුවායි. මෙය **මහානිගම සාමිගේ** ප්‍රාසාදයෙහි වසමින් සිරිනිවාස අපරනාමධෙය මහානාම රජුගේ විසිවෙනි වර්‍ෂයේ ආරම්භ කොට 21 වෙනි වර්‍ෂයේ නිමවන ලදැයි එහි නිගමනයෙන් පෙණෙන බව යට කියනලදී. ක්‍රි ව. 489 දී **ඝඝඝහළ** නම් තෙරකෙනෙකු විසින් මෙය චීන භාෂාවට පරිවර්‍තනය කරණලදී.

(6) **කඬ්ඛාවිතරණී**: මෙය **සොණ** නම් තෙරුන්ගේ ආරාධනා වෙන් විනයෙහි සැක උපදනා තැන්හි සැක දුරුකරමින් භික්‍ෂු භික්‍ෂුණී ප්‍රාතිමොක්‍ෂය වණ්‍ණනා කරමින් කරණලද්දකි.

(7) **සුමඬගලවිලාසිනී**: මෙය **ඝඝඝතෙරදඬ** නම් තෙරුන්ගේ ආරාධනාවෙන් කරණලද දීඝනිකායයෙහි අර්‍ථකථාවයි. මෙය පුරාණ නගර හා එහි වැසියන් ගැණ ද, රජවරුන් හා සිටුවරුන් ගැණ ද, ගඬහා හා කඳු ආදිය ගැණ ද විස්තර දක්වා පෘථිවිශාස්ත්‍රය සම්බඬ බුදුගොස් තෙරුන්ගේ විශෙෂඥ බව ද ප්‍රකට කරමින් කරණ ලද්දකි.

(8) **පපඤ්චසූදනී**: මෙය බුඬමිත්‍ර නම් තෙරුන්ගේ ආරාධනා වෙන් කරණලද මැදුම්සඟයේ අර්‍ථකථාවයි. මධ්‍යමප්‍රමාණ සූත්‍ර යන්ට මධ්‍යමප්‍රමාණයෙන්ම ලක්‍ෂවිස්තර හා අනුත්තානපදයන්හි දීඝවිස්තර ද දක්වමින් කළ අර්‍ථවණ්‍ණනාවකි.

(9) **සාරත්ථදීපනී**: මෙය **ඇරියවංස** නම් තෙරුන්ගේ ආරාධනාවෙන් කරණලද සංයුත් සඟියේ අට්ඨවණ්ණනාවයි.

(10) **මනෝරථපූරණී**: මෙය **භදන්තඤාණිකාල** තෙරුන්ගේ ආරාධනාවෙන් කරණලද අඞ්ගුත්තර අට්ඨවණ්ණනාවයි. මේ ඤාණිකාල තෙරුන්වහන්සේ කාඤ්චිපුරාදියේ පවත් බුදුගොස් තෙරුන් සමඟ වාසය ඇති සහාය කෙනෙකි. ලක්දිව මහවෙහෙරෙහිද එක්ව විසූ බව කියා තිබේ. ඇතැම්විට ඤාණිකාල තෙරුන් බුදුගොස්තෙරුන් සමඟ හෝ උන්වහන්සේගේ පැමිණීමට අනතුරුව හෝ ලක්දිවට පැමිණෙන්ට ඇතැයි සිතිය හැක.

(11) **ජාතකඅට්ඨකථා**: මෙය කුදුගත් සඟියට අයත් ජාතක ගාථා වණ්ණනා කරමින් අත්ථදස්සි-බුද්ධමිත්ත-බුද්ධදේව යන තෙරුන්ගේ ආරාධනාවෙන් කරණ ලද්දකි.

(12) **ධම්මපදඅට්ඨකථා**: මෙය **කුමාරකස්සප** නම් තෙරකෙනෙකුගේ ආරාධනාවෙන් සිරිකුඩ්ඩ රජුගේ පහයෙහිදී කරණලද කුදුගත් සඟියේ ධම්මපදගාථා වණ්ණනාවයි. සඞ්ඝමිත්තගුහයෙහි බුදුගොස් තෙරුන්ට පසු කාලයෙහිවූ ග්‍රන්ථකතෘවරුන්ගේ නාමලේඛනයෙහි ධම්මපදට්ඨකථාව බුදුගොස් නම් තෙරුන් විසින් කළ බවක් සඳහන් වේ. බුදුගොස් නමින් ග්‍රන්ථකතෘන් කිපදෙනෙකු සිටි බව මෙයින් සිතිය හැක

(13) **පරමත්ථජෝතිකා**: මෙය කුදුගත් සඟියේ සුත්තනිපාත වණ්ණනාවයි.

(14) **විසුද්ධජනවිලාසිනී**: මෙය කුදුගත් සඟියේ අපදානාඞ්ග වණ්ණනාවයි.

(15) **අත්ථසාලිනී**: මෙය බුද්ධඝෝෂ නම් තෙරුන්ගේ ආරාධනාවෙන් කරණලද අභිධම්මයේ ධම්මසඞ්ගණී ප්‍රකරණයේ අට්ඨවණ්ණනාවයි. මේ කාලයේද බුද්ධඝෝෂ නමින් කිපනමක් සිටිබව මෙයින් පෙණේ. මේ පොත සම්මෝහවිනෝදනියට අනතුරුව කළබව ඒ පොතෙහිම දක්නා ලැබේ. එය විමසිය යුත්තකි.

(16) **සම්මොහවිනෝදනී**: මෙය අභිධම්මපිටකයේ විභඞ්ගප්‍රකරණයේ අට්ඨකථාවයි.

(17) **පරමත්ථදීපනී**: මෙය **චුල්ලබුද්ධඝෝෂ** නම් තෙරුන්ගේ ආරාධනාවෙන් කරණලද අභිධම්මපිටකයේ ධාතුකථා, පුග්ගලපඤ්ඤත්තිකථා, කථාවත්ථු, යමක, පට්ඨාන යන පඤ්චප්‍රකරණයේ අට්ඨකථාවයි.

සාසනවංසයෙහි බුද්ධඝෝෂාචාර්‍යයන් විසින් **පිටකත්තය ලක්ඛණ හත්ථය, පඤ්චබුද්ධාමණ්ඩ** යන ග්‍රන්ථ දෙකක්ද කළබව කියා තිබේ. පිටකත්තයලක්ඛණ ගත්ථය හැණ කිසිවක් දැනගන්ට නැතිව නාම ශෙෂභාවයට පැමිණ තිබේ. **පඤ්චබුද්ධාමණ්ඩ** නම්: සංසකෘත භාෂාවෙන් බුඩවරිතය ප්‍රකාශ කොට කරණ ලද්දකි. එය දැනට **කුසුඤ්ඤාමි** ශාසත්‍රී විසින් ශුඩකරණ ලදුව මදුරාශියේ ආණ්ඩුව මගින් මුද්‍රණයට පමුණුවා තිබෙන බව විමලවංශ්‍රන් ලෝ මහතාගේ පොතේ දක්වා තිබේ.

බුඩඝෝෂාචාර්යයන්ගේ අවසානය.

මෙසේ මේ බුඩඝාසනය පවත්නා තෙක් නොනැසී පවත්නා කීර්තිකදම්බයකින් යුකතවූ බෞඩග්‍රන්ථාදශීයෙහි සඛකීය නාමය ප්‍රතිබිම්බිත කළාවූ අනුබුඩ බුඩඝෝෂාචාර්‍ය තෙමේ සියළු කටයුතු නිෂ්ඨාවට පමුණුවා ගෙණ සියරට බලා පිටත්ව ගියේය. මුන්වහන්සේ ලක්දිව කොපමණ කල් විසුවෝදැයි නිශ්චය කළයුතු වැදගත් සාක්ෂ්‍යයක් දක්නට නොලැබුනේය. සමන්තපාසාදිකාවේ අවුරුද්දකින් අර්ථකථා පරිඝමාපතියට පැමිණවූ බැව් එහි නිගමනයේ කියා තිබේ. ඒ සියළුම අර්ථකථාවන්ගේ නිමාවීමක් සඳහා කියන ලද්දකැයි සිතිය නොහැකිහි. සඛ්‍යීඝඛ්‍රහයෙහි බුඩඝෝෂාචාර්‍යයන් වහන්සේ අවුරුද්දකින් සියළු කටයුතු නිමවා සියරට වැඩිය බැවි සඳහන් වේ. බුඩඝෝසුපපත්ති කථාවේ තුන්මාසයකින් කටයුතු අවසන් කොට සියරට වැඩියේයයි කියා තිබේ. බුරුම ඉතිහාසයේ උන්වහන්සේ එවන් නගරයෙන් ලක්දිවට පැමිණ තුන් අවුරුද්දක් ලඩකාවේ සිට පෙළ අටුවා පොත් ලියාගෙණ නැවත එහි වැඩිඝෝයයි කියා තිබේ. මේ කියන කාලය නම් මඳක් විශ්වාස කළ හැක. නමුත් එය නිශ්චය කරගැණීමට වැදගත් සාක්ෂ්‍යයක් නොපෙණේ. මේ සියලු ප්‍රවෘත්ති වලින් බුඩඝෝෂාචාර්‍යතෙම තුන් අවුරුද්දක් නෝ ඊට වැඩි කාලයක් ලක්දිව වාසය කොට අර්ථකථා පරිවර්තනය කොට දඹදිව වැඩියේයයි සිතිය යුතුහි.

සමහර පණ්ඩිතයෝ මුන්වහන්සේ සිටිබව පවා විශ්වාස නොකෙරෙති. ඒ පිළිබඳව දක්වන කරුණු ද බොහෝහි. ''බුඩඝෝෂාචාර්‍යයන් වහන්සේ ගැණ ඉතිහාසයේ ලියවී තිබෙන්නේ ශතවර්ෂ කිපයක් ඉක්ම ගියාට පසුවය, ජනශ්‍රැතිසම්ප්‍රදාය වශයෙන් ඒ ඒ ජාතිකයන් කෙරෙහි පැවති වෘත්තාන්තයෝ ඒ ඒ ඉතිහාසයන්හි ඇතුළත් කර තිබෙත්, සිංහල ඉතිහාසය ලියූ. ධර්මකීර්තිපාදයෝත් එකල ජනයා කෙරෙහි පැවති පරම්පරා කථා එක් කොට ගෙණ සිංහල ඉතිහාසය උසස් කිරීම සඳහා බුඩඝෝෂ චරිතය එහි ඇතුළත් කළහ, එහෙයින් එය විශ්වාස නොකළ හැකැ''යි ද කියති ධර්මකීර්තිමහාසාමීහු සිංහල රටේ කෙනෙකු නොවන හෙයින් එසේ සත්‍යයනුවූ ප්‍රවෘත්තියක් ලිවීමෙන් (අපේ) සිංහල ඉතිහාසය උසස් කර දීමට උන්වහන්සේට කිසි යුතුකමක් නැත. එහෙයින් මේ කිම බුඩඝෝෂාචාර්‍යයන් නොසිටිබව ඔප්පුකිරීමට සාධනයක් නොවේ. ඉතිහාසයක කරුණු සිදුවී ශතවර්ෂ කිපයකට පසුව ග්‍රන්ථාරූඪවීම සඛභාවයකි. බුඩඝෝෂ චරිතය ද ශතවර්ෂ කිපයකට පසු ඉතිහාසයට ඇතුළත්කර තිබෙනබව සත්‍යයකි නමුත් උන්වහන්සේ ගැණ අවිශ්වාස කිරීමට එයම ප්‍රමාණ නොවේ. ශතවර්ෂ කිපයකට පසු ඉතිහාසයේ ලියැ තිබෙන්නාවූ බුඩඝෝෂචරිතය සමඟ පවත්නාවූ සෙසු කරුණු විශ්වාස කළ හැකි නම් බුඩඝෝෂාචාර්‍යයන් ගැණ අවිශ්වාස කිරීමට ඇති හේතු කිම ?

බුඩසොඡවරිතය අවිශ්වාස කිරීම සඳහා කියන අනිකුදු දෙවෙනි කාරණයක් නම්:-මේ එකම බුඩසොඡකෙනෙකුට ආසියාවේ බොහෝ රටවල ජනයා සඛකිය අසිතිවාසිකම් කියා තිබීම හා එකිනෙකට විරුඩ වෘත්තාන්ත ඒ ඒ ඉතිහාසවල සඳහන් වීමත්ය.

මෙද අවිශ්වාසයට තරම් වූ කරුණක් නොවේ. සියලු රටවල සියලු ජාතිකයන්ටම මහත් අභිමානයක් නරදීමෙන් සියලු දෙනාගේ සිත් දිනා ගත්තාවූ උන්වහන්සේට ඒ ඒ ජාතිකයන් විසින් තම තමන්ගේ කෙතෙකු මෙන් සලකා ප්‍රේම කළ බවත් උන්වහන්සේ පිළිබඳවූ කීර්තිය හා ගෞරවයත් සඛකිය රටට ජාතියට අභිතිකර නැණීම පිණිස ඒ ඒ රටවැසියන් විසින් "බුඩසොඡාවැයත්‍රියන් වහන්සේ අපේ රටේ-අපේ ජාතියේ කෙනෙකැ"යි කියා තිබෙන බවත් සත්‍යයකි.

තවත් සමහරු "සිංහල ජාතික තෙරුන්වහන්සේ කෙනෙකු විසින් අර්ථකථා මාගධකිරුකතියට පරිවර්තනය කළ බවද කල් යාමෙන් ඒ අර්ථකථා මාගධී භාෂාවෙන් ලියා තිබෙන්නේ මගධ දෙශයෙන් ආ කෙනෙක්ය, ඒ බුඩසොඡ විය යුතුයයි කියා සිතීමෙන් මේ ප්‍රවෘත්තිය සිංහල ඉතිහාසයට ඇතුළත් වී තිබේය"යි ද කියති.

යම් හෙයකින් සිංහල ජාතිකයෙක් මේ උදාරවූ කර්තව්‍යයෙහි යෙදුනේ නම් කිසි කලෙකත් ඒ කීර්තිය හා ගෞරවය සිංහලජාතියට මිස වෙන ජාතියකට වෙන රටකට අයිතිකරදීමට සිංහල ඉතිහාසය කිසිසේත් කැමතිවේයයි සිතිය නොහැක. එහෙයින් ඒ කීම ප්‍රතිඥා රහිතවූවකි.

යටකී පරිදි ලක්දිවින් පිටත්වූ බුඩසොඡ මහාස්වාමිපාදයෝ දඹදිව ගොස් අවශ්‍යට අර්ථකථා කරණු පිණිස බදරතීර්ථවාසී භදන්ත බුඩඝෝෂාචාර්යයන් ලක්දිව පැමිණෙනු පිණිස මෙහෙයා තමන් වහන්සේ ගෙණගිය ශුඩවූ දහම් පොත් සියළු බෞඩ රටවලට යවමින් බුදුසසුන් වැඩවඩා කම්වූ පරිද්දෙන් අපවත් වී වදාළෝය. මේ ශ්‍රේෂ්ඨ අර්ථකථාචාර්යයන් වහන්සේ කොතැනකදී අපවත් විදැයි ඉතිහාසයෙන් නිශ්චය කළ නොහැක. බුඩඝෝසුප්පත්තිකථාවේ උන්වහන්සේගේ භස්මාවශේෂය තැන්පත් කොට බෝඹැඩ සමීපයෙහි ථූපයක් කළ බව සඳහන් වේ. කාම්බෝජ වාසීහු උන්වහන්සේ ඔවුන්ගේ රටේ බුඩසොඡ නම් මහාවිහාරයේදී අපවත්වී වදාළෝයයි කියති.

මෙසේ මහාමහිඳු මහාක්ෂීණාශ්‍රවයන් වහන්සේ විසින් ලක්දිව පිහිටුවා වදාළ සම්බුඩශාසනය පන්දහසක් පවත්නාලෙස සථිරබවට පමුණුවා ලූ විශුඩබුද්ධිසම්පන්න අනුබුඩ බුඩඝෝෂාභිධාන යති රාජයන්වහන්සේ දඹදිව සිටලු ප්‍රත්‍යයනන්හි ද සිටම් බුරුම කාම්බෝජාදි රටවලද බුඩධර්මය පතුරුවා දෙවියන් සහිත ලොකයාට මහත්වූ අනිවාඩියක් සිඩකොට සංඝකාරධර්මයන්ගේ අනිත්‍ය සභාවයට පැමිණියෝය එහෙයින් නුවණැති ජනතෙමේ සියල්ල අනිත්‍යයයි සිතා කුශලකරණයෙහි අප්‍රමාද වියයුතු

P. V.

සංඥාදීපනිලක්ඛණ.

Abbreviations.

උ. ග්‍ර. බ.—උපග්‍රන්ථය බලනු.

මු. ස. i.—ප්‍රථමමුද්‍රිත සන්නය.

මු. ස. ii.—දවිතීයමුද්‍රිත සන්නය.

ස i.—විද්‍යෝදය පුස්තකාලයෙහි පුස්කොළ සන්න පොත.

ස. ii.—පැල්මඩුල්ලේ පුරාණ මහාවිහාරයේ සන්නපොත.

ස. iii.—හික්කඩුවේ තිරුණාගම සුදර්ශනාරාම මහා විහාරස්ථානයේ සන්නපොත.

වි. ටී.—විසුද්ධිමග්ගටීකාව.

ම. ටී.—විසුද්ධිමග්ගටීකා බුරුම අකුරු පොත.

ශුද්ධිපත්‍රය.

(සන්නය.)

පිට.	පෙළ.	අශුද්ධ.	ශුද්ධ.
4	22	නානනරික (1)අධොලිපි	නානනරියක නානනරික
15	28	තනමූලක	තනමූලක
23	12	සමණෙනසමානා	සමනෙහසමානා
42	24	ප්‍රත්‍යයසනනිශ්‍රිත	ප්‍රත්‍යයසනනිඃශ්‍රිත
51	21	තදශීනකෘත්‍යං	දශීනකෘත්‍යං
,,	32	ග්‍රහණනති	ගහණනති
,,	33	ලක්‍ෂවෙධ	ලක්‍ෂ්‍යවෙධ
54	29	විපාකහෙතුක	විපාකාහෙතුක
60	1	අපපමතනක	අපපමතනකමපි
74	8	අගෘධනුව	අගෘධනුව
80	23	ලඟනාකුවූ	ලඟනවූ
99	21	පිට දම	පිට ඉදම
103	27	ප්‍රහණය	ප්‍රහාණය
104	19	විතකකවිරානං	විතක්කවිචාරානං
106	15	අහිමනාශීහ	අහීනමාශීහ
109	2	අපජජති	ආපජජති
111	29	ප්‍රසංසා	ප්‍රශංසා
115	17	අගගිකඛඞ්ගලිඞ්ගන	අගගිකඛඞ්ගාලිඞ්ගන
,,	21	අභිවාදනසදියනෙ	අභිවාදනසාදියනෙ
,,	23	ආපනවූ	ආදීපනවූ
,,	17	මෙස්	මෙසේ
120	22	ශීලමසෙත්‍යපූපිකාඃ	ශීලමසෙත්‍යාපූපිකාඃ
121	23	ඇතිමව	ඇතිවීමව
156	10	අනතනො	අතතනො

(උපග්‍රන්ථය.)

4	26	(නාායඇඳලිය ලබනු)	(නාායාඤ්ජලිය බලනු)
9	2	කිපෙති	කිපෙයි
27	16	අනාගැමි	අනගැමි
33	9	අබ්‍යපනනා	අබ්‍යාපනන
36	30	කහාපණකුමෙහා	කහාපණකුමෙහා

විසුද්ධිමග්ගෝ.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස.

නිදානාදිකථා.

1. "සීලේ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ, චිත්තං පඤ්ඤඤ්ච භාවයං,
ආතාපී නිපකෝ භික්ඛු සෝ ඉමං විජටයේ ජටන්ති" a

ඉති හිදං වුත්තං. කස්මා පනෙතං වුත්තන්ති භගවන්තං කිර සාවත්ථියං විහරන්තං රත්තිභාගෙ අඤ්ඤතරෝ දෙවපුත්තෝ උපසඞ්කමිත්වා අත්තනෝ සංසයසමුග්ඝාතත්ථං:-

2. "අත්තෝ ජටා බහි ජටා ජටාය ජටිතා පජා,
තං තං ගොතම පුච්ඡාමි කෝ ඉමං විජටයේ ජටං" ති. b

ඉමං පඤ්හං පුච්ඡි.

3. තස්සායං සඞ්ඛෙපත්ථෝ:— **ජටා**ති තණ්හාය ජාලිනියා එතං අධිවචනං, සා හි රූපාදිසු ආරම්මණේසු හෙට්ඨුපරියවසෙන පුනප්පුනං උපපජ්ජනතෝ සංසිබ්බනට්ඨෙන වෙළුගුම්බාදීනං සාඛාජාල සඞ්ඛාතා ජටා විය ති ජටා. සා පනෙසා සකපරිකඛාරපරපරිකඛාරෙසු සකඅත්තභාව පරඅත්තභාවෙසු අජ්ඣත්තිකායතනබාහිරායතනෙසු ච උපපජ්ජනතෝ **අත්තනෝ ජටා බහි ජටා**ති වුච්චති. තාය එවං උපපජ්ජමානාය **ජටාය ජටිතා පජා**-යථානාම වෙළුජටාදීහි වෙළු ආදයෝ, එවං තාය තණ්හාජටාය සබ්බාපි අයං සත්තසඞ්ඛාතා [1] පජා ජටිතා විනද්ධා සංසිබ්බිතාති අත්ථෝ. යස්මා චි එවං ජටිතා-**තං තං ගොතමම්පුච්ඡාමී**ති [2] තස්මා තං පුච්ඡාමි; **ගොතමාති** භගවන්තං ගොත්තෙනෙව ආලපති. **කෝ ඉමං විජටයේ ජටන්ති**, ඉමං එවං තෙධාතුකං ජටෙත්වා ඨිතා ජටං කෝ විජටෙය්‍ය විජටෙතුං කෝ සමත්ථෝති පුච්ඡති. [3]

එවං පුත්ථෝ පනස්ස සබ්බඨමෙමසු අප්පටිහතඤාණචාරෝ දෙව දෙවෝ සකකාතං අතිසක්කෝ බ්‍රහ්මාණං අතිබ්‍රහ්මා චතුවෙසාරජ්ජවිසාරදෝ, දසබලධරෝ අනාවරණඤාණෝ සමන්තචක්ඛු භගවා තමත්ථං විස්සජ්ජෙන්තෝ:—

"සීලේ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ-චිත්තං පඤ්ඤඤ්ච භාවයං,
ආතාපී නිපකෝ භික්ඛු-සෝ ඉමං විජටයේ ජටං"ති.

ඉමං ගාථමාහ.

---

1. ම. සත්ත නිකායෙ සඞ්ඛාතා-ත්‍රි. මූ. සත්තකායෙ සඞ්ඛාතා
2. සී. 1. පුච්ඡාමි. 3. ම. පුච්ඡිති. a-b. අංගුත්තරනිකායෙ දේවතා සං.

4. ඉමිස්සාදුනි ගාථාය කථිතාය **මහෙසිනා,**
වණ්ණයන්තෝ යථාභූතං අත්ථං සීලාදිභෙදනං.

5. සුදුල්ලභං ලභිත්වාන **සබ්බඤ්ඤුං ජිනසාසනෙ,**
සීලාදිසබ්භහං ඛෙමං උජුං මග්ගං **විසුද්ධියා.**

6. යථාභූතං අජානන්තා සුද්ධිකාමාපි යෙ ඉධ,
විසුද්ධිං නාධිගච්ඡන්ති වායමන්තාපි යොගිනෝ.

7. තෙසං පාමොජ්ජකරණං සුවිසුද්ධවිනිච්ඡයං
මහාවිහාරවාසීනං දෙසනානය නිස්සිතං.

8. **විසුද්ධිමග්ගං** භාසිස්සං තං මෙ සක්කච්ච භාසතෝ,
විසුද්ධිකාමා සබ්බෙ'පි නිසාමයථ **සාධවෝ'**ති.

9. තත්ථ **විසුද්ධී**ති සබ්බමලවිරහිතං අච්චන්තපරිසුද්ධං නිබ්බාණං වෙදිතබ්බං. තස්සා විසුද්ධියා මග්ගොති විසුද්ධිමග්ගෝ. **මග්ගෝ'**ති අධිගමූපායෙ වුච්චති. තං විසුද්ධිමග්ගං භාසිස්සාමීති අත්ථෝ.

සෝ පනායං විසුද්ධිමග්ගෝ කත්ථචි විපස්සනාමත්තවසෙනෙව දෙසිතෝ. යථාහ:—

"සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති-යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛෙ-එස මග්ගෝ විසුද්ධියා"ති a

කත්ථචි ඛාණපඤ්ඤවසෙන. යථාහ :—

"යම්හි ඛාණම්හි පඤ්ඤඤ්ච-සමෙ නිබ්බාණසන්තිකෙ"ති. b

කත්ථචි කම්මාදිවසෙන. යථාහ :—

"කම්මං විජ්ජා ච ධම්මෝ ච-සීලං ජීවිතමුත්තමං,
එතෙන මච්චා සුජ්ඣන්ති-න ගොත්තෙන ධනෙන වා"ති. c

කත්ථචි සීලාදිවසෙන. යථාහ :—

"සබ්බදා සීලසම්පන්නෝ-පඤ්ඤවා සුසමාහිතෝ,
ආරද්ධවිරියෝ පහිතත්තෝ-ඔඝං තරති දුත්තරං"ති. d

කත්ථචි සතිපට්ඨානාදිවසෙන. යථාහ :—

උපනිස්සයසම්පත්තාය්ය මගෙහනෙව ඉජ්ඣන්ති, මග්ගක්ඛණෙ එව තාසං පටිලභිතබ්බතෝ; එවං සීලසම්පත්තිසමුදාගතා තිස්සෝ විජ්ජා සමාධිසම්පත්තිසමුදාගතා ච ඡ අභිඤ්ඤා උපනිස්සයසම්පත්තාය්ය මග්ගෙනෙව ඉජ්ඣන්තීති මග්ගාධිගමෙනෙව තාසං අධිගමෝ වෙදිතබ්බෝ. පවෙචකබුද්ධානං සම්මාසම්බුද්ධානඤ්ච පවෙචකබෝධි සම්මාසම්බෝධිසම්භිගමසදිසා හි ඉමෙසං අරියානං ඉමේ විසෙසා භිගමා"සි. විනයසූත්‍රාභිධම්මයෙහි සම්‍යක්ප්‍රතිපත්තීන් ත්‍රෛවිද්‍ය තාදීන්ට උපනිශ්‍රයතාව ද යථොක්ත විධින් ම වෙදිතව්‍යයි.)

සීලෙන ච කාමසුඛානුයොගසඞ්ඛාතස්ස අන්තස්ස වජ්ජනං, (සම්පන්නසීලයහට කාමසෙවා නැතිබැවින්) ශීලයෙන් කාමසුඛයෙහි ඇලීමය යන අන්තයාගේ වර්‍ජනය පහළකරණලදී; සමාධිනා අත්තකිල මථානුයොගසඞ්ඛාතස්ස, (ධ්‍යානසුඛලාභීහට ධ්‍යානයෙන් උපන් ප්‍රණීතරූපයෙන් පැතිරෙණලද කාය ඇතිබැවින් කායකිලමථානුයොගය නැත්නුයි) සමාධියෙන් කායකිලමථවෙහි යෙදීමය යන අන්ත යාගේ වර්‍ජනය පහළකරණලදී; පඤ්ඤාය මජ්ඣිමාය පටිපත්තියා සෙවනං, ප්‍රඥවෙන් මධ්‍යමප්‍රතිපත්තිසෙවනය පහළකරණලදී; (උක්තකෘට නිර්දේශයෙන් එකාන්තයෙන් ආර්‍යමාර්ගය ම මධ්‍යම ප්‍රතිපත්ති නමැයි "පඤ්ඤාය"යි මාර්ගප්‍රඥාව ම ගත යුතුය; එතකුදු වුවත් ලෞකිකප්‍රඥාවෙනුදු අන්තවයවර්‍ජනය පහළ කරවයුතු.)

සීලෙන අපායසමතික්කමනුපායෝ, (සිල්වත්හු සුගතියෙහිම උපදනා බැවින්) ශීලයෙන් අපාය ඉක්මීමට උපාය පහළකරණලදී; (ශීල සමාධින් අතික්‍රාන්තවූ කාමාදිභවයෝ කාරණය අප්‍රහීණවෙයින් අනතික්‍රාන්ත ම නම් වෙති; ප්‍රඥවෙන් විනාභි සුප්‍රහීණ වෙයින් අති ක්‍රාන්තනාම වෙත්නුයි "පඤ්ඤාය සබ්බභවසමතික්කමනුපායෝ"යි කීහු.) සමාධිනා කාමධාතුසමතික්කමනුපායෝ, (ධ්‍යානලාභීහු මහද්ගතභූමි යෙහි ම උපදනා බැවින්) සමාධින් කාමභව සමතික්‍රමණයට උපාය පහළකරණලදී; පඤ්ඤාය සබ්බභවසමතික්කමනුපායෝ, ප්‍රඥවෙන් කාමභවාදි නවභවයන්ගේ[a]සමතික්‍රමණයට උපාය පහළ කරණලදී;

සීලෙන ච, ශීලයෙන් ද; තදඞ්ගපහාණවසෙන, දීපාලොකයෙන් අන්ධකාරය මෙන් "පාණාතිපාතා වෙරමණී" ආදී ඒ ඒ කුශලාඞ්ග යෙන්[1] පාණාතිපාතාදි ඒ ඒ අකුසලාඞ්ගයන්ගේ ප්‍රහාණී විසින්; කිලෙ සප්පහාණං පකාසිතං හොති, ක්ලේශයන්ගේ ප්‍රහාණීය පහළ කරණ ලදී; ("දීපාලොකෙනෙව[3] තමස්ස පුග්ගලස්ස චක්ඛුමතෝ[3] න තෙන තෙන කුසලඞ්ගෙන තස්ස තස්ස අකුසලඞ්ගස්ස මහාණං තදඞ්ගප්ප හාණං[b]") සමාධිනා විකඛම්භනප්පහාණවසෙන, උපචාරාර්පණභෙද සමාධිනු විසින් (ප්‍රවෘත්තිනිවාරණය කරණබැවින් සටප්‍රහාරයෙන් ජලතලයෙහි ශෛවාලයන් මෙන්) ඒ ඒ නීවරණධර්මයන්ගේ

---

1. ගුණාඞ්ග, ස. 1 2. ආලොකනෙව. ස. II & මූ. ස. I.
3. චක්ඛුනෙත්ත, පී. a b. උ. ග්‍ර. බ.

විෂකාමභණප්‍රහාණවශයෙන් කෙලෙසප්‍රහාණීය ප්‍රකාශිත වෙ; පඤ්ඤය සමුච්ඡේදපපහාණවසෙන, ආයතිම්අගීහඤ්ඤවෙන් සමුදයපාක්ෂික කෙලෙස ගණයාගේ[1] අත්‍යන්ත අප්‍රවෘත්ති සඞ්ඛ්‍යාත සමුච්ඡේදප්‍රහාණ වශයෙන් කෙලෙසප්‍රහාණීය ප්‍රකාශිත වෙ.

තථා; එසේම; කිලෙසානං විතික්කමපටිපක්ඛා, සංකෙලෙස ධම්මයන්ගේ කම්මකෙලෙසයන්ගේ හෝ කායවාග්වාරයෙහි ව්‍යතික්‍රම සඞ්ඛ්‍යාත අබ්‍යාචාරයට ප්‍රතිපක්ෂයා; සීලෙන පකාසිතා හොති, ශීලය අව්‍යතික්‍රමස්වභාව බැවින් ශීලයෙන් ප්‍රකාශිත වෙ; සමාධිනා පරියුට්ඨාන පටිපක්ඛා, (කුශලෝත්පත්තියට අවකාශ නො දී සිත්හි වැළඳගෙණ කෙලෙසුන්ගේ, සිටීම පරියුට්ඨාන නම් වෙයි.) ඒ පරියුට්ඨානයට ප්‍රතිපක්ෂයා සමාධිහු පරියුට්ඨානප්‍රහායක[2] බැවින් සමාධින් ප්‍රකාශිත වෙ; පඤ්ඤය අනුසයපටිපක්ඛා, (අප්‍රහීණභාව යෙන් සන්තානානුගතවූ අනුරූපකාරණලාභයෙහි උත්පත්තියට අභිවූ සථානගතකාමරාගාදි) සත්තානුසය කෙලෙසයන්ට ප්‍රතිපක්ෂයා ප්‍රඥවෙන් ප්‍රකාශ වෙ; (ආයතිමාගීහඤ්ඤනය අනුශයප්‍රහායක බැවින්.)

දුච්චරිතසංකිලෙස විසොධනං, කායදුච්චරිතාදි දුශ්චරිත සංකෙලෙසයාගේ තදඞ්ගප්‍රහාණ සඞ්ඛ්‍යාත විශොධනය; සීලෙන පකාසිතං හොති, ශීලයෙන් ප්‍රකාශිතවෙ; (ශීලය ව්‍යතික්‍රම ප්‍රතිපක්ෂබැවිනි-**දුච්චරිතසමඞ්ගී සන්තානං සංකිලෙසති විබාධති[3] උපතාපෙති චාති සංකිලෙසෝ**[a]යත්‍යුවෙ.) සමධිනා තණ්හා සඞ්කිලෙස විසොධනං, තෘෂ්ණාසංකෙලෙසයන්ගේ විෂකාමභණප්‍රහාණීයසඞ්ඛ්‍යාත විශොධනය සමාධින් ප්‍රකාශිත වෙ; (සමාධිහු පර්‍යුත්ථාන[4]ප්‍රතිපක්ෂ බැවින්, තෘෂ්ණාවට ද සමාධිහු සෘජු ප්‍රතිපක්ෂ බැවින්;) පඤ්ඤය දිට්ඨිසඞ්කිලෙසවිසොධනං, දෘෂ්ටිසඞ්කෙලෙසයාගේ සමුච්ඡේද ප්‍රහාණ සඞ්ඛ්‍යාත විශොධනය ප්‍රඥවෙන් ප්‍රකාශිත වේ; (ප්‍රඥව අනුශය ප්‍රති පක්ෂ බැවින්; අයාථාවද්ග්‍රාහීදෘෂ්ටිගතගතව යාථාවද්ග්‍රාහිණීප්‍රඥවද ඍජුප්‍රතිපක්ෂබැවින්.)

සීලෙන, සීලයෙන්; සොතාපන්නසකදාගාමිභාවස්ස කාරණං, සොවාන්-සෙදගැම්බවට උපනිශ්‍රයප්‍රත්‍යයාඛ්‍ය කාරණය ප්‍රකාශිත වෙ; සමාධිනා, සමාධියෙන්; අනාගාමිභාවස්ස, අනාගාම්බවට කාරණය ප්‍රකාශිත වෙ; සොතාපන්නා හි, සෝවාන් තෙමේ; සීලෙසු පරිපූර කාරී, (මාගීබ්‍රහ්මචරියභාවයට[5] ආදිහෙයින් ආදිබ්‍රහ්මචරියකතම්වූ පාරාජිකා සංඝාදිසෙසසඞ්ඛ්‍යාත මහාශීලශික්ෂාපදයන්ගේ අව්‍යතික්‍රම යෙන්ද ක්ෂුද්‍රානුක්ෂුද්‍රශික්ෂාපදයන් ඉක්මීමෙන් අවන් ආපත්තින් වහා නැගීමෙන්ද) ශීලයෙහි සමාපත්තිකාරී වෙ; තථා සකදාගාමී,

---

1. ඛභණයාගේ-ස. II 2. පර්‍යුත්ථානප්‍රහායක යනු ථෙරාභ්‍යයන්ගේ පෙරෙහි.
3. කිලෙසති බාධති-ස. II. විබ.ධති-සී. වි. විබාධයති, මූ. ස. II.
4. පරියුට්ඨාන. ස. II & මූ. ස I. පර්‍යුත්ථාන මූ. ස. II.
5. බ්‍රහ්මචරියභාවට, හැම.

a. උ. මූ. බ.

සකෘදාගාමී ද එසේම ශීලයෙහි සමාපත්තිකාරී වේ;- (මේ ආර්යයෝ දෙදෙන වකාහි සමාධි ප්‍රතිපක්ෂවූ කාමරාග ව්‍යාපාදයන් ද ප්‍රඥාප්‍රතිපක්ෂවූ සත්‍යවිත්‍රාදික මොහය ද සර්වාකාරයෙන් තොපැහැර්බැවින් සමාධි ප්‍රඥා දෙදෙන වඩන්නාහු ද සමාධි ප්‍රඥාවෙහි කර්තව්‍යය පමණින් ප්‍රදේශමාත්‍රයක්ම කරණබැවින් සමාධියෙහි ප්‍රඥාවෙහි මාත්‍රාකාරීය, ශීලයෙහි පරිපූර්ණ කාරීයයි කියනුලැබෙත්.) අනාගාමී පන, අන හැම්වනාහි; සමාධිස්මිං පරිපූරකාරී, කාමරාගව්‍යාපාදයන් සමුච්ඡින්න බැවින් සමාධියෙහි සමාපත්තිකාරී වේ; (සත්ත්වයෙහි ශුෂ්ක විදර්ශීකයාද මරණසමයෙහි දු ක්ෂණික්ධ්‍යාන ප්‍රතිලාභයට සාමර්ථ්‍ය[1] ඇතිබැවින් අනාගාමී සමාධියෙහි පරිපූරකාරී නමිසි කීහු.) අරහා පඤ්චක්ඛය පරිපූරකාරී, රහත්තෙමේ සර්වාකාරයෙන් සමෙමාහය සමුච්ඡේදය කළබැවින් ප්‍රඥාවෙහි පරිපූරකාරී වේ.

(එවං යනාදි නිගමනයෙහි අර්ථ යට කී නයින්ම දතයුතු.[a]) ඉමේ තව, මේ ත්‍රිකයෝ කව දෙනද; අඤ්ඤේ ච එවරූපා ගුණත්තිකා, සෙසු මෙබඳුවූ (සත්ත ධම්මෙ, තීණි කුසලමූලානි, තීණි ච මොක්ඛමුඛානි තීණින්ද්‍රියානි යනාදි[b]) ගුණත්‍රිකයෝ; පකාසිතා හොනති, ප්‍රකාශිතවෙත්. (එත්තාවතා පකාසිතා හොනති"යි යොදනු. "සීලෙන කායවිවෙකො පකාසිතො හොති, සමාධිනා චිත්තවිවෙකො පඤ්ඤාය උපධිවිවෙකො" යනාදි ත්‍රිකයන්[2] යොජනාකරණු.)

නිදානාදිකථා නිට්ඨිතා.

---

1. එවං, මේ උක්තප්‍රකාරයෙන්; අනෙකගුණසඞ්ගාහකෙන; අධිසීල ශික්ෂා ආදිවූ ද සෙසු ද අනෙකගුණයෙන් සඞ්ග්‍රහකොට සිටි; සීල සමාධි පඤ්ඤාඛන්ධමුඛෙන, ("සබ්බෙ සඞ්ඛාරා අනිච්චා" යනාදියෙහි මෙන් විදර්ශීතාමාත්‍රාදිමුඛයෙන් සඞ්ක්ෂෙපයෙන් නොා දෙසා) ශීලසමාධි ප්‍රඥාමුඛයෙන්; දෙසිතොපි පනෙස විසුද්ධිමග්ගො, දෙසිතවූ මේ විශුද්ධි මාර්ගය; අතිසඞ්ඛෙපදෙසිතො යෙව, සුඛභාව විභාග විසින් නොා දෙසු බැවින් අතිසංක්ෂෙප දෙසිතම වේත්‍රයි; සබ්බසං උපකාරක ඤාලම්ති, සඞ්ක්ෂිප්තරුචි උදෘචිතඥයන්[3] විනා නාතිසංක්ෂිප්ත විස්තර රුචින් වද විපඤ්චිතඥයන්ට[4] ද උපකාරක අසමර්ථත්‍රයි; අස්ස විත්ථාරං දස්සෙතුං, මේ විශුද්ධිමාර්ගයාගේ විස්තරය දක්වනුපිණිස; සීලං තාව ආරබ්භ,(සමාධි ප්‍රඥාවන් තබා) පළමුකොට ශීලය අරභයා; ඉදං පඤ්හ කම්මං හොති, මේ ප්‍රශ්නකර්මය වේ;-

(1.) කිං සීලං, සුවරූප විහින් සිල්නම් කිම;

(2.) කෙනට්ඨෙන සීලං, නුවරනම් අර්ථයෙන් සිල් නම් ද;

---

1. සම්මෝ. මූ. සං. I & II. 2. ත්‍රිකයොජනා. සං. II.
3. උද්ඝටිතඤ්ඤ. හෑම්. 4. විපච්චිතඤ්ඤ. බොහෝ. විපචිතඤ්ඤෙය මූ. සං. I & II.

a. b. ඵ. ඉ. ඛ.

(3) අස්ස, මෙ සීලයාගේ; ලක්ඛණ රසපච්චුපට්ඨානපදට්ඨානානි කානි, සවභාවය කෘත්‍යය වැටහෙන ආකාරය ආසන්නකාරණය යන මොහු කවරහ;

(4) සීලං, සීලය; කිමානිසංසං, කුමක් අනුසස්කොට ඇත්තේ ද;

(5) එතං සීලං, මේ සීලය; කතිවිධන්ති, කතිප්‍රකාරවේ ද;

(6) කො වස්ස සංකිලෙසො; මේ සීලයට කිලුටු කිම;

(7) කිං වොදානං පිරිසුදු කිම යත්;

තත්‍ර, ඒ ප්‍රශ්නකර්මයෙහි; ඉදං, මෙ; විස්සජ්ජනං, විවරණයි; (නොහොත්: තත්‍ර, සී සේයි. "තස්ස පඤ්හස්ස, යන අර්ථයි.)

2. "කිං සීලං" යන්නෙහි පාණාතිපාතාදිහි වා විරමන්තස්ස, ප්‍රාණවධාදි දෙඅශසීල්‍ය කර්මයෙන් හෝ සමාදානවිරතිසම්ප්‍රාප්ත විරතිවශයෙන් වළක්නහු ගේද; චිත්තපට්විත්තං වා පුරෙත්තස්ස, උපාධ්‍යායවත් ආදි වතැයි කියනලද පිළිවෙත් පුරන්නහුගේ හෝ; චෙතනාදයො ධම්මා, චෙතනාදි ධර්මයෝයි; (-"චෙතනාදයො ධම්මා"යි සඛේකෂපයෙන් කියනලද අර්ථය පාළි විසින් විභාගකොට දක්වනු පිණිස "චුත්තං හෙතං" යනාදි කියනලදි.) පටිසම්භිදායං, පිළිසිඹියායෙහි; එතං, මෙ; වුත්තං, කියනලදි; කිංසීලන්ති, සීලනම් කිම්දයත්? i චෙතනා සීලං, චෙතනා ශීලය; ii චෙතසිකං සීලං, චෙතසිකශීලය; iii සංවරොසීලං, සංවරසීලය; iv අවීතික්කමො සීලන්ති, අව්‍යතික්‍රමශීලයයි (මිහි චෙතනාවට චෛතසිකධර්ම ඇතද "චෙතනාසීලං"යි වෙන ගත් හෙයින් ගොබලිවද්දන්‍යායයෙන් [a]විරති අනභිධ්‍යාදි ශීලයම චෙතනා ශීල නම්වෙයි දතයුතු.) තත්‍ර, ඒ චතුර්විධශීලයෙහි; i චෙතනාසීලං නාම, චෙතනාශීල නම්:-"පාණාතිපාතාදීහි වා විරමන්තස්ස චෙතනා"යි විරතියුක්ත ප්‍රධාන චෙතනාව කිහ; "චිත්තපට්විත්තං වා පුරෙන්තස්ස චෙතනා"යි, වත් පිළිවෙත් කරණ චෙතනාව කිහු; ii "චෙතසිකං සීලං නාම පාණාතිපාතාදීහි විරමන්තස්ස විරති"යි, විරතියගේ ප්‍රධාන බව ගෙණ කිහු-

(සං. 10.)(විරති නො උපදා සමාදන්වන්නහු විසිනුදු කුඩා දරුවන් මෙන් කිසිවක් නොදැන සිල්ගන්නහු විසිනුදු අකුශලචෙතනාවට කුශලචෙතනාවම ප්‍රතිපක්ෂබැවින් චෙතනාවම කිහ. [විරති ඇති හෙතුචෙතනා චෙතම කර්මපථබැවින් චෙතනාවම කිහ යනු සත්‍යයි.] යම්කලෙක "තිවිධා භික්ඛවෙ කායසඤ්චෙතනා කුසලං කායකම්මං" යනාදි වදාළ බැවින් ප්‍රාණාතිපාතාදීන්ට ප්‍රතිපක්ෂවූ තද්විරතිවිශිෂ්ටචෙතනා ම ප්‍රධානභාවයෙන් ප්‍රාණාතිපාතාදීන් කෙරෙන් විරතිය සාධා ද එකල තත්සම්ප්‍රයුක්ත විරති අනභිධ්‍යාදීහු චෙතනාපාර්ශ්වික හෝ අව්‍යවහාරික හෝ වෙතියි; මේ අර්ථය දක්වනු සඳහා "චෙතනාසීලං"යි කිහ. යම්කලෙක වනාහි ප්‍රාණාති

---

[a] b ඉ. ඉ. බ.

පානාදීන් කෙරෙන් සඞ්කොචයට පැමිණෙන්නාහට එසින් විරමණාකාරයෙන් පවත්වන්නාවූ චෙතනා විශිෂ්ට විරති ද අනභිඩ්‍යාදි ධර්මයෝ ද ඒ ඒ තැන්හි ප්‍රධාන බැවින් කෘත්‍යසාධකයෝ වෙද්ද? එකල්හි චෙතනාතොමෝ විරති ආදි පාක්ෂික හෝ වෙයි, අව්‍යවහාරිකහෝ වෙයි යන මෙ අර්ථය සඳහා "චෙතසිකංසීලං" යනු කිහ; ටීකානයයි.)

(දැන් සූත්‍රයෙහි ආ නයින් දශකුශල කර්මපථ වශයෙන් චෙතනා චෛතසිකශීලයන් විභාගකොට දක්වන පිණිස "අපි ච" යනාදි කිහු.)

අපිච, අත්ථෙකච්චෙ ඇති; පාණාතිපාතාදීනි පජහනනයස, (සමාදාන වශයෙනුදු සම්ප්‍රාපනවසනුව අනඩ්‍යාවරණ වශයෙනුදු) ප්‍රාණවධාදීන් දුරුකරන්නහුගේ; සත්තකම්මපථචෙතනා, පිළිවෙළින් සප්ත විධ කුශලකර්මපථචෙතනාවෝ; "චෙතනාසීලංනාම"සි යොදනු, අභිජ්ඣං පහාය, අභිඩ්‍යාව දුරුකොට; විගතාභිජ්ඣා චෙතසා; පහවූ අභිඩ්‍යාඇති චිත්තයෙන්; විහරතීති ආදිනා නයෙන, වෙසෙයි යනාදි නයින්; වුත්තා, කියනලද; අනභිජ්ඣා අව්‍යාපාද සම්මාදිට්ඨි ධම්මා, අනභිඩ්‍යා අව්‍යාපාද සම්‍යග්දෘෂ්ටි ධර්මයෝයි.

(සං. 11.) (මේ අනභිඩ්‍යාදීහු අභිඩ්‍යාදීනට ප්‍රතිෂෙධක බැවින් හෝ අභිද්‍ධ්‍යාදීන් වන මිථ්‍යාචාරාදීනට ප්‍රතිෂෙධක බැවින් හෝ ශීලනාම වෙත්. කිසේය යත්? අභිඩ්‍යායෙන් මිථ්‍යාචාරවෙයි, ප්‍රාර්ථිත වසතුයෙහි ව්‍යතික්‍රම වන බැවිනි. ව්‍යාපාදයෙන් ප්‍රාණාතිපාත වෙයි. 'මියෙත්වයි' පැවති සිත් ඇත්තහු අනුන් මරණ බැවිනි. මිථ්‍යාදෘෂ්ටියෙන් මිථ්‍යාචාරවෙයි, 'පුත්‍රයා මුඛය දැක සවඥිහයට යෙමියි' හත්දෘෂ්ටින් මිථ්‍යාචාරවරණයට කාරණා ඇති බැවිනි. මෙසේම සෙසු කර්මපථයෙහි යෙදෙන යෙදෙන සේ යොදනු. මෙමකිහ-"යථාහි අභිජ්ඣාව්‍යාපාදවසෙන මිච්ඡාචාරපාණාතිපාතාදයො කරීයන්ති, එවං මිච්ඡාදිට්ඨිවසෙනාපි තෙ පුත්ත මුඛදස්සනාදි අත්ථං කරීයන්ති තෙසඤ්ච පජහනකා අනභිජ්ඣාදයො"ති.)

iii "සංවරෙ සීලං" යනුයෙහි; පඤ්චවිධෙන සංවරො වෙදිතබ්බො, පඤ්චප්‍රකාරයෙකින් සංවරය දතයුතු; i පාතිමොක්ඛ සංවරො, චාරිත්‍ර වාරිත්‍ර විභාගඇති විනය පර්‍යාපන්න ශික්ෂාපද ශීල නැමැති ප්‍රාතිමොක්ෂයම ප්‍රාතිමොක්ෂ සංවරශීල නම; ii සතිසංවරො, මනස සවනුවූ ඉන්ද්‍රියයන්ගේ ආරක්ෂායයි කියනලද ඉන්ද්‍රියසංවරපරනාමධෙය ඇති සමෘතියම සතිසංවර නම; iii ඤාණසංවරො, තණ්හාදිට්ඨි ආදීන් සමූලෙඡද කරවන ඤාණයම ඤාණසංවර නම; iv ඛන්තිසංවරො, අධිවාසනා වශයෙන් පවත්නා අලෙෂප්‍රධානසඤ්ඤාඛ්‍යවූ අලෙෂාඛ්‍යම වූ හෝ ක්ෂාන්තියම ක්ෂාන්ති සංවරනම; v විරියසංවරො, කාමවිතර්කාදීන් දූරීකරණවශයෙන් පවත්නා වීර්‍යයම විරියසංවර නම; තත්ථ, ඒ පඤ්චවිධ සංවරයෙහි; i ඉමිනා පාතිමොක්ඛසංවරෙන, මේ ප්‍රාතිමොක්ෂ සංවරයෙන්; උපෙතො හොති, යුක්තවේද; ("සමුපෙතො හොති" යනු

එයට පයිරීයයි.) ii රකඛති චක්ඛින්ද්‍රියං, චක්ඛින්ද්‍රිය රක්නේයි; චක්ඛින්ද්‍රියෙ සංවරං ආපජ්ජතීති, චක්ඛින්ද්‍රියයෙහි සංවරයට පැමිණේය යනු සති සංවර නම්.

iii ("අජිත" යනු අමන්ත්‍රණය "භගවා" යනු ප්‍රතිවචනයි.) ලොකස්මිං, ලොකයෙහි; යානි සොතානි, තෘෂ්ණාදෘෂ්ට්‍යාදි යම් ශ්‍රොතස් කෙනෙක් ඇද්ද; සති තෙසං නිවාරණං, විදර්ශනාසම්ප්‍රයුක්තවූ සමෘති තොමෝ තෘෂ්ණාදෘෂ්ට්‍යාදි ඒ ශ්‍රොතසුන්ට ආවරණයි-(රක්ෂාය යනු අර්ථයි.) සොතානං සංවරං බ්‍රූමි, ශ්‍රොතසුන්ට එම සමෘතිය සංවරයයි කියමි; පඤ්ඤායෙතෙ පිහියරෙ, රූපාදීන් කෙරෙහි අනිත්‍යතාප්‍රතිවෙධසාධකවූ මාර්ගප්‍රඥාවෙන් ඒ ශ්‍රොතස්හු සර්වාකාර යෙන් පියනු[1] ලැබෙත්.

(සං. 12.) (මෙම කිහ අට්ඨවායෙහිදු[a] "සතිඉන්ද්‍රියං නිබ්බානගාමිනී විපස්සනා යුත්තා කුසලාකුසලානං ධම්මානං ගතියෝ සම්පණ්ණා සමානා සති තෙසං සොතානං නිවාරණං, සොතානානං සංවරං බ්‍රූමීති තමේ වාහං සතිං සොතානං සංවරං බ්‍රූමි'ති අධිප්පායෝ, පඤ්ඤායෙතෙ පිහියරෙති රූපාදිසු පන අනිච්චතාදි පටිවෙධසාධිකාය මග්ගපඤ්ඤාය එතෙ සොතා සබ්බසෝ පිහියන්ති"යි. සඤ්ඤායෙහිදු "සොතානං සංවරං බ්‍රූමි"යි; ශව ඉන්ද්‍රියසංවර කිහ; "පඤ්ඤායෙතෙ පිහියරෙ"යි; සමුච්ඡේද කෙලෙසුන් පහන ප්‍රඥාවෙන් කෙලෙස්හු පියන ලැබෙතියි උතුම් ඤාණසංවර කියති යි. ටීකාවෙහි වනාහි "සොතානං සංවරං බ්‍රූමීති වත්වා පඤ්ඤායෙතෙ පිහියරෙති වචනෙන සොතානං සංවරෝ පිදහනං සමුච්ඡේදනං ඤාණන්ති විඤ්ඤායති"යි කිහු,) මේ ඤාණ සංවරයි. පච්චය පටිසෙවනම්පි, ප්‍රත්‍යය සෙවුනා ශීලය ද; එතේව සමොධානං ගච්ඡති, (ප්‍රයෝජනය සලකා නුවණින් ප්‍රත්‍යය සෙවුනාබැවින්) මේ ඤාණසංවරයෙහිම සඞ්ග්‍රහයට යේ

iv යො පනායං, යම් මේ සංවරයෙක්; ඛමො හොති සීතස්ස උණ්හස්සාති ආදිනා නයෙන ආගතො, හුණු සිහිල් අධිවාසනා කෙරෙයි යනාදි නයින් ආයේ ඛන්තිසංවර[b] නම්; v යො චායං, යම් මේ සංවරයෙක්; උප්පන්නං කාමවිතක්කං, ඒ ඒ අරමුණෙහි උපන් කාමප්‍රතිසංයුක්ත විතර්කය; නාධිවාසෙති, නො ඉවසා-(සිත්හි නොතබා යන අර්ථයි); ආදිනා නයෙන ආගතො, මේ ආදි නයින් ආයේ විරිය සංවරනම්; ආජීවපාරිසුද්ධිපි, ආජීවපාරිශුද්ධිශීලය[2] ද; එතේව සමොධානං ගච්ඡති, මේ වීර්‍යසංවරයෙහිම සඞ්ග්‍රහයට යේ.

(සං. 13.) ආජීවපාරිශුද්ධිශීලය වීර්‍යයෙන් සිදුවනබැවින් මෙහි යම්සේ ඥානය තෘෂ්ණාදී ශ්‍රොතසුන්ගේ ප්‍රවෘත්ති නිවාරණයෙන් පිදහනාදී යෙන් සංවරනම් වේ ද, මතුයෙහි පවත්නා ගුණයන්ට ආධාරාදිබැවින් ශීලනාදීයෙන් ශීල වේ ද, එසේම ක්ෂාන්තිය ද අනධිවාසනයෙන් උපදනා කෙලසයන් අධිවාසනයෙන් සංවරණය කරණ හෙයින්

1. පියන් පියනු. සැ. 1.
2. ආජීව පරිශුද්ධශීල, යනු යොග්‍ය යේ පෙණේ.

a. b. c. ඵ. ඉ. බ.

සංවරයයි- කර්‍මානති හෙතුවෙන් උපදනා ගුණයනට ආධාර බැවින් ශීලනාර්‍ථයෙන් ශීලයි; විශ්‍යිය දුරුකවයුතුවූ පාපධර්‍මයන්ගේ දුරි කරණයෙන් සංවරණය කරණහෙයින් සංවරය-පාපවිනොදන හෙතු වෙන් උපදනාවූ ගුණයන්ට ආධාරාදි බැවින් ශීලනාර්‍ථයෙන් ශීලයයි දනයුතු.)

ඉති, මෙසේ; අයං පඤ්චවිධොපි සංවරෝ, මේ පඤ්චවිධ සංවරය ද; පාපභීරුනානං කුලපුත්‍තානං, පාපභීරුකවූ කුලපුත්‍රයන්ගේ; සමාපත්තාවත්‍ථුතො යා ච විරති, සමාපත්ති වසතුයෙන් ශීලසමාදානයක් නැතිව ද මෙවැනි කර්‍ම නුසුදුසුයයි කරණ යම් විරතියෙක් ඇද්ද; සබ්බමෙපතං සංවරසීලන්ති වෙදිතබ්බං, මේ සියල්ලම සංවරශීලයයි දනයුතු

iv අවීතික්කමෝ සීලන්ති, අව්‍යතික්‍රම ශීලනම්; සමාදින්න සීලස්ස, සමාදන්වනලද සිල් ඇත්තහුගේ; කායිකවාචසිකො අවීතික්කමෝ, කායවාග්දවාරයෙහි අව්‍යතික්‍රමයයි. ("න විනිච්ඡකමන්ති එතෙනානි අවිනිච්ඡකමෝ නථාපවත්තෙතා කුෂ්ඨලිච්ඡාදෙ"යි ගන්නේ.

තාව, පළමුකොට; කිං සීලන්ති පඤ්හස්ස, "කිං සීලං" යන පැනයට ඉදං විස්සජ්ජනං, මේ විසදීමයි.

3. (2) අවසෙසෙසු, සෙසු ප්‍රශ්නයන් කෙරෙහි; "කෙනට්ඨෙන සීලං" යන්නෙහි; සීලනට්ඨෙන සීලං, ශීලනාර්‍ථයෙන් ශීල නම්; කිම්දං සීලනං නාම, ඒ ශීලනය නම් කිමයත්; i සමාධානං වා, මනාකොට තිබීම හෝයි; කායකම්මාදීනං, කායකර්‍මාදීන්ගේ; සුසිල්‍යවසෙන අවිප්පකිණ්ණතාති අත්ථො, සෞශීල්‍යවශයෙන් අවිප්‍රකීර්‍ණභවය යන අර්‍ථයි.

(සං. 14.) (ශීල-සමාධෞ, යන ධාතුහට රුචි-දෞශ්ශීල්‍යයෙන් පවත්නා කායකර්‍මාදිහු දැනුදු මතුයෙහිදු අහිත දුඃඛ ඵලවන හෙයින් සමාර්‍ථපිත නම් නොවෙත් නුයි විසිර පවත්නා නම් වෙති. සෞශීල්‍ය වශයෙන් වනාහි පවත්නා කායකර්‍මාදිහු තත්ප්‍රයෝජනයෙන් "ඔකිණ්ණ විකිණ්ණ න බාහුපපවාලනාදි" විසින් සමාර්‍ථපිතයෝ නුයි අවිප්‍රකීර්‍ණ නම්-නොවිසිර පවත්නා නම් වෙත්. "අවිප්පකිණ්ණතා" යන මෙයින් සමාධිහු කෙරෙන් ශීලය වෙසෙසූහු; සමාධිහුගේ සමාධාන නම් සම්ප්‍රයුක්ත ධර්‍මයන්ගේ අවික්ඛෙපභවට හෙතු බවයි- මේ කායකර්‍මාදීන් නොවිසිරිය දී මනාකොට තිබීමයයි දනයුතු.)

ii උපධාරණං වා, අධිෂ්ඨාන බව හෝ ආදිභාවය කීබැවින් මුල්බව හෝ; කුසලානං ධම්මානං පතිට්ඨාවසෙන, (ලෞකික ලෝකොත්තර) කුශල ධර්‍මයන්ට ප්‍රතිෂ්ඨා විසින්; ආධාරභාවො ති අත්ථො, අධාරභවය යන අර්‍ථයි;-

(සං. 15.)(ශීල-ප්‍රතිෂ්ඨාර්‍ථෙ, යන ධාතු රුචි-"පතිට්ඨාවසෙන"යන මෙයින් පෘථිවිධාතු කෘත්‍යයෙන් ශීලය වෙසෙසූහු; පෘථිවිධාතු සහජාත රූපධර්‍මයන්ගේ සන්ධාරණ වශයෙන් පවත්නීය. මේ වනාහි අනවද්‍යධර්‍මයන්ට මූලාධිෂ්ඨානභාවයෙන් පවති.)

එතදෙව හි අත්ථද්වයං, මේ අර්ථදෙකම්; සද්දලක්ඛණවිදූ, ශබ්ද ලක්ෂණදන්නාහු; අත්‍රජානන්ති, අත්‍රඥ කෙරෙත්; අඤ්ඤ පන, (ශබ්ද ලක්ෂණඥයන් කෙරෙන් පිටත්) සෙසු ආචාර්‍යයෝ වනාහි; ("වණ්ණ යන්ති"යි යොදනු;) සිරත්ථා, උත්තමාඛ්‍යය යන අර්ථය (සිලත්ථා,) ශීලශබ්දයාගේ අර්ථයි;-

(සං. 16.) (යම්සේ හිස් සුන් කල්හි සියලු ආත්මභාවය නසීද, එසේම ශීලය භින්නා කල්හි සියලු ගුණශරීරය නස්නේය. එහෙයින් ගුණ ශරීරයාගේ උත්තමාඛ්‍යාර්ථය ශීලාර්ථ නම යන අර්ථයි-නොහොත් "සිරො සීසං"යි වක්තව්‍යයෙහි:-

["වණ්ණොගමෝ වණ්ණවිපර්‍යයශ්ච
ද්වෙ චාපරෙ වර්ණවිකාරනාශෙ
ධාත්වාදර්‍ථාතිශයෙන යොගස්
තදුව්‍යතෙ පඤ්චවිධං නිරුක්තම්."[a]]

යන නෛරුක්තිකවිධින් සකාරයහට ලකාර කොට "සිලං"යි දැක්වූහු.)

සීතලත්ථා (සීලත්ථා,)පරිදාහව්‍යුපශමනාර්ථය ශීලාර්ථ නම; (මේ අර්ථයෙහිදු "සීතලං"යි වක්තව්‍යයෙහි නිරුක්තිනයින්ම තකාරයහට ලොප් කොට"සීලං"යි දැක්වූහු.)එවමාදිනා නයෙන,මේ ආදිනයෙනුදු; එත්, මේ ශීලශබ්දයෙහි; අත්ථං වණ්ණයන්ති, අර්ථය වර්ණනා කෙරෙත්; (ආදිශබ්දයෙන් "**සයන්ති අකුසලා ඵලමිං සති අපච්ඨා හොන්තීති=සීලං,සුපන්ති වා තෙන චිත්තුස්සාහාති [1]සබ්බදුච්චරිතා නීති=සීලං**" [b]යනාදි ගතයුතු. (මේ "තෙනත්ථෙන සීලං" යන පැණයට විසඳිමයි.[2])

4. (3) (ඉදැනි, දැන්-[මෙයට අනතුරුව] "කායස්ස ලක්ඛණරස පච්චුපට්ඨාන පදට්ඨානානි" යන්නෙහි[3])

(i) අනෙකධා භින්නාස්සාපි, (චෙතනාදි විසින්) අනෙකප්‍රකාරයෙන් භින්න ද වූ; තස්ස, ඒ ශීලයට; සීලඤ ලක්ඛණං, කායකර්මාදීන්ගේ අවිප්‍රකීර්ණී බව ද කුශලධර්මයන්ට පිහිට බව ද ලක්ෂණයයි=සභාවයයි; අනෙක භෙදය සඞ්ග්‍රහබැවින් "මේ විශෙෂලක්ෂණ නොවන්නේය, සාමාන්‍ය ලක්ෂණ වන්නේය" යන අදහසින්ම "සනිදස්සනත්තං රූපස්ස යථා භින්නාස්ස නෙකධා"යි කිහු-) අනෙකධා භින්නස්ස,(නීලාදි විසින්) අනෙකප්‍රකාරයෙන් භින්නවූ; රූපස්ස, වර්ණායතනයහට; සනිදස්සනත්තං යථා, සනිදර්ශන බව මෙනි.

(සං. 17.) (යම්සේ නීලාදිවශයෙන් අනෙක භෙදභින්න ද වූ රූපා යතනයහට තදන්‍යධර්මයන්ට අසාධාරණබැවින් සනිදර්ශනබව විශෙෂ ලක්ෂණවී ද, අනිත්‍යතාව මෙන්-රූපකය මෙන් සාමාන්‍යලක්ෂණ නම්

1. චිත්තුස්සාහාති. සං. 11. 2-3. මේ පාඨ පොත්හි නොපෙණේ.
a. b ඵ. ඉ. ඔ.

නොවිද, එසේම ශීලනයෙ[1] ද තදන්‍යධර්මයනට අසාධාරණ බැවින් වෙතනාදිභෙදනිනාශීලයට විශෙෂලක්ෂණයයි දැකවය්‍යයි.)

යථාහි, යම්සේ; නීලපීතාදිභෙදෙන අනෙකධා භින්නසාපි, නීල පීතාදි භෙදයෙන් අනෙකප්‍රකාරයෙන් භින්න ද වූ; රූපායතනස්ස, රූපායතනයහට; සනිදස්සනත්තං ලක්ඛණං, සනිදර්ශනබව තදන්‍ය ධර්මයනට අසාධාරණ බැවින් විශෙෂලක්ෂණ වීද; කුම්හෙසිනා යත්? නීලාදි භෙදෙන භින්නසාපි, නීලාදි භෙදයෙන් භින්න ද වූ (රූපා යතනයාගේ);සනිදස්සනභාවානතික්කමනතො, සනිදර්ශන භාවයාගේ නො ඉක්මීම බැවිති; තථා, එසේම; වෙතනාදිභෙදෙන අනෙකධා භින්නසාපි සීලස්ස, වෙතනාදිභෙදයෙන් අනෙකප්‍රකාරයෙන් භින්න ද වූ ශීලයට; කායකම්මාදීනං සමාධාන වසෙන, කායකර්මාදීන් නො විසිරිය දී මනාකොට තිබීම්වසයෙන් ද; කුසලානඤ්ච ධම්මානං පතිට්ඨාවසෙන, කුශලධර්මයනට පිහිට විසින්ද; වුත්තං, කියනලදැ; යදෙතං සීලනං, යම් මේ ශීලනයෙක් ඇද්ද; තදෙව ලක්ඛණං, හේ ම ලක්ෂණයි; වෙතනාදි භෙදෙන භින්නසාපි, වෙතනාදි භෙදයෙන් භින්නයාගේද; සමාධානපතිට්ඨානභාවානතික්කමනතො, කායකර්මා දීන්ගේ නොවිසිරෙණබව කුශලකර්මයනට පිහිටබව නො ඉක්මෙන හෙයිනි; එවං ලක්ඛණස්ස පනස්ස, මෙබඳු ලක්ෂණ ඇති ශීලයාගේ;-

(ii) දුස්සීල්‍යවිඛංසනතා, කායිකඅසංවරාදිභෙද ඇති දෞශ්ශීල්‍ය යාගේ නැසීම ද; තථා, එසේම; අනවජ්ජගුණා, නිරවද්‍යගුණයෝ[2] ද; කිච්චසම්පත්ති අත්ථෙන, කෘත්‍යය හා සම්පත්තිය අර්ථ කොට ඇති රසයෙන්; රසො නාම පවුච්චති, රස නමැයි කියනු ලැබේ.

("යස්මා රසො නාම පවුච්චති තස්මා"යි කීවෙත්.) ඉදං සීලං නාම, මේ ශීලය නම්; කිච්චත්ථෙන රසෙන, කෘත්‍යාර්ථ රසයෙන්; දුස්සීල්‍ය විඛංසනරසං, දෞශ්ශීල්‍යයාගේ නැසීම කෘත්‍යය කොට ඇත්තේය; සම්පත්තිඅත්ථෙන රසෙන, සම්පත්ත්‍යර්ථ රසයෙන්; අනවජ්ජරසන්ති, අනවද්‍යබව (-අගර්හ්‍යබව) සම්පත්කොට ඇත්තේයයි; වෙදිතබ්බං, දතයුතුයි; ලක්ඛණාදිසු හි, ලක්ෂණරසාදීන් කෙරෙහි; කිච්චමෙව සම්පත්ති වා රසොති වුච්චති, කෘත්‍යය ම හෝ සම්පත්තිය ම හෝ රසය යි කියනු ලැබෙයි.

(සං. 18)(රසායතන රසරසාදිහු කියනු නොලැබෙත්. සන්‍යයෙහි "කිච්ච මෙව" යන අවධාරණයෙන් කෘත්‍යරසය බලවත්බව කිහයි කිහු. "කිච්චමෙව සම්පත්ති එව වා රසො" යන මේ අර්ථය අභිමත බැවින් හේ ඔවුන්ගේ මතිමාත්‍රයි.)

(iii) සොචෙය්‍යපච්චුපට්ඨානං, කායාදීන්ගේ සුචිබව වැටහීම් කොට ඇත්තේයි; තස්ස, ඒ ශීලයට; විඤ්ඤූහි, නුවණැත්තන් විසින්; ඔත්තප්පඤ්ච, ඔත්තප්පයද; හිරිඤ්චව, හ්‍රීයද; පදට්ඨානන්ති, ආසන්න කාරණයයි; වණ්ණිතං, වර්ණනාකරණලදී.

1. ශීලය-හැම. 2. කෘත්‍යයෝ-පොත්හි.

තසිදං[1] සීලං, ඒ මේ ශීලය; කායසොවෙය්‍යං, කායද්වාරශුද්ධිබවය; වචීසොවෙය්‍යං, වාග්ද්වාරශුද්ධිබවය; මනොසොවෙය්‍යන්ති, මනොද්වාර ශුද්ධිබවයයි; එවං වුත්තසොවෙය්‍ය පවත්තුපට්ඨානං, මෙසේ කියනලද ශුද්ධිබව වැටහීම් කොට ඇත්තේයි; සුචි භාවෙන[2] පවත්තුපට්ඨානති, ශුද්ධිබැවින් වැටහේ; ගහණභාවං ගච්ඡති, ගතයුතුබවට පැමිණේ;-

(සං. 19)(මෙයින් උපසථානාකාරසඛ්‍යාත ප්‍රත්‍යුපසථානයයි කියන ලද ඵලාඵලයෙයින් වනාහි "අවිප්පටිසාරපවත්තුපට්ඨානං සමාධිපවත්තුපට්ඨානං වා" කියයුතු-ශීලය දැනුදු අවිප්‍රතිසාරය ඵළවයි, පරම්පරායෙන් සමාධිය ද ඵළවා. මේ ආනිසංසඵලය ආනිසංස කථායෙහි වක්ෂ්‍යමාණ හෙයින් මෙහි නොකිහු-සන්‍යයෙහි ඵලය අනීපසිත බැවින් මෙහි නොගත්තයි කිහ-හෙ නො මැනවි ඵලය අනෙකවිධ බැවිනු දු ලෞකිකාදි ශීලය විභාග කටයුතු බැවිනුදු.)

හිරොත්තපපඤ්ඤ පන, හිරිඔතප් දෙක වනාහි; තස්ස, ඒ ශීලයට; විසුද්ධත්ථාය, ත්‍රුවණැත්තන් විසින්; "පදට්ඨානන්ති වණ්ණිතං"යි සේයි; ආසන්නකාරණන්ති අත්ථො, ආසන්නකාරණය යන අර්ථයි; (පෘථිවී ධාතුගව යම්සේ කම්මාදි දූරකාරණද, සෙසු භූතත්‍රය ආසන්න කාරණද, යම්සේ වස්ත්‍රයට තන්තවාය-තුරිය-වෙම-සලාකාදි දූර කාරණද, තන්තූහු ආසන්න කාරණද, එසේම ශීලයට ද සඞ්ඛිලිශ්‍රවණාදීහු දූරකාරණය, හිරිඔතප් ආසන්න කාරණයයි දක්වන පිණිස "හිරිඔත්තපපඤ්ඤා" යනාදි කිහු-"හිරිඔත්තපෙ හි සති" යන්නාදීන් ආසන්න කාරණ බව ම සාධත්.) හිරිඔත්තපෙ හි සති, හිරි ඔතප් දෙදෙනා ඇතිකල්හි; සීලං, ශීලය; උප්පජ්ජති වෙව, සමාදාන වශයෙන් උපදනේ ද වෙයි; තිට්ඨති ච, අව්‍යතික්‍රමවශයෙන් පිටුනේ ද වේ; අසති; හිරිඔතප්දෙක නැතිකල්හි; නෙව උප්පජ්ජති න තිට්ඨති, නොම උපදනේය, නොම පිටුනේයි.

(එවං, මෙසේ; සීලස්ස, සීලයාගේ; ලක්ඛණ රස පච්චුපට්ඨාන පදට්ඨානානි, ලක්ෂණ රස ප්‍රත්‍යුපසථාන පදසථානයෝ දතයුත්තාහ.[3])

සභාවාදි ශීලකථා නිමි.

---

5. (4) කිමානිසංසං(සීලන්ති,) සීලය[4] කුමක් අනුසස් කොට ඇත්තේද යත්; අවිප්පටිසාරාදි අනෙකගුණපටිලාභානිසංසං, අවිප්‍රතිසාරාදි අනෙකගුණප්‍රතිලාභය අනුසස් කොට ඇත්තේයි;-(මෙහි අවිප්‍රතිසාර නම් විප්‍රතිසාර ප්‍රතිපක්ෂ කුශල චිත්තෝත්පාදයයි. හේ වනාහි වෙසෙසින් "ලාභා වත මෙ සුලද්ධං වත මෙ යස්ස මෙ සුපරිසුද්ධං සීලං" යන්නාදීන් තමාගේ ශීලය ප්‍රත්‍යවෙක්ෂාවශයෙන් ප්‍රවෘත්තයයි වෙදිතව්‍යයි. ආදි ශබ්දයෙන් ප්‍රමොද්‍ය-හොඝසම්පත්ති-

---

1. තංහිදං-මූ. ස. I &. II. 2. සොචෙය්‍ය භාවෙන-මූ. ස. I.
3-4-මේ පාඨ පොත්හි නොපෙණේ.

කිත්තිශබ්දයින් ගත්හු.) වුත්තං හෙතං, a වදුලේමය; ආනන්ද, ආනන්දය; කුසලානි සීලානි, අනවද්‍ය ශීලයෝ; අවිප්පටිසාරත්ථානි, අවිප්‍රතිසාරය ප්‍රයොජන කොට ඇත්තාහුයි; අවිප්පටිසාරානිසංසානි, අවිප්‍රතිසාරය අනුශස්කොට ඇත්තාහුයි. (මෙයින්-අවිප්‍රතිසාරය ශීලයාගේ උද්‍රය මාත්‍රයි, සංවර්ධිතවෘක්ෂයාගෙ ඡායාප්‍රාප්‍රසදෘශය, මෙයින් නිෂ්පාද්‍යවූයේ අන්‍යමවූ සමාධ්‍යාදිගුණයයි දැක්වූහු.)

අපරම්පි වුත්තං, b අනිකෙකුදු කියනලදී; ගහපතයෝ, ගෘහපතිනි;! සිලවතෝ, පරිපූර්ණවූ සිල්ඇත්තහුට; සීලසම්පදාය, එම ශීල සම්පත්තියෙහි; ඉමෙ පඤ්ච ආනිසංසා, මේ පස්අනුසස්හු වෙත්; කතමෙ පඤ්ච, කවර පස්දෙනදයත්:- ඉධ, මෙලෙව්හි; ගහපතයෝ, ගෘහපතීනි! සිලවා, සිල්වත්වූ; සීලසම්පන්නෝ, සීලසම්පන්නා තෙමෙ; i අප්පමාදාධිකරණං, අප්‍රමාදකරණයෙන්; මහන්තං භොගක්ඛන්ධං, මහත් භොග රාශියට; අධිගච්ඡති, පැමිණේ; අයං, මෙතෙම; සීලවතෝ සීලසම්පදාය, සිල්වත්හුගේ ශීලසම්පත්තියෙහි; පඨමෝ ආනිසංසෝ, පළමුවන අනුසසියි; පුනචපරං, නැවත අනික් අනුසසකුදු කියමි;-(මතු සතර වාරයෙහි කී නසින්ම අර්ථ දතහැකිබැවින් නොකී පෙදෙහිම අර්ථ ලියමු.) ii කල්‍යාණෝ කිත්තිසද්දෝ අබ්භුග්ගච්ඡති, 'මෙසේ සිල්වත' 'මෙසේ කල්‍යාණධර්ම'යයි සුන්දරවූ සත්‍යතිඝොෂය නැඟෙ; (=ලොව පැතිරෙය යන අර්ථයි.) iii යං යදෙව පරිසං උපසඞ්කමති, යම් යම් පිරිසකට එළඹේ නම්; යදි ඛත්තියපරිසං, ඉදින් රජපිරිසකට වත්; යදි බ්‍රාහ්මණපරිසං, ඉදින් බමුණුපිරිසකට වත්; යදි ගහපතිපරිසං, ඉදින් ගෘහපති පිරිසකටවත්; යදි සමණපරිසං, දින් මහණ පිරිස කටවත් එළඹේ නම්; විසාරදෝ, නම්කෙරෙහි කිසිවරදක් නොදක්නේ විසාරදවූයේ=නිර්භීයවූයේ; අමඞ්කුභූතෝ, මෙලෙච්ඡුවූයේ; උපසඞ්කමති, එළඹේ; iv අසම්මූළ්හෝ, මරණසමයෙහි කුශලකර්මාදීන්ම වැටහෙනබැවින් මුළානොව-ප්‍රසන්නවූ සිත්ඇතිව; කාලඞ්කරොති, කාලක්‍රියා කෙරේ; v කායස්ස භෙදා, උපාදින්නාකඛන්ධ සඞ්ඛ්‍යාත කාය යාගේ පරිත්‍යාගයෙන්=ජීවිතෙන්ද්‍රියයාගේ උපච්ඡේදයෙන්; පරම්මරණා, මරණින් මත්තෙහි; සුගතිං, සුන්දරගතිඇතිභෙසින් සුගතිනම්වූ; (මනුෂ්‍යගතිය ද සඞ්ග්‍රහ වේ.) සග්ගං ලොකං, දෙවගතිසඞ්ඛ්‍යාත ලොක යෙහි; උපපජ්ජතීති, උපදියි. (දෙවගතිතොමෝ[1] "රූපාදිහි විසයෙහි සුට්ඨු අඥෙහානි සඥෙහා"යි, **ලොකියති**[2] එක්ව උල්ලාරං සුඛඤ්ච ඵලඤ්ච ලොකො"යි ද කියනු ලැබේ. "අපරෙපි ආනිසංසා වුත්තා"යි යොදනු.)

භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, මහණතෙමෙ; සබ්‍රහ්මචාරිනං, සබ්රම්[3]චරයට; පියොවස්සං, ප්‍රියවෙම්වයි; (=ප්‍රේමකටයුතු වෙම්වයියන අර්ථයි;) මනාපෝ ව, සබ්රම්චරුන් සිත් වඩම්වයි; (=මෙත්සිතින් පැතිර විය හෙම්වයි යන අර්ථයි;) ගරු ච, පහණසතක් මෙන් ගුරු වෙම්වයි;

---

1. ගතිතොමෝ-හැම. 2. ලොකයති-මූ. ස. II. 3. සබ්‍රම්-හැම. a. b. ඵ. මූ. බ.

භාවනීයෝ ච, මේ ඇවැත්[1] දතයුත්ත දන්නී-දැක්කයුත්ත දක්කී සි මෙසේ සම්භාව්‍ය වෙම්වයි; ආකඞ්ඛෙය්‍ය වෙ,ඉදින් කැමැත්තේ විනම්; සීලෙසෙවස්‍ස පරිපූරකාරී, සතරපිරිසුදුසිල්හිම සම්පූණීකාරී වන්නේය යන; ආදිනානයෙන, මේ ආදි නයින්; (ආදි ග්‍රහණයෙන් "අඡ්ඣත්තං චෙතොසමථමනුයුත්තෙහා අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රූහෙතා සුඤ්ඤාගාරානං" යන මේ ආදිවූ ශීල සූත්‍රාගතවූ[a] සතලොස් සිලානිසංසයෝ සඞ්ගෘහීත වෙත්.) පියමනාපතාදයො,[2] ප්‍රියමනාපතාදිවූ; ආසවක්ඛයපරියොසානා අග්‍ර වක්‍ෂය පර්‍යවසානවූ; අනෙකෙ සීලානිසංසා වුත්තා, නොඑක් සිලානිසංසයෝ කියනලදහු; එවං, මෙසේ; අවිප්පටිසාරාදි අනෙකගුණානිසංසං සීලං, අවිප්‍රතිසාරාදි අනෙකගුණයන් අනුසස් කොට ඇත්තේයි ශීලය; අපිච, අනිකෙකුදු;-(=තවද සීලානිසංසයෝ ඇත යන අර්ථයි.)

(i) 'සාසනෙ'යි යනු ලොවීලොවුතුරා ගුණ එළවන මේ ශාස්තෘ ශාසනයෙහි; කුලපුත්තානං,ආර්‍යකුලපුත්‍රයන්ගේ; යං විනා පතිට්ඨා නත්‍ථි, යම් ශීලයක් විනා පිහිට නැද්ද; තස්‍ස චිලස්‍ස, මෙසේ අනුසස් ඇති ශීලයාගේ; ආනිසංසපරිච්ඡෙදං, අනුසස්හි පමණ; කො වදෙ, කවරෙක් කියන්නට සමර්‍ථ වෙද?

(ii. iii) ගඞ්ගා,ගඞ්ගානම් නදීද; යමුනා වාපි,යමුනානම් නදීද; සරබූ[3] වා, සරයූ[4]නම් නදීද; සරස්සතී, සරස්වතී නම් නදිද;අචිරවතිනිහනගා වා, අචිරවතීනම් නදීද; මහීවාපි මහානදි, මහි නම් මහානදීද; (වා ශබ්දයෙන් අනුක්තවන්ද්‍රභාගාදිහු ද යන මෙ සියලු නදීහු[b]; "තං මලං විසොධෙතුං න සක්කුණන්ති"යි යොදනු.) ඉධ, මේ ලොකයෙහි; පාණීනං සත්තානං, ප්‍රාණීසඞ්ඛ්‍යාතසත්ත්වයන්ගේ; යං මලං, යම් රාගවෙෂාදි මලයක්; වෙ, එකාන්තයෙන්; සිලජලං විසොධයති, ශීලනැමැති ජලය විශුද්ධ කෙරේද; තං මලං, ඒ මලය; විසොධෙතුං, ශුද්ධ කරන්නට; න සක්කුණන්ති, නො පොහොසත්හු.

(iv. v.) සුරක්ඛිතං, මනා කොට රක්‍ෂාකරණ ලද; අරියං, විශුද්ධවූ; අච්චන්තසීතලං, අත්‍යන්තයෙන් සිහිල්වූ; ඉදං සීලං, මේ ශීලය තෙමෙ; ඉධ, මේ ලොකයෙහි; සත්තානං, ප්‍රාණීසඞ්ඛ්‍යාත සත්ත්වයන්ගේ; යං පරිළාහං සමෙති, යම් පරිදාහයක් සන්හිදුවා ද; තං, ඒ පරිදාහය; සජ්ජලදා වාතා,[c]මෙඝ මාරුතයෝ ද; න සමයන්ති, නොසන් හිදුවත්; හරිවන්දනං, හරිවන්දන ද; න චාපි සමයති, නොම සන්හිදුවා; හාරා, මුක්තාහාරයෝද; නෙව සමයන්ති, නොම සන්හිදුවත්; මණයො, වෛදූර්‍යී මණීහු ද; නසමයන්ති, නොසන්හිදුවත්; චන්ද කිරණඞ්කුරා, සඳරැස්හු ද; න සමයන්ති, නො සන්හිදුවත්. c

(vi) යො, යම් ශීලගන්ධයෙක්; (ශීලසමුත්‍ථිත කීර්තිශබ්දය මනොහර බැවිනුදු දික්හි පැතිරෙණ බැවිනුදු "සීලගන්ධ" යයි කියනලදී.) සමං,

1. ඇසුවත්-ඉ.I&II. ආවත්-මු. ඉ.I & II. 2. පියමනාපාදයො-ඉ. II.-
3. 4 සරහූ-ඉැම්. a. b. c, ඒ. ඉ. ම. මු. ඉ. I. & II.

සමව; අනුවාතෙ ච, යටසුළඟට ද; පටිවාතෙ ච; උඩුසුළඟට ද; වායති, හමා ද; සීලගන්ධසමෝ ගන්ධෝ, ඒ ශීලගන්ධය හා සමවූ ගන්ධයෙක්; කුතෝ නාම භවිස්සති, කොහි නම් වේ ද?.

(vii) සඝාරොහණ, සවර්ගයට නැඟෙන්නට; සීලසමං, ශීලය හා සමවූ; අඤ්ඤං සොපානං කුතෝ, අනික් හිණෙක් කොහි ද; නිබ්බාණ නගරස්ස, නිර්වාණපුරයට; පවෙසනෙ, වදනා තන්හි නොහොත්: ප්‍රවේශක්‍රියමාණෙහි; [1] වාරං වා පන අඤ්ඤං සීලසමං කුතෝ, අනික් ශීලය හා සමාන දෙරෙක් කොහි ද?

(viii) සීලභූසන, ශීලාභරණයෙන්; භූසිතා, අලඞ්කෘතවූ; යතිනෝ, භික්ෂූහු; යථා සොභන්ති, යම්සේ හොබිද්ද; මුත්තාමණිවිභූසිතා, මුතු මැණික් විභූෂිතවූ; රාජානෝ, රජදරුවෝ ද; එවං න සොභන්ති; එසේ නොහොබිත්.

(ix) සීලං, ශීලයතෙමේ; සීලවතං, සිල්වත්නට; සද්ද, හැමකල්හිම; අත්තානුවාදාදිභයං, තමාම තමාට [2] නිග්ගහකිරීමෙහි උපදනා භය; (ආදිශබ්දයෙන් [පරානුවාදභය[3]] දණ්ඩභය-දුග්ගතිභය ගැණේ) සබ්බ සෝ, සර්වාකාරයෙන්ම; විද්ධංසයති, නසා; කිත්තිං, කීර්තිද; භාසඤ්ච, හෂිද; ජනෙති, උපදවා.

(x) ගුණානං මූලභූතස්ස, ගුණයන්ට මුල්වූ; දෝසානං බලඝාතිනෝ, දෝෂයන්ගෙ බලයසි කියනලද ව්‍යතික්‍රම නසන්නාවූ; ("දෝසානං බලං නාම වත්ථුඤ්ඤාවාරෝ; තං තෙසං කාතුං අදෙන්තං සීලං දෝසානං බලං ඝාතෙතීති[4] වෙදිතබ්බං-"

["කෙළාශාඛ්කුරං න ප්‍රතනොති ශීලං
බීජාඞ්කුරං කාල ඉවාතිවෘතකං
ඉවෙව හි ශීලෙ පුරුෂස්‍ය දෝෂා
මනස්‍යලජ්ජා ඉව ධර්මියනති"[a]යි කියේමැනෝ.)

සීලස්ස, ශීලයාගේ; ආනිසංසකථාමුඛං, ආනිසංස කථාමාරය; (=අනුසස් කීමට දෙරය ඇත අර්ථයි;) ඉති විඤ්ඤෙය්‍යං, මෙසේ දතයුතු.

සීලානිසංස කථා නිමි.

6.(ඛ) ("කතිවිධඤ්චිතං සීලන්ති යං වුත්තං තත්‍ර ඉදං විස්සජ්ජනං"යි යොදනු.) තාව, පළමු කොට; සබ්බමෙව ඉදං[i] සීලං, සියලු මේ ශීලයම; i. අත්තනෝ සීලනලක්ඛණෙන, තමාගෙ ශීලන සඞ්ඛ්‍යාත සභාවයෙන්; එකවිධං, එකප්‍රකාර වේ-ii. චාරිත්ත චාරිත්තවසෙන, චාරිත්‍රශීල-වාරිත්‍ර ශීල වශයෙන්; දුවිධං, ද්විප්‍රකාරවෙ; තථා, එසේම; ආභිසමාචාරික ආදිබ්‍රහ්මචරියකවසෙන, ආභිසමාචාරිකසීල-ආදිබ්‍රහ්මචරියක සීල වශයෙනුදු; විරති අවිරති වසෙන, විරතිශීල-අවිරතිශීල වශයෙනුදු; නිස්සිතානිස්සිතවසෙන, නිඃශ්‍රිතශීල-අනිඃශ්‍රිතශීල වශයෙනුදු; කාල

1. ප්‍රවෙශක්‍රියමාණෙහි ඉත්‍යාත්‍ය-ඉත්ත, ස. II. ප්‍රවෙශයෙහි ඒයාඛ්‍යෂේ පෙණේ.
2. තමාතමාට, ස. II. 3. පොත්හි නොපෙණේ. 4. බලඝාතීති. ස. II.

පරියන්තසීල ආපාණකොටිකසීලවසෙන, කාලපරියන්තසීල-ආපාණකොටිකසීල වසයෙනුදු; සපරියන්තාපරියන්තවසෙන, සපරියන්තසීල-අපරියන්තසීල වසයෙනුදු; ලොකිය ලොකුත්තර වසෙන ච, ලෞකික සීල-ලොකොත්තරසීලවශයෙනු දු; ත්‍රිප්‍රකාර වේ.-

(iii) තිවිධං හීන මජ්ඣිම පණීත වසෙන, හීනසීල-මධ්‍යමසීල-ප්‍රණීත සීල වශයෙන් ත්‍රිප්‍රකාර වෙ; තථා, එසේම; අත්තාධිපතෙය්‍ය ලොකාධිපතෙය්‍ය ධම්මාධිපතෙය්‍යවසෙන, ආත්මාධිපතිසීල-ලෝකාධිපතිසීල-ධර්මාධිපතිසීලවශයෙන්ද; පරාමට්ඨාපරාමට්ඨපටිපස්සද්ධි වසෙන, පරාමෘෂ්ටසීල-අපරාමෘෂ්ටසීල-ප්‍රතිප්‍රශ්‍රබ්ධිසීල වශයෙන් ද; විසුද්ධා විසුද්ධවෙමතිකවසෙන, විසුද්ධසීල-අවිසුද්ධසීල-වෙමතිකසීල වසයෙන් ද; සෙඛාසෙඛනෙවසෙඛනාසෙඛවසෙන ච, ශෛඛසීල-අශෛඛසීල-නෙවසෙඛනාසෙඛසීල වසයෙනුදු ත්‍රිප්‍රකාර වෙ.-

(iv) චතුබ්බිධං හානභාගිය ඨිතිභාගිය විසෙසභාගිය නිබ්බෙධභාගිය වසෙන, හානභාගිය ශීල-ස්ථිතිභාගිය ශීල-විශෙෂභාගිය ශීල-නිර්භේධභාගිය ශීල වශයෙන් චතුර්විධ වෙ; තථා, එසේම; භික්ඛු භික්ඛුණී අනුපසම්පන්න ගහට්ඨ සීලවසෙන, භික්ෂුශීල-භික්ෂුණීශීල-අනුපසම්පන්නශීල-ගෘහස්ථශීල වශයෙනුදු; පකතිආචාර ධම්මතාපුබ්බහෙතුකසීලවසෙන, ප්‍රකෘතිශීල-ආචාරශීල-ධර්මතාශීල-පූර්වහෙතුකශීල-වශයෙන් ද; පාතිමොක්ඛසංවර ඉන්ද්‍රියසංවර අජීවපාරිසුද්ධි පච්චයසන්නිස්සිතසීල වසෙන ච, ප්‍රාතිමොක්ෂසංවරශීල-ඉන්ද්‍රියසංවරශීල - ආජීවපාරිශුද්ධිශීල - ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීල වශයෙන් ද චතුර්විධ වේ.-

(v) පඤ්චවිධං පරියන්තපාරිසුද්ධි සීලාදිවසෙන, පර්‍යන්තපාරිශුද්ධිශීලාදි වශයෙන් පඤ්චවිධ වෙ; වුත්තමපි චෙතං පටිසම්භිදායං, ප්‍රතිසම්භිදායෙහි ද මෙම කියනලදී; පඤ්චසීලානි, ශීලයෝ පස්දෙනෙකි; පරියන්තපාරිසුද්ධිසීලං, පර්‍යන්ත පාරිශුද්ධිශීලය; අපරියන්තපාරිසුද්ධිසීලං, අපර්‍යන්ත පාරිශුද්ධිශීලය; පරිපුණ්ණපාරිසුද්ධිසීලං, පරිපූර්ණපාරිශුද්ධිශීලය; අපරාමට්ඨ පාරිසුද්ධි සීලං, අපරාමෘෂ්ටපාරිශුද්ධිශීලය; පටිපස්සද්ධිපාරිසුද්ධි සීලන්ති, ප්‍රතිප්‍රශ්‍රබ්ධිපාරිශුද්ධිශීලයයි මෙසේ පඤ්චප්‍රකාර වෙ; තථා පහාණ වෙරමණිචෙතනා සංවරාවීතික්කමවසෙන, ප්‍රහාණශීල - වෙරමණිසීල - චෙතනාශීල -සංවරශීල-අව්‍යතික්‍රමශීල වශයෙන් එසේම පඤ්චවිධ වේ.-

7 (5) i. තත්‍ථ, එහි; එකවිධකොට්ඨාසෙ අත්‍ථෝ, එකප්‍රකාරඅංශය අර්‍ථ; වුත්තනයෙනෙව, "සීලනට්ඨෙන සීලං" යනාදීන් යටකී න්‍යායින්ම; වෙදිතබ්බා, දතයුතු.

(ii. I.) දුවිධකොට්ඨාසෙ, ත්‍රිප්‍රකාර කොටස; භගවතා, භගවත්හු විසින්; ඉදං කත්තබ්බන්ති, මෙ ආනිසංසවාරිකය කටයුතුයයි; යං පඤ්ඤත්ත සික්ඛාපදපූරණං, පණවනලද ශික්ෂාපදශීලයාගේ යම්පිරීමෙක්ඇද්ද;

තං චාරිත්තං, හේ චාරිත්‍රතම; යං, යමෙක්; ඉදං නකත්තබ්බන්ති; මේ දුශ්චරිතය නොකටයුතුයයි; පටික්ඛිත්තං, ප්‍රතික්ෂේප කරණ ලදද; තස්ස අකරණං, ඒ දුශ්චරිතයාගේ නොකිරීම; චාරිත්තං, චාරිත්‍රතම්; තත්‍ර, ඒ චාරිත්‍ර චාරිත්‍ර ශබ්දදෙක්හි; අයං වචනත්ථෝ, මේ වචනාර්ථයි; තස්මිං සීලෙ, ඒ ශීලයෙහි; චරන්ති, හැසිරෙත්; පරිපූරකාරිතාය, සම්පූර්ණකාරී බැවින්; පවත්තන්තීති, පවතිත්නුයි; චාරිත්තං, චාරිත්‍රතම්; චාරිතා, මෙ නොකට යුතුයයි වැළකූ ආකල්පය; තෙන, ඒ චාරිත්‍රය[1] කරණකොටගෙණ; තායන්තීයි සේසේ; රක්ඛන්තීති, රකිත්නුයි; චාරිත්තං, චාරිත්‍රතම්; තත්ථ, එදෙක්හි; චාරිත්තං, චාරිත්‍රය; සද්ධාවිරියසාධනං, (ශ්‍රද්ධාරහිතය ද-කුසීතය ද වන්පිළිවෙත් නොපුරණ බැවින්) ශ්‍රද්ධාවෙන් හා විය්‍යයෙන් සැදිය යුත්තේයි; සද්ධා සාධනං චාරිත්තං, චාරිත්‍රශීලය ශ්‍රද්ධාවෙන් [2]සැදිය යුතු.

(ii. 2.) අභිසමාචාරොති, අභිසමාචරණම්; උත්තමසමාචාරෙ, අධිශීල ශික්ෂාපය්‍යාපනත බැවින් උත්තමසමාචාරයයි; අභිසමාචාරොව, අභිසමාචාරය ම; ආභිසමාචාරිකං, ආභිසමාචාරික නම් වෙ; (වෙනයිකො, යනු මෙන් සවාර්ථයෙහි "ණ්ඨික" ප්‍රත්‍යය දතයුතු.) අභිසමාචාරං වා ආරබ්භ පඤ්ඤත්තං, (උත්තරාෂ්ටනිදේශයෙන් මාඝීහශීල ඵලශීල අභිසමාචාර නම්)-ඒ උදෙසා=තත්ප්‍රයොජන කොට පණවන ලද්දේ; ආභිසමාචාරිකං, ආභිසමාචාරික නම්; ආජීවට්ඨමකතෝ, (සුපරිශුද්ධ ත්‍රිවිධකායකර්මය හා චතුර්විධ වාක්කර්මය හා පරිශුද්ධ ආජීවය යන මෙ) ආජීවාෂ්ටමකශීලයා කෙරෙන්; අවසෙසසීලස්ස, අවශෙෂශීලයට; එතං අධිවචනං, "ආභිසමාචාරිකය" යනු මෙ නමෙකි;-මඝබ්‍රහ්මචරියස්ස, (ශ්‍රෙෂ්ඨබැවින් මාඝීහය මාඝීහබ්‍රහ්ම චර්‍ය්‍ය නම, ඒ) මාඝීහබ්‍රහ්මචර්‍ය්‍යයට; ආදිභාවභූතන්ති, ආදියෙහි ඉපදවිය යුතුනුයි; ආදිබ්‍රහ්මචරියකං, ආදිබ්‍රහ්මචරියක නම්; ("මඝබ්‍රහ්මචරියස්ස ආදිම්හි භාවෙතබ්බතං න්‍හාදෙතබ්බතං පත්ථනත්ති[3] ආදිභාවභූතං" a යනු මේ.) ආජීවට්ඨමකසීලසෙඛතං අධිවචනං, ආජීවාෂ්ටමක ශීලයට මෙ නමෙකි; තං හි, හෙතෙම; මඝස්ස ආදි භාවභූතං, මාඝීහයට ආදියෙහි ඉපදවිය යුතු වී;-(දෙශනාක්‍රමයෙන් සම්‍යග්දෘෂ්ටිය ආදියයි-ප්‍රතිපත්ති ක්‍රමයෙහි වනාහි ප්‍රාතිමෝක්ෂ සංවර ශීල නැති ගිහි මැස්සනුදු අවශ්‍යයෙන් පිරියයුතු බැවින් ආජීවය අටවනු කොට ඇති ශීලය ආදි බැවින් කිහ "ආදිභාවභූතං"යි.) ආදිම්හියෙව පරිසොධෙතබ්බතෝ, ආදියෙහිම පිරිසුදු කටයුතු හෙයිනි; තෙනාහ,b එහෙයින් ම වදළහ; "අසස, ඔහුගෙ; පුබ්බෙව, පූර්‍වයෙහිම; කායකම්මං, කායකර්මය ද; වචීකම්මං, වාක්කර්මය ද; ආජීවො, ආජීවය ද; සුපරිසුද්ධා හොතී"ති, සුපරිසුද්ධ වෙයි; යානි වා සික්ඛාපදානි, දෙශනාගාමිවූ දුශ්කෘත දුර්භාෂිතවූ හෝ යම් ශික්ෂාපද කෙතෙක්; ඛුද්දානුඛුද්දකානීති වුත්තානි, ක්ෂුද්‍රානුක්ෂුද්‍රශික්ෂාපදගති

1. චාරිත්‍ර. මූ. ස. I & II.
2. සැදියයුතු. මූ. ස. I.
3. පවත්තං. වී. සී.
a. b, උ. ඉ. ඕ.

කියනලදහුද; ඉදං ආභිසමාචාරිකං සීලං, මෙ ආභිසමාචාරිකශීල නම; යෙසං ආදිබ්‍රහ්මචරියකං, යෙස්ස ආදිබ්‍රහ්මචරියක සීල නම්; උභතොවිභඞ්ගපරියාපන්නං වා, උභතොවිභඞ්ගපරියාපන්නසීලය, හෝ; ආදිබ්‍රහ්මචරියකං, ආදිබ්‍රහ්මචරියක නම; ඛන්ධකවත්තපරියාපන්නං, (ආභිසමාචාරිකං) සකඛන්ධවත්ත පඤ්ඤාපනා ශීලය; ආභිසමාචාරිකං, ආභිසමාචාරික නම්; තස්ස සම්පත්තියා, ආභිසමාචාරික ඒ ශීලයාගේ සම්පත්තීන් (පිරීමෙන්); ආදිබ්‍රහ්මචරියකං සම්පජ්ජති; ආදිබ්‍රහ්මචරියකස්ස පිරේ; (යමෙක් ලහුකවූ අල්පසාවද්‍යයන් දුරු කෙරේ නම් හෙතෙම ගුරුවූ මහාසාවද්‍යයන් දුරුකෙරෙයි යනුයෙහි කියයුතුම නැත යන මෙ අර්ථය ව්‍යතිරෙකවශයෙන් දක්වන්නේ "නෙනෙවංහ" යනාදි කී.) භික්ඛවෙ, මහණෙනි! සො භික්ඛු, ඒ මහණ; ආභිසමාචාරිකං ධම්මං අපරිපූරෙඬා, ආභිසමාචාරිකශීලය නො පුරා; ආදිබ්‍රහ්මචරියකං ධම්මං පරිපූරෙස්සතීති, ආදිබ්‍රහ්මචරියක සීලය පුරන්නේයයි; නෙතං ඨානං විජ්ජතීති, මෙ කාරණ නැතැයි; (ක්ෂුද්‍රාපත්ති මඬනසුලු ඉහි පරිවයෙන් මහත් ආපත්ති දු මඬනා බැවිනු දු ආභිසමාචාරික සිල් පුරතු දු ඒ සිල් සමාධිවිපස්සනාවට පදස්ථාන නො වන්නෙනු දු "නෙතං ඨානං විජ්ජති" යුහු.)=පෙ=

(ii. 3.) **තතියෂද්‍දුකෙ**-යන්නෙහි; පාණාතිපාතාදීහි වෙරමණිමත්තං, ප්‍රාණාතිපාතාදීන්කෙරෙන් විරමණමාත්‍රය; විරතිසීලං, විරතිශීලනම්; සෙසවෙතනාදි අවිරතිසීලන්ති, සෙසු චෙතනාදි අවිරති ශීල නම්.

(ii. 4.) **චතුත්ථදුකෙ**,-යන්නෙහි; නිස්සයොති, නිශ්‍රය නම්; වෙ නිස්සයා, නිශ්‍රයයෝ දෙදෙනෙකි; තණ්හානිස්සයො ච දිට්ඨිනිස්සයො ච, තෘෂ්ණානිශ්‍රයය-දෘෂ්ටිනිශ්‍රය යි; තත්ථ, එදෙක්හි; යං යම් ශීලයක්; අහං ඉමිනා සීලෙන, මම මේ ශීලයෙන්; දෙවො වා, ශක්‍රසුයාමාදි දෙවියෙක් [1]හෝ වෙමි; දෙවඤ්ඤතරො වා, සෙසු ශක්‍රාදීන් සේ නොව එක්තරා දෙවියෙක් හෝ වෙමි යි; එවං, මෙසේ; භවසම්පත්තිං ආකඞ්ඛමානෙන, භවසම්පත්ති කැමැත්තහු විසින්; පවත්තිතං, පවත්වන ලදද; ඉදං, මේ; **තණ්හානිස්සිතං**, තෘෂ්ණානිශ්‍රිත නම; යං, යම් ශීලයක්; සීලෙන සුඛිති එවං සුඛිදිට්ඨියා පවත්තිතං, සිලින් සංසාර සුඛියයි මෙසේ සුඛිදෘෂ්ටින් පවත්වනලද ද; ඉදං, මේ ශීලය; **දිට්ඨි නිස්සිතං**, දෘෂ්ටිනිශ්‍රිතශීල නම්; යම්පන ලොකුත්තරං, යම් ලොකොත්තර ශීලයෙක් ඇද්ද; තඤ්ඤෙව සබ්බාරහුතං, ඒ ලොකොත්තර ශීලයට ම කාරණවූ; යඤ්ච ලොකියං, යම් ලෞකික ශීලයෙක් ඇද්ද; ඉදං **අනිස්සිතං**, මේ අනිශ්‍රිතශීල නම;=පෙ=

(ii. 5.) **පඤ්චමදුකෙ**, යන්නෙහි; කාලපරිච්ඡෙදං කත්වා, "ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං" යනාදීන් කාලවශයෙන් පරිච්ඡෙද කොට; සමාදින්නං සීලං, සමාදන්වතලද ශීලය; **කාලපරියන්තං**, කාල

---

1 දෙවියෝ මු. සී. I. & II.

පර්‍යන්ත නම්; යාවජීවං සමාදියිත්වා, යාවජීවයෙන් සමාදන්ව; තථෙව පවත්තිතං, එසේම පවත්වනලද්දේ, **ආපාණකොටිකං**, ආපාණකොටික නම්.

(ii. 6.) **ඡධාතුකෙ**, සවතදුකයෙහි; ලාභයසඤාතිඅඞ්ගජීවිතවසෙන, (කාලපරිච්ඡේද නො කොට සමාදන් වූ ශීලය අනන්තරයෙහි විච්ඡින්නවූයේ ද සමාපත්තිවිරති වසයෙන් උපන්නවුන්ගේ රක්ෂණ වර්ජන වශයෙනුදු) ලාභ-යස ඤාති අඞ්ග-ජීවිතයන්ගේ අවිනාශවශ යෙනුදු; දිට්ඨපරියන්තං, දෘෂ්ටපර්‍යන්තවසින ඇති ශීලය; **සපරියන්තං** නාම, සපර්‍යන්තශීල නම; විපරීතං **අපරියන්තං**, ලාභාදි විසින් අදෘෂ්ට පර්‍යන්තවසින ඇති ශීලය; අපර්‍යන්තශීල නම; =පෙ= කතමන්තං සීලං සපරියන්තං, කවර හේ ශීලයෙක් සපර්‍යන්ත නම් ද; "ලාභ පරියන්තං සීලං අත්ථි"යි (යොදනු.) ලාභපර්‍යන්ත ශීලයෙකුදු ඇත; (සෙසු පෙදෙහි දු මෙසේම අර්ථ බඳිනු.) කතමන්තං සීලං ලාභපරියන්තං, කවර හේ ශීලයෙක් ලාභපර්‍යන්ත වෙ ද? ඉධ, මෙහි; එකච්චෝ, එකෙක්; ලාභහෙතු, ලාභහෙතුවෙන්; ලාභපච්චයා, ලාභප්‍රත්‍යය යෙන්; ලාභකාරණා, ලාභකාරණයෙන්; (හෙතු ප්‍රත්‍යය දෙදෙනා[a] මෙතැන එකාර්ථ බව භගවන පිණිස "ලාභකාරණා"යි කිහු.) යථා සමාදින්නාසික්ඛාපදං විතික්කමති, (මෙතෙක් දවස් රකිම්යි කාල පරිච්ඡේද කොට හෝ නොකොට හෝ මෙතෙක් ශික්ෂාපද රකිම් යි ශික්ෂාපරිච්ඡේද කොට හෝ නො කොට හෝ) සමාදන්වනලද ශික්ෂාපදය ඉක්මෙන්නේ වීනම්; ඉදං තං සීලං **ලාභ පරියන්තන්ති**, මේ ශීලය ලාභපර්‍යන්තයයි; එතෙනෙව උපායෙන, මෙම උපායයෙන්; ඉතරානි පි (පදානි) විත්ථාරෙ තබ්බානි, සෙසු පදයෝද විස්තර කටයුත්තාහුයි;-අපරියන්තවිස්සජ්ජනෙපි, අපර්‍යන්තශීල විසර්ජන යෙහි දු; වුත්තං, කියනලදී; කතමන්තං සීලං න ලාභපරියන්තං, කවර ශීලයෙක් ලාභපර්‍යන්ත නො වේ ද; ඉධ, මෙහි; එකච්චෝ, එකෙක්=පෙ=යථා සමාදින්නා සික්ඛාපද, කී පරිද්දෙන් සමාදන්වන ලද ශික්ෂාපදය; විතික්කම විත්තමපි න උපපාදෙති, ව්‍යතික්‍රම පිණිස සිත ද නො උපදවන්නේය; කිං සො විතික්කමිස්සති, හේ ව්‍යතික්‍රම කෙරෙයි යනු කිම; (=ව්‍යතික්‍රම නො කෙරේමය යන අර්ථයි;) ඉදන්තං සීලං, මේ ශීලය; **න ලාභ පරියන්තන්ති**, ලාභ පර්‍යන්ත නො වේ.

(එතෙනෙව උපායෙන, මෙම උපායයෙන්; ඉතරානිපි, සෙසු පද යෝද විත්ථාරෙතබ්බානි විස්තරකටයුත්තාහුයි.[1])

එවං, මෙසේ, සපරියන්තාපරියන්තවසෙන, සපර්‍යන්ත-අපර්‍යන්ත වශයෙන්; දුවිධං, (ශීලය) දෙවැදෑරුම්[2])

---

1. 2. මේපාඨ පොත්හි නොපෙනේ.

(ii. 7.) **සත්තමඤ්ඤකෝ**, සත්වන චිතයෙහි; සබ්බම්පි සාසවං සීලං, සියලු සාශ්‍රව ශීලයම; **ලෝකියං**, ලෞකික නම; (තමා අරමුණුකරණ ආස්‍රවයන් හා සමග පවත්නෙන් ත්‍රෛභූමික ධර්මයෝ සාසවනම-තත්පරයීපන්න බැවින් ශීලය ද සාසව නමැයි දත්තේ.) අනාසවං, අනාස්‍රව ශීලය; **ලෝකුත්තරං**, ලොකොත්තර නම; තත්, එ දෙක්හි; ලෞකියං, ලෞකික ශීලය; භවවිසෙසාවහං හොති, සුගතියෙහි ම උපදවන බැවින් භවවිශෙෂය එළවන්නෙය; භවනිස්සරණඤ්ච සම්භාරෙ, නිවන්හි අදහසින් රක්නාහට විදර්‍ශනාපාදක වන බැවින් භවනිර්‍හරණයට ද ප්‍රත්‍යය වේ; (=නිර්‍හරණයට ද උපනිශ්‍රය වේය යන අර්‍ථයි) යථාහ, [1] වදලේමය; විනයො, විනයතෙමේ; සංවරත්ථාය, සංවරය පිණිස වෙයි; (=සංවරයට උපනිශ්‍රය වෙයි යන අර්‍ථයි. මෙහි විනය පෙළ හෝ ඉහි ආ සිඛපද හෝ විනය නමි.) සංවරො, සංවරය තෙමේ; අවිප්පටිසාරත්ථාය, අවිප්‍රතිසාරය පිණිස වෙ; අවිප්පටිසාරො, අවිප්‍රතිසාරය තෙමේ; පාමොජ්ජත්ථාය, ප්‍රාමොද්‍යය පිණිස වෙ; (තරුණප්‍රීතිය ප්‍රාමොද්‍යනමි. බලවත් ප්‍රීතිය ප්‍රීති නම්-ශීලයෙහි කලඛකනැති බැවින් ම ශීලය ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නහු සිත පිඛා තොවන්නෙන් "සංවරො පාමොජ්ජත්ථාය" යි කිහු.) පාමොජ්ජං, ප්‍රාමොද්‍යය; පිතත්ථාය, ප්‍රීතිය පිණිස වෙ; පිති, ප්‍රීතිතොමෝ; පස්සඛත්ථාය, ප්‍රීතීන් පිරුණුබැවින් සන්හිදීම පිණිස වෙ; පස්සඛි, ප්‍රශ්‍රබ්ධිය; සුඛත්ථාය, සුව පිණිස වෙ; සුඛං, සුඛය; සමාධත්ථාය, සමාධිය පිණිස වෙ; (නාමරූප පරිග්‍රහයෙන් පෙරටු ක්‍ෂණිකසමාධිය ද අර්‍ථාසමාධිය පිණිස වේය යන අර්‍ථයි.) සමාධි, සමාධිතෙමේ; යථාභූතඤාණදස්සනත්ථාය, සප්‍රත්‍යයනාමරූපදර්‍ශනය පිණිස- තද ධිෂ්ඨාන තරුණවිදර්‍ශනාව පිණිස හෝ වේ; යථාභූතඤාණදස්සනං, යථාභූතඥානදර්‍ශනය; නිබ්බිදත්ථාය, නිර්‍වේදඥානය පිණිස වෙ;(මෙයින් බලවත් විදර්‍ශනා කිහු.) නිබ්බිදා, නිර්‍වේදඥානය තෙමේ; විරාගත්ථාය, මාර්‍ගඵල පිණිස වෙ; විරාගො, විරාගයතෙමේ; විමුත්තත්ථාය, අර්‍හත්ඵල විමුක්තිය පිණිස වෙ;විමුත්ති,විමුක්තිතොමෝ;විමුත්තිඤාණදස්සනත්ථාය, ප්‍රත්‍යවෙක්‍ෂාඥානය පිණිස වෙ; විමුත්තිඤාණදස්සනං, විමුක්තිඥානදර්‍ශනය; අනුපාදා පරිනිබ්බාණත්ථාය, අනුපාදා පරිනිර්‍වාණය පිණිස වෙ; යදිදං,යම් මේ; අනුපාදාචිත්තස්ස විමොක්ඛා,[1] අනුපාදාචිත්තවිමොක්‍ෂයෙක් ඇද්ද; එතදත්ථා කථා, විනයකථාතොමෝ මේ අනුපාදා විමොක්‍ෂයම ප්‍රයොජන කොට ඇත්තීයි; එතදත්ථා මන්තනා, කල්‍යාකල්‍යවශයෙන් විනය විචාරණද මෙම ප්‍රයොජනකොට ඇත්තීයි; එතදත්ථා උපනිසා, "විනයො සංවරත්ථාය" යනාදි යථොක්ත කාරණපරම්පරාසඞ්ඛ්‍යාත උපනිශ්‍රය ද මෙම ප්‍රයොජන කොට ඇත්තීයි; එතදත්ථං සොතාවධානං, කන් තතු කිරීම (=ශ්‍රවණමය ඥානය යන අර්‍ථයි) මෙ ප්‍රයොජන කොට ඇත්තේයි:—

---

1 විමොඛො ස. II. & මූ. ස. I & II a. ඵ. ඉ. බ.

(සං. 20.) (මේහි "අනුපාදා චිත්තස්ස විමොක්ඛෝ" යනු මාර්ගය. මාර්ගය සිද්ධවන්නේ විමුක්තිය විමුක්තිඥානදර්ශනය අනුපාදා පරිනිර්වාණය යන මොවුන් සිද්ධවන බැවින් "එතදත්ථා කථා" යනාදි ඒ අනුපාදා විමෝක්ෂය පිණිසයයි කිහු, එසේ උවහොත් "විරාගත්ථාය" යනු යෙහිම නොසිටුවා "විරාගෝ විමුත්තත්ථාය" යනාදි කුමට කිහ යත්? පරමපරාපනිශ්‍රය නිෂ්ඨාවට පැමිණි තැන් දක්වනුපිණිස කිහු.)

ලොකුත්තරං, මාර්ගඵලසම්ප්‍රයුක්තආජීවාෂ්ටමකශීලය; භවනිස්සරණාවහං හොති, භවනිස්සරණය ඵලවයි; පච්චවෙක්ඛණඤාණස්ස ච භූමි හොති, ප්‍රත්‍යවෙක්ෂාඥානයට ද භූමි වේ; (මේහි මාර්ගශීලය භවනිස්සරණය ද කෙරෙයි- ප්‍රත්‍යවෙක්ෂාවට ද භූමි වෙයි. ඵල ශීලය ප්‍රත්‍යවෙක්ෂාවටම භූමි වේ.) එවං, මෙසේ; ලෝකියලොකුත්තරවසෙන, ලෞකික ලෝකොත්තර වශයෙන්; දුවිධං, දෙවැදෑරුම්.

8. (5. iii. I.) හීනෙඝු, ත්‍රිකයන් කෙරෙහි; පඨමත්තිකෙ, පළමුවන ත්‍රිකයෙහි; හීනෙන, හීනවූ; ඡන්දෙන, ඡන්දයෙන් හෝ; චිත්තෙන, සිතින් හෝ; විරියෙන, වීර්‍යයෙන් හෝ; වීමංසාය වා, ප්‍රඥාවෙන් හෝ; පවත්තිතං, පවත්වන ලද්දේ; හීනං, හීන නම; මජ්ඣිමෙහි ඡන්දාදීහි, මධ්‍යම වූ ඡන්දාදීන්; පවත්තිතං, පවත්වනලද්දේ; මජ්ඣිමං, මධ්‍යම නම්; පණීතෙහි, ප්‍රණීතවූ ඡන්දාදීන්; (පවත්තිතං,) පවත්වන ලද්දේ; පණීතං, ප්‍රණීතනම්;-

(සං. 21.) (මෙහි ඡන්දාදීන්ගේ හීන මධ්‍යම ප්‍රණීත බව හීනමධ්‍යම ප්‍රණීත අධිමුක්ති වශයෙන් වෙයි:- යම්සේ කම්මය ආයූහනවසයෙන් හීනාදි භෙදඝිනන වේ ද එසේම ඡන්දාදිනුදු ප්‍රවෘත්‍යාකාර වශයෙන් හීනාදි භෙදයෙන් භින්න වෙති. ඒ ඒ ප්‍රවෘත්‍යාකාරය ද අධිමුක්ති භෙදයෙනැයි දතයුතු.)

යසකාමතාය වා සමාදින්නං හීනං, කිත්තියෙහි (-සතුතියෙහි) අභිරතියෙන් සමාදන්වනලද්දේ හීන නම්; පුඤඤඵල කාමතාය මජ්ඣිමං, පුණ්‍යඵලයෙහි අභිරතියෙන් සමාදන්වනලද්දේ මධ්‍යම නම්; කත්තබ්බමේවිදනති, මේ කටයුතුමය; (එබඳුවෙක් මෙබඳුවෙක් සේ නම් නො කෙරේදැයි) අරියභාවං නිස්සාය, මනාබව ආශ්‍රය කොට; සමාදින්නං පණීතං, සමාදන්වනලද ශීලය ප්‍රණීත නම්; අහමසම් සීලසම්පන්නොනා, මම සීලසම්පන්නයෙමි; ඉමෙ පන අඤඤෙ භික්ඛූ, මෙ සෙසු භික්ෂූහු; දුස්සීලා, දුස්සීලයහ; පාපධම්මාති, පාපධර්මය හයි; එවං, මෙසේ; අත්තුක්කංසනපරවම්භනාහි, ආත්මොත්කර්ෂණ-පරපරිභවය යන මෙයින්; උපක්කිලිට්ඨං වා, කිලුටුවූයේ හෝ; හීනං, හීන නම; අනුපක්කිලිට්ඨං, අත්තුක්කංසන පරවම්භනාවෙනුදු සෙසු උපක්ලේශයෙනුදු නො කිලුටුවූ; ලෝකියං සීලං මජ්ඣිමං, ලෞකික ශීලය මධ්‍යම නම; ලොකුත්තරං පණීතං, ලෝකොත්තර ශීලය ප්‍රණීත නම්;-තණ්හාවසෙන වා, තෘෂ්ණා වශයෙන් හෝ; භවභොගත්ථාය

පවත්තිතං, භවසම්පත්තිං පිණේඝ ද භොගසම්පත්තිං පිණේඝ ද පවත්වන ලද්දේ; ගීතං, ගීත නම්; අත්තනෝ විමොක්ඛත්ථාය පවත්තිතං මජ්ඣිමං, තමාගේ විමොක්ෂය පිණිස පවත්වනලද්දේ මධ්‍යම නම; සබ්බසත්තවිමොක්ඛත්ථාය පවත්තිතං, සර්ව්වසත්ත්වයන් සංසාරබන්ධන යෙන් මුදනු පිණිස පවත්වනලද; **පාරමිතා සීලං පණීතං, මහා බෝධිසත්ත්වයන්ගේ** පාරමිතා ශීලය ප්‍රණීත වේ.

(iii. 2.) **දුතියනයේන**, විතීය ත්‍රිකයෙහි; අත්තනෝ අනුරූපං පූජිතු කාමෙන, තමන්ට නොසරිප් දෙය දුරුකරණු කැමැත්තහු විසින්; අත්තගරුනා, [1] තමාම ගුරුකොට ඇත්තහු විසින් (=ලජ්ජා ධිකයා විසින් යන අර්ථයි.) අත්තනි ගාරවෙන පවත්තිතං, තමා කෙරෙහි ගෞරවයෙන් පවත්වනලද්දේ; **අත්තාධිපතෙය්‍යං**, අත්තාධි පතෙය්‍ය නම් වේ; (**"අත්තා එව ගරූ අධිපති එතස්සාති අත්තගරූ-ලජ්ජාධිකෝ, අත්තාධිපතිනෝ භාවෝ අත්තාධිපතෙය්‍යං**"යනු වේ.) ලොකාපවාදං පරිහරිතුකාමෙන, ලොකාපවාදය දුරුකරණු කැමැත්තහු විසින්; ලොකගරුනා, ලොකය ගරුකොට ඇත්තහු විසින්; ලොකෙ ගාරවෙන පවත්තිතං, ලොකයාකෙරෙහි ගෞරව යෙන් පවත්වන ලද්දේ; **ලෝකාධිපතෙය්‍යං**; ලොකාධිපතෙය්‍ය නම්; (**"ලෝකෝ ගරු අධිපති ගරූ[2] එතස්සාති ලෝකාධිපති-ඔත්තප්පාධිකෝ**") ධම්මමහත්තං පූජෙතුකාමෙන, ධර්ම්මමහත්ත්වය පුදනු කැමැත්තහු විසින්; (=ධර්ම්මය නම් මහානුභාව ඇත්තෙය "එකාන නෛෂ්ක්‍රමණිකය-භෙද ප්‍රතිපත්තීන් පිදියයුතුය, එහෙයින් ධර්ම්මය ශීලසම්පත්තීන් පුදම්"යි මෙසේ ධර්ම්මමහත්ත්වය පුදනු කැමැත්තහු විසින් යන අර්ථයි.) ධම්මගරුනා, ධර්ම්මය ගුරුකොට ඇත්තහු විසින්; ධම්මෙ ගාරවෙන පවත්තිතං, ධර්ම්මයෙහි ගෞරවයෙන් පත්වන ලද්දේ; **ධම්මාධිපතෙය්‍යං**, ධම්මාධිපතෙය්‍ය නම්.

(iii. 3.) **තතියනයේන**, තෘතීයත්‍රිකයෙහි; දුකෙසු, දුකයෙහි; යං නිස්සිතනති වුත්තං, යම්ශීලයෙක් නිශ්‍රිතයයි කියනලදද; තං, හේ; තණ්හාදිට්ඨීහි පරාමට්ඨත්තා, "ඉමිනා'හං සීලෙන දෙවෝ වා භවිස්සාමි දෙවඤ්ඤතරෝ වා"යි තෘෂ්ණාවෙනුදු "ඉමිනා මෙ සීලෙන සංසාරසුඛී භවිස්සති"යි, දෘෂ්ටියෙනුදු මාර්ගඵල අනුපනිශ්‍රයභාව කරණයෙන් පරාමර්ශනයෙන් ආමෘෂ්ටබැවින්; **පරාමට්ඨං**, පරාමෘෂ්ට ශීල නම්; පුථුජ්ජනකල්‍යාණකස්ස, පෘථග්ජනකෙරෙහි කල්‍යාණවූ ශීලාදි ගුණයෙන් සමන්විතයාගෙ; මග්ගසම්භාරභූතං, මාර්ගඋව සම්භාරවූ ශීලය ද; සෙඛානඤ්ච මග්ගසම්පයුත්තං, ශෛක්ෂයන්ගෙ මාර්ගසම්ප්‍රයුක්තශීලය ද; **අපරාමට්ඨං**, පරාමෘෂ්ටක්ලේශයන්[3] විෂ්කම්භිත බැවිනුදු ඔවුන්විසින් පරාමෘෂ්ට නොවන බැවින් අපරාමෘෂ්ටශීලනම්;

---

1. අත්තගුරුකා-ඝ. II.

2. ලොකෝ ගරු අධිපති-ම්‍ව. ඝ. I. 3. පරාමාසක්ලෙසයන්-ඝ. II.

සෙඛාසෙඛානං, ශෛක්ෂාශෛක්ෂයන්ගෙ; ඵලසමපයුත්තං සීලං, ඵලසම්ප්‍රයුක්තශීලය; **පච්ඡිමඛන්ධත්ති**, ඒ ඒ කෙලඹදරථ සන්සිඳුවන බැවින්; ප්‍රතිප්‍රශ්‍රබ්ධ ශීල නම්.

(iii. 4.) **චතුත්ථනත්තිකෙ**, සතරවන ත්‍රිකයෙහි; යං, යම් ශීලයෙක්; ආපත්තිං අනාපජ්ජනෙන පූරිතං, ආපත්තියට නො අවදනහු විසින් පුරණලදද; ආපජ්ජිතා වා පන, ඇවද වනාහි; කතපටිකම්මං, වුටඨාන දෙසනාවෙන් කරණලද පිළියම්ඇත්තෙද; තං, හේ; විසුඛං, විශුඛශීල නම් වෙ;ආපත්තිං ආපන්නස්ස, ඇවැත් අවන්නහුගෙ; අකත පටිකම්මං, ඝථාධම්මයෙන් නො කළ පිළියම් ඇත්තෙ; අවිසුඛං, අවිශුඛශීලනම්; වත්‍ථුම්හි වා, (වලස්මස් ද්‍රේ හෝ ශූරුමස් ද්‍රේ හෝසි) වස්තුවෙහි හෝ; ආපත්තියා වා, (පාවිත්තිය ද්‍රේ හෝ දුක්කට ද්‍රේ හෝසි) ආපත්තියෙහි හෝ; අජ්ඣාචාරෙ වා, (ව්‍යතික්‍රම කෙළෙම් ද්‍රේ හෝ නොකෙළෙම් ද්‍රේ හෝසි) අධ්‍යාචාරයෙහි හෝ; වෙමතිකස්ස, විමති ඇත්තහුගෙ; සීලං, ශීලය; **වෙමතිකසීලං** නාම, වෙමතික සීල නම්; තත්‍ථ, එහි; යොගිනා, යොගිහු විසින්; අවිසුඛං සීලං විසොඛෙතබ්බං, අවිශුඛ ශීලය විශුඛ කටයුතුය; වෙමතිකෙ, විමතියට පැමිණි කල; වත්‍ථජ්ඣාචාරං අකත්වා, වස්තුව්‍යතික්‍රම නො කොට; විමති පටිවිනොදෙතබ්බා, (තමා හෝ වස්තුව විචාරා චිනයධරයන් කරා එළඹ විචාරා හෝ) විමති දුරුකටයුතු වේ; (මෙසේ දුරුකරණලද සංශය ඇත්තහු විසින් වනාහි නොකැප වී නම් දුරුකටයුතු-එයින් කිඹ. "ඉච්චස්ස ඵාසු භවිස්සතීති") ඉති, එසේ කල්හි; අස්ස, මෙ යොගිහට; ඵාසු භවිස්සති, සුව වේ.

(iii. 5.) **පඤ්චමඛන්තිකෙ**, පස්වන ත්‍රිකයෙහි; චතූහි අරියමග්ගෙහි, සතර ආර්‍යමාර්ගයන් හා ද; තීහි ච සාමඤ්ඤඵලෙහි, යට තුන් ශ්‍රාමණ්‍ය ඵලයන් හා ද; සම්පයුත්තසීලං, සම්ප්‍රයුක්ත ශීලය; **සෙඛං**, සෙඛසීල නම්; අරහත්තඵලසම්පයුත්තං, අර්හත්ඵල සම්ප්‍රයුක්ත ශීලය; **අසෙඛං**, අසෙඛ සීල නම්; සෙසං, සෙසු ලෞකිකශීලය; **නෙවසෙඛං නාසෙඛං**, නෙවසෙඛ්‍යනාසෙඛ්‍යසීලනම්; පටිසම්භිදාසම්පයුත්තා, පිළිසිඹියා යෙහි වනාහි; යස්මා, යම් හෙයකින්; ලොකෙ, ලෙව්හි; තෙසං තෙසං සත්තානං පකති පි, ඒ ඒ සත්වයන්ගේ සවභාවය ද; සීලන්ති වුච්චති, ශීලයයි කියනුලැබේද; යං සන්ධාය, යම් ප්‍රකෘතියක් සඳහා; අයං සුඛසීලෝ, මෙ සුවෙන් වසනසුලුය; අයං දුක්ඛසීලෝ, මෙ දුකින් වසනසුලුය; අයං කලහසීලෝ, මෙ කලහකරණ සුලුය; අයං මණ්ඩන සීලෝති, මෙ මණ්ඩනය කරණසුලුයයි; භණන්ති, බෙණෙද්ද; තස්මා, එහෙයින්; තෙන පරියායෙන, ප්‍රකෘතියද ශීලය යන ඒ පර්‍යායයෙන්; (=සීලශබ්දය ප්‍රකෘත්‍යර්‍ථවාචක බැවින් යන අර්‍ථයි.) කුසලං සීලං, කුශලශීලය; අකුසලං සීලං, අකුශලශීලය; අබ්‍යාකතං සීල[1]න්ති, අව්‍යාකෘත ශීලයයි; එවං, මෙසේ; කුසලාදිවසෙනපි,

1. කුසලසීලං, අකුසලසීලං, අබ්‍යාකතසීලං, ක්‍රි. මු.

කුසලාදී වශයෙනුදු; තිවිධනති වුත්තං, ත්‍රිවිධයයි කියනලදී; තත්‍ථ, ඒ ත්‍රිකයෙහි; අකුසලං, අකුශලශීලය; ඉමස්මිං අත්‍ථේ අධිප්පෙතස්ස සීලස්ස, [1] මේ අර්‍ථයෙහි අභිමතවූ ශීලයාගෙ; ලක්ඛණාදිසු, ලක්ෂණාදින් කෙරෙහි; එකෙනපි න සමෙතීති, එකක් හා ද සම නොවේ නුයි; ඉධ, මෙහි; න උපනීතං, කුශලත්‍රිකෘ නොං එළවනලදී; (මේ ත්‍රිකයෙහි අව්‍යාකෘත ශීලය ශෛක්ෂත්‍රිකයෙන් ඉත්බැවින් මෙහි අනිප්‍රෙතශීලයෙන් එකසඞ්ග්‍රහ නුයි අකුශලයාගෙම අයොජ්‍යමානතාව දක්වන පිණිස "තත්‍ථ අකුසලං" යනාදි කීහු.) තසමා, එහෙයින්; වුත්තතයෙ නෙව, කියනලද නයින්ම; (=කුශලත්‍රිකය නොගෙණ භීතත්‍රිකාදිවූ පඤ්චත්‍රිකයන්ගෙ වශයෙන්මය යන අර්‍ථයි;) අසස තිවිධතා වෙදිතබ්බා, මේ ශීලයාගෙ ත්‍රිවිධතාව දතයුතු වේ.

9. (ඵ. iv. 1.) චතුක්කෙසු, චතුෂ්කයන්කෙරෙහි; පඨමචතුක්කෙ, ප්‍රථම චතුෂ්කයෙහි;—

i. ඉධ, මෙහි; යො අවිදූසු, යම් අඥතභික්ෂුවක්; දුස්සිලෙ සෙවති, දුශ්ශීලයන් සෙවී ද;[2] සීලවතෙන න සෙවති, සිල්වතුන් නොසෙවී ද; වත්‍ථුවීතික්කමෙ, වස්තුව්‍යතික්‍රමයෙහි; දොසං න පසසති, දොෂ නොදකිද; (=දුස්සිලයන් සෙවුනාබැවිනුදු සිල්වතුන් නොසෙවුනා බැවිනුදු ඔවුන්ගෙ දිට්ඨානුගතියට පැමිණීමෙන් අධ්‍යාචාරයෙහි දොෂ නොදක්නේය යන අර්‍ථයි.)

ii. මිච්ඡාසඞ්කප්පබහුලො, කාමසඞ්කල්පාදි නවමහාවිතර්කීසඞ්ඛ්‍යාත[3] මිථ්‍යාවිතර්කී බහුලවූයෙ; ඉන්ද්‍රියානි න රකඛති, මිථ්‍යා සඞ්කල්ප බහුල බැවින් ම මනශ්ෂෂයෙ ඉන්ද්‍රියයන් නොරකී ද; එව රූපසස සීලං, එබදු භික්ෂුහුගෙ ශීලය; වෙ, එකාන්තයෙන්ම; හානභාගියං ජායතෙ, හානභාගිය වන්නේයි; (=පරිහානිය සෙවුනේය යන අර්‍ථයි.)

iii. ඉධ, මෙහි; යො පන, යම් මහණෙක්; (අත්තනො) සීල සමපත්තියා, තමාගෙ චතුෂ්පාරිශුද්ධිශීලයෙන්ම; අත්තමනො හොති, සතුටුවේද; කම්මට්ඨානානුයොගමහි, කර්‍මස්ථානයෙහි යෙදීමෙහි; මානසං න උපපාදෙති, සිත් නොං උපදවා ද?

iv. තුට්ඨස්ස සීලමත්තෙන න, ශීලමාත්‍රයෙන් තුෂ්ටවූ; උත්තරිං අසඨනතස්ස, මතුයෙහි ධ්‍යානසඞ්ඛ්‍යාත විශෙෂාධිගමයට ව්‍යායාම නොකරන්නාවූ; තස්ස භික්ඛුනො, ඒ භික්ෂුහුගෙ; තං සීලං, ඒ ශීලය තෙමෙ; සිතිභාගියං භවති, සප්තියම සෙවුනේයි.

v. යො පන, යමෙක් වනාහි; සමපන්නසීලො, සම්පූර්‍ණවූ සිල් ඇත්තේ; සමාධත්‍ථාය, සමාධිය පිණිස; සටති, ව්‍යායාම කෙරේද; එතස්ස භික්ඛුනො, ඒ භික්ෂුහුගෙ; සීලං, සීලය තෙමෙ; විසෙසභාගියං හොති, ධ්‍යානවිශෙෂ සෙවුනේයි.

---

1. අභිප්පෙතසීලස්ස-මූ. ස. I. & II. 2. සෙවිමද මූ. ස. II.

vi. යෝ, යමෙක්; අතුට්ඨෝ සීලමත්තෙන්න, ශීලමාත්‍රයෙන් අතෘප්ත වූයෙ; නිබ්බිදං අනුප්පත්තෝ, විදර්ශනාවෙහි යෙදේද; (මෙයින් බලවත් විදර්ශනාව කිහු) එතස්ස භික්ඛුනෝ සීලං, මේ භික්ෂුහුගේ ශීලය; නිබ්බේධභාගියං, හොතී, නිර්භේද සෙවුනේයි; (=විදර්ශනාවේහි යෙදුනු පමණෙකිනු දු නිර්භේදභාග් වේ යන අර්ථයි)

(iv. 2.) **දුතියමතුෂෙක**, දෙවන චතුෂ්කයෙහි; භික්ඛු ආරබ්භ පඤ්ඤත්තසික්ඛාපදානි, භික්ෂූන් අරභයා පණවන්නලද ශික්ෂාපදයෝද; භික්ඛුනීනං පඤ්ඤත්තතෝ, භික්ෂුණීන්ට ප්‍රඥප්ත ශික්ෂාපදයෙන්; යානි ව තෙසං රක්ඛිතබ්බානි, යම් ශික්ෂාපදකෙනෙක් ඒ භික්ෂූන් විසින් රැක්ක යුත්තාහුද; ඉදං භික්ඛුසීලං, මෙ භික්ෂුශීල නම් වෙ; භික්ඛුනියෝ ආරබ්භ පඤ්ඤත්තසික්ඛාපදානි, භික්ෂුණීන් අරභයා ප්‍රඥප්ත ශික්ෂාපදයෝ ද; භික්ඛූනං පඤ්ඤත්තතෝ, භික්ෂූන්ට ප්‍රඥප්ත ශික්ෂාපදයෙන්; යානි ව තාසං රක්ඛිතබ්බානි, යම් ශික්ෂපදකෙනෙක් ඒ භික්ෂුණීන් විසින් රැක්කයුත්තාහුද; ඉදං, මෙ; භික්ඛුනීසීලං, භික්ෂුණීශීල නම් වෙ; සාමණෙරසාමණෙරීනං දසසීලානි, සාමණෙර සාමණෙරීන්ගේ දශශීලයෝ; අනුපසම්පන්නසීලං, අනුපසම්පන්නාසීල නම්; උපාසකඋපාසිකානං, උපාසකඋපාසිකාවන්ගෙ; නිච්චසීල වසෙන පඤ්චසික්ඛාපදානි, නිත්‍යශීලවශයෙන් පඤ්චශික්ෂාපදයෝ ද; සති වා උස්සාහෙ දස, මත්තෙහි දු ශීලයන් රක්ෂාකරන්නට උත්සාහ යක් ඇතිකල්හි (ශ්‍රමිකාරාදීන්ට මෙන් සාමණෙරයන් විසින් රැක්ක යුතු එම) දශ ශික්ෂාපදයෝ ද; උපොසථඞ්ගවසෙන අට්ඨ, උපොස ථඞ්ග විසින් නවවාදිමාලාදි වෙරමණින් එක් අඟක් කොට අෂ්ට ශික්ෂා පදයෝ ද; ඉදං ගහට්ඨසීලං, මෙ ගෘහස්ථශීල නම්.

(iv. 3.) **තතියමතුෂෙක**, තුන්වන චතුෂ්කයෙහි:—

උත්තරකුරුකානං[a]මනුස්සානං, උත්තරකුරුවිපය වැසි මිනිසුන් ගේ; අවීතික්කමෝ, පඤ්චශීලයන්ගෙ අව්‍යතික්‍රමය; **පකතිසීලං**, සභාව ශීලනම්; කුලදෙසපාසණ්ඩානං,[b] ඒ ඒ කුලයන්ගෙ ඒ ඒ දෙශවාසීන්ගෙ ඒ ඒ පාෂණ්ඩයන්ගේ; අත්තනෝ අත්තනෝ මරියාදා භතං වාරිත්තං,[1] ඒ ඒ කුලාදිගෙහි පූර්වපුරුෂයන් විසින් ඒ ඒ වරද තොකිරීමෙහි හිමි කොට තබන ලද්ද චාරිත්‍රය; **ආචාරසීලං**, ආචාරශීල නම්; (බ්‍රාහ්මණාදීන්ගෙ අමද්‍යපානාදිකුලධර්මය-සමහර ජනපදයෙක අහිංසනාදි දෙශධර්මය- නිර්ග්‍රන්ථයන්ගෙ යමනියමාදි පාෂණ්ඩධර්ම යයි.) "ආනන්ද, ආනන්දය; එසා ධම්මතා, මේ ධර්මතායි (සභාව යෙකි); යදා, යම්කලෙක; බොධිසත්තෝ, බොධිසත්ත්වතෙමේ; මාතු කුච්ඡිං ඔක්කන්තෝ හොති, මවුකුස උපන්නේ වෙ ද; බොධිසත්ත මාතු මානසං, බොධිසත්ත්වමාතෘචිත්තය; කාමගුණූපසංහිතං, කාම ගුණාස්වාදයෙහි ගිජුවූයෙ; පුරිසෙසු න උපපජ්ජතී"ති, පුරුෂයන් කෙරෙහි නො උපදනේයයි; එවං වුත්තං, මෙසේ කියනලද; බොධි සත්තමාතුසීලං, බොධිසත්ත්වමාතෘශීලය; **ධම්මතාසීලං**, ධර්මතාශීල නම්;

---

1. පකතිවාරිත්තං-ඇසෑම්. a b: ඵ ම. බ:

(සං.22.) ("පකතියා සීලවතී හොති"යි වදළබැවින් බොධිසත්ත්වයන් වහන්සේ පඤ්චශික්ෂාපදශීලය පරිපූර්ණ වෙයි–මේ වනාහී [කුසලිගත මහාබොධිසත්ත්වයන්ගේ පියාතන් කෙරෙහි වූ චිත්තොත්පත්ති පමණෙකිනු වූ අසංකලිෂ්ටවූ පරමොත්තකෝටියට පැමිණි ශීලය ගුණානුභාවයෙන් සිඳවන බැවින්] කාරණ නියමයෙන් ආගතශීලය ධම්මතාශීල නමැති දතයුතු.)

iv. **මහාකාශ්‍යපාදීනං** පන සුඛසත්තානං, විරකාලයක් සුපරිශුද්ධ ශීලව ආ බැවින් මහාකාශ්‍යපාදි ශුඛසත්ත්වයන්ගේ ශීලයද; බොධිසත්තස්ස ච, බොධිසත්ත්වයන්ගේ ද; තාසු තාසු ජාතීසු සීලං, "ඝිලව ඝජ–මහිංසඝාතාදී" ඒ ඒ ජාතියෙහි ශීලය; **සුඛභෙතුකසීලං**, සුඛිජාති සිඳහෙතු ඇතිබැවින් සුඛීහෙතුකශීල නම්.

(iv. 4.) **චතූසු චතුඤ්ඤා**, සතරවන චතුෂ්කයෙහි:–

i. ("යං භගවතා එවං වුත්තං"යි යොදනු.) භගවතා, භගවත්හු විසින්; ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, මහණතෙමේ; පාතිමොක්ඛසංවරසංවුතෝ, ප්‍රාතිමෝක්ෂසංවරයෙන් යුක්තවූයේ; විහරති, වාසය කෙරෙයි; ආචාරගොචරසම්පන්නෝ, වක්‍ෂ්‍යමාණ ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ; අණුම්පෙතෙසු වජ්ජේසු භයදස්සාවී, අණු ප්‍රමාණ වරදෙහිදු භය දක්නේ; සමාදාය, මනාකොට ගෙණ; සික්ඛා පදෙසු, සිඛපදයෙහි; සික්ඛතීති, හික්මෙන්නේයයි; එවං වුත්තං,[a] මෙසේ කියනලද; යං ශීලං, යම් ශීලයෙක් ඇද්ද; ඉදං, මේ; **පාතිමොක්ඛසංවරසීලං** නාම, ප්‍රාතිමෝක්ෂ සංවරශීලනම්.

ii. ("යං පන වුත්තං"යි යොදනු.) සෝ, ඒ ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයෙහි පිහිටි මහණ; චක්ඛුනා රූපං දිස්වා, චක්ෂුසින් රූපය දැක; න නිමිත්තග්ගාහී හොති, නිමිත්තග්‍රාහී නොවෙයි; **නානුබ්‍යඤ්ජනග්ගාහී**, අනුව්‍යඤ්ජනග්‍රාහී නොවෙයි; යත්වාධිකරණං, යම් අසංවරයක හෙතුයෙන්; එතං, ඒ පුද්ගල; චක්ඛින්ද්‍රියං අසංවුතං, අපිහිත චක්ෂුරින්ද්‍රිය ඇතිව; විහරන්තං, වසන්නහු; අභිජ්ඣා, අභිධ්‍යාය; දෙමනස්සා, දෞර්මනස්‍යය ආදී; පාපකා, ලාමකවූ; අකුසලාධම්මා, අකුශල, ධර්මයෝ; අන්වාස්සවෙය්‍යුං, අනුබඳනාහු ද; තස්ස, ඒ චක්ෂුරින්ද්‍රියයාගෙ; සංවරාය පටිපජ්ජති, සංවරය පිණිස පිළිපදනේය; රක්ඛති චක්ඛින්ද්‍රියං, චක්ෂුරින්ද්‍රිය රක්නේය; චක්ඛින්ද්‍රියෙ සංවරං ආපජ්ජති, චක්ෂුරින්ද්‍රිය යෙහි සංවරයට පැමිණෙන්නේය; සොතෙන සද්දං සුත්වා, ශ්‍රොතයෙන් ශබ්දය අසා; ඝාණෙන ගන්ධං ඝායිත්වා, ඝ්‍රාණයෙන් ගන්ධය ආඝ්‍රාණය කොට; ජිව්හාය රසං ඝායිත්වා, ජිහ්වායෙන් රසය ආස්වාද කොට; කායෙන පොට්ඨබ්බං ඵුසිත්වා, කයින් ස්ප්‍රෂ්ටව්‍යය ස්පර්ශ කොට; මනසා ධම්මං විඤ්ඤාය, මනසින් ධර්මය දැන; න නිමිත්තග්ගාහී හොති, නිමිත්තග්‍රහණය නොකෙරෙයි; නානුබ්‍යඤ්ජනග්ගාහී, අනුව්‍යඤ්ජන

ධුතවාදොති එත්ථ පන, ධුතවාදෙ යන මෙහි; අත්ථි ධුතො, ධුත නම් එකෙක් ඇති; න ධුතවාදෙ, ධුතාඞ්ගයෙන් අනුන්ට අවවාද නොකරණ එකෙක් ඇති යන අර්ථයි;(සෙසු පෙදෙහිදු මෙම ක්‍රමයෙන්

අර්ථ බිණ්ණියයුතු.)-තත්ථ, ඒ වතුෂ්කයෙහි; යෝ, යමෙක්; ධුතඞ්ගන අත්තනෝ කිලෙසෙ ධුනි, ධුතාඞ්ගයෙන් තමාගෙ කෙලෙසුන් නැසීද; පරං පන ධුතඞ්ගන න ඔවදති, අනුන්ට වනාහි ධුතාඞ්ගයෙන් අවවාද නොකෙරෙද; නානුසාසති, අනුශාසනා නොකෙරෙද; බක්කුල තෙථේරෝ[a] විය, බක්කුලතෙරුන් මෙන්; අයං, මෙතෙම; ධුතෝ, ධුත නම් වෙයි; න ධුතවාදෝ, ධුතවාද නම් නොවේ; යථාහ, අට්ඨාසෙහි[b] කිඤෙමෝ; ("තයිදං"යනු නිපාතයෙහිය "සෝ අයං"යන අර්ථයි.) තයිදං ආයස්මා බක්කුලෝ, හේ මේ ආයුෂ්මත් බක්කුලතෙමෙ; ධුතෝ න ධුතවාදෝති, ධුතෝ න ධුතවාදෝ යි; (සෙසු පෙදෙහිදු මෙම අර්ථ බණුතු.) [යොපන, යමෙක් වනාහි; න ධුතඞ්ගන අත්තනෝ කිලෙසෙ ධුනි, ධුතාඞ්ගයෙන් තමාගේ කෙලෙසුන් නො නැසීද; කෙවලං, හුදෙක්; අඤ්ඤං ධුතඞ්ගන ඔවදති, අනුන්ට ධුතාඞ්ගයෙන් අවවාද කෙරේද; අනුසාසති, අනුශාසනා කෙරේද; උපනන්දත්ථේරෝ[c] විය, උපනන්දතෙරුන් මෙන්; අයං, මෙතෙම; න ධුතෝ, ධුත නම් නො වෙයි; ධුතවාදෝ, ධුතවාද නම් වේ. යථාහ=පෙ=]යෝ, යමෙක්; උභය විපත්තෙනා, උභයවිපන්නද; (තෙමේ ධුතනොවෙයි අනුන්ට ධුතාඞ්ග යෙන් අවවාද නොකෙරෙද යන අර්ථයි.) ලාළුදායී[d] විය, ලාළුදායී නම් භික්ෂුහු මෙන්;=පෙ=යෝ ච පන, යමෙක් වනාහි; උභයසම්පන්නෙනා, දෙකින්ම සම්පන්නද; (තෙමේ ධුතව අනුන්ට ධුතාඞ්ගයෙන් අවවාද කෙරෙද යන අර්ථයි) ධම්මසේනාපති[1] විය, ධම්සෙනෙවි සැරියුත් තෙරුන් මෙන්;=පෙ=

ධුතධම්මා වෙදිතබ්බාති, ධුතධම්මා වෙදිතබ්බා යන්නෙහි; අප්පිච්ඡතා=පෙ="අප්පිච්ඡතා"යනාදී පෙදෙහි අර්ථ ඔට කී නියාමයෙන් දතයුතු. ("ඉමෙහි කුසලධම්මෙහි අත්ථි[2] ඉදම්ථෝ, ඉදම්ථෝනෝ භාවෝ ඉදම්ථිතා"යනු වේ-[යම් නුවණකින් ප්‍රව්‍රජිතයක්හු විසින් නම් පාංශුකූලිකාදි ධුතාඞ්ගයෙහි පිහිටිය යුතුයයි කියන ලදද, ධුතගුණයන් සම්දන්ව පරිහරණය කෙරෙද, හෙද "ඉදම්ථිතා"නම්-එහෙයින්ම කීහ. "ඉදම්ථිතා ඤාණමෙව"යි]-"ඉමෙ පඤ්ච ධම්මා ධුතධම්මා නාම"යී යොදනු.)ධුතඞ්ගචෙතනායය පරිවාරකා,ධුතාඞ්ගචෙතනාවට පරිවාරවූ; ඉමෙ පඤ්ච ධම්මා, අප්පිච්ඡතාදී මේ ධර්මයෝ පස්දෙන; අප්පිච්ඡං යෙව නිස්සායාති ආදිමවනතෝ, අප්පිච්ඡං යෙව නිස්සාය යනාදී කී බැවින්; ධුතධම්මා නාම, ධුතධර්මයෝ නම් වෙත්; තත්ථ, ඒ ධුතධර්මයන්කෙරෙහි; අප්පිච්ඡතා ච සන්තුට්ඨිතා ච, අප්පිච්ඡතාව ද සන්තුට්ඨිතාව ද යන දෙදෙන;අලොභෙ අනුපතනති, අසම්ප්‍රාප්ත සම්ප්‍රාප්ත වස්තුවෙහි අලුබභ නාකාරයෙන් පවත්නා මහසින් අලොභයෙහි හෙත්; (හිතියෙකි යන අර්ථයි) සල්ලේඛතා ච පවිවේකතා ච, සල්ලේඛතාව ද පවිවේකතාව ද යන දෙදෙන;විසු ධර්මෙසු අනුපතනති අලොභෙ ච අමොහෙ ච, අලොභය අමොහය යන ධර්මයන් දෙදෙනා කෙරෙහි හෙති;(කෙවත්? ප්‍රත්‍යය හෙදුදින් හෙතුකොට ඇති ලොලභාවාදි සඞ්කිලේශයන් මනා කොට

1. මූලකඝට්ඨපත්තෙරෙ-මජ්ඣිමට්ඨකථාරම්භ. 2 අත්ථි සුලබභාවෙමෙහි අත්ථ-මූ. ස. II.

ලියන හෙයින් ද ගණසඞ්ගණිකාදිභෙද සංසග්ගියෙන් විතතයා වෙන් කරණ හෙයින් අලොභ අමොහ සඞ්ඛ්‍යාත සලෙලඛ පව්වෙක දෙදෙන අලොභය අමොහය යන ධර්මයන් දෙදෙනා කෙරෙතිය යන අර්ථයි.) **ඉදමත්ථිතා**, ඉදත්ථිතා නම්; සුණමෙව, සුණයමැති; තත්ථ, එහි; අලොභෙන, අලොභයෙන්; පච්චෙකපවත්තුස්සු, ගෘහපතිවිවරාදි ඒ ඒ ධුතාඞ්ගයෙන් ප්‍රතික්ෂෙප කටයුතු වස්තුවෙහි; ලොභං, ලොභය ද; අමොහෙන, අමොහයෙන්; තෙසෙව, ඒ ප්‍රතික්ෂෙප වස්තුවෙහිම; ආදීනවපටිවෙධකං, ආරක්ෂා දුඃඛය පරාධීනවෘත්තිය වොරහයය යන ආදීනවයන් මුවහකරණ මොහය ද; ධුතාති, නසා; අලොභෙන ච, අලොභයෙනු දු; අනුසුඛතානං, භගවන්හු විසින් නිවජ්ඣරාහ[1] පරිභොග වශයෙන් අනුඥත වූ සුඛස්පර්ශ ඇති ආසනරණ ප්‍රාවරණාදීන්ගෙ; පටිසෙවනමුඛෙන, ප්‍රතිසෙවනාකාරයෙන්; (අනුභවලෙඛයෙන යන අර්ථයි.) පවත්තං, ප්‍රවෘත්තවූ; කාමසුඛානුයොගං, අනුඥත චිවරාදී ප්‍රත්‍යයන් ඇලී අනුභව කිරීම හෝ; (මෙවැනි සප්පායසම්පන්න ආසනරණාදිහු වැළඳගන්නා ලැබෙත්, උපාදින්නඵස්සය වනාහි කුමට නොවළඳනා ලැබේදැයි මෙම දෙරින් ප්‍රවෘත්තවූ කාමසුඛල්ලිකානුයොගය හෝ;) අමොහෙන, අමොහයෙන්; අතිසලෙලඛමුඛෙන පවත්තං, අතිසලෙලඛ පටිපත්ති මුඛයෙන් ප්‍රවෘත්තවූ; (උභයාන්තවවත්තා දූය ද ප්‍රතික්ෂෙප කිරීම් වශයෙන් යන අර්ථයි.)අත්තකිලමථානුයොගං, ආත්මක්ලමථයෙහි යෙදීම ද; ධුතාති, නසා; තසමා, එහෙයින්; ඉමෙ ධම්මා, මේ ධර්මයෝ; ධුතධම්මාති වෙදිතබ්බා, ධුතධර්මයයි දත යුත්තාහුයි; ධුතඞ්ගානි වෙදිතබ්බානීති=පෙ=තානි, ඒ ධුතාඞ්ගයෝ; අත්ථතො,[2] අර්ථවසින් ද; ලක්ඛණාදිහිව, ලක්ෂණාදි විසින් ද; වුත්තානෙව, කියනලදහු මැයි.

"**කස්ස ධුතඞ්ගසෙවනා සප්පායා**"යන්නෙහි; රාගචරිතස්ස, රාගචරිතය හට ද; මොහචරිතස්ස ච, මොහචරිතය හටද; සප්පායා, සැපයෝයි; කස්මා, කුමක් හෙයිකයත්; ධුතඞ්ගසෙවනා හි, ධුතාඞ්ගසෙවනා තොම; දුක්ඛා පටිපදාවෙව, දුඃඛප්‍රතිපද්ද වෙයි; සලෙලඛවිහාරොව, සලෙලඛවිහාරද වේ; දුක්ඛාපටිපදං ච නිස්සාය, දුඃඛප්‍රතිපද් නිසා; රාගො වූපසම්මති, රාගය සන්හිඳේ; (සුඛොපකරණසන්නිශ්‍රය රාගයා දුඃඛප්‍රතිපත්තියෙහි පිහිට නොලබන බැවින් රාගය සන්හිඳේය යන අර්ථයි.) සලෙලඛං නිස්සාය, සලෙලඛය නිසා; අපපමත්තස්ස, අප්‍රමත්තයහට; මොහො පහීයති, මොහය පහණ ලැබේ; (සලෙලඛය නම් සම්ප්‍රඥානයහට වෙයි, සම්ප්‍රඥානය ඇති කල්හි අප්‍රමාදය සම්භව වන බැවින් මොහය අප්‍රතිෂ්ඨිත වේ යන අර්ථයි;) එත්, මේ ධුතාඞ්ග යන් කෙරෙහි; ආරඤ්ඤිකඞ්ගරුක්ඛමූලිකඞ්ගපටිසෙවනා වා, ආරණ්‍යකාඞ්ග වෘක්ෂමූලිකාඞ්ග සෙවනාවෝ; දෙසචරිතස්සාපි සප්පායා, චෙෂචරිතයහට ද සැපයෝයි; තත්ථ හි, ඒ අරණ්‍යයෙහි වෘක්ෂමූලයෙහි;

1. අවජ්ඣරාහ-ඇතැම්.

1. අත්තඵස්සා-මූ. ස. I.

අසඞ්කට්ටියමානස්ස, සඞ්කට්ටනයක් කරණු නොලදින්; විහරතෝ, වසන්නාවූ; අස්ස, ඒ යොගීහට; දෙසොපි වූපසම්මතීති, වෙෂයද සන් හිඳෙන්නේ යි.

අයං, මේතෙම; ධුතාදීනං විභාගතෝ වණ්ණනා, ධුතාදීන්ගෙ විභාග හෙයින් වර්ණනා යි.

iii. "**සමාසව්‍යාසෙනා**"යන්නෙහි; ඉමානි පන ධුතඞ්ගානි, මේ සියලු දුහඟහු; සමාසතෝ, සැඟැවින් ("අට්ඨේව හොන්ති"යන සඛද;) **තීණේ සිසඞ්ගානි**, (කිසිකෙනෙකුන් විනා නොපවත්නා හෙයින් ද සුවසේ රැකෙන බැවින්ද සෙසු දුහඟහු දු සඞ්ගහවන බැවින්[2])උත්තමාඞ්ගයෝ තුන්දෙනෙක; **පඤ්ච අසම්භින්නඞ්ගානීති**, නොමුසු අඟහු පස්දෙනෙ කැයි; අට්ඨේව හොන්ති, අටදෙනෙක්ම වෙත්; තත්ථ, එහි; **සපදානචාරිකඞ්ගං**, සපදානචාරිකඞ්ගය; **ඒකාසනිකඞ්ගං**, ඒකාසනිකාඞ්ගය; **අඞ්ගාකාසිකඞ්ගන්ති**, අඞ්ගාකාසිකඞ්ගය යි; ඉමානි තීණි, මොහු තුන්දෙන; **සිසඞ්ගානි**, උත්තමාඞ්ගයෝ යි; සපදානචාරිකඞ්ගං හි රක්ඛන්තෝ, සපදානචාරික අඟ රක්නෙ; පිණ්ඩපාතිකඞ්ගම්පි, පිඬුපා අඟ ද; රක්ඛිස්සති, රකී; ඒකාසනිකඞ්ගඤ්ච රක්ඛතෝ, එක් අසුන් අඟ රක්නහුට; පත්තපිණ්ඩිකඞ්ග ඛලුපච්ඡාභත්තිකඞ්ගානිපි, පත්පිඬු අඟ හා ඛලුපච්ඡාභත්තික අඟය යන මොහු; සුරක්ඛනීයානි භවිස්සන්ති, සුවසේ රැක්ක හැකි වන්නාහුයි; (ඉහි එක් අසුන් අඟින් මේ පත්පිඬු අඟ නොරැකෙතුදු එකාසනිකඞ්ගයා එක ඉරියවුවෙන් සුවසේ රැක්ක හැකි බැවින් කිහු.) අඞ්ගාකාසිකඞ්ගං රක්ඛන්තස්ස, අඞ්වස් අඟ රක්නවුහට; රුක්ඛමූලිකඞ්ග යථාසන්ථතිකඞ්ගෙසු, රුක්මුල්අඟ යථා සන්ථතික අඟෙහි; රක්ඛිතබ්බං නාම කිං අත්ථි, රැක්ක යුතු නම් කිමෙක් ඇද්ද; (නැත යන අර්ථයි.) ඉති, මෙසේ; ඉමානි තීණි, මොහුතුන් දෙන; සීසඞ්ගානීති, උතුම් අඟහුයි; **ආරඤ්ඤිකඞ්ගං**, ආරණ්‍යකඅඞ්ග; **පංසුකූලිකඞ්ගං**, පංසුකූලික අඞ්ග; **තෙචීවරිකඞ්ගං**, තෙච්වරිකඅඞ්ග; **නෙසජ්ජිකඞ්ගං**, නෙසජ්ජිකඅඞ්ග; **සොසානිකඞ්ගන්ති**, සොසානික අඞ්ගය යන; ඉමානි පඤ්ච, මොහු පස්දෙන; අසම්භින්නඞ්ගානි වාති, නොමුසු අඟහයි; අට්ඨේව හොන්ති, දුහඟහු අටදෙනෙක්ම වෙත්.

පුන, නැවත; **මේ චීවරපටිසංයුත්තානි**, චීවරප්‍රතිසංයුක්තවූ(සිවුරු පිළිබැඳිවූ) දෙදෙනෙක; **පඤ්ච පිණ්ඩපාතපටිසංයුත්තානි**, පිණ්ඩපාත ප්‍රතිසංයුක්තවූවෝ පස්දෙනෙකි; **පඤ්ච සෙනාසන පටිසංයුත්තානි**, සේනාසන ප්‍රතිසංයුක්තයෝ පස්දෙනෙකි; **ඒකං විරියපටිසංයුත්තං**, එකෙක් වීර්‍ය්‍යප්‍රතිසංයුක්ත වෙයි; **එවං චත්තාරෝව හොන්ති**, මෙසේ සතරදෙනෙක්ම වෙත්; තත්ථ, එහි; **නෙසජ්ජිකඞ්ගං**, නෛෂද්‍යකාඞ්ගය; විරියපටිසංයුත්තං, වීර්‍ය්‍යප්‍රතිසංයුක්තය; සෙසානි, සෙස්සෝ; පාකටා නෙව, ප්‍රකටයෝ මැයි; පුන, නැවත; සබ්බානෙව, හැමදෙනම; නිස්සය වසෙන වෙ හොන්ති, නිඃශ්‍රය විසින් දෙදෙනෙක් වෙත්; පච්චය

1. සුරක්ඛියාති-ඉ. ස. I. 2. සහවන බැවින්-ඇඟැම්.

සන්නිසිතානි චාදස, ප්‍රත්‍යයසන්නිස්‍රිතයෝ දෙළොසෙක; විරිය නිස්සිතං එකං, ඒයීනිස්‍රිතවූයේ එකෙකි; සෙවිතබ්බාසෙවිතබ්බ වසෙනපි වෙ ශෙව හොන්ති, සෙවියයුතු නොසෙවියයුතු බැවිනුදු දෙදෙනෙක්ම වෙත්; යස්ස හි, යමක්හට; ධුතඞ්ගං සෙවන්තස්ස, දුහඟ සෙවුනාහට; කම්මට්ඨානං වඩ්ඪති, කමටහන්වඩී ද; (සමඟර දුහඟක් සෙවුනාවූ රාගචරිතයාහට හෝ මොහචරිතයාහට හෝ චෙෂචරිතයා හට හෝ කමටහන් වඩි ද යන අභිප්‍රායයි.) තෙන, ඔහු විසින්; සෙවිතබ්බානි, සෙවියයුත්තාහුයි; යස්ස, යමක්හට; සෙවතෝ, දුහඟ සෙවුන හට; හායති, (කමටහන් හිවුමැලි බැවින් රූඣ පිළිවෙත් හෝ නොඣන්නාහට) පිරිහෙද; තෙන න සෙවිතබ්බානි, ඔහු විසින් හෝ නොසෙවියයුතුවහු; යස්ස පන, යමෙක්හට වනාහි; සෙවතොපි, දුහඟ සෙවුනාහටද; වඩ්ඪතෙශෙව, මහාපුරුෂජාති හෙයින් වැඩීමම වේද; න හායති, නොපිරිහේද; තෙනාපි, ඔහු විසිනුදු; පච්ඡිමං ජනතං අනුකම්පන්තෙන, පශ්චිම ජනයාහට අනුකම්පාකරණ්වහු විසින්; සෙවිතබ්බානි, සෙවියයුත්තාහුයි.

යස්සාපි, යමක්හට; සෙවතොපි අසෙවතොපි න වඩ්ඪති, උපනිස්‍රය නැති බැවින් සෙවුනාහට ද නොසෙවුනාහට ද නොවඩී ද; තෙනාපි, ඔහු විසිනුදු; ආයති වාසනත්ථාය, ආයතිවාසනා පිණිස; සෙවිතබ්බාතෙම, සෙවියයුත්තාහුමැයි; එවං, මෙසේ; සෙවිතබ්බාසෙවිතබ්බ වසෙන දුවිධානිපි, සෙවියයුතු නොසෙවියයුතු විසින් දෙවදෑරුම්වූ ද; සබ්බානෙව, සියලු දුහඟහුම; චෙතනාවසෙන එකවිධානි හොන්ති, චෙතනා වශයෙන් එකවිධ වෙත්; එකමෙව හි ධුතඞ්ගං, චෙතනා සවභාව හෙයින් දුහඟ එකෙක්මය; (එහෙයින්ම කීහ. "සමාදානචෙතනා"යී දුහඟ නම් සමාදානචෙතනා නුයි චෙතනා සවභාව හෙයින් දුහඟ එක්වැදෑරුම් වෙයි යුතැනී.) අට්ඨකථායම්පි වුත්තං, අටුවාහෙයිදු කියනලදී. යා චෙතනා, යම් චෙතනාවක් ඇද්ද; තං, හේ; ධුතඞ්ගං වදන්තීති, දුහඟනමැයි කියති.

ච්‍යාඝෝ පන, විසතරහෙයින් වනාහි; **භික්ඛූනං චෙරස, සමණට** තෙළෙසෙක; **භික්ඛුණීනං අට්ඨ, මෙහෙණට අටෙක; සාමණෙරානං** **දාදස,** හෙරණට දෙළොසෙක; **සික්ඛමානසාමණෙරීනං ඡන්න,** සිඛමාන් නා හෙරණියන්ට සතෙක; උපාසක උපාසිකානං **චෙති,** උපාසක උපාසිකාවන්ට දෙකෙකැයි; **ඉම චත්තාළීස** හොන්ති, දෙසාළිසෙක් වෙත්; සචෙ, ඉදින්; අඵෙහාකාසෙ, අඵවස; ආරඤ්ඤිකඞ්ගසමාදානං, ආරණ්‍යකාඞ්ගයෙන් යුක්තවූ; සුසානං හොති, සොහොනෙක් වේද; එකොපි භික්ඛු, එකම මහණ; එකපදහාරෙන, එකපැහැර; සබ්බ ධුතඞ්ගානි, සියලුදුහඟුන්; පරිහරිතුං සක්කොති, වළඳන්නට සමර්ථ වේ; භික්ඛුනීනං පන, මෙහෙණිනට වනාහි; ආරඤ්ඤිකඞ්ගං, ආරණ්‍යකාඞ්ගය ද; ඛලුපච්ඡා භත්තිකඞ්ගං ච, ඛලුපච්ඡා භත්තිකඞ්ගය ද යන; මෙපි, දෙදෙනම; සික්ඛාපදතොව පටික්ඛිත්තානි, ශික්ෂාපදයෙන්ම ප්‍රතික්ෂිප්තයහ, (ආරණ්‍යකාඞ්ගය "ගණමහා ඔහී"[1] යන ශික්ෂාපදයෙන් ප්‍රතික්ෂිප්තය, ඛලුපච්ඡාභත්තිකඞ්ගය අනතිරිත්තභොජනශික්ෂාපද යෙන්මෝ ප්‍රතික්ෂිප්තයි.

අඛෙහාකාසිකඞ්ගං, අඛෙහාකාසිකඞ්ගය ද;රුක්ඛමූලිකඞ්ගං, රුක්ඛ මූලිසාඞ්ගයද;සොසානිකඞ්ගං, සොසානිකඞ්ගය යන;ඉමානි තිණ්ණි,මොහු තුන්දෙන;දුපපරිහාරානි, දුපැහැරයයෙත්;(දුපැහැරබවම"භික්ඛුනියා" යනාදීන් පහළකෙරෙත්.)භික්ඛුනියා හි, මෙහෙණහට; දුතියිකං විනා, දුතියිකාවක් නැතිව;වසිතුං න වට්ටති, වසන්නට නොවටී;එවරූපෙ ච ඨානෙ, මෙබඳු තැන්හිදු; සමානවස්සා දුතියිකා, සමාන අදස් ඇති දුතියිකාවක්; ලබ්භා, ලැබිය හැ; සවෙපි ලභෙය්‍ය, ඉදින් ලැබුනු නමුදු; සංසට්ඨවිහාරතො තඤ්චෙවය්‍ය, සංසර්ගවිහාරයෙන් නොමිදෙන්නේසි; එවං සති, එසේ කල්හි; යස්සත්ථාය, යමක් පිණිස; (යම් විවෙකයක් පිණිස ද යන අර්ථයි.) ධුතඞ්ගං සෙවෙය්‍ය, දුහඟසෙවී ද; සො එව අත්ථො, එම අර්ථය; අස්සා න සම්පජ්ජෙය්‍ය, ඇට නො සැපයෙන්නේසි.

එවං, මෙසේ; පරිහරිතුං; අසක්කුණෙය්‍යතාය, වළඳන්නට නොපිළිවන් හෙයින්; පඤ්ච හාපෙත්වා, පසක් පිරිහෙළා; භික්ඛුනීනං, මෙහෙණතට; අත්ථෙව හොන්තීති, අටෙක්ම වෙත්නුයි; වෙදිතබ්බානි, දතයුත්තාහුයි; යථාවුත්තෙනත්‍ථ, යථොක්තවූ දුහඟුන් කෙරෙහි;භික්ෂූන්ට කියනලද තෙළෙසෙහිය මෙහෙණහට කී අටෙහිය හි යුතැනී.) ඨපෙත්වා තෙචීවරිකඞ්ගං, තෙචීවරික අඞ්ගය තබා; සෙසානි චාදස, තෙසු දෙළොස; සාමණෙරානං වෙදිතබ්බානි, හෙරණට දතයුත්තාහ; සත්ත, සත; සික්ඛමානසාමණෙරීනං, සිඛමනුන් හා හෙරණින්ට; වෙදිතබ්බානි, දතයුත්තාහු යි; උපාසකඋපාසිකානං පන, උපාසක උපාසිකාවන්ට වනාහි; එකාසනිකඞ්ගං පත්තපිණ්ඩිකඞ්ගඤ්ච, එක් අසුන් අහර පත්පිඬුඅහරයයි යන; ඉමානෙව, මොහුම; පතිරූපානි වෙව, සුදුසුද වෙති; සක්කා ච පරිහරිතුන්ති, වළඳන්නට ද පිළිවන් හුනුයි; වෙ ධුතඞ්ගානීති, දුහඟහු දෙදෙනකැයි; එවං, මෙසේ; ව්‍යාස තො, විසතර විසින්; වෙ වත්තාළීස හොන්ති, දෙසාළිසෙක් වෙත්; අයං, මෙතෙම; සමාසව්‍යාසතො වණ්ණනා, සමාසව්‍යාස හෙයින් වණ්ණනායි.

එත්තාවතා, මෙපමණකින්;=පෙ=("ධුතඞ්ගකථා කථිතා හොති" යනු සබඳ.) [ආදිමණිතාව, ආදියෙහිද; සීලානි විසොධෙන්ති එත්ථ, සීලානි විසොධෙන්ති යන මේ මාතෘකාපදයෙහි;] වුත්තපපකාරස්ස සීලස්ස, කියනලද ප්‍රකාර ඇති ශීලයාගෙ; යෙහි, යම්; අපච්චත්තා සන්තුට්ඨිතාදීහි, අපිස් බැව් සතුටු බැව් යනාදිවූ; ගුණෙහි, ගුණයෙන්; මොදනං හොති, පිරිසුදුබව වේද; තෙසං සම්පාදනත්ථං, ඒ අපිස් ආදි ගුණයන් සපයනු පිණිස; සමාදතබ්බධුතඞ්ගකථා, සමාදන්විය යුතු දුහඟ කථා තොමෝ; කථිතා හොති, කියනලද්දී වේ.

2. ධුතාඞ්ගනිද්දේශ නම්වූ
ද්විතීය පරිච්ඡේදය නිමි.

උපග්‍රන්ථය.

විශුද්ධිමාර්ග සන්න-
ශීලනිද්දේශ පරිකථා.

1. පිට.

a. විශුද්ධිමාර්ග නම් වූ ධර්ම්ප්‍රකරණයට සවිස්තරව්‍යාඛ්‍යානයක් කරණු කැමැති කලිකාලඝාතිත්‍ය සම්බුදුපණ්ඩිත **පරාක්‍රමබාහු** මහ රජතෝ ප්‍රාරම්භයෙහි සද්ධර්ම්යාභි පඤ්චකය දක්වනු පිණිස මේ ග්‍රන්ථ කිහු:—

i. යොගීනං, නිර්වාණාධිගමය පිණිස ප්‍රතිපන්න වූ යොගීජනයාට; පාමොජ්ජත්ථාය, ප්‍රමෝද ජනනය පිණිස; විසුද්ධිනයසමණ්ඩිතෝ, ශීල විශුද්ධි ආදි සප්තවිශුද්ධි ක්‍රමයෙන් සරසනලද; යෝ විසුද්ධිමග්ගෝ, යම් විශුද්ධිමාර්ගයක් (අත්‍යන්ත පරිශුද්ධ නිර්වාණාධිගමෝපාය ප්‍රකාශ කරණ හෙයින් විශුද්ධිමාර්ග නම් ප්‍රකරණයෙක්;) වුත්තෝ, සම්බුදුනීතවූ මූලභාෂාවෙන් කියනලදද;

ii. සබ්බභූපාලකෙතූනා, සම්බුදු නරෙන්ද්‍රයන්ට ධ්වජයක් වැනි වූ; ලඞ්කාදීපාධිපතිනා, ශ්‍රී ලඞ්කාද්වීපයට අධිපති වූ; සාසනෝදයකාමිනා, සම්බුදුශාසනාභිවෘද්ධිය පත්තා වූ; පරක්කමතරිද්ධෙන, පරාක්‍රමබාහු නම් මහාරාජයා විසින්;

iii. තස්ස, ඒ විශුද්ධිමාර්ගීයාගේ; එසා සංවණ්ණනා, මේ ඇත්තේ සංවර්ණනාතෝමෝ; සීහලානං නිරුත්තියා, සිංහලද්වීපවාසීන්ගේ (සිංහල) භාෂාවෙන්; මන්දබුද්ධිනං, නුවණ මඳවූ; යොගීනං, යොගී ජනයන්ට; හිතත්ථාය, හිත පිණිස; කථියති, කියනුලැබේ.

b. සඞ්ඛේප, නිම්මාන, කතීන, පරිමාණ ප්‍රයෝජන යන මේ පඤ්ච පදාර්ථය ප්‍රයෝජනත්වයෙන් සඤ්ඤාතය කොට අර්ථව්‍යාඛ්‍යා කළයුතු බව දක්වන්නට ප්‍රාචීනව්‍යාඛ්‍යාන කතීන්ගෙන් විසින් දක්වනලද "**සඞ්ඛේපං නිම්මානං කතීන්නාරම්**" යනාදී ශ්ලෝකය කිහු. එහි අර්ථ සුගම හෙයින් මෙහි නොදක්වනු ලැබේ.

2. පිට.

a. ග්‍රන්ථය පිළිබඳ ප්‍රයෝජන කථනයෙහි හෙතු දක්වනුවෝ "**සම්බුදුස්සෙව**" යනාදි කිහු:—

සම්බුදුස්සෙව හි ශාසනස්ස, සියලුම ශාසනයාගේ ද; කස්සචිත් කම්මණෝ වා අපි, කිසියම් කර්මස්ථානයක්හුගේ ද; ප්‍රයෝජනම්, ප්‍රයෝජනය; යාවත් න උත්තම්, යම්තාක් නොකියනලදද; තාවත්, ඒ තාක්; තත්, ඒ (ශාසනය හෝ කර්මස්ථාන;) කෙන, කවරෙකු විසින්; භාභ්‍යතෙ, හඞ්ගුලැබේද?

ප්‍රයොජනාපෙක්ෂක ජනයන් සඳහා ප්‍රයොජන කථා කියයුතුමය යනු මෙහි භාවයි.

b. විශුද්ධිමාර්ගකරණයෙහි බාහ්‍යනිමිත්ත දක්වන ආචාර්‍යපාදයෝ "ත්‍රිභඤ්ඣාදි ඡෙට්ඨානං"යනාදිය කිහු. මෙයින් භදන්ත සඞ්ඝපාල නම් මහාස්ථවිරයන්ගේ ආරාධනයෙන් විශුද්ධිමාර්ගය කළබව හැඟේ. බුද්ධඝෝෂාචාර්‍යපාදයන් ලක්දිවට පැමිණි කාලයෙහි සඞ්ඝපාල මහාස්ථවිරයෝ සඞ්ඝරාජ පදවි ලැබ මහවෙහෙර විසූහ. බුද්ධඝෝෂාචාර්‍යයන් විසින් යථොක්ත සඞ්ඝරාජයෝ ආචාර්‍යත්වයෙන් ආශ්‍රිත වූහ. මෙහි කතෘ සන්දර්භයෙහි පෙණෙන පරම්පරායාත වාතාවෙහි "සඞ්ඝ යාද අර්ථකථා කරණ්ඩවට ශක්තී පරීක්ෂා සඳහා–තොපගේ සාමර්ථ්‍යය මිහි දක්වව"යනාදීන් පෙණෙන හෙයින් සඞ්ඝතෙමේ මේ ග්‍රන්ථකරණයෙහි බාහ්‍යනිමිත්ත සේ හැඟේ. එය ආචාර්‍යපාදයන් තමන් විසින්ම කියූ ගාථාර්ථය හා නොගැළපේ. එහෙත් සඞ්ඝපාල ස්ථවිරප්‍රමුඛ සඞ්ඝයාගේ අඛ්‍යෙෂණය මේ ග්‍රන්ථකරණයෙහි නිමිත්තවූ බව නිශ්චය කටයුතුවේ.

3. පිට.

a. "මෙහි ග්‍රන්ථ ප්‍රමාණය තුදුස් දහස් දෙබණ වරෙකි"යි කිහ. "අට්ඨ පඤ්ඤාස භණවාරය"යනු ගාථායෙහි පෙණේ. ග්‍රන්ථසඞ්ඛ්‍යා කථා කාවසථා හෙයින් "දෙබණවරෙකි"යනු ප්‍රමාද පතිතයක් සේ පෙණේ. බණවරකට ග්‍රන්ථ දෙසිය පණස (250)ක් බැවින් මෙහි බණවර පණස් අට ග්‍රන්ථ තුදුස්දහස් පන්සියයක් වියයුතු හෙයිනි.

4. පිට.

a. මෙහි කී වස්තුනිර්දේශය නම් "සීලෙ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ"යනාදියයි.

මේ පිටේ 22 වන පෙළේ"ගානනන්තරික"–යනු අශුද්ධයි. මෙහි අධොලිපියෙහි වූ"නානනන්තරියක"යනු ශුද්ධ පාඨයි. අධොලිපිය "නානන්තරිකස. I & II."කියා වියයුතුයි.

"අනන්තරම් (ප්‍රතිබන්ධාදීනා ව්‍යවධානම්) අනුභවතීති=අනන්තරියඃ, අනන්තරියො න භවතීති=නානන්තරියඃ, නානන්තරිය එව **නානනන්තරියකඃ**" යනු විග්‍රහයි. අවශ්‍යමහාවි යනු එහි අර්ථයි.

6. පිට.

a. **අට්ඨසක්ක කාමණාවචරිකඃ**:=එක්සියඅටක් කාමණාවෝ:—

කාමණාතොමෝ රූපතාමණා, ශබ්දතාමණා, ගන්ධතාමණා,
රසතාමණා, ස්ප්‍රෂ්ටව්‍යතාමණා වශයෙන් සයෙ (6) කි.
එක් එක කාම, භව, විභව, වශයෙන් දසඅටෙ (6×3=18) කි.
ආධ්‍යාත්මික බාහිර වශයෙන් සතිසෙ (18×2=36) කි.
අතීත අනාගත වර්තමාන වශයෙන් එක්සිය අටෙ (36×3=108) කි.

විසුද්ධිමග්ග (පඤ්ඤාභූමි නිද්දෙස-ත්‍රි. මූ. 427 පිට), සමන්තපාසාදිකා විනෝදනී(පටිච්චසමුප්පාදවිභඞ්ග-මූ. 159 පිට), අඞ්ගුත්තරට්ඨකථා-මහාවග්ග, ධම්මප්පදට්ඨකථා (මූ. 241 පිට) ආදියෙහි බලන්න.

7. පිටු.

a. "ආවෙණිකබුද්ධියන්" යන මෙහි ආවේණිකධර්මයෝ අට ලොසක් වෙති. එනම්:—

"අතීතංසේ බුද්ධස්ස භගවතෝ අප්පටිහතඤාණං, අනාගතංසේ අප්පටිහතඤාණං, පච්චුප්පන්නංසේ අප්පටිහතඤාණං, ඉමේහි තීහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතෝ සබ්බං කායකම්මං ඤාණපුබ්බඞ්ගමං ඤාණානුපරිවත්තී, සබ්බං වචීකම්මං—පෙ—සබ්බං මනෝකම්මං ඤාණපුබ්බඞ්ගමං ඤාණානුපරිවත්තී; ඉමේහි ඡහි ධම්මේහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතෝ නත්ථි ඡන්දස්ස හානි, නත්ථි ධම්මදේසනාය හානි, නත්ථි විරියස්ස හානි, නත්ථි සමාධිස්ස හානි, නත්ථි පඤ්ඤාය හානි, නත්ථි විමුත්තියා හානි; ඉමේනි දවාදසහි ධම්මේහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතෝ නත්ථි දවා, නත්ථි රවා, නත්ථි අපථුවං, නත්ථි වෙගාසිතත්තං, නත්ථි ආව්‍යාවට මනෝ, නත්ථි අප්පටිසඞ්ඛා උපෙක්ඛානි ඉමේ අට්ඨ රස අවේණිකධම්මා නාම" (ජිනාලඞ්කාර වණ්ණනා 21 පිට.)

1. "භාග්‍යවත් බුදුන්ගේ අතීත කොට්ඨාසයෙහි නොපැකුලුනු නුවණය, 2. අනාගත කොට්ඨාසයෙහි නොපැකුලුනු නුවණය, 3. වර්තමාන කොට්ඨාසයෙහි නොපැකුලුනු නුවණය, 4. නුවණ පෙරටු කොට ඇති නුවණින් පිරිවරණලද කායකර්මය, 5. වාක්කර්මය, 6. මනඃ කර්මය, 7. ධර්මකාමයවූ ඡන්දයාගේ හානියක් නැතිබවය, 8. ධර්මදේශනාවගේ හානියක් නැතිබවය, 9. වීර්‍යයාගේ, 10. සමාධියාගේ, 11. ප්‍රඥාවගේ, 12. විමුක්තියගේ හානියක් නැතිබවය, 13. දව නම් ක්‍රීඩාසිප්‍රය නැති බවය, 14. රව (=බලාත්කාරක්‍රියා), 15. අපථුවයක් (=නුවණින් නුදුටු දෙයක්), 16. වෙගාසිත බවක් (=ඉක්මන් ක්‍රියාවක්), 17. අව්‍යාපෘතමනස්(=නිෂ්ප්‍රයෝජන සිතක්), 18. අප්‍රතිසඞ්ඛ්‍යාන උපේක්ෂාවක් (=අඥාණයෙන් මැදහත්වන බවක්) නැති බවය" යන මොහු අට්ඨ රස ආවේණික ධර්ම නම් වෙත්.

මෙහි "සබ්බ ධම්මේසු අප්පටිහතඤාණවාරෙ" යන පදයෙන් මේ සියල්ලගේ සඞ්ග්‍රහය දතයුතුයි.

b. "චතුර්වෛශාරද්‍යයෙන් විශාරදබු" යන්නෙහි චතුර්වෛශාරද්‍යයෝ නම්:—

1. "සම්‍යක් සම්බුද්ධ භාවයට විරුද්ධව කරුණෙන් ප්‍රතිවෝදනා කරන්නට නිසි සමතෙකු නැතිබව, 2. එසේම ක්ෂීණාශ්‍රව භාවයට (=කාමාදි ආශ්‍රවයන් ක්ෂයකළ බවට)ද, 3. තථාගතයන් වහන්සේ විසින් "මේ ධර්මයෝ සවඥීයට මොක්ෂයට අන්තරායකරය"යි වදළ අන්තරාය කර ධර්මයන්ගේ නියමයටද, 4. තථාගතයන්වහන්සේ විසින් නියම

කරණලද පිළිවෙතෙහි පිළිපදනහුගේ අභිමතවූ දුඃඛනිරෝධයටද විරුඬව කරුණු සහිතව ප්‍රතිවාද කරන්නට සමතෙකු නැතිබවද"යන සතරයි (මජ්ඣිමනිකාය-මහාසීහනාදසුත්ත, ධම්ප්‍රදීපිකා 36 පිට.)

c. "දශබල ඥානබල"නම්:—

1. සථානාසථානඥානය (විය හැකි නොවිය හැකි දෙය දන්නා නුවණ), 2. විපාකඥානය (කුශලාකුශල කර්මවිපාක දන්නානුවණ), 3. සර්වත්‍රගාමිප්‍රතිපදාඥානය (සියලු ගතිවලට පමුණුවන ප්‍රතිපත්ති දන්නා නුවණ), 4. අනේකධාතු නානාධාතුඥානය (සත්ත්වයාගේ නානාවිධ විශේෂ දන්නා නුවණ), 5. අධිමුක්තිඥානය (හීනාධිමුක්තිකාදී සත්ත්වයන්ගේ සංසන්දනය [එකිනෙක හැලපීම] දන්නා නුවණ), 6. ඉන්ද්‍රිය පරාවරතාඥානය(තීක්ෂ්ණේන්ද්‍රිය මෘදින්ද්‍රියාදි ඉන්ද්‍රිය පරිපාටිය දන්නා නුවණ), 7. ධ්‍යානසංක්ලේශාදි ඥානය (ධ්‍යානවිමෝක්ෂ සමාධිසමාපත්තීන්ගේ කෙලෙසීම් පිරිසුදුවීම් ආදිය දන්නා නුවණ), 8. පූර්වේ නිවාසානුස්මරණඥානය(පෙරවුසූ කඳපිළිවෙළ දන්නා නුවණ), 9. චුත්‍යුත්පාද ඥානය (සත්ත්වයන්ගේ චුතිය හා උත්පත්තිය දන්නා නුවණ), 10. ආශ්‍රවක්ෂය කරඥානය(කාමාදි ආශ්‍රවයන්ගේ ක්ෂය දන්නා නුවණ")යන මොහු තථාගතඥානබල නම් වෙත්.

(විභඞ්ගපාලි-ඤාණවිභඞ්ග-පටිසම්භිදා-ඤාණකථා, මහා සීහනාද සූත්‍රය, ධම්මප්‍රදීපිකා.)

b. "හස්තාමලකන්‍යාය"නම්:—

අතට ගත් ආමලකයක් (නෙල්ලිගෙඩියක්) මෙන් සමීපදෘෂ්ටියන් දන්නා නුවණය. මේ නුවණ සමන්තචක්ෂු නම් ඤාණය වේ. මෙහි ආමලක යනු ආමලක නම් ඵලයයි සමහරු කියති. එය ලෞකික න්‍යාය නොදනිමෙන් විය හැක. "කරතලාමලකම්ව, අත්ලෙහි තුබූ මැණික සෙයින්;"යනු මහාබෝධිවංස සන්නයි. "අත තුබූමැණික". යනු එම ගැටපදය. (න්‍යායඤ්ජලිය ලබනු.)

8. පිටු.

a. අෂ්ට අක්ෂණ:

1. "තයෝ අපායා ආරූපපා'සඤ්ඤං පවත්තනිම්මපිච,
පඤ්චින්ද්‍රියානං වෙකල්ලං මිච්ඡාදිට්ඨී ච දූරුණා.

2. අපාතුභාවෝ බුද්ධස්ස සද්ධම්මා'මතදේසිනෝ,
අට්ඨ'ක්ඛණා අසමයා ඉති එතෙ පකාසිතා."

(සද්ධම්මෝපායන.)

1. නිරය, 2. පෙතයෝනිය, 3. තිරශ්චීනයෝනිය, 4. අරූපාවචරය හා අසඤ්ඤතලය, 5. පත්තනිමය, 6. ඉන්ද්‍රියවෙකල්ලය, 7. මිථ්‍යා දිට්ඨිය, 8. අබුද්ධුපාදය. මේ අට චතුස්සත්‍යාවබෝධයට සුදුසු විදර්ශීනා භාවනාමය කුශලයක් නොකළහැකි හෙයින් අක්ෂණයෝ-හෙවත්-අනවකාශයෝ-ඉඩ නැති තැන්)යි කියනලදහ.

b. "කඛො ආවුසො විසාඛ" යනාදි පාඨොඛාරය ආර්‍යමාර්ගීය ශීලාදි සඤ්ඤාත්‍රයෙන් සඞ්ගෘහීත බව සථුට කරණු සඳහා මජ්ඣිම නිකායේ චුල්ලවෙදල්ලසූත්‍රයෙන් ගෙණ මෙහි යෙදූහු.

9. පිට.

a. නිකායාන්තරලබ්ධි:

බුඞඝොෂාචාර්‍යයන් ලක්දිවට පැමිණි කාලයේ ලක්දිව සඞ්ඝයා මහාවිහාර, අභයගිරි, ජේතවන යන නමින් මතාන්තර හෙදයෙන් නිකාය තුණක් වූහ. බුඞඝොෂාචාර්‍යයෝ මහාවිහාර(ථෙරිය)නිකායික මතය ගරු කළහ. අන්‍යමත තීහරු කොට බැහැර කළහ. එහෙයින් (නිකායාන්තරලබ්ධි හා අසම්මිශ්‍ර බැවින්) "මතාකොට පිරිසුදු විනිශ්චය ඇති" යන අර්ථ කියූ.

මෙයින් බුඞඝොෂාචාර්‍යයන්ගේ කෘතියෙහි සෙසු දෙනිකායෙහි මතභෙද නො පිළිගත් බවත් මහාවිහාර වාසීන්ගේ මතයම පිළිගත් බවත් නිරූපිතය.

11. පිට.

a. "එකං වා නිබ්බාණං අයති ගච්ඡතීති එකායනො" යනාදි විග්‍රහ වාක්‍යය විසුද්ධිමඟ ටීකාවෙහි පෙණේ. මෙහි විස්තර **සතිපට්ඨාන** සූත්‍රනවණ්ණනාවෙන් ද දතයුතුයි.

b. "සරණ ලක්ඛණෙන මඟ්ගඵෙන්ත මඟ්ගො ච" යනාදි ටීකාපාඨ යෙන් පූර්‍වයෙහි එකම මාර්ගයයි කී සමාතිය එකක් වතුදු කායාදි ආරම්මණ භෙදයෙන් චතුර්විධ හෙයින් "චත්තාරො **සතිපට්ඨානා**"යි බුදුබස් කීහයි දතයුතු.

12. පිට.

a. "**අප්පමාදරතො**" යනාදි ගය අප්පමාදපදයෙහි සඞ්ග්‍රහ කොට විශුද්ධිමාර්ගීය දෙසූ තැන් දක්වනු සඳහා ධම්මපද-අප්පමාදවග්ගයෙන් ගෙණ මෙහි යෙදූහ.

15 පිට.

a. "ආදිවචනෙනා" යන තැන ආදිශබ්දයෙන්-අඞ්ගුත්තර චතුක්ක නිපාතයෙහි භණ්ඩගාම වග්ගයෙහි ප්‍රථම සූත්‍රාදියෙහි:—

"සීලං සමාධි පඤ්ඤා ච විමුත්ති ච අනුත්තරා,
අනුබුද්ධා ඉමේ ධම්මා ගොතමෙන යසස්සිනා"සී

වදාළ සීල, සමාධි, පඤ්ඤා, විමුත්ති යන චතුර්විධ ධර්මස්කන්ධයන් සඞ්ග්‍රහ වන බවද දතයුතු.

16. පිට.

a. 'සික්ඛානිසංසම්දං භික්ඛවෙ බ්‍රහ්මචරියං" යනාදි පාඨොඛාරය අඞ්ගුත්තරනිකායෙහි චතුක්ක නිපාතයෙහි ආපත්තිභයවග්ගයෙහි තුන්වන සූත්‍රයෙන් ගෙණ ශාසනයාගේ ප්‍රඥොත්තරතාව (=ප්‍රඥාවම පරම ඥොව ඇති බව) දක්වනු පිණිස මෙහි යොදනලදී.

b. "යාදිසෝ ඉට්ඨේසු ලාභාදිසු"යනාදි පාඨය නාදි පදනීය දක්වනු සඳහා කිහු. ඉෂ්ටලාභාදියෙහි සෞම්නස්‍ය ද අනිෂ්ටලාභාදියෙහි දෞර්මනස්‍ය ද නැත්තේ-නොහොත් ලද නොලද ඉෂ්ට අනිෂ්ට ආලම්බන යෙහි නොසැලෙන සම්වෘත්ති ඇත්තේ නාදී නම් වේ. තාදීහුගේ භාවය (=ශබ්දප්‍රවෘත්ති නිමිත්ත) නාදිභාව නම්. ඉටු අනිටු හැම අරමුණෙහිම සම අදහස් ඇති බවය යු තැනි.

17. පිට.

a. "යොගා වෙ ජායතෙ භූරි අයොගා භූරි සඞ්ඛයෝ
එතං දෙවධා පථං ඤත්වා භවාය විභවාය ච,
තථත්තානං නිවෙසෙය්‍ය යථා භූරි පවඩ්ඪති"සි.

ධම්මපද මහාවග්ගයෙහි කී මේ ගයින් "පථවීකසිණාදි අවතිස් අරමුණෙහි යොනිසෝ මනසිකාරයෙහි යෙදීම හෙතු කොට ගෙණ එකාන්තයෙන් ලෞකික ලොකොත්තර ප්‍රඥාව උපදීයයි"කී හෙයින් පුථුජ්ජනාදීන් පරිභාවිත ප්‍රඥාව සිවුපිළිසැඹියා හෙදයට හෙතුවන බව දක්වනු පිණිස "යොගා වෙ ජායතෙ භූරි"යනු මෙහි උද්ධෘතය.

18. පිට.

a. "කාමාදි නව භව" නම්:—

කාම, රූප, අරූප, සඤ්ඤී, අසඤ්ඤී නෙවසඤ්ඤී, නාසඤ්ඤී, එක වොකාර, චතුවොකාර, පඤ්චවොකාර යන මොහු කාමාදී නව භවයෝ වෙත් (විභඞ්ගපාළි, පරමත්ථජෝතිකා. ත්‍රි: මූ. 13 පිට.)

b. "දීපාලොකෙනෙව තමසා"යනාදිය පිකාපාඨයි. දීපාලෝක යෙන් අන්ධකාරයාගේ ප්‍රහාණය මෙන් පුඤ්ඤකිරියවත්තුකවූ අලෝභාදී ඒ ඒ කුශලාඞ්ගයෙන් ලෝභාදී ඒ ඒ අකුශලාඞ්ගයාගේ ප්‍රහාණය තදඞ්ගප්‍රහාණ නම්.

19. පිට.

a "දුච්චරිතමෙව සන්තානං"යනාදිය"දුච්චරිත සංකිලෙස"යන පදයේ අර්ථ ප්‍රකාශ කළ පිකාගත විග්‍රහවාක්‍යයි. කායාදි දුශ්චරිතයම සන්තානය කෙලෙසන හෙයින් සංකිලේශ නම් වේ.

20. පිට.

a. එවං යනාදි නිගමනයෙහි අර්ථ 14 පිටේ "එතකාවතා තීසෙසා සිකඛා"යනාදීන්ට කී අර්ථවශයෙන් දතයුතුයි.

b. මෙහි සීල සමාධි සඤ්ඤා මුඛයෙන් ත්‍රිවිධ විවෙක, ත්‍රිවිධ කුශලමූල, ත්‍රිවිධ විමොක්ෂමුඛ, ත්‍රිවිධ ඉන්ද්‍රිය යනආදී සෙසු ගුණ ත්‍රිකයෝ ද ප්‍රකාශිත වෙත්ගයි කිහු.

එහි-විවෙකනිද්දේශ:—

"සීලෙ පතිට්ඨාය" යනාදී ගාථාවෙහි විවේකාසන්නාශ්‍රිත ශීලය අභිප්‍රේත හෙයින් ශීලයෙන් (1) කායවිවේකයද, සමාධියෙන් (2) චිත්ත විවේකයද, ප්‍රඥාවෙන් (3) උපධිවිවේකයද ප්‍රකාශිත වෙත්.

කුශලමූලනිද්දේශ:—

ශීලය ක්ෂාන්තිය ප්‍රධාන කොට ඇති බැවින් හා අපරෝපකාන්ත ස්වභාවයෙන් ශීලයෙන් (1) අවෙෂකුශලමූලය ද, ලෝභ ප්‍රතිපක්ෂ බැවින් අලෝභ ප්‍රධානභෙයින් සමාධියෙන් (2) අලෝභකුශලමූලයද, ප්‍රඥාවෙන් (3) අමෝහකුශලමූලයද ප්‍රකාශිත වෙත්.

විමෝක්ෂමුඛනිද්දේශ:—

අවෙෂය ප්‍රධාන කොට ඇති සීලසම්පදාවෙන් වෙෂයෙහි ආදීනවය දක්නාකට අතීත්‍යානුදර්ශනය සුවසේ සම්පාදනය වන හෙයින් ශීලයෙන් (1) අනිමිත්ත විමෝක්ෂමුඛය ද, සමාධිය තමා අලෝභ ප්‍රධාන හෙයින් කාමනිඃසරණයවූ සමාධි සම්පදාවෙන් කාමයෙහි ආදීනව දක්නහුට දුක්ඛානුපස්සනාව සුවසේ සැපයෙන හෙයින් සමාධියෙන් (2) අප්පණිහිතවිමෝක්ෂ මුඛය ද, ප්‍රඥාසම්පත්තියෙන් අනත්තානුපස්සනාව පහසුවෙන් සැපයෙන බැවින් ප්‍රඥාවෙන් (3) සුඤ්ඤතා විමෝක්ෂමුඛය ද ප්‍රකාශිත වෙත්.

ඉන්ද්‍රියනිද්දේශ:—

සීලයෙහි පරිපූර්ණකාරීවූ අෂ්ටම ආර්‍ය්‍ය පුද්ගලයාගේ ඉන්ද්‍රියය හෙයින් ශීලයෙන් (1) අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියය ද, සමාධියෙහි පරිපූර්ණකාරීවූ අනාගාමීහුගේ හා අග්‍රමාර්ගීඵලයාගේ උත්තරීයට පැමිණි ඉන්ද්‍රිය හෙයින් සමාධියෙන් (2) අඤ්ඤින්ද්‍රියය ද, තදුත්පාදභෙයින් රහත්හු ප්‍රඥාවෙහි පරිපූර්ණකාරී බැවින් ප්‍රඥාවෙන් (3) අඤ්ඤාතාවින්ද්‍රියය ද ප්‍රකාශිත වෙත්.

මෙහි ආදී ශබ්දයෙන් රාගප්‍රහාණාදී ප්‍රහාණනිද්දේශය, අධිශීල ශික්ෂාසමාදානාදී ශ්‍රමණකාර්‍ය්‍යනිද්දේශය, අධිසීලශික්ෂාදී සෙඛපටිපදා නිද්දේශය, වර්ණසම්පදාදී භික්ෂුසම්පත්තිනිද්දේශය, කුශලකර්මාදී නිදානනිද්දේශය, සීලසම්පදාදී සම්පත්තිනිද්දේශය යනාදී ගුණනිද්දේශයෝද ගතයුතු වෙත්.

21. පිටු.

1. ගොබලීවද්දීන්‍යාය:

"ගොබලීවද්දීයෝ ආහ"යි කීකල ගොශබ්දයෙන් සාමාන්‍ය ගවයෝ ද බලීවර්දී ශබ්දයෙන් ප්‍රධාන වෘෂභයා ද ගැණෙති. එමෙන් මෙහි චෙතනා ශබ්දයෙන් සෙසු චෛතසිකයන් අරම්මණෙහි යොදවන කුශලචෙතනාව ද, චෛතසික ශබ්දයෙන් විරති, අනභිධ්‍යා, අව්‍යාපාද, සම්මාදිට්ඨි යන චෛතසිකයෝ ද ගැණෙත්. එහෙයින් මෙහි විරති අනභිධ්‍යාදි ශීලයම **චෙතනාශීල** නමැති දතයුතුයි

23. පිට.

a. "මෙම කිහ අට්ඨකථායෙහිදු"යන තැන්හි ප්‍රකාශිතවූයේ පරමත්ථ ජෝතිකා නම් සූත්‍රනිපාත අට්ඨකථාවයි. එහි අජිතසුත්තවණ්ණනාව (ත්‍රි. මූ. 471 පිට) බලනු.

"විපස්සනා යුත්තා කුසලාකුසලානං ධම්මානං ගතියෝ සමන්නෙන සම්මතා සති තෙසං සොතානං නිවාරණං"යනු අට්ඨකථායි. සන්නයේ "සම්පෙක්ඛාසමාධිනා"යනු "සමණෙන සමනා"යි පෙණේ. එය ප්‍රමාද පතිතයකි.

"සන්ෂයෙනිදු-'සොතානං සංවරං බ්‍රූමි'යි යට සතිසංවර කිහ"යන මෙහි කි සන්ෂය කුමක්දැයි අවිනිශ්චිතය. පරාක්‍රමබාහුරජ් විශුද්ධි මාර්ගයට සන්න ලිවීමේදී ආශ්‍රිත වූ විශුද්ධිමාර්ගය සම්බන්ධ වූ සිංහල අර්ථවර්ණනාවෙකැයි සිතිය හැක.

සිංහලයෙන් ලියූ විශුද්ධිමාර්ගයට සමාන පිම්මුකතිමාර්ග නම් ධර්ම ප්‍රකරණයක් තුබූ බව කණ්ඩාකණ්ඩ වාර්තාවයි. මෙය පරාක්‍රමබාහු රජුට දක්නට ලැබුනාද? නැත්නම් අන්‍යතරයෙකු විසින් ලියූ විශුද්ධිමාර්ග සන්නයක් තිබී රජතුමා එය තමන්ගේ කෘතියෙහි පරිශීලනය කෙළේදැයි සැක කටයුතු. කෙසේ නමුත් පරාක්‍රමබාහුරජ පෙරතුබූ සන්නයේ අර්ථවිවරණ අනාදෘත බව සඛකිය කෘතියෙහි මතාන්තර වශයෙන් දක්වා තිබෙන පාඨෝද්ධාර වලින් නිශ්චිතය.

b. මෙහි-ඛන්තිසංවර නම්:-මජ්ඣිමනිකායයෙහි සබ්බාසවසුත්‍රයෙහි "කතමෙ ච භික්ඛවෙ ආසවා අධිවාසනා පහාතබ්බා? ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛායොනිසො ඛමො හොති සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය=පෙ=ඉමෙ වුච්චන්ති භික්ඛවෙ ආසවා අධිවාසනා පහාතබ්බා"යි යනාදීන් වදාළ අධිවාසනා සඞ්ඛ්‍යාත ඛන්තිසංවරයයි-හෙවත්-නුවණින් මෙනෙහි කොට ශීතොෂ්ණාදිය ඉවසීමෙන් කාමාසව භවාසව දිට්ඨාසව අවිජ්ජාසව යන චතුරාශ්‍රවයන්ගේ ප්‍රහාණයයි. මෙහි විස්තර පාලිය හා තදර්ථකථාව බලා දතයුතුයි.

c. විඝිඝසංවර නම්:—

"ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛායොනිසො උප්පජ්ජාං කාමවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති" යනාදීන් වදාළ අයොනිසො මනසිකාරාදි වසයෙන් උපන් කාමාදි නවමහාවිතර්කාදිය "අකුසල්ය, වරදය, තමාහවත් පීඩාකරය, මෙරම, හටත් පීඩාකරය"යනාදීන් යොනිසොමනසිකාරයෙන් සලකා සිත්හි වාසය කරවා නොහැණීමය-බැහැර කිරීමය යනාදීන් දැක්වූ විනෙ, දනා සඞ්ඛ්‍යාත වීර්‍යසංවර යයි-හෙවත්-වීර්‍යයෙන් කාමාදි විතර්කයන් බැහැර කිරීමෙන් කාමාසවාදිය ප්‍රහාණය කිරීමයි.

25. පිටු.

a. ශිරසඝ-උත්තමාඛ්‍යය යන අර්ථයෙහි පවත්නා "සීල"ශබ්දය වාණිජගමය, වණිජ්‍යපථ්‍යය, වණිජ්‍යවිකාරය, වණිජ්‍යනාශය,(වණිජ්‍යවිකාරත්‍රාශ දෙකින්) ධාත්වර්ථාතිශයයොගය යන පඤ්චවිධ නිරුක්තවිධි අතුරෙන් වණිජ්‍යවිකාර විධින් "ශීඝ්‍රං" කියයුතු තැන සකාරයට ලකාර කොට "ශීලං"යි සිඹවූ බව දක්වනු පිණිස "වණිජගමෝ"ඝනාදි කිහු.

b. "සයතති අකුසලා එතසම්ං සති අපවිබා හොන්තීති=සීලං" ඝන්නාදි වාක්‍ය "එවමාදිනා නයෙන"ඝන තැන ආදිශබ්දයාගේ අර්ථ දක්වනු පිණිස කියන ලදී. මෙහි "කෙනට්ඨෙන සීලං? සීලනට්ඨෙන සීලං. කිම්දං සීලනං? සමාදානං වා කායකම්මාදීනං, උපධාරණං වා කුසලානං ධම්මානං' යි ශීලශබ්දයාගේ අර්ථ දක්වා "එතදෙව අත්ථවයං සද්දලක්ඛණවිදූ අනුජානන්ති"යි ඝන මෙයින් "සීල=සමාධිම්හි" ඝන භූවාදි ගණීක වූ ද, "සීල=උපධාරණෙ" ඝන චුරාදිගණීක වූ ද 'සීල' ධාතූහුගේ අර්ථය ම ශාබ්දිකයන් විසින් අනුඥාත බව කියනලදී.

මෙහි භූවාදි ගණයෙහි නම්'සීලතීති'(සීලං)ඝන රූපය වේ. "සමාධියති"ඝනු එහි අර්ථයි.

චුරාදිගණයෙහි නම් "සීලෙති, සීලයතීති"(සීලං)ඝන රූප වෙත්. "උපධාරෙති"ඝනු එහි අර්ථයි.

"සීලති සමාධියති කායකම්මාදීනං සුසීල්‍යවසෙන න විප්පකිරතීති සීලං. අථවා "සීලනති සමාදහනති චිත්තං එතෙනාති සීලං"ඝනු භූවාදිගණීක සීලධාතුවෙන් නිපන් 'සීල'ශබ්දයේ නිර්වචනයි.

"චිලෙති කුසලෙ ධම්මෙ උපධාරෙති පතිට්ඨාභාවෙන භුසො ධාරෙතීති සීලං, සීලෙනති වා එතෙන කුසලෙ ධම්මෙ උපධාරෙන්ති භුසො ධාරෙනති සාධවොති සීලං"ඝනු චුරාදි ගණීක 'සීල' ශබ්දයේ නිර්වචනයි.

"අසෙසඤ්ච පන සිරත්ථො=සීලත්ථො, සීතලත්ථො=සීලත්ථො'ති එව මාදිනා නයෙන"ඝන මෙහි ආදිශබ්දයෙන් ගතයුතු සෙසු අර්ථයන් දැක්වීම පිණිස "සයතති අකුසලා එතසම්ං සති" ඝනාදි නිර්වචන දැක්වූහ.

28. පිටු.

a. "වුත්තං හෙතං"ඝන මෙහි "අවිප්පටිසාරත්ථානි බො ආනන්ද කුසලානි සීලානි"ඝනාදින් අඞ්ගුත්තර නිකායෙහි දසකනිපාතයෙහි වදාළ පාලිප්‍රදේශයෙන් අවිප්‍රතිසාරය (විප්‍රතිසර නොවීම) සීලයාගේ ඵලමාත්‍රවූ අනුබඳ්ධඵලඝයිද, අවිප්‍රතිසාරය හෙතු කොට හෙණ සමාධි පඤ්ඤා විමුත්ති විමුත්ති ඤාණදර්ශන ආදි සීලයෙන් සම්පාදනය කට යුතු වූ ගුණයම මුඛ්‍යඵලඝයිද දැක්වූහ.

b. "අපරම්පි වුත්තං" යනාදින් දීඝනිකාය මහාපරිනිබ්බාණ සූත්‍ර-අඞ්ගුත්තර පඤ්චකනිපාත ආදියෙහි වදාළ පඤ්චානිසංසයෝ ලෞකිකවූ සිලානිසංස වශයෙන් දක්වන ලදහ.

29. පිළිවෙල.

a "සීලසම්පති සුත්‍රාගත වූ" යන තැන සීලසම්පති සූත්‍ර නම්: මජ්ඣිමනිකායෙහි **ආකඞ්ඛෙය්‍ය** සූත්‍රයයි. එහි —

"සම්පන්නසීලෝ භික්ඛු සබ්‍රහ්මචාරීනං පියෝ හොති මනාපෝ, ගරුභාවනියෝ, පච්චයානං නිකාමලාභී, පච්චයදායකානං මහප්ඵල කරෝ, අරහිරනිසභෝ, භයහෙරීව සහෝ, රූපාවචරජ්ඣානානං අරූපාවචරජ්ඣානානං ච ලාභී, හෙට්ඨිමානි තීණි සාමඤ්ඤඵලානි, පඤ්චලෝකියාභිඤ්ඤා, ආසවක්ඛය ඤාණන්ති"යි දක්වන ලද ලෞකික ලොකොත්තරවූ සතළොස් සිලානිසංසයෝ මෙහි ආදිග්‍රහණයෙන් සංගෘහීත වෙත්.

b. මෙහිකී ගඞ්ගාදි නදීහු දඹදිව උතුරේ සිට නැගෙණහිර මුහුදට ගලාඑන බ්‍රාහ්මණ් විසින් පාපමල ශෝධනයෙහි හා තෘෂ්ණා මොහ විධ්වංසනයෙහි සාධුත්වයෙන්කල්පිත වූ ගඞ්ගාවෝය.

කිඹේ මැයි —

"ගඞ්ගා සරස්වතී ශෝණ යමුනා සරයූ: සවී
වේණා ඉරවතී නීලා උත්තරාත්ත පූජිවාහිනී
හිමවත් ප්‍රභවාහ්‍යෙතා හිමසම්භව ශීතලා:
සමා: සතීගුණේ නීදේ‍ය වාතශ්ලේෂ්මහරානණාම්
ආසාං නවශතෙඑස්ත්‍රීකතා ගඞ්ගාපූජි සමුද්‍රගා."

මෙහි **ගඞ්ගා** නම්:

"ගම්‍යතෙ ප්‍රාප්‍යතෙ ඉප්‍යතෙ මොක්ෂාර්ථිභිර්‍යා සා ගඞ්ගා"යි නිර්වචන හෙයින් මොක්ෂාර්ථීන් විසින් (මිදෙනු කැමැතියන්) විසින් යමක් තොමෝ සොඑනු ලැබිද-යනු ලැබිද-දැනගණුලැබි ද ඕ තොමෝ **ගඞ්ගා** නම් නදියයි. මෝතොමෝ මනුලොව පවී සොඳ හරණට දෙවියන් විසින් හිමාලය පර්වතයෙන් ප්‍රභව කොට දෙනලද්දීයයි පුරාණ ප්‍රණෙතෘන් විසින් කියනලදී. ඕතොමෝ පිරිවර නදීන් නව සියයක් ඇත්තී ශිඛීනාගයෙහි අහස්ගඟ නමින් ද මධ්‍යභාගයෙහි හා අධොභාගයෙහි නානා නමයෙන් ද, සුරනිම්නගා, භාගීරථී යනාදි නාමයෙන් ද ව්‍යවහෘතය.

යමුනා—හිමාලය දකුණු දෙසින් පටන්ගෙණ ප්‍රයාග නම් තීර්ථ ස්ථානයේදී ගඞ්ගානදිය සමග එක්වී යන කාලින්දියයි ප්‍රසිද්ධ නදියයි. **කලින්දි** නම් පර්වතය ප්‍රභව කොට ඇති හෙයින් කාලින්දියයි කියනු ලැබේ.

මෙහි ජලගුණ නම්: පිත්ත, දාහ, වමන, ශ්‍රම නැසීමය, මධුරරසය, වාතජනනය, පාවනය, අග්නිදීපනය, රොචනය, බලප්‍රදනය යන මොහුයි. "මෝතොමෝ යමයාගේ භගිනියය"යන අර්ථ හෙයින් **යමුනා** යයි කියනු ලැබේ.

සරබ්බූ—සරයූ නෝ සරයූයයි ප්‍රසිද්ධ අයොද්ධ්‍යාදෙශවර්තී නදියයි. මෙහි "සරයූ"යි දන්ත්‍යසකාරාදි පාඨය බහුශම්මතයි.

සරඝඨි—ඝඨා විසින් කළ සාපයෙන් ජලචරරූපයෙන් මනු ලොව පව් හා මිශ්‍රවනු පිණිස භාරත පථයට පැමිණි **සරඝඨීයයි** සලකනු ලබන නදියයි. මෝතොමෝ රසවත් ජලය ඇති හෙයින් ද සරඝවතීයයි කියනු ලැබේ.

අචිරවති—ඉරාවතී (වර්තමානයෙහි ඉරවඩි) යයි ප්‍රසිද්ධ මහා නදියයි.

මහී—මාලවදෙශවර්තීනී මහා නදියයි.

ගාථායෙහි කී වාශබ්දයෙන් අනුකථන චන්ද්‍රභාගාදිහු ද ගතයුතුයයි කිහු. එහි:

චන්ද්‍රභාගා—හිමාලයෙන් පටන්ගෙණ උතුරේ කාශ්මීරය මැදින් හලාගොස් **පඤ්ඣබ්හිදී** ඉන්දුනදියට එක්වී යන නදියයි.

මෙහි ආදි ශබ්දයෙන් **නම්මදා, ශොදුවරී, බාහුකා, අධිකකක්කා, ශබරා, සුඤ්ඣිකා, පයාග, බාහුමතී** යනාදීන්ගේ සඞ්ග්‍රහය දතයුතුයි.

මේ සියලු නදීහු උදක ශුද්ධීන් විසින් ශුද්ධත්වයෙන් කල්පිත නමුත් සත්ත්වයන්ගේ පාපමලශොධනයෙහි එකාන්තයෙන්ම අස මර්ථයහ.

එහෙයින් ශීල නැමැති ජලයෙන්ම රාගවෙෂාදි කෙලෙසමලයන්ගේ ශුද්ධිය වන්නේය යි දතයුතු.

6. මෙහි කී "**භගීවඤ්ඣන, මුක්තාහාර, වෛදූර්‍යමණි, චන්ද්‍රරශ්මි**" යන මොහු ලොකයෙහි ශීතත්වයෙන් කල්පිතයෝය.

භගීවඤ්ඣන නම්: ගොශීර්ෂ නම් මලය පර්වතෙකදෙශයෙහි හට ගන්නා රත්වන් සඳුන් වෙසසෙකි. උදුනෙහි කකාළ තෙලෙහි බහාලූ පමණින් තෙලුත් ගිනිත් නිමන්නට සමර්ථ හෙයින් ජලය මෙන් සිහිල් සඳුනැයි යන අර්ථයෙන් මෙයට ගොශීර්ෂ චන්දනයයිද කියත්.

30. පිටු.

8. "**කෙලඤ්ඣාංඛුරං න ප්‍රකනොති ශීලං**" යනාදි ශ්ලොකය දෙෂයන්ගේ බලඤ්ඣතනයෙහි ශීලයාගේ සමර්ථභාවයට සාධක වශයෙන් කියන ලද්දකි.

"කල් ඉක්මගිය බීජය අඞ්කුර නොගන්නාක් මෙන් ශීලයතෙමේ කෙලඟ නැමැති අඞ්කුර නොපතුරුවයි=නොවඩයි, ශීලය පිරිසුදු කල්හි පුරුෂයාගේ කායදුශ්චරිතාදි දෙඟයෝ සිතෙහි ලජ්ජාව මෙන් වැනසී යත්"යනු එහි අර්ථයි.

32. පිට.

a. ආජීවය අවවැනි කොට ඇති සීලයම ආදි හෙයින්-හෙවත්-සුපරිසුඛවූ ත්‍රිවිධ කායකර්මයන් හා චතුර්විධ වාක්කර්මයන් මාර්ගබ්‍රහ්ම චර්‍යාවට පළමුවෙන් නිපදවියයුතු හෙයින් "ආදි භාවතෘත්වං"යි කීහු. මෙහි දෙශනා ක්‍රමයෙහි සම්‍යග්දෘෂ්ටිය ආදිවුවද ප්‍රතිපත්ති ක්‍රමයෙහි ප්‍රාතිමෝක්ෂ ශීලසංවර නැති ගිහියන් විසින් ද සම්‍යක් ආජීවය පිරිය යුතු හෙයින් ආජීවය අටවනුකොට ඇති ශීලයම ආදිභූතයයි දතයුතුයි.

b. ආජීවාෂ්ටමක ශීලයම ආදි බැව් දක්වනු පිණිස අඞ්ගුත්තර නිකායෙහි වදාළ "පුබ්බෙවස්ස කායකම්මං වචීකම්මං ආජීවෝ සුපරිසුද්ධෝ හොති"යන පාඨය දක්වන්නලදී.

34. පිට.

a. මෙහි කී හෙතු-ප්‍රත්‍යය දෙදෙනා නානාඵලයෙහි ද එකාඵලයෙහි ද පවතින්.

එහි එකාඵපක්ෂයෙහි කියයුත්තෙක් නැති. නානාඵලපක්ෂයෙහි:- හෙතුව අසාධාරණ ලක්ෂණය, ප්‍රත්‍යය සාධාරණ ලක්ෂණය; කුමක් මෙන් ද යත්? අඞ්කුරයට බීජය මෙනි. අඞ්කුර ඝටගැණීමට බීජය අසාධාරණය. පඨවී-අපොධාතු (භූමිය පොදු හෙයින්) සාධාරණයහ. එහෙයින් අඞ්කුරයට බීජය හෙතුය, පෘථිවී ආප් දෙක ප්‍රත්‍යයහ.

කළයෙහි බැහැර කිරි දී වෙයි. කිරි දී දෙදෙනාගේ එක්විට සමවය යෙක් නැත. එමෙන් හෙතුප්‍රත්‍යය දෙදෙනාගේ එකකාල සම්භවයෙක් නැත. එහි සමනන්තර හෙතුය, පරම්පර හෙතු යයි හෙතුවද දෙවැදෑරුම්ය. බීජය- අඞ්කුරයට සමනන්තර හෙතුය. එලෝතපත්තියට පරම්පර හෙතුය

සභාවය හෙතුය, පරභාවය ප්‍රත්‍යයය; අධ්‍යාත්මිකය හෙතුය, බාහිරය ප්‍රත්‍යයය; ජනකය හෙතුය, පරිග්‍රාහකය ප්‍රත්‍යයය. මෙසේ හෙතුප්‍රත්‍යය දෙදෙනා නානාඵවතුදු මෙහි එකාඵ බව හෙයින් "ලාභකාරණා"යි කීහු.

35. පිට.

a. "ඝථාහ"- විනය- පරිවාරපාලි- චුල්ලසඞ්ගාමයෙහි "විනයෝ සංවරත්ථාය"යනාදිය වදාළහ. (මූද්‍රි. 219 පිට බලනු.)

39. පිට.

a. "කවමභාවිතකකී"නම්:

(1) කාමවිතකක, (2) ව්‍යාපාදවිතකක, (3) විහිංසාවිතකක, (4) ඤාති විතකක, (5) ජනපදවිතකක, (6) අමරවිතකක, (7) පරානුද්දයතා පටිසංයුත්තවිතකක, (8) ලාභසක්කාරසිලොකපටිසංයුත්තවිතකක, (9) අනවඤ්ඤත්තිපටිසංයුත්තවිතක යන මොහුයි. (අභිධම්ම-විභඞ්ග පාලි සුත්තනිපාත—ගෙමක සුත්ත, අනඝසුත්ත.)

40. පිට.

a. "උත්තරකුරුකානං මනුස්සානං අවීතික්කමෝ පකතිසීලං"

මෙහි: උතුරුකුරුදිවයින් වැසි මිනිසුන්ගේ පඤ්චශීලය උත්පත්ති යෙන්ම නියතවූ ශීලයකි. උතුරුකුරුදිවයින් වැස්සෝ උත්පත්ති නියත හෙයින් පණිවා නොකෙරෙති, අයිනාදන් නොකෙරෙති, පරදූරිසෙවුන නොකෙරෙති, (ඔවුනට තමඹුවන් කෙරෙහිදු මමත්ව යෙක් නැත, නැතොත්නැ මාගමුන් දැක රාගයිතකුදු නොඋපදනේය.) මුසවා නොකියති, රහමෙර නොබොති. මෙසෙයින් ඔවුන්ගේ ශීලය, පකතානි ශීලානියි-හෙවත්-සවභාවයෙන්ම සිදුවූ ශීලයයි කියූ.

b. "කුලදෙසපාසණ්ඩානං අත්තනෝ අත්තනෝ මරියාදභතං වාරිත්තං ආචාරසීලං."

මෙහි: ඒ ඒ කුලයන්ගේ ද ඒ ඒ දෙශවාසීන්ගේ ද ඒ ඒ පාෂණ්ඩ යන්ගේ ද ඒ ඒ වරද නොකිරීමෙහි ශික්ෂා කොට ඒ ඒ කුලදෙශාදී යෙහි පූර්වපුරුෂයන් විසින් තබනලදුව පවත්වා ගෙණ එනලද වාරිත්‍රය-හෙවත්-කුලධර්ම, දෙශධර්ම, පාෂණ්ඩධර්ම ආචාරශීලයයි කියූ.

"තත්ථ කුලධම්මෝ තාව බ්‍රාහ්මණාදීනං අමජ්ජපානාදි; දෙසධම්මෝ එකච්චජනපදවාසීනං අහිංසනාදි; පාසණ්ඩධම්මෝ තිත්ථියානං යම නියමාදි"යනු ටීකායි.

එහි: බ්‍රාහ්මණාදීන්ගේ අමද්‍යපාන, අමාංශභක්ෂණාදිය කුලධර්මයි. සමහර ජනපදයන්හි වැසියන්ගේ සත්ත්වහිංසනාදිය නොකිරීම දෙශ ධර්මයි. තීර්ථියන්ගේ යම නියමාදිය පාෂණ්ඩ ධර්මයි.

"තිත්ථකර මනං දිට්ඨිපාසෙන ච තණ්හාපාසෙන ච බෙති පවත්ත තීති, පාසං වා අරියවිනයස්ස බෙතීති=පාසණ්ඩාති වුච්චති-"

(තීර්ථකයන්ගේ සිත දෘෂ්ටිපාශයෙන් හා තෘෂ්ණාපාශයෙන් පවත් නේය යන අර්ථයෙන් හෝ ආර්ය්‍ය විනයට=බුදුසසුනට බාධාවූ දෘෂ්ටි පාශය පවත්වන්නේය යන අර්ථයෙන් හෝ පාශණ්ඩයයි කියනු ලැබේ. මෙහි පාෂණ්ඩ ශබ්දයෙන් තීර්ථකයන් හා ඔවුන්ගේ දෘෂ්ටි ජාතය කියනු ලැබේ.)

එහි: **බ්‍රහ්මජාලසූත්‍ර**යෙහි ආ දෙසැටක් දෘෂ්ටිහුද-

"චතුර්විධා භික්ෂවසෙත කුථිවකබහුදතෙෘ,
හංසා පරමහංසශව යොඃත්‍රපශ්‍යාත් ස උත්තමඃ."

යනාදීන් කී කුථිවක, බහුදක, හංස, පරමහංසාදී සිව්තිසක්දෙසි පාෂණ්ඩදෘෂ්ටීහු සයාත්‍රුවෙකි. මේ පාෂණ්ඩදෘෂ්ටි ගත්තෝ පාෂණ්ඩ යයි ද තීර්ථක යයි ද සත්‍යාසි යයි ද කියත්‍රුලැබෙති. ඒ පාෂණ්ඩයන් අතර හෝ ඔවුන්ගේ සසුන්හි හෝ පැවත ආ යමනියමාදි චාරිත්‍ර ධර්ම පාෂණ්ඩ ධර්ම නම් වෙති.

එහි: යම නම් අහිංසා (සත්ත්වහිංසා නොකිරීම)-සත්‍යවචන-බ්‍රහ්මචර්‍ය්‍ය-අවඤ්චා (වඤ්චා නො කිරීම=කුටිඋපායාදියෙන් නොරැවටීම) -අස්තෙය (=නොසොරබව) යන පඤ්චප්‍රකාරව්‍රතයෝය, ඉන්ද්‍රියදමනය ආදි සංයමය යන මොහුය. මේ සියල්ල දෙහසාධනය=ශරීරයෙන්ම සිඳ කටයුතුබව අපෙක්ෂා කොට ඇති හෙවත් යාවජීවයෙන් (දිවි ඇති තාක්) පිරියයුතුවූ නිත්‍යකර්ම්යි.

නියම නම්: උපවාසය, වෛතුක ව්‍රතය, වකව්‍රතය, විඩාලව්‍රතය යනාදි අනිත්‍යවූ ආගනතු සාධනවූ නොහොත් ශුක්ලපක්ෂාදි නියමිත කාලයෙහි උපවාසාදි වශයෙන් හෝ ශරීරයෙන් පිටත් ගිනි, දර, ගිතෙල්, මැටි, කුසතණ ආදියෙන් හෝ සිද්ධකටයුතු වූ කර්ම්යි.

එහෙයින් කීහ පාළිතිසඤ්ඤුවෙහි:

"යං දෙහසාධනා පෙක්ඛං නිච්චං කම්ම'ඃං යමෝ,
ආගනතුසාධනං කම්ම ම'නිච්චං නියමෝ භවෙ."

41. පිට.

ඇ. "එවං වුත්තං"යන මෙහි:

"ඉධ භික්ඛවෙ භික්ඛු පාතිමොක්ඛසංවරසංවුතෝ විහරති ආචාර ගොචරසම්පන්නෝ අණුම්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදය සික්ඛති සික්ඛාපදෙසු"යි මෙසේ (**අඞ්ගුත්තරනිකාය**-තිකනිපාත-චතුක්ක නිපාත, **මජ්ඣිමනිකාය**, **දීඝනිකාය**-සාමඤ්ඤඵලසූත්‍ර-සුභසූත්‍ර, **බුද්දකනිකාය**-නිද්දෙසපාළි-ගුහට්ඨකසූත්‍ර, **අභිධම්ම**-ඛ්‍රානවිභඞ්ග යනආදි නොයෙක් තැන්හි) වදාළ ශික්ෂාපද ශීලය ප්‍රාතිමොක්ෂ සංවර ශීලයයි දතයුතු.

42. පිට.

ඇ. "සංවුත්තං"යන තැන "**සෝ චක්ඛුනා රූපං දිස්වා**"යනාදීන් **අභිධම්ම**-ඛ්‍රානවිභඞ්ග, **මජ්ඣිමනිකාය**-සබ්බාසවසූත්‍ර, චූළහත්ථිපදෝ පම්සූත්‍රාදියෙහි හා ප්‍රාතිමොක්ෂසංවරශීලය දක්වූ දීඝනිකායාදී ඒ තැන්හි වදාළේ ඉන්ද්‍රියසංවරසීලයයි දක්වූ.

b. ආජීවහෙතුවෙන් පනවනලද ශික්ෂාපදයෝ සදෙන නම්:—

1. ආජීවහෙතු ආජීවකාරණා පාපිච්ඡෝ ඉච්ඡාපකතෝ අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපති ආපත්ති **පාරාජිකස්ස.**

2. ආජීවහෙතු ආජීවකාරණා සඤ්චරිත්තං සමාපජ්ජති ආපත්ති **සඞ්ඝාදිසේසස්ස.**

3. ආජීවහෙතු ආජීවකාරණා යෝ තෙ විහාරෙ වසති සෝ භික්ඛු අරහා'ති භණති ආපත්ති **ථුල්ලච්චයස්ස.**

4. ආජීවහෙතු ආජීවකාරණා භික්ඛු පණීතභොජනානි අත්තනෝ අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති **පාචිත්තියස්ස.**

5. ආජීවහෙතු ආජීවකාරණා භික්ඛුනී පණීතභොජනානි අත්තනෝ අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති **පාටිදෙසනීයස්ස.**

6. ආජීවහෙතු ආජීවකාරණා සූපං වා ඔදනං වා අගිලානෝ අත්තනෝ අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති **දුක්කටස්ස.**

විනය-**පරිවාරපාළි** (මූ. 198 පිට බලනු.)

45. පිට.

a. **"දශආක්‍රොශවස්තු":**—

(1) වොරොසි, (2) බාලොසි, (3) මූළෙහොසි, (4) ඔට්ඨොසි, (5)ගොණොසි, (6)ගද්‍රභොසි, (7) නෙරයිකොසි, (8) තිරච්ඡානගතොසි, (9) නත්ථි තුය්හං සුගති, (10) දුග්ගතියෙව තුය්හං පාටිකඞ්ඛා. (**ධම්ම පදට්ඨකථා**-අප්පමාදවග්ග-උදෙනිවත්ථු.)

අනිකුදු ක්‍රමයෙක්:

ඔට්ඨොසි, මෙණ්ඩොසි, ගොණොසි, ගද්‍රභොසි, තිරච්ඡානගතොසි, නෙරයිකොසි, නත්ථි තුය්හං සුගති, දුග්ගති යෙව තුය්හං පාටිකඞ්ඛා, යකාරෙන වා භකාරෙන වා, කාටකොටවිකාය වා (**පාචිත්තියපාළි.**)

මෙහි "ය කාරෙන වා භකාරෙන වා" යනු 'ය, භ,' යන අකුරුදෙක සංයොග කොට මෙථුන පටිසංයුත්තයෙන් ගරා බිණීමය, "කාට කොට විකා" යන්නෙහි කාට නම් ස්ත්‍රීනිමිත්තය, කොටවිකා නම් පුරුෂ නිමිත්තය යන මෙයින් ගරා බිණීමයි.

46. පිට.

a. **"නිද්දෙස් නයින්"** යනු: **නිද්දේශ පාලියෙහි** පුරාභෙද සූත්‍රයෙහි කී නයින් යයි ගතයුතුයි. ධ්‍යානවිභඞ්ගයෙහි කී නයින් ආචාරගොචර දක්වා දැන් නිද්දේශයෙහි පුරාභෙද සූත්‍රයෙහි කී නයින් ද ආචාරගොචර යන් දක්වනු ලැබේ යන අර්ථයි.

b. "පස්අස්නෙන්"යනු පත් අස්නෙන් කියා විගුහ කුපයකම් තුබුන හෙයින් වෙනස් නොකෙළෙමු. "අත්තනෝ පත්තා සනෙ අනිසිදිත්වා පුරෙවා පවිසා වා පවිසනෙතා ආසනෙන පටිබාහති තාම"යනු මෙහි අට්ඨ්ඨ්.

48. පිට.

a. "අසුතං සුණාති-"කල්‍යාණමිත්‍රයෙකු ඇසුරු කෙරෙමින් පෙර නො ඇසූ (නොදත්)දෑය අසා දැනගැණීමයි.

b "කඩ්ඛං විතරති:"ඇසූතැන් වරදවා තේරුම් ගැණීමාදියෙන් සැක සහිත නම් එය නැවත පිළිවිසීමාදියෙන් සැක දුරුකර ගැණීමයි.

c. දිට්ඨිං උජුං කරොති: "නත්ති දින්නං"යනාදීන් වරදවා නොගෙණ "අත්ති දින්නං"යනාදීන් කම්පල ඇදහීමෙන් ද තුනුරුවන් කෙරෙහි ඇදහීමෙන් ද සම්‍යග්දෘෂ්ටි වශයෙන් දෘෂ්ටිය ඍජු කිරීමයි.

49. පිට.

a. "දුම්මයුතු (දුඹු) වස්සෙකු වැඹෙක්හි ලංකොට බැඳ යම්සේ භික්ෂූවන්නේ ද, එසේම යොගාවචරතෙමේ තමාගේ කම්මට්ඨන් සිත සිහි නමැති යොතින් සතර සිවටන් අරමුණෙහි දැඩිකොට බඳනේය" යන අර්ථයි. (සතිපට්ඨානසුත්තනවණ්ණනා.)

b. භාග්‍යවතුන්වහන්සේ විසින් මේ සතරමහසිවටන්හුගේ උපනිබන්ධනොවරභාවය "කොව භික්ඛවෙ—පෙ—යදිදං චත්තාරෙ සතිපට්ඨානා"යනාදීන් සංයුත්තනිකායෙහි සතිපට්ඨානසංයුත්තයෙහි වදාරණලදී.

50. පිට.

a. "පුග්ගලාධිට්ඨානදෙසනා" යන මෙහි:—

භාග්‍යවතුන්වහන්සේගේ දෙසනාතොමෝ '1. ධම්මාධිට්ඨාන ධම්ම දෙසනාය, 2. ධම්මාධිට්ඨානපුග්ගලදෙසනාය, 3. පුග්ගලාධිට්ඨාන පුග්ගලදෙසනාය, 4. පුග්ගලාධිට්ඨානධම්මදෙසනාය"යි ධම්මපුග්ගල වසයෙන් සතරවැදෑරුම් වේ.

එහි: 1. ධම්මාධිට්ඨාන ධම්මදෙසනා නම්: "තිස්සොා ඉමා භික්ඛවෙ වෙදනා, කතමා තිස්සොා? සුඛාවෙදනා දුක්ඛාවෙදනා අදුක්ඛමසුඛා වෙදනා ඉමාසොා භික්ඛවෙ තිස්සොා වෙදනා"යනාදිය මෙන් නිස්සත්ත්ව නිර්ජීව සභාවධර්මයක් විෂය කොට එබඳු නිස්සත්ත්ව නිර්ජීව සභාව ධර්මයක්ම දක්වීමයි.

2. ධම්මාධිට්ඨානපුග්ගලදෙසනා නම්: "ඡද්ධාතුරොා අයං භික්ඛු පුරිසොා ඡඵස්සායතනොා අධ්‍යාරුහමනොපට්වාරොා චතුරාධිට්ඨානොා" යනාදිය මෙන් නිස්සත්ත්ව නිර්ජීව සභාවධර්මයක් විෂය කොට පුද්ගලයෙකු දක්වීමයි.

3 පුග්ගලාධිට්ඨානපුග්ගලදෙසනා නම්: "තයොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තෙතා සංවිජ්ජමානා ලොකස්මිං, කතමෙ තයො? අක්ඛො එකචක්ඛු· ච්වක්ඛු"යනාදිය මෙන් පුද්ගලයෙකු විෂය කොට පුද්ගල යෙකු දැක්වීමයි.

4. පුග්ගලාධිට්ඨානධම්මදෙසනා නම්: "කතමඤ්ච භික්ඛවෙ දුග්ගතිභයං? ඉධ භික්ඛවෙ එකච්චෙ ඉති පටිසඤ්චික්ඛති කායදුච්ච රිතස්ස ඛො පාපකො විපාකො අභිණ්හපරාභං—පෙ—සුද්ධමත්තානං පරිහරති"යනාදිය මෙන් පුද්ගලයෙකු විෂය කොට සභාවධර්මයක් දැක්වීමයි.

මෙහි "ඉධ භික්ඛවෙ භික්ඛු පාතිමොක්ඛසංවරසංවුතො විහරති" යනාදීන් දැක්වූ පාඨයෙහි 'භික්ඛු'නම් වූ පුද්ගලයා කෙරෙහි පිහිටුවා 'ප්‍රාතිමොක්ෂසංවරශීල' නම් වූ නිස්සත්ත්ව නිර්ජීව සභාවධර්ම සඞ්ඛ්‍යාතගුණය දෙසනලද බැවින් මේ පුග්ගලාධිට්ඨාන ධම්මදෙසනා යයි දතයුතුයි.

51. පිටු.

a. "අථ විඤ්ඤාණං රූපං පස්සෙය්‍ය"යනාදිය ටීකාගත පාඨයි. මෙයින් කෙවල විඥානය රූපදර්ශනයෙහි සමර්ථ නොවන බව ද චක්ෂුරාශ්‍රිත විඥානයම රූපදන්නා බව ද කිහ.

b. මේ දර්ශනශාස්ත්‍රානුමතියෙන් ද "චක්ඛුඤා රූපං පස්සති"යන මෙහි චක්ෂුඃප්‍රසාදය, තදාශ්‍රිත විඥානය, ආලොකය, මනස්කාරය යන ප්‍රත්‍යයයන් ඇතිකල්හිම රූප දක්නේයයි කියනලදී. යමෙකුගේ චක්ෂුස (රූප)දක්නා අර්ථයෙන් දර්ශනය වේද (එහෙත්) ඔහුගේ කෙවල චක්ෂුස පමණක්ම රූප නොදක්නේය. කුමක් හෙයිනයත්? චක්ෂුස විඥානය විෂය කොට ඇති බැවිනි. යමකුගේ විඥානය දර්ශනය වේද, එහෙත් කෙවලවිඥානය ම රූප නොදක්නේය. විඥානය චක්ෂුඃ ආශ්‍රය කොට ඇති බැවිනි. ඒ චක්ෂුර්විඥානය ද භික්ෂු ආදි යම් තැන්හි ආලොකයාගේ වැළක්ම වේ නම් එබඳු ව්‍යවහිත (අතරක් ඇති) ස්ථානයෙහි නූපදී. පළිඟුමිණි වලාපටලාදි යම්තැනක ආලොකප්‍රතිබන්ධයක් නැත්ද එබඳු ව්‍යවහිතයෙහි ද චක්ෂුර් විඥානය උපදීමැයි. එහෙයින් එය ව්‍යවහිත නොවේ. ව්‍යවහිතය නම් චක්ෂුර්විඥානවිෂය නොවේ. එහෙයින් ම "චක්ඛුර්විඤ්ඤාණං පස්සති"යනු ද "දර්ශනකෘත්‍යං හි චක්ෂුර්විඥානම්"යනු ද කියනලදී.

c. "ඔථාමෙත්වා උත්තෙක්‍රාඝනති"යන තැන්හි මෙන් "චක්ඛුඤා රූපං දිස්වා" යි අභෙදෙපචාරයෙන් කී බව දතයුතු.

d. "චක්ඛුපසාදසන්නිස්සයෙහි විඤ්ඤාණෙ" යන ආදි පාඨය "පසාදවත්ථුකෙන චිත්තෙන පස්සති"යන තැන්හි අර්ථවිභාවනය සඳහා දැක්වූ ටීකාහි. එහි අර්ථ සන්‍යායෙහි ම දක්වා තිබේ.

52. පිට.

a. සත්‍යනමාංශවෙශද්‍යාදි සත්‍රීනිමිත්ත නම්:—විශදවූ පයොධරා අවිශදවූ උරොමාංශ, උඩු ඇට රැවුල් රහිතවූ මුඛය යන ආදී'මෝ ඉතිරි ය'සිහදුනන්න ලකුණ්‍ය.

54. පිට.

a. **කිරියමනොධාතු**:—චක්ෂුරාදි පඤ්චද්වාරයෙහි අරමුණු ආවජ්ජනය කිරීම් පමණවූ පඤ්චද්වාරාවජ්ජනචිත්තයයි. එය පස්දෙර අරමුණු ගැටෙනකල සෙසු සිත් හැමට පෙරටුව උපදී. කෙසේද යත්? පළමු කොට ඇස්දෙර ඉටු-ඉටු මැදුම්-අනිටු රූ අරමුණු අතුරෙහි යම්කිසි අරමුණක් ප්‍රසාද රූපයෙහි ගැටුන කල එය අරමුණු කොට ගෙණ ආවජ්ජනා කිරීම් වසයෙන් පෙරගමනයෙහි යෙදී භවාඞ්ගචිත්තයා පෙරළාගෙණ උපදී. සෙසු සොතද්වාරාදියෙහි ද මෙසේම දතයුතු. මේ සිත ආවජ්ජනක්‍රියා ඇති හෙයින් ක්‍රියානම් ද සත්ත්වාදින් සූන්‍යහෙයින් මනොධාතු නම් ද වේ.

b **විපාකමනොධාතු**:—සවභාවසූන්‍යත්වනිස්සත්තාභාවයෙන් මන සමඤ්ඤනොධාතු නම්. ඕතොමෝ චක්ෂුර්විඤ්ඤාණාදින්ට අනතුරුව රූපාදි අරමුණු දන්නා සවභාව ඇත්තීය. රූපාදි අරමුණ සම්ප්‍රත්‍යෙෂණය (පිළිගැණීම)කෘත්‍යය කොට ඇත්තීය. ඝථාසවභාවයෙන් පිළිගැණීම ම වැටහීම් කොට ඇත්තීය. චක්ෂුර්විඤ්ඤාණාදින්ගේ අපගමනය (ඉඛ දී යාම) උත්පත්තියට ආසන්නකාරණ (ලංවූ හෙතුව) කොට ඇත්තීය. මේ සිත පස්දෙරැ අරමුණු පිළිගන්නෙක්ව විපාකභාවයට පැමිණෙන බැවින් විපාකමනොධාතු නම් වේ.

c. **විපාකාහෙතුකමනොවිඤ්ඤාණධාතු**:—ඉටු අරමුණ පවත්නා ප්‍රීතිය අධික සොම්නස් වෙදනාසහගිය සන්තීරණය ද, ඉටුමැදුම් අරමුණ පවත්නා උපෙක්ෂා සහගිය සන්තීරණය ද යන සන්තීරණද්විකය මනොවිඤ්ඤාණධාතු නම් වේ. එයම අහෙතුක විපාක හෙයින් විපාකා හෙතුක මනොවිඤ්ඤාණධාතු නම් වේ. ඕතොමෝ අහෙතුකවිපාකවූවා ඝඩ්වාරයෙහි අරමුණු දැනීම් ලක්ෂණ ද සන්තීරණ (විනිශ්චයකිරීම) කෘත්‍ය ද තථාභාවයෙන් වැටහීම ද භවඳහවාසනු පදස්ථානද ඇත්තීය.

එහි ප්‍රථම සන්තීරණය දෙතැනක විපාක භාවයට පැමිණේ. පඤ්චද්වාරයෙහි විපාක මනොධාතුව අරමුණ පිළිගෙණ නිරුද්ධවූකල ඒ අරමුණ සන්තීරණය කරමින් පඤ්චද්වාරයෙහි විපාකඛවට පැමිණේ. බලවත් අරමුණෙහි තදුරමණව ඝඩ්ද්වාරයෙහි විපාකඛවට පැමිණේ.

දෙවන සන්තීරණය මනුෂ්‍යලොකයෙහි ජාත්‍යන්ධ ආදීන්ගේ ප්‍රතිසන්ධි චිත්තය වශයෙන් ද, භවාඞ්ගචිත්තය වශයෙන් ද, ඉටුමැදුම් පස්දෙර අරමුණෙහි සන්තීරණය වශයෙන් ද, බලවත් අරමුණු සදෙරැ තදුරමණ වශයෙන් ද, මරණකාලයෙහි චුතිය වශයෙන් දැයි පස් තැනක විපාක වශයෙන් පැවසේ.

d. ක්‍රියාහෙතුකමනොවිඤ්ඤාණධාතු නම්:—පඤ්චද්වාරයෙහි අර මුණු ව්‍යවස්ථාපනය කරණ චිත්තයයි.

58. පිටු.

a. 42 පිටේ 'b' ලකුණ බලනු.

60. පිටු.

a. "තත්‍ථ කතමං පච්චය පටිසෙධන සඞ්ඛාතං කුහනවත්‍ථු?" යනාදිය මහානිද්දෙසයෙහි— අට්ඨකථාවගහයෙහි— පුරාණදසුත්තනිද්දෙසයෙහි වදුරණලද්දේ වේ.

69. පිටු.

a. බ්‍රහ්මජාලසූත්‍රයෙහි-මහාසීලනිද්දෙසයෙහි:—

"යථාපනෙකෙ හොනෙතා සමණබ්‍රාහමණා සද්ධාදෙය්‍යානි හොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කපෙපනති, සෙය්‍යථිදං? අඞ්ගං නිමිත්තං උප්පාදං සුපිනං ලක්ඛණං මූසිකච්ඡින්නං, අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං කණහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං, අඞ්ගවිජ්ජා වත්‍ථුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූතවිජ්ජා අහිවිජ්ජා භූරිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා, පක්කජක්ඛානං සරපරිත්තානං මිගපක්කං, ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය ඔමඞ්ගීවා පටිවිරතෙ සමණෙ ගොතමොනි." යි වදළ නොයෙක් පාපධර්මයන්ගේ ග්‍රහණය දතයුතුයි.

(මෙහි භාවය: යම් බදුවූ ඇතැම් මහණබ්මුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ මේ මතු දක්වන තිරශ්චීන විද්‍යා හෙතු කොටගෙණ මිථ්‍යාජීවයෙන් ජීවිකාව කෙරෙත්. ඒ කවරහයත්? සාමුද්‍රිකා ශාස්ත්‍රයයි කියූ "අත්තල පාතලඅන්හි යම් මෙබදු අඞ්ගයකින් යුක්තවූකල දීඝායුස් ඇත්තේ මේ"යනාදීන් පවසනි **අඞ්ගශාස්ත්‍රය**, ඒ ඒ කාශ්‍යපී පරීක්ෂා කොට කියන **නිමිත්ත ශාස්ත්‍රය**, අස්තිපාත උල්කාපාතාදි මහත් නිමිත්තෙන් මේ මේ ශුභ වන්නේයයි කියන **උත්පාදශාස්ත්‍රය**,"පෙරයම සිහින දුක්කොත් මෙබදු විපාකය-මේ මේ සිහින දුක්කොත් මෙබදු විපාකය" යනාදීන් පැවැති **සුපිනශාස්ත්‍රය**, "මෙනම් ලකුණු ඇත්තේ රජවෙයි-මෙනම් ලකුණු ඇත්තේ යුවරජවෙයි"යනාදීන් කියන **ලක්ෂණශාස්ත්‍රය**, අලුත් හෝ පරණ පිළි මෙතැන් පවන් මෙතැන් දක්වා මියන් කැකල මෙබදු විපාකයයි කියන මූසික ශාස්ත්‍රය, "මෙබදු බෙලිදර ආදියෙන් ගිනි පිදීම මෙබදු විපාකය"යි දර වෙසෙස් සලකා ගිනිපිදීමයයි කියූ **අග්ගිහොමය**, "මෙබදු හැන්දෙන් පිදූව මෙබදු විපාකය"යි දර්වී විශෙෂ සලකා කරණ **දර්වීහොමය**, පොතු වෙසෙස් සලකා කරණ **ථුසහොමය**, කුඩුවෙසෙස් සලකා කරණ **කණහොමය**, ශාලිතෘණාදි තණ්ඩුල

විශෙෂ සලකා කරණ **කණ්ඩුලහොමය**, ගොසපී අජසපී ආදි සර්පිස් විශෙෂ සලකා කරණ **සප්පිහොමය**, තිලතෙලාදි තෙල විශෙෂ සලකා කරණ **තෙලහොමය**, මුඛයෙන් අබ ආදිය ගෙණ ගින්නෙහි බැහිමාදියෙන් කරණ **මුඛහොමය**, දක්ෂිණජත්‍රුවෙහි ලෙයින් හොමකිරීමවූ **ලොහිතහොමය**, සිරුර දූක ශුභාශුභ කිම් -හෙවත්-ඇඟිලි ආදිය දූක විජ්‍යා ජප කොට "මේ කුලපුත්‍රයෙකා, මේ ශ්‍රී සම්පන්නයෙකැ"යි කියන **අඞ්ගවිජ්ජාය**, ගෘහවාසතු ආරාම වාසතු ආදියෙහි ගුණදොෂ විවෙචනය කරන්නාවූ **වත්ථුවිජ්ජාය**, අඩියය මසුරකඛණාදි නිමිත්තශාස්ත්‍රයයි කියූ **ඛත්තවිජ්ජාය**, සොහොන්හි වැස සෙත්කරණ සිඟාලරුතවිජ්ජායයි කියූ **සිවවිජ්ජාය**, භූත්චිකිත්සා මන්ත්‍රජල්පනාදි **භූතවිජ්ජාය**, බිම්ගෙයි වැස මන්ත්‍රහැදීමයයි කියන **භූමිවිජ්ජාය**, සර්පවිෂචිකිත්සා සර්පාඝවානාදි **විසවිජ්ජාය**, ගොණුපු විසට පිළියම්වූ **වච්ඡිකවිජ්ජාය**, මීවිසට පිළියම්වූ **ඵූසිකවිජ්ජාය**, සකුණරුතයෙහි ශුභාශුභ දන්නා **සකුණවිජ්ජාය**, කාක රුතයෙහි ශුභාශුභදන්නා **වායසවිජ්ජාය**, "මෙතෙමේ මෙතෙක් කල් ජීවත් වෙයි, මෙතෙමේ මෙතෙක්කල් ජීවත් වෙයි"මෙසේ පැවැති අරිට්ඨකඤ්ඤ [මුහුකුරුගිය නුවණ] යයි කියූ **පක්ඛජක්කානය**, ශර පරිත්‍රාණ [ඊවැළක්වීම] යයි කියූ **සරපරිත්තාණය**, මෘග පක්ෂීන්ගේ ශබ්දඥතයයි කියූ **මිගපක්ඛරුත** යනාදි තිරශ්චීන විද්‍යාවෙන් දිවි පෙවෙත්ම මෙහි මිථ්‍යාජීවය වේ. මෙහින් වැළැක්ම මහණුන්ගේ ආජීවපාරිශුද්ධිශීලය වේ.)

71. පිට.

a. "**මුධාසිකමල්ලාදයෝ**"යන තන්හි ආදි ශබ්දයෙන් නිබ්බුධ (නියුද්ධ) මල්ලව, බාහුමල්ලව යන මල්ලව විශෙෂයෝ ගැණෙත්.

එහි: **මුධාසිකමල්ලව** නම්:-මිටින් පොරපහර පිළිපහර දෙමින් අත්‍යුද්ධ කරන්නෝය.

බාහුමල්ලව නම්: බාහුමූලයෙන් හා බාහුසන්ධියෙන් පහර දෙමින් යුද්ධ කරන්නෝය.

නිබ්බුධමල්ලව නම්: (අතින් අත ගෙණ වෙරවාරු පාමින්)හසතා හසිං නම් යුද්ධ කරන්නෝය. අවිශෙෂයෙන් වහාගි මල්ලව පොරහට "බාහුයුද්ධ"යයි කියනු ලැබේ. "නිබ්බුධ"යනු තත්පර්‍යායයි.

b. "**පොරිසමදනිම්මදනං**"යන තැන්හි කී "සමහරු කියත්"යන කෙවිවාදියෝ භගිරිනඛයන් සඳහා කිහු. භගිරිනඛයෝ මෙවුන්දම් සෙවීමෙහි වාජීකරණාදියෙන් සමත් (නොපසුබස්නා) බව නිසාවූ මානරූගය පුරුෂමදයයි කියති. සන්න කතෘහු තුමන් එය නොගත් හෙයින් "මම පුරුෂයෙමි"යි යන අහංකාරය නිසා පැවැති මානය **පුරුෂමද** යයි අරුත් බිණූහ.

72. පිට.

a. "මනොපදොසිකදෙවාදීන්ට" යන තැන ආදි ශබ්දයෙන් ඛිඩ්ඩාපදොසිකදෙවියෝ ද ගැණෙත්. මෙය 'ඛිඩ්ඩාපදූසික, මනොප දූසික' කියාත් පෙළෙහි ආය.

i. ඛිඩ්ඩාය පදූසනතීති=විනාසනතීති ඛිඩ්ඩාපදොසිකා, ක්‍රීඩා ප්‍රසුතතායෙන් වැනසෙන දෙවියෝ ඛිඩ්ඩාපදොසිකා නම්. කියේ මැනෝ බ්‍රහ්මජාලසූත්‍රයෙහි:

"සන්ති භික්ඛවෙ ඛිඩ්ඩාපදොසිකා නාම දෙවා, තෙ අතිවෙලං හස්ස ඛිඩ්ඩාරතිධම්මසමාපන්නා විහරන්ති. තෙසං අතිවෙලං හස්සඛිඩ්ඩා රතිධම්මසමපන්නානං විහරතං සති මුස්සති, සතියා සම්මොසා තෙ දෙවා තම්හා කායා චවන්ති."

(භාවය-මහණෙනි, ක්‍රීඩායෙහි ඇලීමෙන් නැසෙන හෙයින් ඛිඩ්ඩාපදොසිකා නම්වූ දෙවිකෙනෙක් ඇත. ඔහු කල් ඉක්මවා (ඉතා බොහෝ කල්) හාස්‍යරතියෙහි හා ක්‍රීඩාරතියෙහි යෙදුනාහු-හෙවත්-නන්වැදුරුම් කෙළිලොලින් කාවිසි සුවෙහි යෙදුනාහු කෑයුතු බුදිය යුතුදෑහි සිහිවුළාබවට පැමිණෙත්. ඒ දෙවියෝ පින් වෙසෙසින් ලද මහත් සම්පත් ඇති හෙයින් සිය සිරිමහිමයෙන් නැකැත් කෙළි කෙළනාහු සැපැත් මහත් බැවින් "අහර වැළඳුම්හ, නො වැළඳුම්හ"යි යනුත් නොදනිති. කම්ජතෙජස්හුගේ බලව භාවයෙන් හා වඳුපුවුම තායෙන් එක්වේලේ අහරක් සුන්පමණින් ද දෙවි අත්බැවින් වුත වෙත්. මිනිසුන්ගේ වූකලී කම්ජතෙජස් මඳය. කරජකය බලය. එහෙ සින් සත්දිනක් ඇවෑමෙනුත් උණුදිය කෑදිය ආදියෙනුත් වඳු උපත්ථම්භනය කටහැක. (ඝාප්‍යය යන අර්ථයි.) දෙවියන්ට වනාහි එක් වේලක අහර නොලදෙත් තැවුන ගලක තැබූ නෙලුම් මලක් සවස දියකල සියයකිනුදු ප්‍රකෘතියට නො පැමිණවිය හැකි සේ නැවත කොපමණ අහර ලදත් නොසිටිත්. නො ඇපෙත්. මේ දෙවියෝ කවුරුදැයි අවුවාහිත් අවිනිශ්චිතය. අවිශෙෂයෙන් කී හෙයින් කබලීකාර ආහාරයෙන් ජීවත්වන දෙවියෝ මෙසේ වුත වෙත් යයි දතයුතු. නිම්මානරතී-පරනිම්මිත වසවත්තී දෙවියෝයයි සම්හරු කියත්.

ii. "මනෙන පදූසනතීති විනාසනන්තීති=මනොපදොසිකා. චිත්ත ප්‍රදොෂයෙන් වැනසෙන දෙවියෝ මනොපදොසිකා නම් වෙත්.

කියේ මැ නෝ:

"සන්ති භික්ඛවෙ මනොපදොසිකා නාම දෙවා, තෙ අතිවෙලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායන්ති, තෙ අතිවෙලං අඤ්ඤමඤ්ඤං උප නිජ්ඣායන්තා අඤ්ඤමඤ්ඤමහි චිත්තානි පදූසෙන්ති, අඤ්ඤමඤ්ඤමහි පදුට්ඨචිත්තා කිලන්තකායා කිලන්තචිත්තා තෙ දෙවා තම්හා කායා චවන්ති."

(භාවය-මනොපදොසිකා නම්වූ දෙවිකෙනෙක් ඇත. ඒ දෙවියෝ ඉතා බොහොකල් ඔවුනොවුන් ක්‍රොධයිතින් බලන්නාහු (හෙළාදක්නාහු) ඔවුනොවුන් කෙරෙහි දූෂිතයිත් ඇත්තාහු කලාතතවූ ශරීර-කලාතතවූ සිත් ඇත්තාහු එයින් චුත වෙත්.)

මේ සිව්මහ රජයෙහි දෙවියෝය. ඔවුන් අතුරෙන් එක් දෙවියෙකු නැකැත්කෙළි සඳහා සපිරිවරින් රිය නැඟ මිපියට ගියකල අනෙක් දෙවියෙක්ද නික්මෙන්නේ පෙරටුව යන ඒ දෙව්පුත් දැක "මේ කෘපණයා කවරේදැයි පෙර නුදුටුවෙකුමෙන් ඔහු දැක ප්‍රීතියෙන් උදම්ව ගැප්‍රම්මින් යෙතැයි"කිපෙති. ඉදිරි යන්නේ ද නැවතී ඔහු කිපෙනහු දැක"කිපුනෝ නම් සුවිදිතහ"යයි ඔහු කිපි බැව් දැන"තොපි කිපියහු මට කුම් කරහුද? මේ සපු මව්සින් දැනසීලාදිය නිසා ලද, තොප නිසා නොවෙයි"කියා ප්‍රතික්‍රොධ කෙරෙයි. එකෙකු කිපි කල අනිකා නොකිපෙන තුරු රැකෙයි. දෙදෙනාම කිපිකල එකෙකුගේ කොපය අනිකාට ප්‍රත්‍යයය වෙයි. ඔහුගේ කොපය අනිකාට ප්‍රත්‍යයය වෙයි. එකල දෙදෙනම මියති. මේ දෙවියන් පිළිබඳ සවභාව ධම්මතායි.

මේ අර්ථය සලකා "අත්තනතො සංයොජනුපපත්ති පටිසෙධනත්ථං-පරස්සපි සංයොජනුපපත්ති පටිසෙධනත්ථං"යි කිහු.

76. පිට.

a."වුත්තමපිවෙතං"යන්නෙහි"චත්තාරෙ පඤ්ච ආලොපෙ"යනාදි ගය **ථෙරගාථාපාළියෙහි**-තිංසති නිපාතයෙහි-සාරිපුත්ත ථෙරගාථා පාළියෙහි සැරියුත් තෙරුන් වදාළ පරිදියි. "ඵාසුවිහාරෙ ව මෙ භවිස්සති"යන පදයට සාධක වශයෙන් මෙහි දක්වූ.

සතර පස්පිඩක් නොවළඳා පැන් බීම යොගාවචරයාහට මෙන්ම සෙස්සනට ද ඵාසුවිහාරය පිණිසම වෙයි.

77. පිට.

a. "**පටිසල්ලානාරාමත්ථං**"යන්නෙහි නිජීවනාදී දක්වනු පිණිස ටීකාගත "නානාරම්මණතො"යනාදි පාඨය දක්වූහු.

මෙහි පටිසල්ලාන නම්: කම්මස්ථාන සඞ්ඛ්‍යාන එක් අරමුණෙහි සිත මනාකොට තැබීමයි. "පටිසල්ලානා වුට්ඨිතො"යනාදි තැන්හි ඵල සමාපත්තිය පටිසල්ලාන නමැයි කියූ. "පටිසල්ලනනති එකී භාවො" යනු අට්ඨවයි.

78. පිට.

a. "**සත්ත හි නගරපරිඛාරෙති**"යන පාඨොඩාරය අඞ්ගුත්තර නිකායෙහි සත්තකනිපාතයෙහි සත්ත වග තුන්වන සූත්‍රයෙහි ආයේය.

ඒ සූත්‍රයෙහි: "(1) එසිකා, (2) පරිඛා, (3) අනුපරියායපථො, (4) ආවුධං, (5) බලකායො, (6) දොවාරිකො, (7) පාකාරො"යි යන මොනු සප්තනගරපරිෂ්කාරයයි කීහු.

1. **එසිකා** නම්: ඉන්ද්‍රකීලයයි. එය ඇතුළතුවර හෝ පිටතුවර නගර රක්ෂාව පිණිස හෝ නගරාලඞ්කාර පිණිස ගඩොළින් හෝ ගලින් හෝ කිහිරි ආදි හරලියෙන් හෝ අවැස්ස කොට අටරියන්-සොළොස් රියන්-විසිරියන් හෝ කොට අඩක් පොළොවට කොට අඩක් මතු කොට පිහිටුවන අවලඤ්ඡන විශෙෂයකි. ඉන්ද්‍රයාගේ(=ශක්‍රයාගේ) කීලය මෙන් උස් වූ අවල වූ ස්තම්භය නුයි, ඉන්ද්‍රවූ (=අධිපතිවූ) කීලයනුයි හෝ ඉන්ද්‍රකීල නම් වේ. ('ඉන්ද්‍රඛීල'යනු එළිපතයයි සන්‍යෙයෙහි අර්ථ කියූ.) මේ ඉන්ද්‍රකීල පෙලට නොව ගොමූත්‍රවඞ්කාරයෙන් අතර තබා විසිතුරු කොට පිහිටුවති. එහි වක්ව ගිය තැන්හි යුදකල යෙබළු රැක සිටිති.

2. **පරිඛා** නම්: නුවර මහපවුර වට කොට කැණූ ගැඹුරුවූ පුළුල්වූ මහ අගලයි. එය එතෙරට නො යා හැකි එරෙන මඩ අගලය, නොහොත් කිඹුල් දැතිමුවර ආදීන්ගෙන් ද පියුම් උපුල් වතයන් ගෙන් ද සෙවෙල් රොදින් ද එතෙරට නො යා හැකි දිය අගලයි.

3. **අනුපරියායෂථ** නම්: නුවර මහපවුර ඇතුළත පවුර සමග එකා බඳ්ධ කොට පවුරු හිස දක්මං පස්ගොඩ කොට තැනූ උස්වූ පුළුල්වූ බොහෝ දෙනාට ඔබමොබ යා හැකි මහාමාර්ගය යි. එහි සිට පවුරෙන් පිටත සිටිනා සතුරන් හා යුද කළ හැකි වේ.

4. **ආයුධ** නම්: 'සලාක' නම්වූ ඊතල ඊටි කොහොල් ආදී දමා ගසන ආයුධය, 'ජෙවනිය' නම්වූ එක අතැ මුව ඇති දෙඅතැ මුව ඇති කඩු සිරිය කිණිසි අඩයටි ආදි අත තබා ගෙණ අනික ආයුධය යනාදි යුද්ධායුධ ඇතුළතුවර අවිහල්හි තබා ගැණීමය.

5. **බලකාය** නම්: නුවර සැදී සිටින යුද්ධභට සමූහයායි. එනම්: ඇතැරැ-ඇතැදුරු-ඇත්වෙද-ඇත්ගොව් යනාදී හයන්‍යාරොහ භට යෝය, අසරු-අසැදුරු-අස්වෙද-අස්ගොව් ආදි අශ්වාරොහ භටයෝය, රියැදුරු-රියබළු-රියරැකි ආදී රථාරූඪ භට යෝය, ධනුග්‍රාහ (=දුනුවායෝ) භටයෝය, යුදෙහි ජය කොඞි ගෙණ පෙරමුණට යන "වෙලක"නම් භටයෝය, "මෙතැන රජ වේවා, මෙතැන මහමැති වේවා"යි මෙසේ සුදුසු පරිද්දෙන් සෙනාසනනිවෙශය කරණ ව්‍යූහකාරක භටයෝය, සතුරු සෙන් මැදට වැද ඔවුන් කඩ කඩ කොට පලුගසා ලා පැන එන සාහසික මහායොධයෝය,-නොහොත්-යොධයන්ට ඔත් පැන් ගෙණ යුදමැදෙහි හැසිරෙණ පිණ්ඩදායිකා නම් යොධ යෝය, උග්‍රවූ සඞ්ග්‍රාමාවචර (රණශූර) රාජපුත්‍රයෝය, "අසුවල් සතුරාගේ හිස-අසුවල් සතුරාගේ අවිය ගෙණ එව"යි කී කල මැතැවැ යි කියා යුදමැද පැන ඒ කීවක් ම ගෙණ එන "පකඛන්දි" නම් යොධයෝය, මතැතෙකු නමුදු ඉදිරියට එනකල නොබා නො කැවතී පෙරමුණට ම යන "මහානාග"නම් යොධයෝය,

ගමේ මුහුදේ පිහා ගොස් වුවත් යුද කරණට සමත් අති සූර මහායොධයෝ ය, නිපහර කඩුපහර වලහන පලිස් ගෙණ යුදකරණ "වම්මයොධී"නම් හටයෝ ය, රජු කෙරෙහි බලවත් සෙනහයෙන් යුදකරණ රජගෙදර දැසවූ "දැසපුත්‍ර" නම් යොධයෝ ය යන මේ සියල්ල බලකාය නම් වේ.

6. **අදුවාරික** නම්: දොරටුපාලයා ය. හෙතෙමේ මහවහසල්දොර රකිමින් සිටිහා අදුනන නිසැකවූවන් නුවරට වැද්ද දෙන නොඅදුනන සැක කළයුත්තන් නුවරට නොවැද්ද දෙන මහ නුවණ ඇති මහ බල ඇති කෙනෙකි.

7. **පාකාර** නම්: මුළු නුවර වටා සිටි අගලෙන් මෙපිට මහ පදමනම මතුයෙහි තැඟු අවලොස්රියන් පමණවූ සන බහලින් සුණු පිරියම් කළ මහ වාසල් සතරක් හා සතර කොණ අවලු(=මුරගෙවල්) සතරක් ඇති පුන්කලස් පෙල දක්වා කැටයම්වින් විසිතුරු කොට කළ සතුරන්ට ඇතුල්විය නොහොන ශක්තිමත් වූ මහා ප්‍රාකාර යයි.

මෙසේ මේ සපතාඛහය නගරයක ආරක්ෂාව පිණිස වූ පරිවාර බැවින් "නගරපරිකඛාර"යයි කිහු.

"කවාටපරිකෙඛපො, පරිඛා, උඳුපො, පාකාරො, එසිකා පලිඝො, පාකාරපත්‍ථරණඤ්ච නන්ති සත්ත නගර පරිකඛාරාති වදන්ති"යි විශුද්ධිමාර්ග ටීකායෙහි කි සපතානගරපරිෂකාරම සන්තයෙහි දක්වූහ.

(එහි: 1. **කවාටපරිකෙඛප** නම්: ඛාණුපාකාරයයි-හෙවත්-සියල්ලට පිටින් දැව වැටින් නගරය වට කොට ලිමයි, 2. **පරිඛා** නම්: දැව වැට ඇතුළ කැණූ දිග අගල හෝ මඹ අගලයි, 3. **උඳුප** නම්: උපකාරි කාවයි-හෙවත්-පරිඛාවෙහි පටන් ප්‍රාකාරය තෙක් අසුගේ කුර සටහනින් සතුරන්ට පවුර පැන නොයා හැකි සේ බැවුම් හැඩෙට ලිහා වැටෙන සේ කළ පදනමය, 4. **පාකාර** නම්: නුවර වටා සිටි මහ පවුරයි, 5. **එසිකා** නම්: ඉපුකීලයයි, 6. **පලිඝ** නම්: නුවර දොර කණය මයි-හෙවත්-අගුලයි, 7. **පාකාරපත්‍ථරණඩ්ඩිල** නම්: පාකාරය හා සම්බන්ධ කොට පිල්කඩක් මෙන් සමතල කොට කළ භූමිභාගයයි-හෙවත්-අනුපරියාය පථයයි.)

මේ ටීකාපාළිය යට කී අඞ්ගුත්තරනිකාය පාළියෙහි ආ ක්‍රමයට වෙනස් බව පෙනේ.

මෙහි"සත්තහි නගරපරිකඛාරෙහි"යන තැන "පරිකඛාර"ශබ්දයා පරිවාරාර්ථ යයි කී. අඞ්ගුත්තරට්ඨකථාවෙහි"නගරපරිකඛාරෙහි පරිකඛතන්ති: නගරාලඞ්කාරෙහි අලඞ්කතං"යි අලඞ්කාරාර්ථ බව කී.

(යට දක්වූ නගරපරිෂකාර ඇතුළුනුවර කළාහු නම් නගරාලඞ්කාර පිණිස වන බව ද පිටනුවර කළාහු නම් නගරාරක්ෂාව පිණිස වන බව ද අටුවාවෙහි කිය. සූත්‍රයෙහි කි සපතානගරපරිෂකාර නගර

යක ආරක්ෂාව පිණිස වූ පරිවාරයන්ම බව හැඟෙන හෙයින් "නහරු ලඞ්කාරෙහි අලඞ්කතං"යි එහි 'පරිකඞ්කාර'පදයට ලියූ අටුවා නො යෙදෙනු සේ පෙනේ.) විමසියයුතු.

80. පිට.

a. "**ආගමෙහි තවං සාසිපුත්ත තථාගතෙ ච කඤ්චි කාලං ජානිස්සති**"යනාදිය විනය විභඞ්ගයෙහි (පාරාජිකපාළියෙහි) වෙරඤ්ජ ඛණ්ඩයෙහි ශික්ෂාපද ප්‍රඥප්තිය පිණිස සැරියුත් තෙරුන් විසින් "**එතස්ස භගවා කාලෝ, එතස්ස සුගත කාලෝ, යං භගවා සාවකානං සික්ඛාපදං පඤ්ඤපෙය්‍ය උද්දිසෙය්‍ය පාතිමොක්ඛං යදිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං**"යනාදීන් "දැන් සිකපද පනවන්නට කලැයි"කළ ආයාචනය ප්‍රතික්ෂෙප කරමින් බුදුරජාණන් වහන්සේ විසින් වදාළ පරිදිය. මෙය ශික්ෂාපදප්‍රඥප්තිය ශ්‍රාවක විෂය ඉක්ම පැවති බැවිනි නිදර්ශන වේ.

b. "සිකඛාපදපඤ්ඤත්තියා වත්ථුපරිච්ඡෙදො ච"යන තැන්හි සම්වච්‍යාඛ්‍යාවෙහි වඤ්චදයෙන් සම්වච්‍යය කළ "**අපඤ්ඤත්තං නපඤ්ඤපෙම පඤ්ඤත්තං න සමුච්ඡින්දාම, යථා පඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදාය වත්තාම**" යනු බුදුනුබුදුකසික්ඛාපදසමූහය කථායෙහි මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේ වදාළ පරිදිය.

(මේ පාඨය විනය චුල්ලවග්ගපාළියෙහි පඤ්චසතිකක්ඛන්ධකයෙහි: "**අපඤ්ඤත්තං න පඤ්ඤපෙති, පඤ්ඤත්තං න සමුච්ඡින්දති, යථා පඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදාය වත්තති**"යි පෙනේ.)

මෙසෙයින් ප්‍රාතිමොක්ෂසංවරශීල නම්වූ ශික්ෂාපද ශීලය පැන විමට සුදුසු කාලය පවා සැරියුත් මහතෙරුන් වැනි මහාප්‍රාඥයන්ටත් විෂය නොවන බැවින් ද මහාකාශ්‍යප ස්ථවිරාදී මහා ශ්‍රාවකයන් විසිනුදු 'පැනවූ සේම ශික්ෂාපදයෙහි සමාදන්ව ගෙණ රකුම්හ'යි ප්‍රතිඥා කළ බැවින් ද මේ ශික්ෂාපද ශීලය හුදෙක් ශාස්තෘන්වහන්සේ කෙරෙහි ද තදනුශිෂ්ටධර්මය කෙරෙහි ද ඇදහීමෙන්ම සිදුකටයුතු වන හෙයින් වීර්‍ය්‍ය සමෘති ආදී තවත් හෙතු ඇතද ශ්‍රද්ධාවගේ විශෙෂ හෙතුබව ගෙණ "ශ්‍රද්ධාසාධන"යයි කියූ.

81. පිට.

a. **සමඞ්ගිසි** යන තැන-"**සමසීසීති: ජීවිතඤ්ඤමඞ්ගිසි; යස්ස හි කිලෙස සීසං අවිජ්ජං මග්ගපටිපාටියා අරහත්තමග්ගො පරියාදියති, තතො එකූනවීසතිමෙ පච්චවෙක්ඛණඤ්ඤණෙ පතිට්ඨාය භවඞ්ගාතරණෙ පවත්තසීසං ජීවිතින්ද්‍රියං චුතිචිත්තං පරියාදියති, සො ඉමාය වාර සමතාය ජීවිතසමසීසීති වුච්චති**"යනු විශුද්ධිමාර්ගී ටීකාය.

මෙහි අර්ථ විවර්ණය සන්නයෙහි (සං 35) පෙනේ.

එහි යම් යොගාවචරයෙකුගේ කෙලෙසුන්ට හිස්වූ(=ප්‍රධානවූ) අවිද්‍යාව මග්ගපිළිවෙළින්-හෙවත්-සොවාන් මගින් දුගතිගාමිනිවූ අවිද්‍යාව ය, සෙදගැම් මගින් ඔඳුරික අවිද්‍යාවය, අනාගැමි මගින් කාමාදීනව ප්‍රතිවේධාදක අවිද්‍යාවදැයි මෙසේ සුදුසු පරිද්දෙන් නඟා අවසානයෙහි

රහත්මඟතෙමේ රූපාරූපභවාදීනවප්‍රතිවේධාදකවූ අවිද්‍යාව අනුසය සමූදඝාත මඟයෙන් ක්ෂයකෙරේද, ඒ අතීත්මාර්ගීවිත්තය පහළවීමෙන් පසු එකුන්විසිවන ප්‍රත්‍යවෙක්ෂාඥානයෙහි පිහිටා සිත භවාඞ්ගයට බැසැ ගැණීමෙහි සකඞ්ගයන්ගේ පැවැත්මට හිස්වූ(=ප්‍රධානවූ) ජීවිතෙන්ද්‍රියය චුතිවිත්තය තෙමේ ක්ෂයකෙරේද, මෙසේ මාර්ගීවිපියේ උපන් පස්විකුම් ජවන් කෙළවර භවාඞ්ගාවස්ථාවෙහි චුතිය වීමෙන් කෙලෙසපරිනිර්වාණ ය අනතුරුව සකඞ්ගපරිනිර්වාණයෙන් පිරිනිවන් පානා රහත්තෙමේ කිලෙසසීස ජීවිතසීස දෙදේනාගේ පරියාදානවාරයාගේ සමබව (=එක්වටමවූබව) හෙතු කොට ගෙණ **ජීවිතාසමසීසී** නමැයි කියනු ලැබේ.

සංයුත්තනිකායට්ඨකථායෙහි ද මාරසංයුත්තකයෙහි තුන්වනවග තුන්වන **ඛොඩිඝ** සූත්‍රවර්ණනායෙහි:—'**සමසීසී** නාම තිවිධෝ හොති: ඉරියාපථසමසීසී රොගසමසීසී ජීවිතසමසීසී'ති (සමසීසී නම්: i. ඉරියාපථ සමසීසීය, ii. රොගසමසීසීය, iii. ජීවිතසමසීසීයයි ත්‍රිවිධ වේ) යනු කීය. විස්තර එසින් බලා දතයුතුයි.

පුග්ගලපඤ්ඤත්තියි පාළියෙහි ද "යස්ස පුග්ගලස්ස අපුබ්බං අවරිමං ආසවපරියාදානඤ්ච හොති ජීවිතපරියාදානඤ්ච අයං වුච්චති පුග්ගලෝ **සමසීසී**"යි වදාරණලදී.

යම් පුද්ගලයෙකුට ඉදිරි පසු නොව (=එක් වරම) ආශ්‍රවක්ෂය සඞ්ඛ්‍යාතවූ කෙලෙසපරිනිර්වාණය ද ජීවිතක්ෂය සඞ්ඛ්‍යාත සකඞ්ගපරි නිර්වාණය ද වේ නම් මෙසේවූ රහත්තෙමේ **සමසීසී**යයි කියනු ලැබේ- යනු එහි භාවයි. (විස්තර තදට්ඨකථායෙන් දතයුතුයි.)

මෙහි ආසවපරියාදානය කරණ මාර්ගීවිත්තයත් ජීවිතපරියාදානය කරණ චුතිවිත්තයත් එකට උපදින්නාක් මෙන් හැඟෙතත් එසේ එකට ඉපදීමෙක් නම් නැත. මාර්ගීවිත්තයට අනතුරුව ඵලසිත් ද ඵලචිත්තයන්ට අනතුරුව භවාඞ්ග සිත්ද ඉන්පසු ප්‍රත්‍යවෙක්ෂා වීපිද තදනන්තරව භවාඞ්ගක්ෂණයෙහි චුතිවිත්තය ද උපදින්. කෙසේද යත්? ලොකොත්තර මාර්ගාධිගමයට විදසුන් වඩන යොගීහට විදසුන් මූහුකුරා ගොස් දැන් දැන් අජිණ්ණ නම් ලොකොත්තර මාර්ගය උපදින්නේයසි කියයුතු කල්හි සිත භවාඞ්ගපාත වේ. තදනන්තරව භවාඞ්ගසන්තතිය සිඳගෙණ සුදුසුපරිද්දෙන් අනිත්‍යාදි ලක්ෂණයක් අරමුණු කොට මනොද්වාරාවජ්ජනය උපදී. අනතුරුව දෙකක් හෝ තුණක් විදසුන් ජවන්සිත් අනිත්‍යාදි සංඛාරලක්ෂණයම අරමුණු කොට ගෙණ පරිකම්, උපචාර, අනුලොම නාමයෙන් පවතින්. අනතුරුව නිවන් අරමුණු කොට ගොත්‍රභූ නම් විදර්ශනාචිත්තය උපදියි. අනතුරුව අභාවඞ්ගික ආර්‍ය්‍ය මාර්ගය සිවුඅස් පිළිවිදිමින් අජිණ්ණාවීපියෙහි සතරවන භවාඞ්ගික ජවනසථානයට බසී. ඒ මාර්ගීවිත්තයයි. තදනන්තරව හෝ පස්වන ජවනසථානයට බසී. ඒ මාර්ගීවිත්තයයි. තදනන්තරව දෙකක් හෝ තුණක් ඵලසිත් මාර්ගයට සුදුසු පරිද්දෙන් සන්තානගත

කෙලෙස් දරථ සංසිඳුවමින් ඉපිද නිරුද්ධ වෙත්. ඒ ඵලසිත්ය. මෙය සත්වන ජවනය පරම කොට ඇති එකාවජ්ජනචිත්ය හෙයින් සත් වන ජවනයවූ අන්තිම ඵල සිත ඉපිද නිරුද්ධ වීමෙන් භවාඞ්ගපාතය වේ.

b. "එකූන්විසි ප්‍රත්‍යවේක්ෂාඥන:"

මෙසේ එකාවජ්ජන මාර්ගචිත්තචිත්ය අවසන් වීමෙන් භවාඞ්ගපාතවූ කල නැවත භවාඞ්ග සන්තතිය සිඳගෙණ මඥාපචවවෙක්ඛණය පිණිස මනොද්වාරාවජ්ජනය ඉපද නිරුද්ධ වූ කල පිළිවෙළින් මඥාපචව වෙක්ඛණ ජවන් සතක් උපදී. නැවත භවාඞ්ගාවතරණය වී ක්‍රම යෙන් ඵල-නිබ්බාණ-පච්චණ කිලෙස-සෙසකිලෙස යන මොවුන් ප්‍රත්‍යවේක්ෂණය පිණිස මනොද්වාරාවජ්ජනාදි වශයෙන් පචවවෙක්ඛණ චිත්ත පහළ වෙත්.

එහෙයින් කීහ: "එස මඥං පචවවෙක්ඛති, ඵලං පචවවෙක්ඛති, නිබ්බාණං පචවවෙක්ඛති, හීනෙ කිලෙසෙ පචවවෙක්ඛති, සෙසෙ කිලෙසෙ පචවවෙක්ඛති"යි.

මෙසේ වාරවශයෙන් ලැබෙන ප්‍රත්‍යවේක්ෂාඥනයෝ පස්දෙන සොවාන්-සෙදගැම්-අනාගැම් ආර්ය්‍යන්ගේ වශයෙන් පසළොසෙක, රහතුන්ට සෙස කිලෙස නැති හෙයින් සතරෙකැයි එකූන්විස්සෙක් වෙති.

ඒ ප්‍රත්‍යවේක්ෂණ චිත්තු කල් ඇත හොත් මාර්ගප්‍රත්‍යවේක්ෂණාදි පඤ්චවාරයෙන් සම්පූර්ණවැ හෝ කල් නැත හොත් අසම්පූර්ණවැ වරක් දෙවරක් ම හෝ උපදින්. තියුණු මුවහත් ඇති කඩුවකින් එක් පහ රින්ම හිස සිඳුනා කල්හි ද ප්‍රත්‍යවේක්ෂණ චිත්තු එකක් දෙකක් වත් උපදින් මැයි. එහෙයින් ජීවිතසමසීසි රහත්හට එකූන්විසිවන ප්‍රත්‍ය වෙක්ෂාඥනයෙහි සිට භවාඞ්ගාවතරණය වන තෙණෙහිම චුතිචිත්තය ලැබේ. මෙසේ චිත්තය තමා ලහුපරිවත්තී (=වහා පෙරලෙන සුළු) බැවින් මාර්ගචිත්තක්ෂණයෙහි වන කෙලෙසක්ෂය ද ඉන්පසු පලසිත් හා පස්විකුම් ජවන් සිත් ද නිරුද්ධව හොස් භවාඞ්ගප්‍රත්‍යාවයෙහි ලැබෙන චුතිචිත්තයෙන් වන ජීවිතක්ෂයද එකෙණෙහි වන්නාක් මෙන් පෙනේ. එහෙයින් "අපුබ්බං අවරිමං"යි කිහු.

§2. පිට.

a. "ආදිත්තපරියාය සුත්තං"

1 ආදිත්ත පරියායං වෝ භික්ඛවෙ ධම්මපරියායං දෙසිස්සාමි තං සුණාථ, කතමෝ ච සෝ භික්ඛවෙ ආදිත්තපරියායෝ ධම්මපරියායෝ?

2. චරං භික්ඛවෙ චක්ඛාය අපෝ සලාකාය ආදිත්තාය සම්පජ්ජලි තාය සජෝතිභූතාය චක්ඛුද්වාරං සම්පලිමට්ඨං, තඤ්චෙව චක්ඛුවිඤ්ඤේ යෙසු රූපෙසු අනුව්‍යඤ්ජනසෝ නිමිත්තග්ගාහෝ, නිමිත්තසාරාගඝ

ධිතං වා භික්ඛවෙ විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය අනුව්‍යඤ්ජනසස්සාදගධිතං වා, තඤ්ච සමයෙ කාලඞ්කරෙය්‍ය ඨානං එතං විජ්ජති, යං දවින්නං ගතීනං අඤ්ඤතරං ගතිං ආගචෙජ්ය්‍ය නිරයං වා තිරච්ඡාන යොනිං වා. ඉමං ඛවාහං භික්ඛවෙ ආදීනවං දිසවා එවං වදෙමි.

3. චරං භික්ඛවෙ තිණෙහන අගෙ සඞ්කුතා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන සොතින්ද්‍රියං සම්පලිමට්ඨං, නචෙව සොත විඤ්ඤෙය්‍යෙසු සද්දෙසු අනුව්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො. නිමිත්තසස්සාදගධිතං වා භික්ඛවෙ—පෙ—නිරයං වා තිරච්ඡානයොනිං වා. ඉමං ඛවාහං භික්ඛවෙ ආදීනවං දිසවා එවං වදාමි.

4. චරං භික්ඛවෙ තිණෙහන නඛවෙජ්දනෙන අදිත්තෙන—පෙ—ඝාණින්ද්‍රියං සම්පලිමට්ඨං, න චෙව ඝාණවිඤ්ඤෙය්‍යෙසු ගන්ධෙසු අනුව්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො. නිමිත්තසස්සාදගධිතං වා භික්ඛවෙ —පෙ—නිරයං වා තිරච්ඡානයොනිං වා. ඉමං ඛවාහං භික්ඛවෙ ආදීනවං දිසවා එවං වදාමි.

5. චරං භික්ඛවෙ තිණෙහන ඛුරෙන—පෙ—ජිවහින්ද්‍රියං සම්පලිමට්ඨං, න චෙව ජිව්හාවිඤ්ඤෙය්‍යෙසු රසෙසු අනුව්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො—පෙ—නිරයං වා තිරච්ඡානයොනිං වා. ඉමං ඛවාහං භික්ඛවෙ ආදීනවං දිසවා එවං වදාමි.

6. චරං භික්ඛවෙ තිණහාය සත්තියා ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය කාසින්ද්‍රියං සම්පලිමට්ඨං, න චෙව කායවිඤ්ඤෙය්‍යෙසු ඵොට්ඨබ්බෙසු අනුව්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො,-පෙ-විඤ්ඤාණං ගතීනං අඤ්ඤතරං ගතිං ආගචෙජ්ය්‍ය නිරයං වා තිරච්ඡාන යොනිං වා. ඉමං ඛවාහං භික්ඛවෙ ආදීනවං දිසවා එවං වදාමි.

7. චරං භික්ඛවෙ සුත්තං, සුත්තං ඛො පනාහං භික්ඛවෙ වඤ්ඣං ජීවිතාන්නං වදාමි අඵලං ජීවිතාන්නං වදාමි මොමූහං ජීවිතාන්නං වදාමි. න චෙව තථාරූපෙ විතක්කෙ විතක්කෙතය්‍ය යථාරූපානං විතක්කානං වසංගතො සඞ්ඝං භින්දෙය්‍ය. ඉමං ඛවාහං භික්ඛවෙ වඤ්ඣං ජීවිතාන්නං ආදීනවං දිසවා එවං වදාමි.

8. තස්ඵ භික්ඛවෙ සුතවා අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති.

තිට්ඨතු තාව තත්තාය අගෙ සලාකාය ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය චක්ඛුන්ද්‍රියං සම්පලිමට්ඨං, හඤ්චාහං ඉදං එව මනසි කරෙමි, ඉති චක්ඛුං අනිච්චං රූපා අනිච්චා චක්ඛුවිඤ්ඤාණං අනිච්චං, චක්ඛුසම්ඵස්සා අනිච්චො, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උපජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං.

9. තිට්ඨතු තාව තිණෙහන අගෙසඞ්කුතා—පෙ—සොතින්ද්‍රියං සම්ඵලිමට්ඨං; හඤ්චාහං ඉදං එව මනසිකරොමි. ඉති සොතං අනිච්චං — සද්දා — සොතවිඤ්ඤාණං — සොතසම්ඵස්සා — සොතසම්ඵස්සපච්චයා උපජ්ජති වෙදයිතං—පෙ—තම්පි අනිච්චං,

10. තිට්ඨතු තාව තිණෙහන තඛවෙජ්දතෙන —පෙ— ඝාණින්ද්‍රියං සමපලිමට්ඨං, ඉන්‍දූහං ඉදං එව මනසිකරොම්, ඉති ඝාණං අනිච්චං ඉන්ධා — ඝාණවිඤ්ඤාණං — ඝාණසම්ඵස්සා — යම්පිදං ඝාණසම්ඵස්ස පච්චයා උප්පජ්ජති වෙදයිතං—පෙ—තම්පි අනිච්චං.

11. තිට්ඨතු තාව තිණෙහන ඛුරෙන—පෙ—ඉන්‍දූහං ඉදං එව මනසිකරොම්. ඉති ජිව්හා අනිච්චා රසා—ජිව්හාවිඤ්ඤාණං—ජිව්හා සම්ඵස්සා-යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං—පෙ—තම්පි අනිච්චං.

12. තිට්ඨතු තාව තිණහාය සත්තියා—පෙ—ඉන්‍දූහං ඉදං එව මනසිකරොම්, ඉති කායො අනිච්චො පොට්ඨබ්බා—කායවිඤ්ඤාණං—කාය සම්ඵස්සා-යම්පිදං කායසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං—පෙ—තම්පි අනිච්චං.

13. තිට්ඨතු තාව සුත්තං, ඉන්‍දූහං ඉදං එව මනසිකරොම්. ඉති මනොා අනිච්චො ධම්මා-මනොවිඤ්ඤාණං—මනොසම්ඵස්සා—යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං—පෙ—තම්පි අනිච්චං.

14. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකොා චක්ඛුස්මිං නිබ්බින්දති රූපෙසු නිබ්බින්දති චක්ඛුවිඤ්ඤාණෙපි නිබ්බින්දති චක්ඛුසම්ඵස්සෙපි නිබ්බින්දති—පෙ—යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

15. අයං භික්ඛවෙ අදිත්තපරියායො ධම්මපරියායොති.

(සංයුත්තනිකාය-සළායතනසංයුත්ත.)

83. පිට.

a. **වඞ්ගීසත්ථෙර** නම්: අසුමහසව්වන් අතුරෙහි වූ මහරහත් කෙනෙක. මෙතෙමේ සැවැත්නුවර බමුණුකුලයෙහි ඉපිද වඞ්ගීස මානව නමින් ප්‍රසිද්ධව ත්‍රිවෙදය හදාරා ඡවඞ්ගිස නම් මන්ත්‍රයක් ඉගෙණ මළවුන් භිස්කබල නියෙන් ගොා "අසුවල් අය අසුවල් තැන අසුවල් යොනියෙහි උපන්හ"යි කියමින් එයින් මුළු දඹදිව පැතිරගිය කීර්ති ඇත්තේ"මට වඩා පණ්ඩිතයෙක් ලොව නැතැ"යි හත් අභිමානයෙන් උදම්ව බුදුරජාණන්වහන්සේ කරා පැමිණ රහත්තැනකගේ භිස්කබල ගොා උපන් තැන් නොදන ලජ්ජිතව "ඉදින් ඔබ මෙය දන්නෙහි නම් වදාළමැනවැ"යි බුදුන් විාාළේය. බුදුරජහුද "මම මෙද දනිමි, ඕන් වැඩියක්ද දනිම්"යයි වදාරා:

"වුතිං යො වෙදි සත්තානං උපපත්තිඤ්ච සබ්බසො,
අසතං සුගතං බුද්ධං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං.
යස්ස ගතිං න ජානන්ති දෙවා ගන්ධබ්බමානුසා,
ඛීණාසවං අරහන්තං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං"

ය්‍ය ගාථාව වදාළෝය. බමුණුතෙමේ එය ඉගෙණ ගණු පිණිස බුදුන් වෙත පැවිදිවූයේය. එසේ පැවිදිව කම්වඨන් වඩා රහත්ව ප්‍රතිභාන වතුන්ගෙන් අග්‍රත්‍රතුරු ලැබුයේය. (විස්තරකථාව **මනෝරථපූරණී** යෙන් හා **පරමත්ථදීපනී** නම් ථේරගාථාට්ඨකථාවෙන් දතයුතු.)

වඞ්ගීසස්ථවිරයන්වහන්සේ පැවිදිවූ තො බෝකල් ඇත්තේ **අනද** මහතෙරුන් සමග ඇතුළ්ගමට වැඩ අනදතෙරුන්ට උවටැන් පිණිස හා පැන පිළිවිසීම් පිණිස පැමිණි උතුම් රූපවත් සත්‍රීන් දැක උපන් රාගය වැඩී අන්තරාය පිණිස වූවොත් විපතැයි සිතා ලභ සිටි අනද තෙරුන්හට ඒ බව භගවා රාගනිර්‍හරණයට කාරණා විචාරමින් "කාම රාගෙන බැහැම්"යනාදිය කියූ.

85. පිට.

a. "**රඤ්ඤ**"යී මෙහි කි රජ කවරෙක්දැයි අවිනිශ්චිතය. "මාගම වසන රජතෙමේ"යයි අරුත් බිණීමෙන් ව්‍යාඛ්‍යාන කතෘ ද මේ රජුගේ නාමය නොදැන සිටි බව හැගේ. මාගම සිටි රජුන් අතුරෙහි ශ්‍රද්ධා බුද්ධීන් ප්‍රසිද්ධියට පැමිණි රාජයා **කාවණ්ණතිස්ස**ය. මෙහි කියේ මේ රජ දැයි සැක සහිතය. **කරඩුම්භලෙන්** වැසි තෙරුන්ගේ ගුණකථාව අසා පැහැද දැක වැඳ සිල්ගණු පිණිස තෙරුන් කැඳවාගත් හෙයින් එකල මාගම විසූ මේ රජු බුද්ධාගම කෙරෙහි මහත් භක්ති ඇත්තෙකු බැව් නිශ්චිතය. බුදුගොස්තෙරුන් ලක්දිව විසූ කාලයෙහි මේ තෙරුන්ගේ පුවත ලක්දිව ප්‍රසිද්ධව තුබූ හෙයින් එය ඉන්ද්‍රියසංවර ශීලයෙහි නිදර්ශිතවීයයි සිතිය යුතු.

86. පිට.

a. **විසඝණ්ඩරොග** නම්: එනකන්දලරොගයයි. පාපරොගාදිය ද විසඝණ්ඩ රොගයයි කියනු ලැබේ. මේ ගණ්ඩරොගය භවඟත් කල ඇඟ දරුණු විෂ වන්නාක් මෙන් කටුක වූ වෙදනා ඇති කෙරේ.

91. පිට.

a. මෙහි "**පඤ්චවත්තාළීසවස්සානි, පන්සාළීස්හවුරුද්දක්**"යයි බොහෝ පොත්වල පාළියෙහි ද සන්නයෙහි ද දක්නා ලැබේ. බුදුරජුන් බුදුව වැඩසිටියේ පන්සාළීස් වසෙකි. සැරියුත් තෙරහු බුදුන් බුදුවූ දෙවෙනි වස පැවිදිව බුදුන් ධ්‍රියමාණ කල්හිම පරිණිර්වියෝය. සැරියුත් තෙරුන්ගේ පරිණිර්වීම බුද්ධපරිණිර්වාණ වෙලේ මූලභාගයෙහිවූ බැව් නිශ්චිතය. එහෙයින් මෙහි "**චත්තාළීසවස්සානි**"යනුම සුද්ධපාඨයි.

92. පිට.

a. "**අම්බඛාදකමහානිස්සභත්ථෙරවත්ථු**"නම්:

ශ්‍රීලඞ්කාද්වීපයෙහි බොහෝ භික්ෂූන්වහන්සේට වාසස්ථානවූ **විවරගුම්බ** නම් එක්තරා විහාරයක වාසයකරන්නාවූ එක් මහතෙර කෙනෙකුන් වහන්සේ එකාකිව අද්‍යාන මාර්ගප්‍රතිපන්නව වඩනාසේක්:

එක්තරා ගමක සැතපී උදැසන්හි කළමනා ශ්‍රමණකෘත්‍ය සම්පාදනය කොට සිවුරු ගැටවට්ටගන්වා පාත්‍රය ගෙණ ඇතුළු ගමට වැද පිඬු පිණිස හැසිර එකලට බොහෝ දුර්භික්ෂ හෙයින් අහර නොලැබ ගමතින් කැලඹුන හෙයින් යාත්‍රාවට අසමර්ථව පලගෙණ පැසුනු එක් අඹගසක් මූල සිහිල් සෙවන හිඳිනු නොහෙන හෙයින් සැතපුනු සේක. (අහෝ මහාතමයන්ගේ [ශික්ෂා] ධර්මගෞරවය ආශ්චර්‍ය්‍ය නියාය.) ගමනාගාර විකලතායෙන් ජීවිතාවසාන වන තරම් ශරීර මර්දනය උවද ශික්ෂාපද මර්දනය නො කෙරෙමියි බොහෝ මිහිරි අඹපල හුනුව තුබුවාසින් එක අඹගෙඩියකවත් අත නො පොවා එතැම හලාහලව්ඡ මෙන් සලකා සැතපුනු සේක.

මෙසේ තෙරුන් අඹරුක මූල සැතපෙන කල්හී එක් මහලු උපාසකයෙක් අඹ ඇසිඳ කන්නට ගසමූලට පැමිණියේ හෙත් තෙරුන් දැක ලය පිරුණු සොවින් ලහට ගොස් බණවා "මාගේ සවාමිදරුවානන් වහන්ස, මේ තුමන්වහන්සේට පැමිණියේ කවර අනාථ අසරණයෙක්ද"යි හඬහඬා බැණවියදීත් බැණ නැග ගත නො හෙන හෙයින් අඹරස මැඹ පාදා වළඳවා එතැන්හි නැගී යාමට ශක්ති මදබව දැන තෙරුන්වහන්සේ තමන් කර මතුයෙහි තබාගෙණ තමා වසන ගමට යනු පිණිස නික්මුනේය. එකල්හි තෙරුන්වහන්සේ මදක් සිහි ලදින් ඔහුගේ කරමුදුනෙහි ම හිඳ සිතනසේක්:

"න පිතා නපි තෙ[1]මාතා න ඤාති න පි බන්ධවො,
කරොතෙ තාදිසං සිවං සීලවන්තස්ස කාරණා."

"දැන් මේ පුරුෂතෙමේ පිතෘ නොවෙයි, මාතෘත් නොවෙයි, ඥාතීහු ද නොවෙති, අවශ්‍ය බන්ධුවර්ගයෙහි බන්ධුපුරුෂයෙකුදු නොවෙයි, පූර්ව කෘතොපකාරයට ප්‍රත්‍යුපකාර කරන්නෙකුදු නොවෙයි, ඒ හැම නොවී සිට මෙබඳු කෘතියක් කරණුයේ ගුණ සලකාමය, එසේ හෙයින් සිල්වත් ගුණවත්වූ මා විසින් ඕහට කුශලය මහත් කොටම වර්ධනය කළ මැනවැ"යි තමන්වහන්සේ තමන්වහන්සේටම අවවාද කොට ගෙණ භාවනා කෙරෙමින් විදර්ශනා වඩා ඔහු කර මතුයෙහිම හිඳ රහත් වූ සේක. මෙසේ වූ ව්‍යඤ්ජනයෙකින් හිඳ අනුන් තමන්හට කළාවූ ගුණ සලකා සිත එකඟ කොට සොවාන් ආදි සතරමග සතර ඵලයට පැමිණ කෙලෙසුන් හිඳ රහත්වූ සේක. ඒ උපාසකතෙමේත් මෙසේ රහත්ව නිවන් දුටුවාවූ ඒ තෙරුන්වහන්සේ මහත් සන්තොෂයෙන් කර තබා ගෙණ තමා කළ කුශලානුභාවයෙන් ලත් නිවන් භාරයක් මෙන් තමාගේ වාසස්ථානයටම ගොස් සරුප්තැනක සකස් කොට හිඳිනා අනුන් පතවා එහි වඩාහිඳුවා අපමණ සන්තොෂයෙන් පසඟ පිහිටුවා වැඳ පිරිසිදු සෙනසුන් පතවා සතපමින් දෙවන දවස් දන් දී අනුමෙවෙනි බණ අසා සවඟීමොක්ෂඵලයත් සිඛවන සේ කුශලවර්ධනය කෙළේය.

1. මේ මාතා-ඇතැම්.

මෙසේ සාදුකින් පෙළෙම්නුත් "පටිඝඝන"ශික්ඛාපද ඉක්මෙන බියෙන් හුනු අඹ පල නොවළඳ ආජීවඝ පිරිසිදු කොට සිල් පිරූ මහ තෙරුන් වත ආජීවපාරිසුද්ධි සීලයෙහි නිදර්ශන කටයුතු.

94. පිටු.

a. "සඤ්ඤානං සෙඛානං" යන තැන සප්තවිධ ශෛක්ෂයෝ නම්:

(1) ශ්‍රෝතාපත්තිමාර්ගස්ථඝ, (2) ඵලස්ථඝ, (3) සකෘදාගාම්මාර්ගස්ථඝ, (4) ඵලස්ථඝ, (5) අනාගාම්මාර්ගස්ථඝ, (6) ඵලස්ථඝ, (7) අර්හත්මාර්ගස්ථඝ, යන ආර්‍යයෝ සත්දෙනඝ. ශෛක්ෂඝන්ගේ ප්‍රත්‍යඝපරිභොගඝ "දෘඝජ්ජපරිභොග"නමැයි කියූ.

96. පිට.

a. "භාණිතෙඝ්‍ය ඝඬ්ගරඝකිඝ වත්ථු:"

ධම්මපදවර්ණකථාවෙන් හා අපදානවර්ණකථාවෙන් දතයුතුයි. තෙරුන් වඤ්චේ ගෙරණ පැවිදි කල උවදූ තෙරුන් විසින් "මාඝෙව ත්වං සාමණේර-ජීවිඝං ඛ්‍යාපෙසි අසඤ්ඤතෝ"ඝනාදීන් දුන් අවවාදඝෙහි පිහිටා මොනවට පස්විකා වැළඳී. එහෙයින් උන්වහන්සේ මේ ප්‍රත්‍යඝසඤ්ඤානිශ්‍රිත ශීලඝෙහි සම්පූර්ණකාරී බැවිහි නිදර්ශිතඝ.

99. පිට.

a. අම්බඩාදඤ්ඤමහාතිස්ස තෙරුන්ගේ සීලඝ ජීවිතහෙතුවෙනුදු ශික්ෂාපද නොඉක්මවූ හෙයින් අදිට්ඨපරිඝන්න භාවඝෙන් අපරිඝන්න පාරිසුද්ධි සීලඝ නමැයි දතයුතු. (92 පිටේ [a] පරිකථා බලනු.)

101. පිට.

a. "කුටුම්බියපුත්ත තිස්සත්ථේර"නම් කවර ඝන්?

සැවැත්නුවර තිස්ස නම් කෙළෙඹිපුතෙක් සතළිස් කෙළක් ධනඝ හැර පැවිදිව අරණ්‍යඝෙහි වාසඝ කෙළේඝ. උන්වහන්සේගේ කනිටු සොහොයුරුගේ බිරින්ද "ඝව් ඔහු දිවි නොර කරව්"ඝයි පන්සිඝ ඝක් සොරුන් පිටත් කොට යැවිඝ. ඔහුද ගොස් තෙරුන් පිරිවරා ගත්හ. ඉක්බිති තෙරහු "කුමක් හෙයින් අවුද උපාසකවරුනි"යි විමසූඝ. "ඔබ දිවි නොර කරම්හ"යි සොරු කීහ. එසේ නම් "උපාසකවරුනි ඇපඝක් ගෙණ අද එකරැඝක් මා දිවි දෙවුඝයි තෙරුන් කී කල්හි සොරහු "ශ්‍රමණ! කවරෙක් මෙහි ඔබට ඇපවේද"යි පිළිවිසූහ. තෙරහු මහත් පහණකැවක් ඝෙන උඹරුඅට බිඳගෙණ ඇපඝ පමණද? උපාසකවරුනි"යි කීහ. එකල්හි සොරහු ඉවත්ව සක්මන් හිඝ හිනිදල්වා ගෙණ හොඳ්තාහුඝ. වෙදනාවිඤ්ඤාණඝන කොට ශීලඝ ප්‍රත්‍යවෙක්ෂාකරන්නාවූ තෙරුන්ට පරිශුද්ධශීලඝ නිසා ප්‍රීති ප්‍රමොද්‍යඝ උපන්නේඝ. ඉක්බිති පිළිවෙළින් විදසුන් වඩා සියලු රාත්‍රියෙහි භාවනා කොට අරුණෝදඝෙහි රහත් බවට පැමිණ මෙසේ උදන් ඇනුහ:

"උභො පාදානි භින්දිත්වා සංයම්සසාමි වො අහං
අට්ඨියාමි හරායාමි සරාගමරණං අහං,
එවාහං විනානසිත්වාන යථාභූතං විපසසිං
සමපතෙන අරුණුගාමයි අරහත්තං අපාපුණිං.

මෙසෙසින් මේ තෙරුන්ගේ සීලය තෘෂ්ණාවශයෙන් අපරාමෘෂ්ට හෙයින් අසඞ්කමඛණාදිසුඛාධිෂ්ඨිල නමැයි දතයුතු.

104. පිටු.

a. "අභිජ්ඣං ලොකෙ පහාය:"යන තැන—

"සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති, අභිජ්ඣාය චිත්තං පරිසොධෙති; බ්‍යාපාදදොසං පහාය අබ්‍යාපන්න චිත්තො විහරති සබ්බපාණභූත හිතානුකම්පි, බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති; පිනමිද්ධං පහාය විගතපිනමිද්ධො විහරති ආලොක සඤ්ඤි සතො සම්පජානො, පිනමිද්ධා චිත්තං පරිසොධෙති; උද්ධච්ච කුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්නචිත්තො, උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති; විචිකිච්ඡං පහාය තිණ්ණ විචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු, විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති" යනුවෙන් නෙක්ඛම්මාදි ඒ ඒ ප්‍රහාණාඞ්ගයෙන් කාමච්ඡන්දාදීන්ගේ ප්‍රහාණීය කිහු. කාමච්ඡන්දාදීන්ගේ ප්‍රහාණය පූර්ව භාග ප්‍රතිපත්ති වශයෙන් ප්‍රථමධ්‍යානාදීන්ගේ අධිගමයට උපාය වේ.

මෙහි නෙක්ඛම්මය කාමච්ඡන්දයට උජුවිපච්චනික (ඉදුරම් ප්‍රතිවිරුද්ධ)වූ ප්‍රහාණාඞ්ගය හෙයින් නෙක්ඛම්මයෙන් කාමච්ඡන්දයාගේ ප්‍රහාණීය වෙයි. ඒ ප්‍රහාණීය ඒ ඒ කුශලධර්මයට ප්‍රතිෂ්ඨාවන හෙයින් උපධාරණය ද වෙයි, අවිප්‍රකීර්ණීසවභාවසාධනයෙන් සමාධානය ද වෙයි. එහෙයින් නෙක්ඛම්මය උපධාරණය, සමාධානය යන අර්ථයෙන් ප්‍රහාණශීල නම් වෙයි. සෙස්ස ද මේ නයින් දතයුතුයි.

105. පිටු.

a. "සමෙමාහාභිනිවෙසසස" යන පදයට "ඉස්සරකත්තාදි වසෙන ලොකො සමුපපන්නොහා(=ඊශ්වරාදි නිර්මාණ කර්තෘකෙනෙකු හෙතු කොට ගෙණ ලොකය උපන්නේය"යි කරණ අභිනිවෙශය (=දෘෂ්ටි වශයෙන් නිශ්චය කොට ගැණීම) සමෙමාහාභිනිවෙස නමැයි. අරුත් කියා මතානන්තර දක්වනුවෝ "සත්‍යයෙහි ශාස්වත, උච්ඡේද, අභිනිවෙශ"යයි කීහු. සමහරු "අහොසිං නුඛො අහං අතීත මද්ධානං"යනාදින් ප්‍රවෘත්ත සංශයාපත්තිය සමෙමාහාභිනිවෙශය යෙත්"යයි කීහු.

"ඉස්සර කතකාදිවසෙන ලොකො සම්පජ්ජෙනාති අභිනිවෙසො සමෙමාභාභිනිවෙසො; උවෙජදසස්සතාභිනිවෙසොති කෙවි-අහොසිං නුඛො අහං අතීතමද්ධානං, ආදිනඅපපවත්තා සංඝයාපත්ති සමෙමා භාභිනිවොසොති අපරෙ"ඇති බදරතීකා සඳහන ඛම්මපාලාචාර්‍ය පාදයන් විසින් මේ පදයට ලියූ ටීකායි.

මෙහි "සන්‍යයෙහි"යයි කියේ මේ ටීකායෙහි පෙණෙන 'කෙවි" යන පදයට හෙයින් පරාක්‍රමබාහු ව්‍යාඛ්‍යානයෙහි තැනින් තැන මතාන්තර දර්‍ශනයෙහි දැක්වූ 'සන්‍යය' විසුද්ධිමග්ග ටීකාවටත් පෙර පැවැත්තේයයි සිතියයුතු.

"අහොසිං නුඛො අහං අතීතමද්ධානං=මම ඉකුත් කාලයෙහි (=අත්බැවිහි)වූයෙම්දෝ"යනාදින් පැවැති සොළොස්වැදෑරුම් සැකය මජ්ඣිමනිකායෙහි-සබ්බාසවසුත්‍රය බලා දතයුතු.

108. පිට.

a. "සත්තසු ආපත්තික්ඛන්ධෙසු"යන මෙහි සප්තාපත්තිස්කන්ධයෝ නම්:

"තත්‍ර කතමෙ සත්ත ආපත්තික්ඛන්ධා?,(1)පාරාජිකාපත්තික්ඛන්ධො, (2) සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධො, (3) ථුල්ලවච්‍යාපත්තික්ඛන්ධො, (4) පාචිත්තියාපත්තික්ඛන්ධො, (5) පාටිදෙසනීයාපත්තික්ඛන්ධො, (6) දුක්කටාපත්තික්ඛන්ධො, (7) දුබ්භාසිතාපත්තික්ඛන්ධො; ඉමෙ සත්ත ආපත්තික්ඛන්ධා. (විනය-පරිවාරපාළි-කතිපුච්ඡාවාර.)

110. පිට.

a. "මදෙ"යන තැන "ජාතිමද"ආදි සත්විසි මදයෝ ම ගතයුතු වෙත්.

එනම්:

"1. ජාතිමදෙ, 2. ගොත්තමදෙ, 3. ආරොග්‍යමදෙ 4. යොබ්බන මදෙ, 5. ජීවිතමදෙ, 6. ලාභමදෙ, 7. සක්කාරමදෙ, 8. ගරුකාරමදෙ, 9. පුරෙක්ඛාරමදෙ, 10. පරිවාරමදෙ, 11. භොගමදෙ, 12. වණ්ණ මදෙ, 13. සුතමදෙ, 14. පටිභානමදෙ, 15. රත්තඤ්ඤුමදෙ, 16.පිණ්ඩ පාතමදෙ, 17. අනවඤ්ඤත්තිමදෙ, 18. ඉරියාපථමදෙ, 19. ඉද්ධිමදෙ, 20. යසමදෙ, 21. සීලමදෙ, 22.ඛාතමදෙ, 23. සිපපමදෙ, 24.ආරොහ මදෙ, 25. පරිණාහමදෙ, 26. සඤ්ඤාතමදෙ, 27. පාරිපූරිමදෙ"යන මොහු සත්විසිමද නම් වෙත්. (අභිධම්ම-විභඞ්ගපාළි.)

111. පිට.

a. "ඉමෙ පඤ්ච ආදීනවා"යන ආදින් සීලවිපත්තියෙහි පඤ්ච ආදීනව වදාළ සූත්‍රය නම්:

පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා දුස්සීලස්ස සීලවිපත්තියා, කතමෙ පඤ්ච?

1. ඉධ භික්ඛවේ දුස්සීලෝ සීලවිපන්නෝ පමාදාධිකරණං මහතිං භොගජානිං නිගච්ඡති. අයං භික්ඛවේ පඨමෝ ආදීනවෝ දුස්සීලස්ස සීලවිපත්තියා.

2. පුනවපරං භික්ඛවේ දුස්සීලස්ස සීලවිපන්නස්ස පාපකෝ කිත්තිසද්දෝ අබ්භුග්ගච්ඡති. අයං භික්ඛවේ දුතියෝ ආදීනවෝ දුස්සීලස්ස සීලවිපත්තියා.

3. පුනවපරං භික්ඛවේ දුස්සීලෝ සීලවිපන්නෝ යඤ්ඤදේව පරිසං උපසඞ්කමති යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපති පරිසං යදි සමණපරිසං අවිසාරදෝ උපසඞ්කමති මඞ්කුභූතෝ. අයං භික්ඛවේ තතියෝ ආදීනවෝ දුස්සීලස්ස සීලවිපත්තියා.

4 පුනවපරං භික්ඛවේ දුස්සීලෝ සීලවිපන්නෝ සම්මූළ්හෝ කාලං කරොති. අයං භික්ඛවේ චතුත්ථෝ ආදීනවෝ දුස්සීලස්ස සීලවිපත්තියා.

5. පුනවපරං භික්ඛවේ දුස්සීලෝ සීලවිපන්නෝ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. අයං භික්ඛවේ පඤ්චමෝ ආදීනවෝ දුස්සීලස්ස සීලවිපත්තියා.

ඉමේ ඛෝ භික්ඛවේ පඤ්ච ආදීනවා දුස්සීලස්ස සීලවිපත්තියා.

(අඞ්ගුත්තර—පඤ්චකනිපාත-අකෙකාසකවග්ග.)

12. පිට.

a. "අග්ගික්ඛන්ධූපමියාසෙ"කි තැන අග්ගික්ඛන්ධූපරියාය නම්:

"එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරති මහතා භික්ඛු සඞ්ඝෙන සද්ධිං, අද්දසා ඛෝ භගවා අද්ධානමග්ගපටිපන්නෝ අඤ්ඤතරස්මිං පදෙසෙ මහන්තං අග්ගික්ඛන්ධං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං, දිස්වා මග්ගා ඔක්කම්ම අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ පඤ්ඤත්තාසනෙ නිසීදි, නිසජ්ජ ඛෝ භගවා භික්ඛූ ආමන්තෙසි, පස්සථ නෝ තුම්හෙ භික්ඛවේ අමුං මහන්තං අග්ගික්ඛන්ධං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතන්ති?"ඝන ආදීන් ආරම්භ කොට "තස්මා තිහ භික්ඛවේ එවං සික්ඛිතබ්බං යෙසඤ්ච මයං පරිභුඤ්ජාම චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරානං, තෙසං තෙ කාරා මහප්ඵලා භවිස්සන්ති මහානිසංසා, අම්හාකං චෙවායං පබ්බජ්ජා අවඤ්ඣා භවිස්සති සඵලා සඋද්‍රයාති—පෙ—අත්තත්ථං වා භික්ඛවේ—පරත්ථං වා භික්ඛවේ—උභයත්ථං වා භික්ඛවේ සම්පස්ස මානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුන්ති"ඝන්‍රවෙන් අවසන් කොට වදාළ සූත්‍රයයි.

"ඉමස්මිං ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ සට්ඨිමත්තානං භික්ඛූනං උණ්හං ලොහිතං මුඛතො උග්ගඤ්ඡි, සට්ඨි මත්තා භික්ඛූ සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිංසු දුක්කරං භගවා දුක්කරං භගවාති, සට්ඨි මත්තානං භික්ඛූනං චිත්තානි අනුපාදාය ආසවෙහි විමුච්චිංසු."

මේ නිර්ගාථක සූත්‍රය වදාරණ කල්හි සැටක් පමණ භික්ෂූහු උණු ලේ වැමෑරූහ. සැටක් පමණ භික්ෂූහු "භාග්‍යවතුන්වහන්ස! පැවිද්ද නම් දුෂ්කරය, පැවිද්ද නම් දුෂ්කරය"යි කියා හිවුරු හැර ගිහි වූහ. සැටක් පමණ භික්ෂූහු රහත් වූහ.

(අඞ්ගුත්තර—සත්තකනිපාත මහාවග්ග.)

114. පිට.

a. "ඛත්තියමහාසාලානංවා"-යි කැන ක්ෂත්‍රිය මහාසාරයෝ නම් කැත්මහසල්කුලයෙහි උපන්නෝය. **කෑත් මහසල්කුලය** නම්: යටත් පිරිසෙසින් දවස කහවණු සියයක් නිධානගත වේද, කහවණු විසි අමුණක් දවස වියදම වේද, ඒ කැත්මහසල්කුලයයි දතයුතු.

b. "බ්‍රාහ්මණමහාසාලානංවා"-බ්‍රාහ්මණ මහාසාරයෝ නම්: බමුණු මහසල්කුල ඇත්තෝය. **බමුණු මහසල් කුලය** නම්: දවස කහවණු අසූකෙළක් නිධානගත වේද, දසඅමුණක් දවස වියදම වේද, ඒ බමුණු මහසල්කුල නමැයි දතයුතු.

c. "ගහපතිමහාසාලානංවා" ගෘහපති මහාසාරයෝ නම්: ගැහැවි මහසල්කුල ඇත්තෝය. **ගැහැවිමහසල්කුල** නම්: දවස කහවණු සත ලිස්කෙළෙක් නිධානගත වේද, පස්අමුණක් දවස වියදම වේද, ඒ ගැහැවි මහසල්කුල නැමැයි දතයුතු.

එහෙයින් කීහ:

1. කොටිනං හෙට්ඨිමන්නෙන සතං යෙසං නිධානගං,
කහාපණානං දිවස වලඤ්ඤා විසතිමමණං.
2. තෙ ඛත්තිය මහාසාලා'සිනිකොටි ධනානිතු,
නිධානගානි දිවස වලඤ්ඤා ච දසමමණං.
3. යෙසං දව්ජ මහාසලා තදුපඩ්ඪ නිධානගෙ,
වලඤ්ඤා ච ගහපති මහාසාලා ධනෙ සියුං.

(අභිධානප්පදීපිකා.)

"ඛත්තියමහාසාලානි: ඛත්තිය මහාසාරපත්තා මහාඛත්තියා, එසනයො සබ්බත්ථ. තෙසු ඛත්තිය මහාසාලා නාම: යෙසං කොටි සතමපි කොටිසහස්සම්පි ධනං නිබණ්හිත්වා ඨපිතං, දිවසපරිබ්බයාය එකං කහාපණ සකටං නිගච්ඡති, සායං මෙ පවිසන්ති.

බ්‍රාහ්මණමහාසාලා නාම: යෙසං අසීති කොටි ධනං නිහිතං හොති, දිවසපරිබ්බයො එකො කහාපණකුම්භො නිගච්ඡති, සායං එකං සකටං පවිසති.

ගහපතිමහාසාලා නාම: යෙසං චත්තාළීස කොටි ධනං නිහිතං හොති, දිවසපරිබ්බයාය පඤ්ච කහාපණමමණානි නිගච්ඡන්ති, සායං කුම්භො පවිසති. (සුමඞ්ගලවිලාසිනි-දීඝ. මූ. 410 පිට.)

115 පිට.

a.–b. "ලොහකුම්භියා"කියූ තැන ලොහොකුඹු නරකය:

"තමේනං නිකඛිවෙ නිරයපාලා උද්ධපාදං අධොසිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපන්ති ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය; සො තත්ථ ඵෙණුදෙදහකං පච්චති. සො තත්ථ ඵෙණුදෙදහකං පච්චමානො සකිම්පි උබ්බං ගච්ඡති, සකිම්පි අධො ගච්ඡති, සකිම්පි තිරියං ගච්ඡති, සො තත්ථ තිප්පා කට්ඨකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්ති හොති."

(අඞ්ගුත්තරනිකාය-දෙවදූතසුත්තය.)

මෙහි වදාළ ලොහොකුඹු නිරය වනාහි දහසක් යොදුන් දිගය. දහසක් යොදුන් පුළුලය. දහසක් යොදුන් ගැඹුරය. මේ නිරය සිසාරා ගිනිගෙණ දිලෙන තඹයොදුන් බොල් යපවුරෙක් ඇත. තඹයොදුන් බොල් යපියන් පතින් මුදුන පියත ලද්දේය. සිවුදිග සිවුමහ දොරක් ඇත්තේය. දහසක් යොදුන් පල්ලේ සිට මුවවිට තෙක් ගිනිගෙණ දිලියෙන ලොහොදියෙන් පිරුණේය. මෙහි ලෝදිය රසදිය මෙන් කකියය කකියා තිබෙයි. මෙසේවූ ලෝදිය වාත වෙගයෙන් රළ ඝසා පී කල දෑ ඇවිල නැහෙන්නේය.

මෙසේවූ නරකයෙහි නිරයපල්ලෝ පව්කලාවූ සත්වයන් පා උඩු කුරු කොට හිස යටිකුරු කොට ගෙණ බහන්නාහුය. ඔවුහු මෙහි වැටී පෙණ නගනගා උදුන්පත්ලෙහි ගකඛල බනාලූ වෙඩරු පිඩක් සෙයින් ද තුතුයෙක කකියවනලද තඹ දියත්තක් සෙයින්ද දෑ වැගිරි වැගිරී වරක් උඩට එන්නාහුය වරක් යට බස්නාහුය වරක් සරස යන්නාහුය. මෙසේ බලවත් දුක් විඳින්නාහු කම් ගෙවී යන තෙක්ම නො මියන්නාහුය. සතුන් මරා කෑවෝද පරදුර අකුසල් කළෝ ද සුරාපාන කළෝ ද දුසිල්ව සිටගෙණ සැදැහැගෙන් දෙන සිවු පස පරිභොග කළෝ ද මේ නරකයෙහි උපදින්නාහුය.

මෙහි-අඟුලිකඛණොපම සූත්‍රයෙහි ලොහොකුඹු නිරයෙහි පැසීම දුසිල්ව සිටගෙණ සැදැහැමතුන්ගේ සෙනසුන් පරිභොගයට වඩා උතුම්සි වදාළේය. (එහෙයින් මෙතැන් නිති සිහිපත් කළයුතු.)

116. පිට.

a. "ආත්මානුවාදාදි"හය නම්:

1. ආත්මානුවාදභය, 2. පරානුවාදභය, 3. දණ්ඩභය, 4. දුගතිභය යන මොහුයි.

එහි: 1. **ආනුවාදභය** නම්: තෙමේ තමන්ට අනුවාද කිරීමෙහි උපදනා බියසි-හෙවත්-යමෙක් "ඉදින් මම් කා විසි මුනි තුන්දෙරින් දුසිරිත් කෙලෙම් නම් කිම, මට මාගේ ආත්මය (=තෙමේ)ම සීල යෙන් දෙස් තගන්නේ නොවේද"යි මෙසේ සිතා තුන්දෙර දුසිරිත් හැර තමන් පිරිසුදුව ගෙණ වාසය කෙරේ ද, මෙසේ තුමන් තුමන්ට උපදවාද බිණීමෙහි බියෙන් පවින් වැළැක්ම ආත්මානුවාදභය නමැයි දතයුතු.

2. **පරානුවාදභය** නම්: මෙරමාගේ නිසුබිණීමෙන් (=දෙස් නැගීමෙන්) උපදනා බියසි-හෙවත්-යමෙක් "ඉදින් මම් තුන්දෙරින් දුසිරිත් කෙලෙම් නම් මෙරමා මට සීලයෙන් උපවාද කරන්නේය දෙස් තගන්නේය"යි සලකා පවින් වළකී ද, මෙසේ මෙරමා නුගුණ බියෙන් පවින් වැළැක්ම පරානුවාදභය නමැයි දතයුතු.

3. **දණ්ඩභය** නම්: දෙතිස් කම්කටුලු නිසා උපදනා භයසි-හෙවත්-යමෙක් අපරාධකාරී හොරෙකු ගෙණ කසවලින් තැලීමාදි දෙතිස් කම්කටුලු කරණු ලබනහු දැක "ඉදින් මමත් මෙබඳු පව් කෙලෙම් නම් මාද රාජපුරුෂයෝ අල්වා ගෙණ නොයෙක් දඬුවම් කරන්නාහ"යි මෙසේ සලකා පවින් වැළකේ ද, එසේ දඬුවමට බියෙන් පව් නොකිරීම දණ්ඩභය නමැයි දතයුතු.

4. **දුගතිභය** නම්: සතර අපාය නිසා උපදනා භයසි-හෙවත්-යමෙක් "කායු වාක් මනඃ දුශ්චරිතයන්ගේ විපාක පරලොවදීය, එහෙයින් මම් තුන්දෙරින් පව් කෙලෙම් නම් කාබුන් මරණින් මතු අපායෙහි උපදින්නෙමි"යි සලකා පවින් වළක්නේද, එසේ දුගති යට බියෙන් පවින් වැළැක්ම දුගතිභය නමැයි දතයුතු.

(වදලේ මැ නොවේ:(**අඞ්ගුත්තර**—චතුක්කනිපාතයෙහි—)

"චත්තාරි මානි භික්ඛවෙ භයානි, කතමානි චත්තාරි? අත්තානුවාද භයං, අපරානුවාදභයං, දණ්ඩභයං, දුග්ගතිභයං"යනාදි.

මෙහි දුශ්ශීලයා මෙකී සියලු භයින් නොමිදෙන්නේ අපාය මග වම පිළිපන්නේ වේද, එහෙයින් "සබ්බභයෙහි අමුත්තෝ"යනාදීන් කීහු.

ධුතාඞ්ගනිද්දේශ පරිකථා.

119. පිට.

a. "කුලපුත්තානං"යන තැන්හි කුලපුත්‍රයෝ නම්:

ජාතිකුලපුත්‍රයහ, ආචාරකුලපුත්‍රයහයි ද්විධ වෙත්.

එහි: 1. "තෙන ඛෝ පන සමයෙන රඤ්ඤෝ පසේනිස්ස කුලපුත්තෝ තස්මිං යෙව ථුල්ලකොට්ඨිතෙ අඞ්ගකුලිකස්ස පුත්තෝ"යන ආදි තැන්හි ආ උත්තමකුලප්‍රසූතයෝ ජාතිකුලපුත්‍ර නම් වෙති.

2. "යෙ තෙ කුලපුත්තා සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිත්වා' යන ආදි තැන්හි ආ යම් ඒ කුලයක ප්‍රසූත නමුදු ආචාර සම්පන්නවූවෝ ආචාර කුලපුත්‍ර නම් වෙති. (පපඤ්චසූදනී.)

එසින් ආචාරකුලපුත්‍රයන්ට තෙළෙස් දුඟහඟ අනුදන්නාලදසි සන්නයෙහි කිහු.

120. පිට.

a. "අපූප ඛාදනම පූපං, තත් ශීල මස්සෙත්‍යාපූපිකඃ"යනු "පංසුකූල"ශබ්ද සිද්ධියෙහි සාධක වශයෙන් දැක්වූහ.

"ආපූපිකඃ"යන පදය කාශිකා, සිද්ධාන්ත කෞමුදී ආදියෙහි "අපූප භක්ෂණං ශීලමස්‍ය"යි වාක්‍යය ගෙණ උත්තරපදලොපයෙන්වූ භක්ෂණාර්ථය ලක්ෂණ කොට ඇති 'අපූපං'යන ෂෂ්ඨ්‍යන්ත නිරූඪ ප්‍රථමාන්තයඃ තෙරෙන් තච්ඡීලාර්ථයෙහි "ශීලම්"යන සූත්‍රයෙන් 'ඨක්' ප්‍රත්‍යය කොට "ඨස්‍යෙකඃ"යන සූත්‍රයෙන් 'ඨ'යන්නට 'ඉක' ආදෙශ කොට 'කිති ච'යන සූත්‍රයෙන් පූර්ව අකාරයට වෘද්ධි කොට 'ආපූපික'යි සිද්ධ කොට තිබේ.

(එසින් උද්ධෘත[මෙහි දැක්වූ]පාඨයෙහි "අපූප ඛාදනං"යි ව්‍යඤ්ජන මාත්‍රයෙක්ම වෙනසි.)

මෙසේම "පංසුකූලස්‍ස ධාරණං=පංසුකූලං"යි උත්තරපද (ධාරණ ශබ්ද) ලොපයෙන් පංසුකූල ශබ්දය සිද්ධ වූ බව දතයුතු.

122. පිට.

a. අනතිරිත්ත භොජනස්‍ස එතං නාමං"යි අනතිරිත්ත(කැපකළ)භොජන යට 'පච්ඡාභත්ත'යනු නමෙකැයි කියූ. සික්ඛාපදයෙන් අනතිරිත්ත භොජනය ප්‍රතික්ෂිපතය. කැපයෙහිම ධුතාඞ්ග සමාදන ගෙසින් බලු පච්ඡාභත්තිකඞ්ගයෙන් අනතිරිත්තභොජනඝඞ්ඛ්‍යාතපච්ඡාභත්තභොජනය ප්‍රතික්ෂිපතය. එහෙසින් වළඳ පැවරූ පසු කැපවූ භොජනයද නැවත නො වැළඳීම ඛලුපච්ඡාභත්තිකඞ්ග නමැයි දතයුතු

එහෙයින් කිහ:—

"බලුති: පටිසෙධත්ථෙ නිපාතො, පවාරිතෙ සති පච්ඡා ලද්ධං භත්තං පච්ඡාභත්තං නාම. තස්ස පච්ඡාභත්තස්ස භොජනං පච්ඡාභත්ත භොජනං, තස්මිං පච්ඡාභත්තභොජනෙ පච්ඡාභත්තසඤ්ඤං කත්වා පච්ඡාභත්ත සීලමස්සාති පච්ඡාභත්තිකො, සමාදානවසෙන පටික්ඛිත්තං තිරිත්තභොජනසෙඛතං නාමං; තස්ස අඞ්ගං බලුපච්ඡාභත්තිකඞ්ගං."

(සද්ධම්මපජ්ජොතිකා-නිද්දෙසට්ඨකථා.)

b. "අට්ඨකථායං පන වුත්තං"යන තන්හි අට්ඨකථා නම් මිහිඳු මහරහතුන් විසින් කළ සිංහල මහ අටුවාව විය යුතු යි. "බලුති: එකො සකුණිකො"යනාදිය නිද්දෙසට්ඨකථාදියෙහි නො පැණේ.

123. පිට.

a. "වුත්තමපි චෙතං අට්ඨකථායං"යන තැන අට්ඨකථා යනුද මහඅටුවාහි. මහානිද්දෙසඅට්ඨකථායෙහි දැ: "වුත්තමපි චෙතං, යො සමාදියති, සො පුග්ගලො, යෙන සමාදියති චිත්තචෙතසිකා එතෙ ධම්මා, යා සමාදානචෙතනා තං ධුතඞ්ගං, යා පටික්ඛිපති තං වජ්ජෙතීති"හි කිහ.

125. පිට.

a. දෙවහාතිකත්ථෙරවත්ථු"යන තන්හි දෙබෑතෙරුන්ගේ වත නම්:

සිතුල්පව්වෙකෙර දෙබෑ (සොහොයුරු) තෙර කෙනෙක් විසූහ. කනිටු තෙරහු උපස්ථායකයා විසින් එවූ උක්දඬු ගෙණ දෙටු තෙරුන් වෙත ගොස් වහන්ස! පරිභොගකළ මැනවයි කීහ. එය තෙරුන් වළඳා මුව දෝනා කලහි. එහෙයින් ඇවැත කම් නැතැයි පිළිකෙව් කෙළේය. කිම වහන්ස! එකාසනිකදැයි කනිටු තෙම ඇසීය. එකල තෙරහු "උක්දඬු ගෙණවයි ගෙන්වා ගෙණ පණස්වසක් රැක්ක එකාස නිකධුතඞ්ගය සහවමින් පරිභොග කොට මුව දෙවා කැවත දුහඟ ඉටා ගත්තෝය. (මනොරථපූරණී.)

මෙය එකාසනිකඞ්ගයෙහි අපිස් බැව්හි නිදසුන් පිණිස දැක්වූ වතහි.

සන්නයෙහි (සං. 3.) පෙණෙන දෙබෑතෙරුන්වත නෙසජ්ජිකඞ්ග යෙහි නිදසුන්ය.

සොසානිකධුතඞ්ගයෙහි අපිස්බැව්හි සොසානික කුමාරතෙරුන් ගේ වත කිය යුතු.

සොසානික කුමාරතෙරහු වනාහි සැවඅවුරුද්දක් ම සොහොන්හි විසූහ. අනික් එකද භික්ෂූනෙනෙක් ඒ බව නො දත්තේය.

එහෙයින් කිහ:

"සුසානෙ සටඨි වසසානි අබෙබාකකිණණං වසාමහං,
දුතියො මං න ජානෙය්‍ය අහො සොසානිකුත්තමො."

126. පිට

a. "තාළවෙළි මගෙහ"යන තැන "මහඟම තාළවෙලි නම් විපි යෙහි"යයි සන්න කියා "අනුරාධපුරෙහි වේය යෙත්ම"යි මතාන්තරය කුදු දැක්වූහ.

මෙහි මහගම රුහුණුජනපදයෙහි වූ බැවින් ද තිසස නම් ඇමැත් තාගේ මවු මහමඟ වුසු බැවින් ද තාළවෙලි නම් විපිය මහඟම වූ වක්ම වියයුතු.

134. පිට

a. "අනනමිදං භිකඛවෙ ජීවිකානං යදිදං පිණෙඩාලය්‍යං"(=මහ ණෙනි! යම් මේ පිඬු සිහා යෑමක් ඇද්ද ඒ අනනිම ජීවිකායයි. අඞ්ගුත්තරනිකායෙහි වදාළ පෙළයි. එහෙයින් පිණඩපාතිකඞ්ගය රක්තාවූ අනනිම ජීවිකායෙහි යෙදුනහුගේ නවවිධ මානයාගේ ප්‍රහා ණිය එක් ආනිසංසයෙකි.

d. "ගණභොජන-පරමපරභොජන-චාරිත්තසිකඛාපදෙහි අනා පත්තිනා"යි යූ තැන—

1. "ගණභොජන ඝිඛපදය"නම්:

"ගණභොජනෙ අඤඤත්‍ර සමයා පාචිත්තියං, තත්‍රායං සමයෝ ගිලානසමයෝ, චීවරදානසමයෝ, චීවරකාරසමයෝ, අද්ධානගමන සමයෝ, නාවාභිරුහණ සමයෝ, මහාසමයෝ, සමණභත්තසමයෝ; අයං තත්‍ර සමයෝ"යි වදාළ ඝිඛපදයයි.

එහි: ගණව පිළිගත් භොජනය නිමිති කොටගෙණ-හෙවත්-භික්ෂූහු සතරනමක්-ඔදන, සත්තු, කුම්මාස, මච්ඡ, මංස යන පස් බොජුනෙන් එක්තරා බොජුනකින් කැඳවන ලද්දාහු චීවරදානාදි සමය තබා වැළඳීමෙහි 'පචිති'ඇවතී යනු භාවයි.

2. "පරමපරභොජන ඝිඛපදය"නම්:

"පරම්පර භොජනෙ අඤඤත්‍ර සමයා පාචිත්තියං, තත්‍රායං සමයෝ ගිලානසමයෝ, චීවරදානසමයෝ, චීවරකාරසමයෝ. අයං තත්‍ර සමයෝ"යි වදාළ ඝිඛපදයයි.

එහි: පස්බොජුන් අතුරෙන් එක්තරා බොජුනකින් "භොජනෙන නිමන්නෙමි"යන ආදි අකැප වචනයෙන් බොහෝ දෙනෙකු පැවරූ කලැ පැවරූ බොජුන් පිළිවෙළ තබා උපිළිවෙළින් අන් බොජුනක් වැළඳීමෙහි සමය තබා "පචිති"ඇවැතී යනු භාවයි.

3. "චාමීහත සිඛපදය"නම්:

"යො පන භික්ඛු නිමන්තිතො සහතෙතා සමානො සන්තං භික්ඛුං අනාපුච්ඡා පුරෙභත්තං වා පච්ඡාභත්තං වා කුලෙසු චාරිත්තං ආපජ්ජෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පවිත්තිසං, තත්‍රායං සමයෝ: චීවරදාන සමයෝ, චීවරකාර සමයෝ. අයං තත්‍ර සමයෝ"ති වදළ සිඛපදයයි.

එහි: යම් මහණෙක් භොජනයකින් පවරණලදුව දෙළොස් රියන කින් ඇතුළෙහි ඇති භික්ෂුවක් නොවිචාරා පැවරූ බත් වැළඳීමට පෙර හෝ පසුව හෝ කැත්කුල ආදි කුලයෙහි සමය නබා හැසිරේ නම් 'පවිති'ඇවැති"යනු භාවයි.

(විභඞ්ග-භාවිතතියඝාළි.)

136. පඨ.

a. "තස්සාපි පත්තවිස්සට්ඨානං පඤ්ඤායති එව"යන තන්හි මහ කස්සප් මහතෙරුන්ගේ පා විහිදි තැන් නම්:

එක් දවසක් මහකස්සප් මහතෙරහු නිරොධසමාපත්තියෙන් නැගී රජගහනුවර පිඬු පිණිස නික්මුනුකල සක්දෙව්රජුගේ කකුටපාදිනී නම් දෙවහතන් පන්සියයක් තෙරුන්ට දෙනු පිණිස ගෙණා පිණ්ඩ පාතය පිළිකෙව් කොට සපදානවතින් පිඬු පිණිස හැසිරෙණුවෝ පෙනෙර ළිපියෙහි පෙහෙරවෙස් ගෙණ සිටි සක්දෙව්රජුගේ ගෙදෙ රට වැඩි සේක. සක්දෙව්තෙමේ තෙරුන් දූන ගෙහින් නික්ම පාත්‍රය ගෙණ සටියෙන් බත් ගෙණ-ඇතැම්හු-"සටිඔදන"නම් දිව්‍යාහාර විශෙෂයෙන් පාත්‍රය පුරවා තෙරුන්ට පිළිගන්වා වැඳ පැදකුණු කොට අහස නැගී තුන්වරක් උදන් ඇනීය.

මෙහි විස්තර කථාව දම්පියාඅට්ඨවණ්ණනාවේ මහකස්සප්තෙරුන්ට පිඬු දුන් වත බලා දතයුතුයි.

උදානපාළියෙහිදු:

"එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දක නිවාපෙ, තෙන ඛො පන සමයෙන ආයස්මා මහාකස්සපො පිප්පලි ගුහායං විහරති, සත්තාහං එකපල්ලඞ්කෙන නිසින්නො හොති අඤ්ඤ තරං සමාධිං සමාපජ්ජිත්වා. අථ ඛො ආයස්මා මහාකස්සපො තස්ස සත්තාහස්ස අච්චයෙන තමහා සමාධිමහා උට්ඨාසි. අථ ඛො ආයස්මතො මහාකස්සපස්ස එතදහොසි—යන්නූනාහං රාජගහං පිණ්ඩාය චරෙය්‍යන්ති. තෙන ඛො පන සමයෙන පඤ්ච මත්තානි දෙවතාසතානි උස්සුක්කං අපච්චානානි හොන්ති ආයස්මතො මහාකස්සපස්ස පිණ්ඩපාත පටිලාභාය. අථ ඛො ආයස්මා මහාකස්සපො තානි පඤ්චමත්තානි දෙවතාසතානි පටික්ඛිපිත්වා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය රාජගහං පිණ්ඩාය පාවිසි. තෙන ඛො පන සමයෙන සකෙකා දෙවානමින්දො ආයස්මතො මහාකස්සපස්ස

පිණ්ඩපාතං දුතියකාමෝ පෙසකාරවණ්ණං අභිනිම්මිණිත්වා තන්තං වායමානෝ විය සුජා අසුරකඤ්ඤා තසරං පූරෙති.' අථඛෝ ආයස්මා මහාකස්සපෝ යෙන සක්කස්ස දෙවානමින්දස්ස නිවෙසනං තෙනුපසංකමි. අද්දසා ඛෝ සක්කෝ දෙවානමින්දෝ, ආයස්මන්තං මහාකස්සපං දූරතොව ආගච්ඡන්තං දිස්වා ඝරා නික්ඛමිත්වා පච්චුග්ගන්ත්වා හත්ථතෝ පත්තං ගහෙත්වා ඝරං පවිසිත්වා සූතිතොදනං උද්ධරිත්වා පත්තං පූරෙත්වා ආයස්මතෝ මහාකස්සපස්ස පාදාසි. සෝ අහොසි පිණ්ඩපතෝ අනෙකසූපෝ අනෙකබ්යඤ්ජනෝ අනෙකසූපරසබ්යඤ්ජනෝ. අථ ඛෝ ආයස්මතෝ මහාකස්සපස්ස එතදහොසි—කොනුඛෝ අයං සත්තෝ යස්සායං එවරූපෝ ඉද්ධානුභාවොති. අථ ඛෝ ආයස්මතෝ මහාකස්සපස්ස එතදහොසි—සක්කෝ ඛෝ අයං දෙවානමින්දොති, ඉති විදිත්වා සක්කං දෙවානමින්දං එතදවොච—කථං ඛෝ තෙ ඉදං කොසිය මාදිසෙ පුනපි එවරූපමකාසීති? අමහාකම්පි හනෙත කස්සප පුඤ්ඤෙ නත්ථෙ ආමහාකම්පි පුඤ්ඤානි කරණීයානෙව, අථ ඛෝ සක්කෝ දෙවානමින්දෝ, ආයස්මන්තං මහාකස්සපං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා වෙහාසං අබ්භුග්ගන්ත්වා ආකාසෙ අන්තලික්ඛෙ නික්ඛන්තුං උදානං උදානෙසි:—"අහො දානං පරමදානං කස්සපෙ සුප්පතිට්ඨිත"න්ති. අසෙසාසි ඛෝ භගවා දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසකාය සක්කස්ස දෙවානමින්දස්ස වෙහාසං අබ්භුග්ගන්ත්වා ආකාසෙ අන්තලික්ඛෙ නික්ඛන්තුං උදානං උදානෙන්තස්ස "අහො දානං පරමදානං කස්සපෙ සුප්පතිට්ඨිත"න්ති. අථ ඛෝ භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

පිණ්ඩපාතිකස්ස භික්ඛුනෝ අත්තභරස්ස අකිඤ්චනස්සපොසිනෝ,
දෙවා පිහයන්ති තාදිනෝ උපසන්තස්ස සදා සතිමතෝ"ති.

(උදානපාළි-නන්දවග්ග.)

138. පිණ්ඩපාතික.

අ "අනතිරිත්තපච්චයා අනාපත්තී"යන තන්හි අනතිරිත්තාපත්ති නම්:

"යෝ පන භික්ඛු භුත්තාවී පවාරිතෝ අනතිරිත්තං ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියං"යි වදළ පවාරණ සිඛාපදයෙන් වන ඇවතැයි-භෙවත්-යම් මහණෙක් පස්බොදුනෙන් එක්තරා බොදුනක් වළඳා පැවරූයේ (නිමන්තේ) කැප නොකිරීම් ආදියෙන් අයිරින් නොකළ යම් කැලි ඇ තුන්කැලි හැර සෙසු කැයුතු දෙයක් හෝ බුදියයුතු දෙයක් හෝ කා නම් හෝ බුදී නම් හෝ පවිති ඇවතැයි කී ආපත්තියයි.

නන්අස්නෙහි හිඳ (වරින්වර) වළඳනුවහට කැප නොකළ බොජුන් වැළඳීමෙන් වන ඇවත **එකාසනිකඛඛෙස** රක්නා මහණහට නොවේ යන අර්ථයි.

143. පිට.

a. "අභිධම්මපරියායෙ"යන තන්හි අරණ්‍යලක්ෂණ කී අභිධර්ම දෙශනා නම්:

"අරඤ්ඤනති: නික්ඛම්මා බහි ඉන්ද්‍රඛීලා සබ්බමෙතං ආරඤ්ඤං"යි කියූ විභඞ්ගප්‍රකරණයෙහි ධ්‍යානවිභඞ්ග පාලියයි.

"තත්ථ අරඤ්ඤනති: විනයපරියායෙන තාව ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච අවසෙසං ආගතං, සුත්තන්තපරියායෙන ආරඤ්ඤකං භික්ඛුං සඤ්ඤාය—ආරඤ්ඤකං නාම සෙනාසනං පඤ්ච ධනුසතිකං පච්ඡිමනති ආගතං. විනයසුත්තන්තා පන උභොපි පරියාය දෙසනා නාම, අභිධම්මො නිප්පරියාය දෙසනාති අභිධම්මපරියායෙන අරඤ්ඤං දස්සෙතුං නික්ඛම්මා බහි ඉන්ද්‍රඛීලාති වුත්තං. ඉන්ද්‍රඛීලතො බහි නික්ඛම්මාති අත්ථො"යනු මෙයට ලී අට්ඨවාසි.

d. "ආවරියධනුකා"යන තැන "නවවියත් ඇඳරද්දන්නෙන්"යි අර්ථ කියූ.

"ආවරියධනූ නි: පකති හත්ථෙන නවවිදත්ථිපමාණං, ජියාය පන ආරොපිතාය චතුහත්ථපමාණන්ති වදන්ති"යනු ඤාණප්පභාසිනීනම භාසාවාමින් විසින් ලියූ ටිකාසි.

"ඇඳුරු දුන්න"නම් පියවි අතින් නව වියත් (සතර රියන් බාහුයක්)පමණය. දුනුදිය තැගුකල සතර රියන් පමණ යයි ද කියත්"යනු එහි අර්ථයි.

c. "මජ්ඣිමට්ඨකථායං"යනුවෙන්-මැදුම්සඟි අට්ඨවාසයෙහිදු වණ්ණනා කළ අරණ්‍යලක්ෂණයද මෙයටම සරිලන හෙයින් සූත්‍රානන්තපර්‍යායෙහිම කී අරණ්‍ය ලක්ෂණය මෙහි පමණයයි කිහු.

විනයපරියායෙහි:අදින්නාදාන පාරාජිකායෙහි ආ"ගාමා වා අරඤ්ඤා වා"යන තැන "ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච අවසෙසං අරඤ්ඤං නාම"යනුවෙන් කී අරණ්‍ය ලක්ෂණය නිරවශෙෂයෙන් අවභාරට්ඨාන ගැණීමෙහි ග්‍රාමාරණ්‍ය දෙක සංකර නොවනු සඳහා කීහ.

අභිධම්මපරියායෙහි: "නික්ඛම්මා බහිඉන්ද්‍රඛීලා සබ්බමෙතං අරඤ්ඤං"යි අරණ්‍යලක්ෂණය පර්‍යායයෙන් ග්‍රාමොපචාරයත් ග්‍රාම සඞ්ඛ්‍යාවවම යන හෙයින් නිෂ්පර්‍යායයෙන් නො ගම් තැනම අරණ්‍ය යයි දක්වනු සඳහා කීහ.

සුත්තන්තපරියායෙහි: "ආරඤ්ඤකං නාම සෙනාසනං පඤ්චධනුසතිකං පච්ඡිමං"(=යටත්පිරිසෙයින් ග්‍රාමොපචාරයෙහි සිට දුනු පන් සියයක් ඉක්ම ගිය තැන් පටන් ආරණ්‍යසෙනසුනැ) යි කී අරණ්‍ය ලක්ෂණය ආරණ්‍යක භික්ෂූහු සඳහාම කීහ. සූත්‍රයෙහි ආරණ්‍යසෙනාසනයයි කියේ විනයෙහි කී අරණ්‍යය සඳහා නොවේ. මෙද සූත්‍රවර්ණනා වෙක. එහෙයින් සූත්‍රයෙහි කී අරණ්‍යලක්ෂණයම මෙහි (ආරඤ්ඤිකඞ්ග යෙහි) පමණ වේ යනු මෙහි නිගමිතවූ අර්ථයයි.

148. පිට.

a. "මඤ්චපීඨානි අන්තෝ පවෙසෙතුං වට්ටති"යනු—

"යො පන භික්ඛු සඞ්ඝිකං මඤ්චං වා පීඨං වා භිසිං වා කොච්ඡං වා අඩ්ඩොකාසෙ සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය වා අනාපුච්ඡා වා ගච්ඡෙය්‍ය පාචිත්තියං"යි වදළ ඕඛපදයෙහි සහසතු ඇඳ පුටු ආදිය අඛවස තිබෙනු දුටොත් ("අඩ්ඩොකාසිකෙන චීවරකුටිං කත්වාපි රක්ඛිතබ්බං" [="අඩ්ඩොකාසි කඞ්ගය රක්නනු මිසිනුදු සිවුරු කිළියක් වත් කොට රැක්ක යුතු ය,] "අනාදරයෙන් නො සලකා ගියොත් ඇවතැයි"කී හෙයින්)එබඳු ඇඳ පුටු ආදිය තැන්පත් කරණු පිණිස සෙවනියකට ඇතුල්විය වටී. දුඞ්ග නො බිඳෙයි කියූ තැනි.

155. පිට.

a. "අභයගිරි වැසි"යන මෙහි "යෙසමපි ධුතඞ්ගං කුසලතන්තික විනිමුත්තං"යි පෙළෙහි මතාන්තර භෙදයක් කියනු පිණිස දැක්වූ 'යෙසං"යන පදයට යම් අභයගිරි වැසි කෙනෙක්හට යයි අරුත් කියා "අභයගිරි වැසි තෙරහු ධුතාඞ්ග නම් ප්‍රඥප්තිය, පරමාර්ථ විසින් විද්‍යමාන නැත්මයයි යෙතීයි"දක්වා පරමාර්ථයෙන් අවිද්‍යමාන හෙයින් අභයගිරිවාසීන්ට ධුතාඞ්ග නම් නැත. එහෙයින් "ධුතගුණ සමාදන්ව වෙසෙයි"කීමෙහි ධර්මවශයෙන් අවිද්‍යමානයා ගුණ නො වන බැවින් වචනවිරොධය ද ඔවුනට පැමිණේයි. එහෙයින් ඔවුන්ගෙ වචනය නො ගතයුතුයයි කීහු. මෙයින් ආචාර්‍යපාදයන් "මහාවිහාරවාසිනං දෙසනානයනිස්සිතං"යි ප්‍රතිඥත පරිදි කරුණු සහිතවම මත භෙද නිරාකරණයෙන් මහාවිහාරවාසීන්ගේ නිර්මල ශුද්ධියෙහි පිහිටි බව නිශ්චිතය.

මෙහි ව්‍යාඛ්‍යානකතීහු ද නිකායාන්තර ලබ්ධි ඇති තැන් විශෙෂයෙන් පරීක්ෂා කොට යථාර්‍හයම සුගම වන සේ දක්වා සකීය අර්‍ථ ව්‍යාඛ්‍යානය නිර්මලබයෙන් පූජ්‍යබවට පැමිණවූ පරිදිත් සිත් ගන්නේ ම ය.

157. පිට.

a. "බක්කුලත්තෙරෙ" බක්කුලතෙරහු නම්: "විසු කුලෙසු වඤ්ඤ තන්තා එවං ලබ නාමෙ ථෙරෙ" දෙකුලයෙක්හි වැඩුනු හෙයින් ඒවකකුලයයි කියනුතු තැන 'දව'යන්නට බකාර කොට 'බක්කුල'යයි නම් ඇති තෙරහුය. මේ තෙරහු අල්පාබාධ ඇත්තවුන් අතුරෙන් අග තැන් ලදහ. සථවිරතෙමේ ධුතාඞ්ගයෙන් තමන් කෙලෙස් නැසූහෙයින් ධුත නම් වේ. ධුතාඞ්ගයෙන් අනුන්ට අවවාද නො කරණ හෙයින් ධුතවාද නම් නො වේ.

b. "අට්ඨවාගෙහි කියේ මෑ නො"යනු මිහිඳු මහරහතුන් කළ මහ අට්ඨවාව සඳහා කීහු.

අඞ්ගුත්තර අට්ඨකථායෙහි දැ: "යථාහ-නහිදං ආයස්මා ඛණ්ඩකුණ්ඩලෝ ධුතෝ න ධුතවාදෙ"යි මෙසේම දැක්වූහු.

ඉ. "උපනන්දසක්කේ"ති: "ශාක්‍යකුලයෙන් පැවිදිවූ ආයුෂ්මත් උපනන්දස්ථවිරතෙමේ අපිච්ඡතාදි ධුතගුණ ප්‍රතිසංයුක්ත කොට අනුන්ට ධර්මදේශනා කිරීමෙහි සමර්ථයෙක. තෙරුන් ගෙන් බණ අසා බොහෝ භික්ෂූහු ධුතඞ්ග සමාදන් වූහ. එහෙත් තමා එකී ධුතගුණ යන්හි නො පිහිටියේය. එහෙයින්—

"නහිදං ආයස්මා උපනන්දසක්‍යපුත්තෝ න ධුතෝ, ධුතවාදෙ"යි කීහ. ආයුෂ්මත් උපනන්දතෙරහු තමන් ධුතගුණයෙන් කෙලෙස් නො නැසූ හෙයින් ධුත නම් නො වෙති. අනුන්ට ධුතඞ්ගයෙන් අවවාද අනුශාසනා කරණ හෙයින් ධුතවාද නම් වෙති.

ඉ. "ලාළුදායී" ලාළුදායි තෙරහු අල්පශ්‍රුතයහ. ධර්මකථායෙහි අසමර්ථයහ. කියයුතු නො කියයුතුත් නො දනිති. අපිච්ඡතාදි ගුණයෙහි තමනුත් නො පිහිටියෝය. "අනුන්ටත් අවවාද අනුශාසනා නො කරන්නෝය.

එහෙයින් "නහිදං ආයස්ම ලාළුදායී නෙව ධුතෝ, න ධුතවාදෙ"යි කීහ. ආයුෂ්මත් ලාළුදායි ධුතද නොවේ, ධුතවාදීද නොවේ.

169. පිමං


ඉ. "ගණභොජනා ඔහී"යන ශික්ෂාපද නම්: "යා පන භික්ඛුනී එකා වා ගාමන්තරං ගච්ඡෙය්‍ය එකා වා නදීපාරං ගච්ඡෙය්‍ය එකා වා රත්තිං විප්පවසෙය්‍ය එකා වා ගණභොජනං ඔහීයෙය්‍ය, අයම්පි භික්ඛුනී පඨමා පත්තිකං ධම්මං ආපන්නා; නිස්සාරණීයං සඞ්ඝාදිසෙසං"යි කියූ සිඛපදයයි.

මෙහි "එකා වා ගණභොජනා ඔහියෙය්‍ය"යනුවෙන් නොගම්වූ අරණ්‍යයෙහි දෙවැනි මෙහෙණකගේ දර්ශනොපචාරය හෝ ශ්‍රවණොපචාරය (දෙළොස් රියන් පමණ තැන්) ඉක්මවා ගණයාගෙන් තොර වී නම් සඞ්ඝාදිසෙස ඇවතැයි කියූ හෙයින් භික්ෂුණීන්ට ආරණ්‍යකාඞ්ගය ප්‍රතික්ෂිපතය.

b. "ඛලුපච්ඡාභත්තිකඞ්ගය අතිරිත්තභොජනශික්ෂාපදයෙන්ම ප්‍රතික්ෂිපතය"යන තන්හි අතිරිත්තභොජනසික්ඛාපදය අසාධාරණ පඤ්ඤත්ති හෙයින් භික්ෂූන්ට මුත් භික්ෂුණීන්ට නැත.

අතිරිත්ත භොජනය (=වළඳ පැවරූ පසු නැවත කැප කරවා වැළඳීම) භික්ෂූන්ට කැපය. භික්ෂුණීන්ට අකැපය. කප්‍යවස්තුවෙහි ලොලතා නැසීම පිණිස ධුතඞ්ගසමාදාන වෙයි. අකප්පියෙහි ධුතඞ්ගසමාදාන නැත. එහෙයින් භික්ෂුණීන්ට ඛලුපච්ඡාභත්තිකඞ්ගය ශික්ෂාපදයෙන්ම ප්‍රතික්ෂිපතයයි කියූ.

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු